ආතර් කොනන් ඩොයිල් ගේ

# බිහිසුණු නිම්නය

## ෂර්ලොක් හෝම්ස් පරීක්ෂණ



චන්දන මෙන්ඩිස්

# බිහිසුණු නිම්නය

# ෂර්ලොක් හෝම්ස් පරීක්ෂණ

අද්භූත නේවාසිකයා

# අනුවාදකගේ නිර්මාණ

යොවුන් නවකතා - අභිරහස් දූපතේ නිධානය

පරිවර්තන - නැතිවුණු ලොවේ සවාරියක්
(THE LOST WORLD)

ලෝකය වටේ අසූ දවසකින්
(AROUND THE WORLD
IN EIGHTY DAYS)

සිව් රහස් සලකුණ සහ තවත්
ෂර්ලොක් හෝම්ස් කථා
(THE SIGN OF FOUR)

සුනඛ ශාපය සහ හොඳම
ෂර්ලොක් හෝම්ස් කථා
(THE HOUND OF THE
BASKERVILLES)

මළගිය ඇත්තන් යාන්කී දෙනී
(THE BEST OF
SHERLOCK HOLMES)

බිහිසුණු නිම්නය
(THE VALLEY OF FEAR)

ඇලන් ක්වාටමෙන්ගේ වීර චාරිකාව
(ALLAN QUARTERMAIN)

ක්‍රීඩා සාහිත්‍යය -

ඔලිම්පික් ක්‍රීඩා සියවසක කතාව

ශ්‍රීමත් ආතර් කොනන් ඩොයිල්ගේ

# බිහිසුණු නිම්නය

## ෂර්ලොක් හෝම්ස් පරීක්ෂණ

අනුවාදක

චන්දන මෙන්ඩිස්

ප්‍රකාශක

චන්දන මෙන්ඩිස්

141/2, දුව පාර,

බැද්දගාන, කෝට්ටේ

ප්‍රථම මුද්‍රණය - 1999

දෙවන මුද්‍රණය - 2000

© චන්ද්‍රා මෙන්ඩිස්

ISBN- 955-95930-8-0

හිමිකම් ඇවිරිණි

මෙම ග්‍රන්ථය 1988 මුද්‍රිතය අදාළ පිළිබඳ හිමිකම් ජාත්‍යන්තර නීතිය යටතේ ආවරණය වේ. මෙම පොත සම්පූර්ණයෙන් හෝ කොටසක් උපුටා ගැනීම, මුද්‍රණ, ලිඛිත, ඡායාපිටපත් හෝ විද්‍යුත් වුවමනා ආදී සෑම මාධ්‍යයකින් හෝ පළකිරීම, විකාශනය කිරීම, ඡායා පිටපත් කිරීම සම්පූර්ණයෙන් තහනම් වේ. පොතට අදාළ සියලු කාර්යයන් සඳහා කර්තෘගෙන් ලිඛිත අවසරය ලබාගත යුතුමය.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය- ප්‍රකාශනගත පූර්වකරණ දත්ත

ඩොයිල්, සර් ආතර් කොනන්
බිහිසුණු නිම්නය : ෂර්ලොක් හෝම්ස් පරීක්ෂණ
සර් ආතර් කොනන් ඩොයිල් : පරි. චන්ද්‍රා මෙන්ඩිස්
කොළඹ : පරිවර්තක, 1998

පි. 200 : සෙ.මී.21 - (ෂර්ලොක් හෝම්ස් රහස් පරීක්ෂණ කථා) : The Valley of Fear කෘතියේ පරිවර්තනයකි

ISBN 955-95930-8-0 මිල: රු. 175

I. 823 ඩවි 21 II. ග්‍රන්ථ නාමය
III. මෙන්ඩිස්, චන්ද්‍රා පරි. IV. ග්‍රන්ථ මාලාව
1. රහස් පරීක්ෂක හා අද්භූත කථා, ඉංග්‍රීසි
2. ඉංග්‍රීසි ප්‍රබන්ධ

ඉදිරි පිටකවරය - මින්දුල කරියවන්ද
මුද්‍රණය - එස්. ඇන්ඩ් එස්. ප්‍රින්ටර්ස්
නො. 33, පාසල් පටුමග,
කොළඹ 09.

# පටුන


i බිහිසුණු නිම්නය

පළමුවන කොටස- ඛේද වාචකය

1. අනතුරු ඇඟවීමක්
2. ෂර්ලොක් හෝම්ස්ගෙන් දේශනයක්
3. බර්ල්ස්ටන්හි ඛේද වාචකය
4. ගනඳුර
5. විස්මයජනක සිදුවීමේ කොටස්කරුවෝ
6. අරුණලු
7. ගැටළුවට විසඳුම

දෙවැනි කොටස- ස්කෝවර් සංගමය

1. ඔහු
2. නායකතුමා
3. 341 වන ශාඛාව, වර්මිසාව
4. බිහිසුණු නිම්නය
5. අඳුරුම පැය
6. අනතුරුදායකයි !
7. බර්ඩි එඩ්වඩ්ස් උගුලක

පසුවදන

ii අද්භූත තේමාධිකයා

# කොනන් ඩොයිල්, බෙල්, හෝම්ස් හා වොට්සන්

'මේ මනුෂ්‍යයා' මහාචාර්ය ජෝසප් බෙල් රෝගියෙකු පෙන්වමින් තම ශිෂ්‍යයන් ඇමතුවේය.

'ඔහු වමත් කාරයෙක්, ඒ වගේම සපත්තු මහත්තයෙක්. ඔහුගේ කලිසමේ මේ තැන් මේ විදියට ගෙවී ගොස් තියෙන්නේ සපත්තේරුවන් දණහිස් අතර තිරසාර තබාගන්නා උපකරණය නිසා. කලිසමේ දකුණු පැත්ත වැඩිපුර ගෙවී ඇත්තේ, ඔහු වම් අතින් සපත්තුවලට ඇණ ගහන නිසා'

තමා වමත හුරු සපත්තු මහත්තයෙක් බව රෝගියා පිළිගත්තේය.

ෂර්ලොක් හෝම්ස් චරිතය නිර්මාණය කිරීම සඳහා කොනන් ඩොයිල් ආදර්ශයට ගත්තේ එඩිංබ්‍රෝ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය ජෝසප් බෙල්ගේ චරිතය බව ප්‍රකට කරුණකි. රෝගියා නිරීක්ෂණය කොට, ඔහුගේ රෝගය පමණක් නොව, රැකියාව පිළිබඳවද යමක් කීමට බෙල් සමත්කම් දැක්වීය.

'ඔබ නගරයේ දකුණු කෙළවරේ ඉඳලා එතකොට ගොල්ෆ් පිටිය හරහා ආ ගමන කොහොමද ? චමත්කාරජනක එකක්ද?'

ඔහු වරක් රෝගියෙකුගෙන් විමසුවේ, ඔහු විමතියට පත්කරමිනි. මේ රෝගියා ඇත්තෙන්ම බෙල් කලින් දැනහැඳින සිටි පුද්ගලයෙකු නොවේ.

'අද වගේ වැහි දවසක ගොල්ෆ් පිටියේ තණ කොළ නැති හරියේ තියෙන රතු පැහැති පස්, සපත්තු අඩියේ ඇලෙනවා. නගරයේ වෙන කොහේවත් මේ වර්ගයේ පස් දකින්නට ලැබෙන්නේ නෑ'

තමා ඒ නිගමනයට එළැඹි ආකාරය, බෙල් තම ශිෂ්‍යයින්ට පැහැදිලි කළේය.

'මේක බොහොම සරල දෙයක්. නමුත් මහ හොඳින් නිරීක්ෂණය කරන්න ඕන . අතින් අල්ලා බලන්න. ඔබේ සියළුම සංවේදී ඉන්ද්‍රියයන් යොදවන්න, ඉන්පසු බුද්ධිය මෙහෙයවා නිර්ණයකට එන්න.' බෙල් තම ශිෂ්‍යයන්ට අවධාරණය කළේය.

දිනක් බාහිර රෝගීන්ගේ අංශයට ප්‍රතිකාර ගැනීමට පැමිණි රෝගියකු ගැන බෙල් මෙසේ කීය.

'මෙන්න හොඳ සිත් ඇදගන්නා සුළු පරීක්ෂණයකට අවස්ථාවක්. මේ පුද්ගලයා බොහොම වෙලාවට රාජකීය ස්කොට්ලන්ත (රෝයල් ස්කොට්ස්) රෙජිමේන්තුවේ සේවය කොට, මෑතකදී සේවයෙන් ඉවත් වූ භටයෙක් විය යුතුයි. ඔහු සෑහෙන කාලයක් පෙරදිග රටක සේවය කර තිබෙනවා. යුද්ධ හමුදාවේ ඔහු සේවය කරන්න ඇත්තේ තූර්ය වාදක කණ්ඩායමේ. එහි දුම්බට (හොරණෑවක්) වැනි සංගීත භාණ්ඩයක් පිඹපු කෙනෙක්'

මෙම නිගමන වලින් ශිෂ්‍යයෝ මහත් පුදුමයට පත්වුන.

'මං කොහොමද මේ නිගමන වලට ආවේ?

ඔබ දක්කාද ඔහු මෙහි පැමිණි වෙලේ සිරුවෙන් සිටගත්තා. හමුදාවේ නොවන කෙනෙක් එහෙම කරන්නේ නෑ. හමුදාවේ කෙනෙක් වුණත් සේවයෙන් අස්වෙලා කලක් ගතවෙද්දී එය අතහැර දමනවා. ඒ නිසා, ඔහු හමුදාවෙන් ඉවත්වී ඇත්තේ මෑතකදී බව මට කියන්න පුළුවනි.

ඔබට පෙනෙනවා ඇති ඔහුගේ මුහුණත් බෙල්ලත් අව් රශ්මියට පිළිස්සී, කළුවී ඇති හැටි. ඒ සමගම ඔහුගේ අතේ තිබෙනවා පච්ච කොටපු ලකුණක්. අව්වට පිළිස්සී තිබෙන ආකාරය අනුව ඔහු උෂ්ණ කලාපීය රටක ජීවත්වී ඇති බව කිය හැකියි. පච්ච කොටු ලකුණ අපේ රටවල දකින්න ලැබෙන ආකාරයේ මෝස්තරයක් නොවෙයි. ඒ නිසා බොහෝ විට පෙරදිග රටක සේවය කළ කෙනෙක්. ඔහුගේ බඳ පටියේ ගාංචුවේ රෝයල් ස්කොට්ස් රෙජිමේන්තුවේ ලාංඡනය තිබෙනවා.

ඔහු උසෙන් අඩුයි. මේ තරම් කුඩා ශරීරයක් ඇත්තෙක් යුද්ධ හමුදාවේ සාමාන්‍ය භටයෙක් ලෙස ඉන්නවා දකින්න ලැබෙන්නේ නෑ. ඒ නිසා බොහොම වෙලාවට තූර්ය වාදක කණ්ඩායමේ විය යුතුයි. ඊළඟට බලන්න ඔහු හුස්ම ගන්නකොට ස්වභාවය: පෙනහැල්ල තුළ පටක, ශ්වසන නාල හා නාලිකා පමණට වඩා ප්‍රසාරණය වීම නිසා වැළැඳුණු එම්ෆිසීමා රෝගයේ ලක්ෂණ තියෙනවා නේද? ඒක බොහොම වෙලාවට හැදෙන්නේ ඇත්තේ විශාල පිත්තල හොරණෑවක් අවුරුදු ගණනක් පියලේ පිඹීමෙන්. දැන් අපි ඔහුගෙන්ම අහල බලමු.

'ඔබ සේවය කළේ හමුදාවේද?'

'ඔව් මහත්මයා'

'රෝයල් ස්කොට්ස් රෙජිමේන්තුවේ?'

'ඔව් මහත්මයා'

'සෑහෙන්න දීර්ඝ කාලයක්?'

'අවුරුදු විස්සක් රාජකාරි කළා'

'ළඟදී විශ්‍රාම ගත්තාද?'

'ඔව් මහත්මයා'

'ඔබ ඉන්දියාවේ සේවය කළාද?'

'ඔව් මහත්මයා'

'ඔබ සේවය කළේ තූර්ය වාදක කණ්ඩායමේ?'

'ඔව් මහත්මයා'

'ඔබ කළේ ලොකු හොරණෑවක් වැනි විශාල නළාවක් පිඹීමයි?'

'නෑ මහත්මයා මං කළේ බෙර වාදනය !'

මෙම පිළිතුර අසා වෛද්‍ය සිසුයින් මහ හඬින් සිනාසීමට පටන් ගත් කල, මෙල්ද ඊට හවුල් වූ බව පැවසේ.

බාල, තරුණ, මහලු පාඨකයින්ගේ ඉමහත් ආදරයට පාත්‍ර වූ ෂර්ලොක් හෝම්ස් හා දොස්තර වොට්සන්ගේ පරීක්ෂණ ඇතුළත් දීර්ඝ කථා හතරක් සහ කෙටිකථා පනස්හයක් කොනන් ඩොයිල් අතින් රචනා කෙරිණි. ඔහු 1886 දී රචනා කොට 1887 දී පළ වූ ලෝහිත පරීක්ෂණය කථාවේ සිට 1927 දී පළවූ අවසන් කථාව දක්වා අවුරුදු හතළිහක පමණ කාලයක් ෂර්ලොක් හෝම්ස් කථා නිර්මාණය කළේය. මෙම දීර්ඝ කාලය තුළ කතුවරයා අතින් සිදුවූ සුළු වැරදීම්ද හෝම්ස් රසිකයින්ගේ රසාස්වාදයට හේතු වී ඇත.

මයිවාන්ඩ් හි පැවැති සංග්‍රාමයේදී සතුරන්ගේ ජසායිල් වර්ගයේ සතරොම් තුවක්කු වෙඩි සහරින් තමාගේ උරහිසට තුවාල සිදුවූ බව, හෝම්ස් හමුවීමට පෙර වොට්සන් පවසයි.[1]

එහෙත් සිව්රහස් සලකුණ කථාවේදී වොට්සන්ගේ තුවාලය ඇත්තේ කකුලේ මිස උරහිසේ නොවේ. 'මම නිහඬවම මගේ කකුලේ වේදනා දෙන ස්ථානය පිරිමැදීමට පටන් ගත්තෙමි. කලකට පෙර ජසායිල් උණ්ඩයක් වැදීමෙන් මගේ කකුලට බරපතල තුවාල සිදුවිය.................... කාලගුණයේ වෙනස්වීමත් සමඟ දැන් කකුල වරින්වර වේදනා ගෙන දෙන්නට පටන් ගෙන ඇත'[2]

1888 වර්ෂය පසුබිම් කරගෙන ලියැවෙන බිහිසුණු නිම්නය කථාවේ මහාචාර්ය මොරියාටි ගැන වොට්සන්ට හොඳ අවබෝධයක් නැත. එහෙයින් හෝම්ස්, මොරියාටි ගැන ලොකු විස්තරයක් වොට්සන්ට පවසයි. එහෙත් 1891 අප්‍රේල්/ මැයි පසුබිම් කරගෙන ලියැවුණු 'අවසන් ගැටළුව' කථාන්තරයේ,

'වොට්සන් ඔබ මොරියාටි ගැන කවදාවත් අහල නැද්ද?'

'කිසි දවසක අහල නෑ.'

---

1. දුහුනම් පාඨය හා තොරඳම ෂර්ලොක් හෝම්ස් කථා (පිටු අංක 1)
2. සිව්රහස් සලකුණු (පිටු අංක 11)

ඩොක්ටර් වොට්සන් ගේ නම ජෝන් එච්. වොට්සන් බව අපි හොඳින් දනිමු. එහෙත් 'විරූපී මිනිහා' කථාවේ වොට්සන්ගේ බිරිඳ, රාත්‍රියේ තම හමුවීමට එන මිතුරිය - කේට් විට්නි හා සැමියා යහනට සූදානම් වී ලෙසේ කියයි.

'මං එහෙනම් ජේම්ස්ට නිදාගන්න යන්න කියන්නද?'

'අනේ එපා. මට ඩොක්ටර් මහත්තයාගෙන් අවවාදයක් උදව්වක් ඕනෑ.' කේට් විට්නි කියයි.

මේ ආදී පුංචි වැරදීම් නිසා, ෂර්ලොක් හෝම්ස් කථාන්තර වඩාත් රසවත් වී ඇත.

බිහිසුණු නිම්නය හුදු මනඃකල්පිත කථාවක්ම නොවේ. 19 වැනි සියවස මැද භාගයේ ඇමරිකා එක්සත් ජනපදයේ, පෙන්සිල්වේනියා ජනපදය තුළ, තම ආධිපත්‍යය පැතිරවීමට දැඟලූ කල්ලියක් සම්බන්ධය. එය මැඩ පැවැත්වීමට රජයේ ආරක්ෂක නිලධාරියෝ අපොහොසත් වූහ. මෙම සිද්ධියේ මුල්තැන ගෙන කටයුතු කළේ මැක්පාලේන් නම් පැනැත්තයායි. කොනන් ඩොයිල් මෙහි මැක්මර්ඩෝ යනුවෙන් හඳුන්වා දී ඇත්තේ ඔහුයි.

සත්‍ය සිද්ධියක් ඇසුරින් මෙවැනි කථාන්තරයක් රචනා කිරීමෙන්ම ශ්‍රීමත් ආතර් කොනන් ඩොයිල් කොතරම් ප්‍රතිභා පූර්ණ ලේඛකයකු ද යන්න මොනොවට පැහැදිලි වේ.

චන්දන මෙන්ඩිස්

1999 පෙබරවාරි 1.

් විය යුතුයි.'

# බිහිසුණු නිම්නය

## පළමුවන කොටස

### 1

### අනතුරු ඇඟවීමක්

'මට හිතන්න කාරණා තියෙනවා .........'

මා කථාව ඇරඹුවා පමණි...

' මම එහෙම හිතනවා,' කියමින් ෂර්ලොක් හෝම්ස් මගේ කථාවට බාධා කළේය. මේ අවහිරයෙන් මම මඳක් කෝපයට පත්වුණෙමි.

'මේ ඇත්තමයි හෝම්ස් – වෙලාවකට ඔබේ පිළිවෙළ නිසා මට තරහත් යනවා.'

එහෙත් මා කියූ දෙය ඔහුට ඇසුණු බවක් නොපෙනිණ. ලියුම් කවරයකින් එළියට ගත් කඩදාසි කෑබැල්ලක් දෙස, ඔහු දැඩි අවධානයකින් බලා සිටියේ මුළු ලොවම අමතක වූවාක් මෙනි. මේසය උඩ සූදානම් කොට තිබූ උදේ ආහාරයට ඔහු අත තබා වත් නැත. ලියුම් කවරය හිරු එළියට අල්ලා හෝම්ස් එය හොඳින් පරීක්ෂා කළේය.

'මේක නං ලියල තියෙන්නේ පෝර්ලොක්. ඔහුගේ අත් අකුරු මං දැකලා තියෙන්නේ මට ඉස්සර දෙවතාවයි. ඒත් මේක පෝර්ලොක්ගෙ ලියවිල්ලක් හැටියට මට කිසිම සැකයක් නෑ. 'ඊ' අකුරේ ඉහළ කෙළවර ලියලා තියෙන්නෙ, ග්‍රීක් කාලෙට, බොහොම විදගතේ. හැබැයි මේක පෝර්ලොක් ගෙන් නම් ඒක බොහොම වැදගත් ලියුමක් විය යුතුයි.'

හෝම්ස් මේ සියල්ල කියාගත්තේ තමාටමයි. එහෙත් ඒ

වචන වලින් මගේ සිතේ ඇතිවූයේ උද්යෝගයකි. මගේ සැක එයින්ම යටපත් විය.

'පෝලොක් කිව්වේ කවුද ?'

' පෝලොක් කියල කිව්වට, ඒක හඳුනාගැනීම සඳහා යොදා ගනිපු රහස් නාමයක් පමණයි. ඒ නම පිටිපස්සේ හැංගිලා ඉන්නේ අපව මගහැරලා ඉන්න පුද්ගලයෙක්. මීට කලින් ලියුමක ඔහු අවංකව කියා තිබ්බා මේක ඔහුගේ ඇත්ත නම නොවෙයි කියලා. ඉතින් ලක්ෂ ගණනක් ජීවත් වෙන ලන්ඩන් නගරයේ ඔහුව හොයාගන්න එක මට කොහොමටවත් කරන්න බෑ. පෝලොක් අපට වැදගත් වෙන්නෙ, ඔහු සමග සම්බන්ධව ඉන්න ඉතාම ප්‍රසිද්ධ පුද්ගලයා නිසා. ඔබේ හිතේ මවාගන්න කුඩා මාලුවෙක් පිටුපස පිහිනා යන මෝරෙක්. නැත්නම් හිවලෙක් පසුපස යන සිංහයෙක්. පුංචි සතා පිටුපස්සෙන් ඉන්නේ, මොහොම දරුණු විස්තර කරන්න බැරි තරම් භයානක, කුරිරු සතෙක්. ඔබ අහල ඇති මං මහාචාර්ය මොරියාටි ගැන කථා කරනවා.'

' ප්‍රසිද්ධ වගේම විද්‍යානුකූල අපරාධකාරයා ? අපරාධකාරයින් අතර කොයිතරම් ප්‍රසිද්ධ ද කිව්වොත් ......'

' හා, හා, වොට්සන්...'

'නෑ. මං කියන්න හැදුවෙ ඔහු ගැන මහත්තයා කිසිසේත්ම දන්නේ නැහැ කියලයි.'

' වොට්සන් ඔබත් දැන් අලුත්ම තාලේ විහිළු කථා කියන්න පටන් අරගෙන. ඔබ මොරියාටිව අපරාධ කාරයෙක් කියනවා කාටවත් ඇහුණොත් ? ඔහුට ප්‍රථමයෙන් ද්වේෂ සහගත ලෙස අපහාස කරා කියලා ඔබව අධිකරණයට ඉදිරියට ගෙනියන්න.

බලන්න ඒකෙත් හැටි. මෙපමණ කාලයකට ලෝකයේ බිහිවූ අති ප්‍රසන්නම සැලසුම් කාරයා. පාතාල ලෝකයම මෙහෙයවන මොළකාරයා. සියලුම අපරාධ හා දූෂණ වල ප්‍රධාන සංවිධායකයා. රටක පැවැත්මට ඉඩ හරිනවාද, නැත්නම් එය වැනසීමට ඉඩ සලස්වනවාද යන්න පවා තීරණය කිරීමට ඔහුට හැකියාවක්

තිබෙනවා. අන්න ඒ වගේ දක්ෂයෙක්.

ඔහු ගැන අංශු මාත්‍රයක සැකයක් මහත්තයාටගේ නැහැ, ඒ විශ්වාසය කොපමණ ද කිව්වොත්, ඔබේ කටින් පිටවුණු වචන වලට උසාවියට කැඳවලා ඔබට දඬුවම් නියම කරන්න ඉඩ තිබුණා. ඔහුගේ කීර්ති නාමයට වුණු අපහාසයට අලාභ වශයෙන්, ඔබේ අවුරුද්දක විශ්‍රාම වැටුප් අය කරගන්නවා සිකුරුයි.

ඔබ දන්නවාද වොට්සන්, 'උල්කාපාතයක ගති විද්‍යාව' කියලා ඔහු ලිව්වා පොතක්. ඒ පොතේ අඩංගු කරුණු විවේචනය කරන්න පුළුවන් විද්‍යාඥයෙක් තවම බිහිවෙලා නැහැ. මෙන්න මේ වගේ සුප්‍රසිද්ධ විද්‍යාඥයෙකුට අපහාස කළොත් එහෙම ? ඔබ ගැරහීමකට ලක්වූ විද්‍යාඥයෙක් සහ කට වාචාල දොස්තර කෙනෙක් කියලා මිනිස්සු ඔබ දෙපළ හඳුන්වාවි. මිනිහා අති දක්ෂයෙක් වොට්සන්. මිනිහව අල්ලා ගන්න, දවසක් ඒවි අපටත්.'

'මාත් ඉඳීවිද එදාට ? ඒ වුණත් ඔබ කිය කියා හිටියෙ පෝර්ලොක් ගැන..'

' ආ..... ඔව්, පෝර්ලොක් කියන්නේ අපි දැවැන්තයාට අපව සම්බන්ධ කරන දම්වැලේ එක පුරුකක්. මට පෙනිල තියෙන හැටියට ඒ දම්වැලේ තියෙන දුර්වලම පුරුක තමා පෝර්ලොක්.

'ඒ වුණත් එක පුරුකක් දුර්වල නම් දම්වැල කොහොමද ශක්තිමත් වෙන්නේ ?'

'හරියට හරි වොට්සන්. අන්න ඒකයි පෝර්ලොක් අපට වැදගත් වෙන්නේ. ඔහුගේ යටි හිතට ඇතුළු වෙලා තියෙනවා, අපරාධ වලට විරුද්ධ විය යුතුයි කියන සියුම් හැඟීමක්. ඊට අමතරව හෝරයක් මාර්ග හරහා මම පවුම් දහයේ නෝට්ටු ඔහු අතට ලැබීමට සලස්වනවා. අන්න ඒවල ආධාරයෙන්, යමක් සිදුවීමට පෙර වරක් දෙවරක් මට ඔහුගෙන් ආරංචි ලැබී තිබෙනවා. අපරාධ කිහිපයක් වලක්වා ගැනීමට ඒවා අතිශයින්ම ප්‍රයෝජනවත් වුණා.

මේ රහස් පණිවුඩයේ යතුර තිබුණා නම් මේකෙන් කියන්න හදන්නේ මොකක්ද කියලා අපට පැහැදිලිව තේරුම් ගන්න තිබුණා.' පැවසූ හෝම්ස් එය යළිත් පරීක්ෂා කර බැලුවේය. මම එයට එබී බැලුවෙමි. එහි මෙසේ සඳහන්ව තිබිණ.

**534 C2 13 127 36 31 417 21 41 ඩග්ලස් 109 293 5 37 බර්ල්ස්ටෝන් 26 බර්ල්ස්ටෝන් 9 13 171**

'මේ මොකක් ගැන ද හෝම්ස් ?'

'මොකවත් හරි රහස් පණිවුඩයක් අපට දෙන්න කරපු උත්සාහයක්'

'ඒ වුණත් රහස් පණිවුඩයේ ඇති ප්‍රයෝජනය මොකක්ද, ඒක කියවා ගැනීමට උදව් කරගත යුතු සූත්‍රය නැතුව ?'

'සමහර නං එකෙන් ප්‍රයෝජනයක් නැහැ තමයි.....'

'ඇයි ඔබ 'සමහර නම්' කිව්වේ ?'

'ඒ මොකද සමහර රහස් පණිවුඩ තුන් කියවෙනවා මට පහසුවෙන් කියවලා තේරුම් ගන්න පුළුවනි, හරියට පත්තරේ මරණ දැන්වීම් තීරය කියවලා තේරුම් ගන්නවා වගේ. නමුත් මේක නං ඊට වෙනස්. මේක මොකක් හරි පොතක, පිටුවක අංක වචන සම්බන්ධයෙන් ලියවිලා තියෙන්නේ. ඒත් ඒ පොත මොකක්ද කියලා හඳුනාගන්න තුරු මට මොකුත් තේරුම් ගන්න බැ.'

'ඒ වුණත් ඇයි ඩග්ලස්, බර්ල්ස්ටන් කියලා අකුරෙන් ලියලා තියෙන්නේ ?'

'ඒක පැහැදිලියි. ඒ වචන, අර පොතේ පිටුවල අංක නැති නිසා.'

'හොඳයි පොත මොකක්ද කියලා මිනු සඳහන් නොකළේ ඇයි?'

'ඔබේ තීක්ෂණ බුද්ධියට මොකද වුණේ වොට්සන් ? ගුප්ත භාෂාවකින් රහස් පණිවුඩයක් එවන ගමන්, එය විසඳන යතුරත්

ඒ පවරම් ඇතුළත් කළා කියමු. එවා එවංගු කවරය වැරදි තැනකට ගියොත් සියල්ල විනාශයි. ඒ දෙක වෙන වෙනම එවනවා නම් ආරක්ෂාව වැඩියි. ගැටළුවත් යතුරත් දෙකම වැරදි තැනට යන්න තියෙන ඉඩකඩ අඩුයි. අද දවසේ දෙවැනි වර ලියුම් බෙදිය යුතු වෙලාව දැනටමත් පහුවෙලා. මේ ගැටළුව විසඳන යතුර එහෙ නම් නොවරදවාම තියෙන්න ඕන"

වැඩි වේලා යාමට පෙර බිලී නම් සේවකයා හෝම්ස් නමට ලැබී තිබුණු ලිපියක් ගෙන ආවේය.

"ඒ අත් අකුරුමයි. ආ... පඩින් අත්සන් කරලත් තියෙන්නේ."

එහෙත් ලියුම කියවීමට පටන්ගත් විගසම ඔහුගේ නළල රැළි වැටිණි.

"අයියෝ ! අපේ බලාපොරොත්තු සම්පූර්ණයෙන්ම බිඳ වැටෙනවා. පෝර්ලොක්ට මොනවා හරි කරදරයක් වගේ. එයේ නොවෙච්චා කියලා මං ප්‍රාර්ථනා කරනවා."

මම ලියුම පරීක්ෂා කර බැලුවෙමි.

"හිතවත් හෝම්ස් මහතාණෙනි,

මේ කාරණය මම මෙතෙකින්ම හමාර කරමි. බොහොම අන්තරායකයි. ඔහු මට සැක කිරීමට පටන් අරං. මා ලියුම කවරයේ ලිපිනය ලියද්දී ඔහු හිටිහැටියේම මා ළඟට ආවේ බලාපොරොත්තු නොවූ අයුරින්. කවරය ඉක්මනින්ම සැඟවීමට මට හැකිවුණා. මං බලාපොරොත්තු වුණේ රහස් ලියවිල්ලට යතුර මේ සමඟ එවන්නයි. එය ඔහු දුටුවා නං මට ගැලවීමක් නෑ. ඔහු මා සැකකරන බව ඔහුගේ දෑසෙන් මට තේරුම් ගත හැකියි. අර රහස් ලියුම පුච්චලා දමන්න. දැන් ඔබට එයින් ප්‍රයෝජනයක් නෑ."

ෆ්‍රෙඩ් පෝර්ලොක්

හෝම්ස් මඳ වේලාවක් කල්පනා කරමින් සිටියේය.

"සමහර වෙලාවට ලොක්කගෙ හිතේ මොකුත් සැකයක් ඇති නොවුණා වෙන්නත් පුළුවනි. තමන් මන්ත්‍ර දැන සිට දන්න නිසා පෝලොක්ගෙ හිතේ ඇතිවුණු භයක් වෙන්නත් ඇති"

"ලොක්ක කියලා කිව්වෙ මහාචාර්ය මොරියාටිද ?"

"වෙන කවුද ? පාතාල ලෝකෙ කවුරුත් ඉතාම පුවිශේෂ ලෙස 'මකු' කියල හඳුන්වන්නෙ මොරියාටි තමා"

"ඒත් මොනවද මකුට කරන්න පුළුවන් ?"

"හම්. ඒක බරපතල ප්‍රශ්නයක්. මකුට කියන්නේත් යුරෝපයේ තියෙන තීක්ෂණම මොළ වලින් එකක්. විලගට පාතාල ලෝකයේ සහාන්ධකාරය තුළ මකුට ආරක්ෂාවත් සැලසෙනවා. ඉතින් සිදුවෙන්න පුළුවන් දේ අප්‍රමාණයි. අපේ මිත්‍රයා පෝලොක්, බොහොම භයට පත්වෙලයි ඉන්නෙ. කලින් ලියුමේ මකුගේ අත්අකුරුයි දෙවැනි ලියුමේ අත්අකුරුයි සසඳලා බලන්න. එකක් හොඳටම පැහැදිලියි. අනෙක අවුල් ජාලයක්."

"ඉතින් ඇයි මකු අපට ලියල දැන්නුවෙ ? නිශ්ශබ්දවම මේක අත්හැරදන්න තිබුණා නේ ?"

"මකු සැවුණා අපි මේක ගැන විමසිලි මොනවා හරි කරාවි කියලා. එහෙම වුණොත් තමන් කරදරේ වැටේවි කියන බයට තමයි යවුදෙනුව අවසානයි කියලා අපට දැන්නුවෙ"

මම රහස් ලියවිල්ල යළිත් පරීක්ෂා කර බැලුවෙමි.

"ඉතාම වැදගත් රහස් පණිවුඩයක් මේකෙ අඩංගු වෙලත්, ඒක විසඳගන්න සමත් මිනිස්සයෙක් නැතැ නේද කියලා හිතන කොට පිස්සු හැදෙනවා නේද ?" මම කීවෙමි.

ෂර්ලොක් හෝම්ස් උදේ ආහාරය අඩංගු බඳුන් සියල්ල පසෙකට තල්ලුකොට, පයිප්පය දල්වා ගත්තේය. කල්පනා සයුරේ ගැඹුරටම කිමිදීමට අවශ්‍ය වූ විට මිනිසාගේ සහකාරයා වූයේ මේ පයිප්පයයි.

'තර්කානුකූල ක්‍රමයට මේ ගැටලුව විමසා බලමු. මේ මිනිහා සඳහන් කරන්නේ පොතක් ගැන. අපි එතනින් පටන් ගමු.'

' ඒක ඒ තරම් පැහැදිලි හෝඩුවාවක් නොවෙයි ?'

'ඇත්ත. ඒත් බලමු එයෙන් අපිට සොයාගන්න පුළුවන් කරුණු මොනවද කියලා. පණිවුඩය පටන් ගන්නේ 534 කියන අංකයෙන්. අපිට හිතාගන්න පුළුවන් මේ දැනුම් දෙන්නේ පොතක පිටු අංකයකට කියලා. මේ තරම් පිටු සංඛ්‍යාවක් තියෙනවා නම් එය විශාල පොතක් විය යුතුයි. එය මොන පොතක්ද කියන එක හිතාගන්න මොනවද අපිට තියෙන සලකුණු? ඊළඟ අංකය C 2. වොට්සන් ඒක ගැන ඔබට මොනවද කියන්න පුළුවන් ?'

' දෙවැනි පරිච්ඡේදය කියන එක විය යුතුයි. 'C' අකුරෙන් chapter කියන වචනය ඔහු අදහස් කරන බවට කිසිම සැකයක් නෑ.'

' නෑ වොට්සන්. පිටු අංකය දුන්නට පස්සේ පරිච්ඡේද අංකයෙන් ප්‍රයෝජනයක් නෑ. අනෙක පිටු 534 ක් ගියාමත් අපි ඉන්නේ දෙවන පරිච්ඡේදයේ නම්, පළවෙනි පරිච්ඡේදය කියවීම එපාවෙන තරමට දීර්ඝ ඇති ! '

'එහෙනං කොලම ?'

'විශිෂ්ටයි වොට්සන්. අද උදේ සිටම ඔබේ මිළිඳුරු බොහොම දීප්තිමත්. ඉතින්, දැන් අපිට තියේ මවාගන්න පුළුවනි විශාල පොතක්. එක පිටුව කොලම් දෙකට මුද්‍රණය කරපු එකක්. ඒ වගේම බොහොම දීර්ඝයි. බලන්න එක වචනයක් ඒ කොලමේ තියෙන 293 වැනි වචනය. වෙන මොනවද ?'

මේ පොත බොහොම දුර්ලභ එකක් වුණා නං ඔහු ඒක මට එවනවා. එහෙම නොඑව්ව එයෙන් හිතාගන්න පුළුවනි, ඒක අපිට පහසුවෙන් හොයාගන්න පුළුවන් පොතක් බව ඔහු විශ්වාස කරනවා. කෙටියෙන් කියනව නං ඉතාම සාමාන්‍ය පොතක්'

'බයිබලය !' මම ජයග්‍රාහී අයුරින් පැවසුවෙමි.

"බොහොම හොඳයි වොට්සන්. ඒ වුණාට ඊපාස් හොඳ මදි. මොරියාටිගෙ ගෝලයන් ළඟ, මෙන්න මෙන්න පොතක් තිබුණත් බයිබලේ නම් තියේවි කියලා මං හිතන්නේ නෑ. අනෙක බයිබලයේ එකිනෙකට වෙනස් මුද්‍රණ, සංස්කරණ, ඉතා විශාල සංඛ්‍යාවක් තියෙනවා. ඉතින් මිනු ළඟ තියෙන පොතේ පිටු අංකය, මගේ පොතේ පිටු අංකයට හරියටම ගැළපේද කියලා සහතික වෙන්න අමාරුයි. මේක ඊට වඩා වෙනස් ආකාරයක පොතක් විය යුතුයි. මිනුගේ 534 වැනි පිට, මගේ පොතේ එම පිටට හරියටම සමානයි කියලා මිනු හොඳින් දන්නා පොතක්."

"ඒ වගේ පොත් තියෙන්න පුළුවන් ඉතාම ස්වල්පයයි නේ. බ්‍රැඩ්ෂෝ ගෙ දුම්රිය හා නැව් ගමන් කාලසටහන් පිළිබඳ විස්තර පොත ?"

"ඒක තෝරා ගන්න තියෙන සීමිත වචන ප්‍රමාණය අනුව පණිවුඩයක් යැවීම සඳහා බ්‍රැඩ්ෂෝ ඒක යොදා ගනීවි කියලා හිතන්න බෑ. එහෙනම් ඉතුරු වෙන්නෙ මොනවද ?"

"කෝෂ ග්‍රන්ථයක් ?"

"විශිෂ්ටයි වොට්සන්. මං හිතන්නේ මීක ඉතාම නිවැරදියි. අපි විටේකර්ගේ කෝෂ ග්‍රන්ථය ගැන සලකා බලමු. ඒක සාමාන්‍යයෙන් බහුලව හිතෑම තැනක හමුවෙන පොතක්. අපට උවමනා පිටු සංඛ්‍යාව ඒකෙ තියෙනවා, සකස් කරලා තියෙන්නේ කොලම් දෙකට."

"එසේ පැවසූ හෝම්ස් මේසය උඩින් එම පොත අතට ගත්තේය

"මෙන්න 534 වෙනි පිටුව. දෙවැනි කොලම. වචන වලින් පිරුණු පිටුවක්. බ්‍රිතාන්‍ය ඉන්දියාවේ සම්පත් හා වෙළඳාම ගැන.මේ වචන ටික සටහන් කරගන්න. අංක 13 මහාරාෂ්ට්‍ර.. ඒක නං ඒ හැටි සුභ ආරම්භයක් කියන්න බෑ. 127, රාජ්‍යය, පම්පිකි ශේර්මන් නං තියෙනවා...ඊළඟ වචනය ලැරන්නේ කෙදි..... අපි ලෝක අමාරුවක වැටුණේ වොට්සන් ! සකාව එකනිං ඉවරයි!"

ඔහු සතා කාලේ හාසය පිට කළකිනි. එහෙත් බලාපොරොත්තු කඩවීම මුහුණෙන් පිළිබිඹු විය. මඳක් වේලා නිහඬව සිටි හෝම්ස් එක්වරම නැගිට, අසේ පොත් අල්මාරිය වෙත දිවගියේය. කහ පැහැති කවරයක් සහිත පොතක් අතට ගත් ඔහු,

" අපි කලට වේලාවට නැඟපෙන විදියට සූදානම් වී සිටීම නිසා වැටිච්ච අමාරුවක් මේක. අද සවසින් ජනවාරි මාසෙ හත්වෙනිද, සැකයක් නෑ, පෝර්ලොක් ඔහුගේ රහස් ලියැවිල්ලට යොදාගන්න ඇත්තේ ගිය අවුරුද්දේ විටේකර් කෝෂ ග්‍රන්ථය. දන් බලමු 534 වැනි පිටුවේ තියෙන්නේ මොනවද කියලා. මම පිටු අංකය අනුව වචන කියන්නම්. ලියාගන්න වොට්සන්. හ හා.. පළමුවෙනි වචනය අන්තරාදයක...., ඊළඟට... ලියන්න ලියන්න.

**" අන්තරාදයක වහාම උදාවෙයි ධනවත් ඩග්ලස් නම් මහතා වෙත. විශ්වාස මාර්ගයකින් දැනගැනීම. බර්ල්ස්ටන් ප්‍රදේශයේ බර්ල්ස්ටන් මන්දිරයේ පදිංචිව සිටින"**

ඔහු 'අදහස් ප්‍රකාශ කරන්නේ හරිම නොපැහැදිලි ආකාරයකට සහ' මම කීවෙමි.

"එහෙම කියන එක වැරදියි වොට්සන්. පොතක පිටුවකින් වචන තෝරල අරගෙන පණිවුඩයක් දෙන කොට, වාක්‍ය නිවැරදිව ගැළපීම සඳහා හැම වචනයක්ම නිවැරදිව ලැබෙන්නෙ නෑ."

හෝම්ස් ඔහුගේ ජයග්‍රහණය ගැන, ප්‍රමෝදයට පත්වෙමින් සිටියේය. අප නිවසේ සේවකයා වූ බිලී, එක්වරම දොර විවෘත කරගෙන අපේ විසිත්ත කාමරයට ඇතුළු විය. ඔහු පැමිණියේ ස්කොට්ලන්ඩ්යාඩ් රහස් පොලිසියේ රහස් පරීක්ෂක මැක්ඩොනල්ඩ් සමගයි.

ඒ අසූව දශකයේ අග භාගයයි. දැන් ප්‍රසිද්ධ රහස් පරීක්ෂකයෙකු බවට පත්ව ඇතත් ඇලෙක් මැක්ඩොනල්ඩ් එවකට එතරම් ජනප්‍රියත්වයක් ලබා සිටියේ නැත. එහෙත් දක්ෂයෙකු වූ ඔහු, තමාට භාරවූ පරීක්ෂණ කිහිපයකින්ම සතුටුදායක ප්‍රතිඵල ලබා සිටියේය. කෙට්ටු, උස ශරීරයක් හිමිකළ මැක්ඩොනල්ඩ් ඉතා

ශක්තිමත් පුද්ගලයෙකු බව බැලූ බැල්මට පෙනිණ. ප්‍රමාණයෙන් විශාල හිස් කබලෙන් හා රළු ඇහිබැමට යටින් පිහිටි සියුණු නෙත් යුවළින් ද දිස්වූයේ ඔහුගේ බුද්ධිමත් ස්වභාවයයි.

දුෂ්කර පරීක්ෂණ දෙකක්ම සාර්ථක කරගැනීම සඳහා මීට පෙර අවස්ථාවල ඔහුට, හෝම්ස්ගේ සහාය නොඅඩුව ලැබිණ. එම අවස්ථා වලදී ගැටළුව විසඳීමේ ගෞරවය හා ප්‍රසිද්ධිය හිමිවූයේ මැක්ඩොනල්ඩ්ටයි. හෝම්ස්ට හිමිවූයේ එය විසඳීමෙන් ලැබුණු ආත්ම තෘප්තිය පමණකි. මේ හේතුව නිසාම මැක්ඩොනල්ඩ්ගේ සිතේ හෝම්ස් කෙරෙහි පැවැතියේ ගෞරව සම්ප්‍රයුක්ත හිතෙකම් බවකි. විසඳීමට දුෂ්කර ගැටළුවක් ලැබුණු විහාම හෝම්ස් හමුවීමට එමට මැක්ඩොනල්ඩ් අමතක නොකළේය.

"ඔබ බොහොම පාන්දරින්ම කෑම සොයාගෙන යන කුරුල්ලෙක් වගෙයි මැක් මහත්තයා. මට හිතෙන හැටියට කොහේ හරි මොකව හරි කලබලයක් ඇතිවෙලා තියෙනවා"

"ඔව් හරි හෝම්ස් මහත්තයා. ස්තූතියි. මං දුම් බොන්නේ නෑ. මං ඉක්මනට යන්න ඕනෑ. ඕනෑම සිද්ධියක් වුණාම ඒකෙ මුල් පැය කීපය ඉතාම වැදගත්. ඒක ඉතින් වෙන කාටවත් වඩා ඔබ හොඳින් දන්නවා නොවැ.

නමුත්..... නමුත්..."

එත්වරම තම කථාව නැවැත්වූ පොලිස් පරීක්ෂකයා මේසය මත වූ කඩදසි කැබැල්ල දෙස පුදුමයෙන් බලා සිටියේය. පෝර්ලොක් එවූ රහස් පණිවුඩය විසඳ, අප එය සටහන් කළ කඩදසියයි ඒ.

"ඩග්ලස් ! බර්ල්ස්ටන් !! " මැක්ඩොනල්ඩ් ගොත ගැසීමට පටන් ගත්තේය.

" මේ මොකක්ද හෝම්ස් මහත්තයා මේ ? මේක නම් අංජනං බලනවා වගේ වැඩක් නේ. ඔබට කොහොමද මේ නම් දෙක හම්බවුණේ ?"

'ඒක වොට්සන්ටයි මටයි විසඳන්න ලැබුණු රහස් පණිවුඩයක්. මොකක්ද ඒ නම් දෙයක් ඇති වැරැද්ද ?'

රහස් පරීක්ෂක මැක්ඩොනල්ඩ් අප දෙස බලාසිටියේ අදහාගත නොහැකි තරම් විස්මයෙන් දෑස් විවර කරගෙනයි.

'බර්ල්ස්ටන් මන්දිරයේ ඩග්ලස් මහතා, ඊයේ රාත්‍රී ඉතා සාහසික ලෙස මරා දමලා !'

# 2

## ෂර්ලොක් හෝම්ස්ගෙන් දේශනයක්.

කොතරම් උද්වේගකාරී මොහොතක් වුවත් හෝම්ස්ගෙන් දැකිය හැකිවූයේ ඔහුටම විශේෂ වූ නැත්පත් ස්වභාවයයි. මගේ සිතේ එම ප්‍රවෘත්තියෙන් ඇතිවූයේ භීතියකි, කම්පනයකි. එහෙත් හෝම්ස් එයින් තිගැස්සුනේ නැත. ඔහු මේ ආරංචිය අසා සිටියේ පර්යේෂණයක් නරඹන රසායන විද්‍යාඥයෙකු දක්වන උනන්දුවකිනි.

'බොහොම වැදගත් ! බොහොම වැදගත් ! හෝම්ස් කීය

'ඔබ එයින් පුදුමයට පත් වුණු බවක් මට නං පෙනෙන්නෙ නෑ?'

'මං ඒ තරම් පුදුමයට නං පත්වුණේ නෑ මැක් මහත්තයා නමුත් උනන්දුවක් ඇතිවුණා. මං මොකටද පුදුම වෙන්නෙ. පාතාල ලෝකයෙන් මට නිර්නාමික පණිවිඩයක් ලැබෙනවා, යම් පුද්ගලයෙක් අනතුරකට භාජනය වීම අතළඟයි කියලා. පැයක් ඇතුළත මට දැනගන්න ලැබෙනවා සියල්ල සිදුවෙලා හමාරයි කියලා

'එවැනි දෙයක් සිද්ධ වෙන්න යන බව ඔබ දැනගත්තේ කොහොමද ?'

තමාට ලැබුණු රහස් පණිවිඩය ගැන හෝම්ස් කෙටියෙන් මැක්ඩොනල්ඩ්ට පැහැදිලි කළේය.'

'මං මේ බර්ල්ස්ටන් වලට යන ගමන් ආවේ, ඔබටත් ඔබේ මිත්‍රයාටත් මා සමඟ එකතුවෙන්න පුළුවන්ද කියලා අහන්නයි. ඒත් ඔබ කියන කාරණා වල හැටියට, අපට ලන්ඩනයේ නැවතී ඉඳගෙනම පරීක්ෂණ කටයුතු වඩා හොඳින් කරන්න හැකිවේවි'

'මම නං එහෙම හිතන්නේ නෑ' හෝම්ස් පිළිතුරු දුන්නේය.

'මොන පිස්සුද හෝම්ස් මහත්තයා ? හෙට අනිද්දා වෙන කොට බර්ල්ස්ටන් අභිරහස ගැන පත්තරවල පිටු පිරෙන්න

විස්තර තියෙව්. අපරාධය සිද්ධ වෙන්න ඉස්සර වෙලා ඒ ගැන අනාවැකි කියන්න පුළුවන් මිනිහෙක් ලන්ඩනයෙ ඉන්නවා. එහෙකොට මොකක්ද මේකෙ තියෙන අභිරහස ? අපට තියෙන්නේ ඒ මිනිහව අල්ල ගන්න එක විතරයි. ඉතිරි ටික ඉබේම විසඳේවි'

'ඔව්, ඔහුව අල්ලා ගත්තොත් විසඳේවි. ඒත් මය ෂර්ලොක් කියල තමාව හඳුන්වාගන්න මිනිහව අල්ලා ගන්න ඔබ බලාපොරොත්තු වෙන්නෙ කොහොමද ?'

හෝම්ස්ට ලැබුණු ලිපියේ කවරය, මැක්ඩොනල්ඩ් පරීක්ෂා කළේය.

'ලියුම තැපැල් කරල තියෙන්නේ කැම්බර්වෙල් තැපැල් කන්තෝරුවෙන්. ඒකෙන් නම් ඒ තරම් වැඩක් නෑ. නමින් බොරු එකක් කියලා ඔබ කිව්වා. ඇයි ඔහුට මුදල් යැව්වා කීව නේද?'

'දෙපාරක්'

'කොහොමද යැව්වෙ ?'

'කවරයක දැම්මු මුදල් නෝට්ටු, කැම්බර්වෙල් තැපැල් කන්තෝරුව භාරයේ'

'ඔබ කිසිත් හොයල බැලුවෙ නැද්ද තැපැල් කන්තෝරුවෙන්, ඇවිත් ඒව අරගෙන ගියේ කවුද කියල ?'

'නෑ.'

'ඇයි හෙව්වෙ නැත්තේ ?' පොලිස් නිලධාරයා ඇසුවේ මහත් පුදුමයෙනි.

'ඒ මොකද ඔහු මා ගැන තබපු විශ්වාසය කඩකරන්න මං කැමති නැති නිසා. මේ විදියට ආරංචි දෙන්න පුළුවන් බව ඔහු මට මුලින්ම දැනුම් දුන් වෙලේ, මං පොරොන්දුවක් වුණා. ඒ, ඔහු කවුද, ඉන්නේ කොහේද ආදී වංශය හොයන්න මං උත්සාහ නොකරන බව.'

'ඔබ හිතන්නේ ඔහු පිටිපස්සෙන් කවුරු හරි රැළවනවා කියලද ?'

'මං දන්නවා කෙනෙක් ඉන්නා බව'

'ඔබ මේ සඳහන් කළ මහාචාර්ය වරයා ?'

'හරියටම හරි !'

මඳ සිනාවක් පෑ මැක්ඩොනල්ඩ් මා දෙස බලා ඇසක් ඉඟි කළේය.

'ඔබට මේ කාරණාව ගැන හංගන්න හිත නෑ හෝම්ස් මහත්තයා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අපි කවුරුත් කතා වෙන දෙයක් තමයි, හෝම්ස් මහත්තයාට මේ මහාචාර්යතුමාව රුස්සන්නේ නෑ කියන එක. මං පෞද්ගලිකවම ඔහු ගැන කාරණා හොයලා බැලුවා. ඔහු ඉතාම උගත්, දක්ෂ, ඒ වගේම වැදගත් මහත්මයෙක්'

'ඔහුගේ දක්ෂකම් හඳුනා ගැනීමට ඔබට හැකිවීම ගැන මට සන්තෝෂයි'

'ඔබේ මේ චෝදනා ඇහුවට පස්සෙ, මං මහාචාර්යතුමාව හමුවෙන්න ගියා. සූර්යග්‍රහණ ගැන මං ඔහුත් එක්ක කථාවක් පටන් ගත්තා. ඔහු ලන්තෑරුමක් සහ ලෝක ගෝලයක් අරගෙන, සූර්යග්‍රහණය ඇතිවෙන පිළිවෙළ මට හොඳට තේරුම් කරලා දුන්නා. ඔහු ඒ පිළිබඳ පොතක් පවා මට දුන්නා. ඔහුගේ පැසුණු හිස, උදාර කථා විලාසය, දක්ෂකම් මට දැනුණේ ඔහු දේවස්ථානයක පූජකතුමෙක් වගේ. අපි සමුගන්න වෙලාවේ ඔහු මගේ උරහිසට අත තියද්දී මට දැනුණේ මේ කුරිරු, විෂම ලෝකයට මුහුණ දෙන්න හදන පුතෙකුට ආදරණීය පියෙක් ආශිර්වාද කරනවා වගෙයි'

'ශ්‍රේෂ්ඨයි ! හරිම ශ්‍රේෂ්ඨයි !' හෝම්ස් තම දෑත් පිරිමදිමින් සිනාසුණේය.

'ඉතින් කියන්න මිත්‍රයා, මේ සම්පූර්ණ සාකච්ඡාව පැවැත්වුණේ මහාචාර්යතුමාගේ කාර්යාලයේදීද ?'

'ඔව්'

'හරිම අලංකාර කාමරයක්. නැද්ද ?'

'හරිම අලංකාරයි හෝම්ස් මහත්තයා'

'ඔබ වාඩිවෙලා හිටියේ ඔහුගේ ලියන මේසය ඉදිරිපිට ?'

'ඔව්'

' එතකොට හරි මුහුණට හිරු එළිය වැටිලා. ඔහුගේ මුහුණ තිබුණේ අඳුරේ ?'

'ඒ වෙලාවේ හුඟක් හවස්වෙලා. මට මතකයි අර ලත්කැරුම් එළිය මගේ මුහුණට වැටිල තිබුණා'

'ඔබ දැක්කද මහාචාර්යතුමාගේ හිසට ඉහළින් බිත්තියේ එල්ලා තිබුණු සිතුවම ?'

'මට ඒ හැටි දේවල් මගහැරෙන්නේ නෑ හෝම්ස් මහත්තයා. මං ඒව ඉගෙන ගත්තේ නම් ඔයාගෙන් වෙන්න පුළුවනි. අර තරුණියක් හිස පැත්තකට ඇල කරගෙන, එක් අතක් හිසේ තබාගෙන, අප දිහා කොරහින් බලන ඉරියව්වෙන් ඉන්නා හැටි දැක්වෙන සිතුවම නේද?'

'ඔව්. ඒක ෂෝන් බැප්ටිස් ග්‍රූස්ගේ තෙල් සායම් සිතුවමක්. ඔහු 1750 සිට 1800 කාලයේ ඉතා ඉහළින් වැජඹුණු ප්‍රංශ චිත්‍ර ශිල්පියෙක්. ඔහුගේ චිත්‍ර පිළිබඳව.....'

පොලිස් නිලධාරියාගේ දෙබැම ඉහළට එසවිණි.

' අපි මාතෘකාවට බැස්සොත්.........'

'ආ, ඒකට තමයි මං මේ එන්නේ. මං කියන මේ හැම දෙයක්ම ඔබ අර කිව් බර්ල්ස්ටන් අභිරහසට සම්බන්ධයි. හැම

අංශයකම දැනුම රහස් පරීක්ෂකයන්ට ප්‍රයෝජනවත් වෙනවා.

1865 දී පෝටාලිස්ති පැවැත්වුණු චිත්‍ර ප්‍රදර්ශනයේදී ජෝන් බැප්ටිස් ග්රූස්ගෙ සිතුවමක් ෆ්‍රෑන්ක් මිලියන දෙදහකට අලෙවි වුණා. ඒක රත්පවුම් හතලිස්දහසකට වැඩි මුදලක්.

මං ඔබට මතක් කර දෙන්න ඕන මහාචාර්ය මොරියාටිගෙ වැටුප අවුරුද්දකට පවුම් හත්සියයක් පමණ බව.'

'ඉතිං කොහොමද ඔහු මේ චිත්‍රය මිලට ගත්තේ ?'

'අන්න හරි ! කොහොමද ඔහු මිලට ගත්තේ ?'

'ඒක බොහොම වැදගත් කාරුණක්. ඉතින් දිගටම විස්තර කියාගෙන යන්න හෝම්ස් මහත්තයා. මං බොහොම ආශාවෙන් අහගෙන ඉන්නෙ.'

හෝම්ස් සිනාසුණේය. ඇලැවිතම් තමාට අගය කිරීම ගැන ඔහු සතුටට පත්විය.

'එතකොට බර්ල්ස්ටන් අභිරහසට මොකද වෙන්නේ ?'

'අපට හරි වෙලා තියෙනවා' මැක්ඩොනල්ඩ් පැවසුවේ තම ඔරලෝසුව පරීක්ෂාකර බලමිනි.

'වික්ටෝරියා දුම්රිය පොළට අපට මිනිත්තු විස්සෙන් යන්න පුළුවන්. අපි කතා කර කර හිටියේ මේ චිත්‍රය ගැන. හෝම්ස් මහත්තයා, මට මතකයි ඔබ එක දවසක් කිව්වා, ඔබට කවදාවත් මහාචාර්ය මොරියාටි හමුවෙලා නැහැ කියලා.'

'ඇත්තෙන්ම කිසිම දවසක හමුවෙලා නැහැ'

'එතකොට ඔබ කොහොමද ඔහුගේ කාර්යාලයේ ඇතුළත ගැන දන්නේ ?'

'ඒක වෙනම කාරණයක්. මං ඔහුගෙ කාර්යාලයට තුන් වරක් ගිහි- තියෙනවා. දෙවරක්ම ගියේ ඔහු එහේ නැතිවෙලාවල.

ඔහු කම්මුවෙන්න යන මුවාවෙන්. ගිනි එතැන රැඳී ඉඳල, ඔහු ආපහු එන්න කලිං පිටවෙලා ආවා. එක සැරයක්.... මං කොහොමද මේව පොලිස් නිලධරයෙක් එක්ක කියන්නේ. ඒ අන්තිම වරට ගිය සැරේ තමයි මට ඔහුගේ ලියකියවිලි ඔක්කොම අවුස්සල බලන්න පුළුවන් වුණේ.

'ඔහු යම්කට පැටලෙන කාරණා මොනව හරි ඔබට දකින්න ලැබෙන්න ඇති ?'

'කිසිම දෙයක් නෑ. අන්න ඒකනේ තමා මං පුදුමයට පත්වුණේ. ඔහු කොහොමද මේ තරම් ධනවතෙක් උණේ? මොරියාටි අවිවාහකයි. ඔහුගේ මල්ලි බටහිර එංගලන්තයේ දුම්රිය පොළක දුම්රිය ස්ථානාධිපති වරයෙක්. මහාචාර්ය හැටියට මොරියාටිට ලැබෙන්නේ අවුරුද්දකට පවුම් හත්සියයයි. ඒ වුණත් ග්‍රූස්ගේ තෙල් සායම් සිතුවමක් ඔහුට අයිතියි ?'

'ඉතිං මොකක්ද ඔබ අදහස් කරන්නේ ?'

'නිගමනය මොකොකම් සරලයි, පහසුයි.'

'ඔබ කියන්නේ ඔහු නීති විරෝධී ආකාරයට විශාල ධනයක් උපයනවා කියලද ?'

'ඇත්තෙන්ම ඔව්. මේක විතරක් නෙමෙයි. තව කාරණා රාශියක් මට දැනගන්න ලැබිලා තියෙනවා. ඒ හැම එකකම මුල හොයලා බැලුවොත්, ඒ ඔක්කොම කේන්ද්‍ර වෙන්නෙ එක තැනකට. විෂ සහිත සත්තවයා දැගවිලා ඉන්නෙ අන්න එතැනයි. මං මේ ග්‍රූස් සිතුවම ගැන පණිකක් සඳහන් කළේ ඒක ඔබට පැහැදිලිව තේරුම් ගන්න පුළුවන් එකක් නිසයි.'

'මං පිළිගන්නවා හෝම්ස් මහත්තයා, ඔබ කියන කතාව ඉතාම සිත් ඇදගන්න සුළුයි. නැත්නම් මහා පුදුමාකාරයි කිව්වොත් වඩාත් නිවැරදියි. ඒ වුණත් තව ටිකක් පැහැදිලි කරන්න. කොහෙන්ද මේ සල්ලි ? හොර සල්ලි අච්චු ගහලද ? ගෙවල් බිඳලද ? කොහොමද?'

'ඔබ කියවලා තියෙනවද ජොනතන් වයිල්ඩ් ගැන ?'

'නම් නෑ. ඒකත් නුරුපුරුදුයි වගේ. නවකතාවක එන චරිතයක් නේද ? මම නවකතාවල එන රහස් පරීක්ෂකයා ගැන මං එච්චර තැකීමක් කරන්නේ නෑ. එයාල මහ පුදුමාකාර විදියට රහස් හොයා ගන්නවා. ඒවා කරන්නේ කොහොමද කියලා කවුරුත් දන්නේ නෑ.'

'ජොනතන් වයිල්ඩ් කියන්නේ රහස් පරීක්ෂකයෙක් නොවෙයි. ඔහු නවකතාවක එන චරිතයකුත් නොවෙයි. ජොනතන් වයිල්ඩ් කියන්නේ 1750 පමණ එංගලන්තයේ හිටි මහා එකේ අපරාධකාරයෙක්.'

'එහෙනං ඉතිං එයාගෙං වැඩක් නෑ. මං කොහොම ප්‍රායෝගික මිනිහෙක්.'

'මැක් මහත්තයා, ප්‍රායෝගික මිනිහෙක් වෙන්න ඕනෙ නම් කළ යුතු වැඩේ මම කියන්නද ? පහුගිය කාලේ සිද්දවුණු අපරාධ ගැන හොඳට කියවන්න. දවසකට පැය දොළහක් ගණිතේ මාස තුනක් තිස්සේ, කාමරයකට වෙලා පෙර අඳුරු දශක අපරාධ ලෝකයේ ඉතිහාසය කියවන්න. හැමදේම චක්‍රයක් වගේ කැරකෙනවා, මහාචාර්ය මොරියාටි එහෙමයි.

ජොනතන් වයිල්ඩ් තමා ඒ කාලෙ ලන්ඩනයේ පාතාල ලෝකයේ මොළකාරයා. අනිත් අය වෙනුවෙන් හැම දෙයක්ම සැලසුම් කළේ එයා. හැබැයි මංකොල්ල කාපු හෝ හොරකම් කළ මුදලෙන් සියයට පහළොවක් එයාට ගෙවන්න ඕන, කොමිස් එක විදියට. අතීත හැම දෙයක්ම වගේ අපරාධත් චක්‍රයක් වගේ කැරකි කැරකී යළි එනවා. මේ හැම දෙයක්ම මීට ඉස්සර සිද්ධවෙලා තියෙනවා. ඉස්සරහටත් සිද්ධවේවි. ඔබ අහන්න ආසනම් මං මොරියාටි ගැන තවත් කාරණා එකක් හෝ දෙකක් ඔබට කියන්නම්.'

'ඇත්තෙන්ම හෝම්ස් මහත්මයා ඔබේ කතා වලින් දැනටමත් මං වශීවෙලයි ඉන්නේ.'

'මං දන්නවා මොරියාටිගේ දම්වැලේ පළමුවැනි පුරුක කවුද කියලා. මේ දම්වැලේ එක් කෙළවරක නැපෝලියන් අධිරාජයා වගේ වැජඹෙන්නෙ මොරියාටි. ඔහුගේ දකුණු අත වගේ ඉන්නේ කර්නල් සෙබස්ටියන් මොරාන්. ඔහු ඉන්නේ නීතියට කිට්ටු කරන්න බැරි තරම් ඉහළින්. මේ දම්වැලේ පහළින් තමයි පික්පොකට් කාරයන්, ඩංවනිකයන්, මිනීමරුවන් වැනි අය ඉන්නේ. ඔබ දන්නවද මොරියාටි, කර්නල් මොරාන්ට ගෙවන පඩිය කොච්චරද කියලා ?'

'මං කැමතියි දැනගන්න.'

'අවුරුද්දකට රත්පවුම් හයදහසක්. ඒ ගෙවන්නේ මොරාන්ගේ දක්ෂකමට, සූක්ෂම උපාය ඥානයට. ඒ තමයි ඇමෙරිකන් කාර්යින්ගේ ව්‍යාපාර මූලධර්මය. මේක මට දැනගන්න ලැබුණේ අහම්බෙන් වගේ. මේ පඩිය එංගලන්තෙ අගමැතිට ලැබෙන පඩියටත් වැඩියි. ඒකෙන් ඔබට හිතාගන්න පුළුවන් නේද මොරියාටිගෙ ආදායම කොයිතරම් විශාල එකක්ද කියලා. තවත් එකක්. මේ ළඟකදී මං සොඳිසි කරල බැලුවා මොරියාටි ඔහුගේ මුදල් ගෙවීම් කරන චෙක්පත් ගැන – මේ ගෙදර දොර සාමාන්‍ය වියදම් සඳහා පුංචි පුංචි ගෙවීම් කරන චෙක්පත්. ඔබ දන්නවාද ඔහුගේ ගිණුම් තියෙනවා බැංකු හයක. ඒකෙන් මොකවද ඔබට හිතාගන්න පුළුවන් ?'

'ඒක හරි අස්වාභාවික තමා. තමුන් මොකක්ද ඔබ ඒකෙන් සොයාගත්තේ ?'

'ඔහු සතු ධනස්කන්ධය ගැන කිසි කෙනෙකුට දැනගන්නට ඉඩ නොතැබීම තමයි ඒකේ අරමුණ. තනි මිනිහෙකුට දැනගන්න පුළුවන් වෙන්නේ ඔහුගේ එක් ගිණුමක තියෙන මුදල ගැන පමණයි. මට කිසිම සැකයක් නෑ, ඔහුට බැංකු විස්සක විතර ගිණුම් තියෙනවා. ඔහුගේ ධනස්කන්ධයෙන් වැඩිකොටස තියෙන්නේ පිටරට, ජර්මනියේ ඩොයිෂ් බැංකුවේ, නැත්නම් ප්‍රංශයේ ක්‍රෙඩිට් ලියොන් බැංකුවේ. මං ඔබට හොඳ අවවාදයක් දෙන්නම්. අවුරුද්දක දෙකක නිවාඩුවක් ගන්න පුළුවන් නම් කළ යුතු හොඳ

වැඩිස් තියෙනවා. මහාචාර්ය මොරියාට්ටි අධ්‍යයනය කරන්න.'

හෝම්ස්ගේ කථාන්තරයෙන් පොලිස් පරීක්ෂක වරයා කොයිතරම් වශී වී සිටියාද කිවහොත්, ඔහු මෙහි පැමිණි ප්‍රධාන කරුණ අමතක වෙමින් තිබිණ.

'මොරියාට් මහේ හිටියාවේ. ඔබතුමාගෙ මේ කතාන්තර වලින් අපි වෙනත් පැත්තකට හැරුණා නොවැ. දැන් වැදගත් වෙන්නේ මහාචාර්යතුමාත් මේ අපරාධයත් අතර මොකක් හරි සම්බන්ධයක් තියෙනවාද කියන කරුණයි. ඒක සොයා ගැනීමට අපට ගත හැකි ඉදිරි පියවරක් නැද්ද ?'

'මේ මිනීමැරුමේ අරමුණ මොකක්ද කියලා අපට සොයා ගැනීමට හැකි විය යුතුයි. තමුන් මට මුලින් කිව් කාරණා වල හැටියට මේක හේතුවක් හොයාගන්න බැරි අපරාධයක්. මට හිතාගන්න පුළුවන් හේතු දෙකක් තියෙනවා. මොරියාට් ඔහුගේ පාතාල ලෝකයේ දැඩි පාලනයක් ගෙන යන කෙනෙක්. වැරදිකාරයින්ට ඔහු දෙන්නෙ එකම දඬුවමයි.ඒ තමා මරණ දඬුවම. අපට හිතන්න පුළුවන් මේ ඩග්ලස් ඔහුගේ ප්‍රධානියාට විරුද්ධව යම් පාවාදීමක් කළා කියලා. ඒකයි ඔවුන්ගේ කල්ලියේ තවත් කෙනෙකුට ඩග්ලස්ට අත්වෙන්න යන ඉරණම ගැන ඉව වැටුණේ. අනිත් අයටත් ආදර්ශයක් වෙන විදියට ඩග්ලස්ට දඬුවම් දුන්නා. අන්න ඒකයි පළමුවෙනි එක.'

'එතකොට දෙවැන්න ?'

'මොරියාට්ගෙ සාමාන්‍ය ක්‍රියා පටිපාටියේ උවමනාවක් නිසා ඩග්ලස්ව මරා දමන්න ඇති. මං කොල්ලකෑමක් සිදුවෙලා තියෙනවද ?'

'ඒ බවක් අහන්න ලැබුණේ නම් නෑ.'

'කොහොම වුණත් මේකට විසඳුම හොයාගන්න බර්ල්ස්ටන් වලට යා යුතුයි. මොරියාට්ට මං හොඳට අඳුනනව මැක් මහත්තයා. මේ මිනීමැරුමට ඔහුව ගැටෙන කිසිම දෙයක් අපට එතෙන් සොයාගන්න ලැබෙන්නේ නම් නෑ.'

'එහෙනං ! අපි වහාම පිටත්වෙමු, බර්ල්ස්ටන් වලට'

මැක්ඩොනල්ඩ් පැවසුවේ හුනස්සෙන් නැගී සිටිමිනි.

'දෙයියෝ සාක්ෂි ! මං හිතුවට වඩා ප්‍රමාද වෙලා. මහත්වරුනි, කමුන්නාන්සේලාට සූදානම් වෙන්න, මං දෙන්නම් මිනිත්තු පහක්. එච්චරයි.'

'අපි දෙන්නාට ඒක වැඩිත් එක්ක ඇති' පැවසූ හෝම්ස් ඇඳුම් මාරු කිරීමට පටන් ගත්තේය.

'මැක් මහත්මයා, එහේ යන අතරේ මේ සිද්ධිය ගැන ඔබ දන්න සියලුම දේ අපි අහමු'

ඔහු දන්නා සියලුම දේ ඉතාම ස්වල්පයක් බව අපට දැනගන්නට ලැබිණ.

'උදේ පාන්දරින් සසෙක්ස් වලින් එන කිරි ප්‍රවාහණය කරන දුම්රියෙන් මට කෙටි ලියුම් කෑල්ලක් ලැබුණා. එහේ රහස් පරීක්ෂණ අංශයේ ප්‍රධාන නිලධාරියා, වයිට් මේසන්. මිනිහ මගේ පෞද්ගලික මිත්‍රයෙක්. ඔයාහාම ඉන්න. මං කියවන්නම් ඔහුගෙ ලියමන:

'හිතවත් මැක්ඩොනල්ඩ්,

මේ පරීක්ෂණය සඳහා ස්කොට්ලන්ඩ්යාඩ් රහස් පොලීසිය කැඳවීමේ රාජකාරී ලියුම වෙනත් කවරයක ඇත. මේක ඔබේ පෞද්ගලික අවධානයට. ඔබට බර්ල්ස්ටන් කරා ඒමට හැකි මොන දුම්රියේ දැයි වහාම විදුලි පණිවුඩයකින් දන්වන්න. මං එන්නම් ඔබව හමුවෙන්න දුම්රිය පොළට. මේක නම් විසඳීමට අන්තිම අමාරු මහා ගැටළුවක්. මොහොතක් හෝ පමා වෙන්න එපා.

ඔබට හෝම්ස් මහත්මයාද කැඳවා ගෙන ආ හැකිනම් වඩාත් හොඳයි. ඔහුටම විශේෂ වූ ක්‍රම වලට මොකක් හරි හොයා ගනීවි. මෙතන ඇත්තටම මළ මිනියක් නොතිබුණා නම්, මිනෑම

කොහෙතුට තියෙන්නේ, මේක නාට්‍යයක ජවනිකාවක් රඟ දැක්වීමට සූදානම් කළ පසුතලයක් කියලයි. විසඳන්න අන්තිම අමාරු මහා ගැටළුවක්."

"මගේ මිත්‍රයා නම් හොඳ බුද්ධිමතෙක් වගෙයි." හෝම්ස් කීය.

"ඔව් මහත්තයා. මං දන්න තරමින් වයිට් මේසන් බොහොම නැණවත් කෙනෙක්."

"ඩග්ලස් මහතා කුරිරු අන්දමට මරා දමා ඇති බව ඔබ කොහොමද දැනගත්තෙ ?"

"ඒ බව තිබුණා මේසන්ගෙ තිල වාර්තාවෙ. 'කුරිරු' කියලම ඒකෙ සඳහන් වෙලා තිබුණේ නෑ. ඒක රාජකාරියේදී පාවිච්චි කරන වචනයක් නොවෙයි. නම ජෝන් ඩග්ලස් බවත්, පසරෝම් තුවක්කු වෙඩි පහරකින් හිසට සිදුවූ තුවාල මගින් මිය ගොස් ඇති බවත් කියා තිබුණා. වෙලේ මධ්‍යම රාත්‍රියට කිට්ටුවලු සිදුවෙලා තියෙන්නේ. එය මිනීමැරුමක් බවට සැකයක් නැති බවත්, තවමත් කිසිවෙකු අත්අඩංගුවට ගෙන නැති බවත් සඳහන් වෙලා තිබුණා. එපමණයි."

"එහෙම නම් අපි ඒක එහෙමම තියෙන්න අරිමු මැක් මහත්තයා. ප්‍රමාණවත් තරම් දත්ත නොමැතිව නිර්ණයක් ගැනීමට යාම අපේ වෘත්තියේ හැටියට හානිකරයි. දැනට නම් මට පැහැදිලිව පෙනෙන කාරණා දෙකක් තියෙනවා. එකක් ලන්ඩනයේ සිටින අති දක්ෂ මොළ කාරයෙක්. අනෙක සසෙක්ස්හි මළ මිනියක්. මේ දෙක සම්බන්ධ කරන දම්වැලයි අපට හොයාගන්න තියෙන්නෙ."

# 3

# බර්ල්ස්ටන්හි ඛේද වාචකය

සසෙක්ස් ප්‍රාන්තයේ උතුරු කෙළවරේ පිහිටි බර්ල්ස්ටන්, කුඩා ගම්මානයකි. එය ශතවර්ෂ ගණනක් තිස්සේ නොවෙනස්ව පැවැති ගමකි. එහි වැඩිපුරම දක්නට ලැබුණේ අඩක් දැව වලින් නිමකළ කුඩා නිවාසයි. එහෙත් ප්‍රදේශයේ ඇති ස්වභාවික සෞන්දර්යය නිසා, මෑතක සිට ධනවතුන්ද බර්ල්ස්ටන් කරා ඇදී ඒමට පටන්ගෙන ඇත. ගම වටා පිහිටා ඇති කැලෑව එළිපෙහෙළි කොට මෙහි නිවාස ඉදිකිරීමට පටන් ගෙන ඇති බැව් පෙනේ.

මෙම වනගත පෙදෙස මහා විල්ඩ් වනාන්තරයේ එක් කෙළවරක් බව ප්‍රදේශ වාසීන්ගේ මතයයි. වැඩිවෙන ජනගහනයේ අවශ්‍යතා පිරිමැසීම සඳහා කුඩා කඩ සාප්පු කිහිපයක් ගමේ විවෘත වී ඇත. එහෙත් බර්ල්ස්ටන්, තවමත් පාළු, විශාල භූමි ප්‍රදේශයක් මධ්‍යයේ පිහිටි කුඩා ගම්මානයකි. කිට්ටුවම ඇති ප්‍රධාන නගරය ටන්බ්‍රිජ් වෙල්ස් නගරයයි. එය සැතපුම් දහයක් දොළහක් ඈතින් කෙන්ට් ප්‍රාන්ත සීමාව තුළ පිහිටා ඇත.

කඩමණ්ඩියට සැතපුම් භාගයක් පමණ ඈතින් පිහිටි විශාල වනෝද්‍යානයකි. එය මැද, පෞරාණික ගොඩනැගිල්ලක් වූ බර්ල්ස්ටන් මන්දිරය පිහිටා ඇත. රතු රජතුමා විසින් හියුගෝ ද කැපස්ට ප්‍රදානය කරන ලද මේ භූමි භාගයේ මැද, ඔහු විසින් කළු ගල් යොදා කුඩා බලකොටුවක් ඉදිකරන ලදී. එය 1543 දී ගින්නෙන් විනාශයට පත් විය. පසුව, එනම් ජැකොබියන් යුගයේදී මුල් ගොඩනැගිල්ලේ නටබුන් මත විශාල මන්දිරයක් ගඩොලෙන් ගොඩ නැංවිණ.

බර්ල්ස්ටන් මන්දිරය තවමත් ඇත්තේ 17 වැනි සියවසේ තැනූ ආකාරයටමයි. පුරාණ යුද්ධ වලදී මන්දිරයේ ආරක්ෂාවට එය වටා දිය අගල් දෙකක් සාදා තිබිණ. මෑත කාලයේදී, පිටදිය අගල වියළීයාමට ඉඩහැර, එහි පස් පුරවා, මුළුතැන් ගෙය දෙසින් ගෙවත්තක් ලෙස, සකස්කොට ඇත. එහෙත් ඇතුළත දිය අගල තවමත් පෙර පරිදිම මැදුර වටා පිහිටා ඇත. පළලින් අඩි

හතළිහක් පමණ වූ එහි, ගැඹුර අඩි කිහිපයකට වැඩි නොවීය. විනෝද්‍යානයේ ඉහළ සිට ගලා ආ කුඩා දිය පහරකින් එයට ජලය ලැබුණු අතර, තවත් පසෙකින් ජලය බැස යාමට සකසා තිබිණි. ජලයේ බොර, නොපැහැදිලි ගතියක් තිබුණත්, එක තැන නොරැඳීම නිසා කිසි විටෙකත් ජලය පල්වන ස්වභාවයක් නොවීය. මන්දිරයේ පහළ තට්ටුවේ ජනේල පිහිටියේ ජල මට්ටමට අඩියක් පමණ ඉහළිනි.

මන්දිරයට ඇතුළුවීම සඳහා තිබූ එකම මාර්ගය වූයේ දිය අගල හරහා පහත් කළ හැකි පාලම පමණකි. මන්දිරය දෙසින් බිමට සවිකොට තිබූ පාලම, යකඩ දම්වැල් හා දඹරයක් මගින් ක්‍රියා කරවන ලදී. දිය අගල හරහා ගමන් කිරීමට අවශ්‍ය අවස්ථා වලදී පහත් කර තැබීමටද, අනවශ්‍ය අවස්ථා වලදී ඔසවා තැබීමටද මේ මගින් හැකි විය. ඇත්ත වශයෙන්ම සෑම දිනයකම හැන්දෑවේ පාලම ඉහළට ඔසවා මන්දිරයට ඇතුළුවීම අවහිර කරන ලදී. මේ හේතුව නිසා බර්ල්ස්ටන් මන්දිරය රාත්‍රී කාලයේදී දූපතක් බවට පත්විය. මෙහි ඇතිවූ අබිරහස සම්බන්ධයෙන්ද ඒ කරුණ ඉතා වැදගත් වෙයි.

මෙම පැරණි මන්දිරයේ අවුරුදු ගණනාවක් තිස්සේ කිසිවකු වාසය නොකළ අතර, එය ක්‍රම ක්‍රමයෙන් දිරාපත්වී විනාශ මුඛයට ඇද වැටෙමින් පැවතිණි. ඩග්ලස් යුවළ විසින් එය මිළදී ගෙන ඇත්තේ මේ කාලයේදීය. මේ පවුලට අයත් වූයේ ජෝන් ඩග්ලස් මහතා සහ ඔහුගේ බිරිඳ පමණකි. චරිත ස්වභාවයෙන් මෙන්ම පෙනුමෙන්ද ඩග්ලස් අපූර්ව මිනිසෙකු විය. අවුරුදු පනහක් පමණ වයස් වූ ඔහු, ශක්තිමත් ක්‍රියාශීලී මිනිසෙකු විය. ඔහුගේ උඩු රැවුල ක්‍රමයෙන් සුදු වීමට පටන්ගෙන තිබිණි. කවුරුන් කෙරෙහිත් ඔහු දැක්වූයේ ප්‍රීතිමත් ප්‍රසන්න ආකල්පයකි. එහෙත් කලක් විදේශ රටක ජීවත්වීමෙන්දෝ ඔහුගේ සිරිත් විරිත් වලද තරමක අපූර්ව ස්වභාවයක් දක්නට ලැබිණ.

බර්ල්ස්ටන්හි පදිංචියට පැමිණි සුළු කාලයකින්ම ඔහු ගමේ කවුරුත් අතරත් ජනප්‍රියත්වයට පත්විය. ගමේ ඕනෑම කටයුත්තක්

සඳහා ඔහු නොමසුරුව මුදල් පරිත්‍යාග කළේය. ගම්වාසීන්ගේ විවිධ පුස-ග හා නොයෙකුත් උත්සව වලට සහභාගි වීමටද ඔහු අමතක නොකළේය. ගැඹුරු කටහඬක් මෙන්ම ගී ගැයීමට හැකියාවක්ද ඩග්ලස් මහතා සතු විය. ඔහු අකමිට සරු පුද්ගලයෙක් බව පෙනෙන්නට තිබිණි. කැලිෆෝනියාවේ රන් ආකරවල සේවය කිරීමෙන් ඔහු මුදල් උපයාගත් බව සතු දත් අය පැවසූහ. ඔහුගේත් බිරිඳගේත් කතා බහෙන් පැහැදිලි වූයේ ඩග්ලස් මහතා කලක් ඇමරිකාවේ ජීවත්වී ඇති බවයි.

ඩග්ලස්ගේ බිරිඳ, ආශ්‍රය කළ සුළු පිරිස අතර ජනප්‍රිය කැනැත්තියක් වූවාය. තරමක් ලැජ්ජාශීලී කාන්තාවක වූ ඇය ගෙදර දොර වැඩ කටයුතු සඳහාත් ස්වාමිපුරුෂයා වෙනුවෙනුත් වැඩි කාලයක් ගත කළ බව අසන්නට ලැබිණ. කලින් විවාහ වී සිටි බිරිඳගේ මරණයෙන් පසුව ජෝන් ඩග්ලස් මහතා කලක් ලන්ඩනයේ ජීවත්වී ඇත. වර්තමාන ඩග්ලස් මහත්මිය ඔහුට හමු වී ඇත්තේ එහිදීයි - ඉංග්‍රීසි ජාතික තරුණ කාන්තාවක වූ ඇය සෞඛ්‍ය සම්පන්න එකියක වූවාය. වයසින් ඇය ස්වාමිපුරුෂයාට වඩා අවුරුදු විස්සකින් පමණ ලාබාල විය. එහෙත් ඔවුන් සතුටින් ජීවත් වූ යුවලක් බව පෙනෙන්නට තිබිණි.

කෙසේ වෙතත් ඔවුන් හොඳින් දැනහැඳින සිටි සමහරු වෙනස් මතයක් දැරූහ. ඔවුන්ගේ අදහස වූයේ දෙදෙනා අතර අන්‍යොන්‍ය විශ්වාසය එතරම් සතුටුදායක නොවූ බවයි. සිය ස්වාමිපුරුෂයා ඇමරිකාවේ ගෙවූ ජීවිතය ගැන කතා කිරීමට ඩග්ලස් මහත්මිය මැලිවූවාය. සමහර විට ඒ ගැන විස්තර ඇයට ස්වාමියා විසින් නොපැවසුවා වන්නටත් ඉඩ ඇත. ඔවුන් ගැන හොඳින් නිරීක්ෂණය කළ අයගේ සිත්වල එක් කරුණක් විශේෂයෙන් සනිටුහන් වී තිබිණි. සමහර අවස්ථාවලදී, එනම් සැමියා ගෙදරින් බැහැර ගොස් ආපසු ඒමට පමා වූ කල, ඩග්ලස් මහත්මිය බලවත් චිත්ත පීඩාවකට පත්වූ වගයි. නිහඬ ගම්බද පරිසරයක මෙවැනි මිපාදන කාගේත් සාකච්ඡාවට ලක්වීම සාමාන්‍ය කරුණකි. බර්ල්ස්ටන් මන්දිරයේ ස්වාමිදූවගේ මෙම හැසිරීම, එහි ඇතිවූ මිනීමැරුම නිසා කාගේත් සිහියට නැඟිණි.

මේ ගෙදර වරින්වර ලැගුම් ගත් තවත් එක් පුද්ගලයෙක් විය. ඒ හැම්ස්ටෙඩ් හි හේල්ස් ලොජ් නිවසේ සිසිල් ජේම්ස් බාකර් මහතායි.

සිසිල් බාකර්, බර්ල්ස්ටන් ගම්මානයේ වීදි වල මෙන්ම, බර්ල්ස්ටන් මන්දිරයේද නිතර දකින්නට ලැබුණු පුද්ගලයෙකි. ඩග්ලස් මහතාගේ අතීතය ගැන දැන සිටි එකම මිතුරා ඔහු විය. ඉංග්‍රීසි ජාතිකයකු වූ බාකර්, ඩග්ලස් මහතා ඇමරිකාවේ ජීවත්වූ කාලයේ සිටම ඔහු සමග මිත්‍ර සම්බන්ධතාම පවත්වා ඇත. සිසිල් බාකර් ධනවතෙකු වූ අතර අවිවාහකයෙකු බවද අසන්නට ලැබිණ.

සිසිල් බාකර්ගේ වයස අවුරුදු හතළිස් පහකට වැඩි නොවීය. මුළුමනින්ම රැවුල මුඩුකොට සිටි ඔහුට තිබුණේ වෘත්තීය බොක්සිං ක්‍රීඩකයකු සතු මුහුණකි. පුළුල් පපුවක් හා පුළුල් උරහිස් සහිත ශක්තිමත් ශරීරයක් තිබූ බාකර්ගේ, කළු සහ ඇහි බැම්ම යටින් පිහිටියේ තියුණු නෙත් පුවළකි. ඔහු දඩයමේ යාමට හෝ අසුපිට යාමට ප්‍රිය කළ බවක් අසන්නට නොලැබිණ. සිසිල් බාකර් දවස ගත කළේ එක්කෝ පයිප්පයක් මුවේ රඳවාගෙන බර්ල්ස්ටන් ගම්මානයේ පාරවල් දිගේ ඇවිදිමිනි. නැතහොත් ජෝන් ඩග්ලස් මහතා සමග හෝ මහත්මිය සමග අශ්ව කරත්තයේ නැඟී බර්ල්ස්ටන් ප්‍රදේශය අවට සොබා දහමේ සිරි නැරඹීමට යාමෙනි.

'ජීවිතය බොහොම සැහැල්ලුවට ගන්නා, නිදහසේ ජීවත්වෙන මහත්මයෙක්. ඒ වුණත් මං දිවුරලා කියන්නම් : ඔහුව කේන්ති ගැස්සුවොත්, විනාසයි' බර්ල්ස්ටන් මන්දිරයේ ප්‍රධාන මෙහෙකරු ඒම්ස්, සිසිල් බාකර් ගැන පැවසූ අදහසයි ඒ.

බාකර් හා ඩග්ලස් අතර පැවැතියේ සමීප මිත්‍රත්වයකි. බාකර් හා ඩග්ලස් මහත්මිය අතර පැවැති මිතුරුකමද ඊට අඩු නොවීය. ඒ මිතුරු කම නිසා ජෝන් ඩග්ලස් මහතා කිහිපවිටක්ම බලවත් ලෙස කෝපයට පත්වී ඇත. මේ බව සේවකයන්ටද රහසක් නොවීය.

මේ පැරණි ගොඩනැගිල්ලේ අනෙක් පදිංචි කරුවන් ස්වල්පයකි. වැදගත් පෙනුමක් ඇති දක්ෂ, කාර්යක්ෂම සේවකයකු වූ ඒම්ස් ප්‍රධාන මෙහෙකරුවා විය. අනෙකා, තරමක් තරබාරු ප්‍රසන්න ස්වභාවයක් ඇති ඇලන් මහත්මියයි. ගෙදර දොර වැඩකටයුතු සඳහා ඇය, ඩග්ලස් මහත්මියට සහාය වූවාය. මෙම නිවසට සම්බන්ධ සේවකයන් තවත් හයදෙනෙකු සිටියත්, ජනවාරි 6 වැනිදා රාත්‍රියේ සිදුවූ ඛේදවාචකයට ඔවුන් සම්බන්ධ නොවේ.

බර්ල්ස්ටන් ගම්මානයට අදාළ පොලිස් ස්ථානය භාර නිලධාරියා සාජන්ට් විල්සන්ය. අනතුර පිළිබඳ පණිවුඩය ඔහු වෙත ලැබුණේ රාත්‍රී එකොළහයි හතළිස්පහටයි.

' මොහොතකට කලින් සීනුව නාද කරන ශබ්දයක් ඇසිල මං ගැස්සුණා. හතිදමමින්, දුවගෙන වගේ ඇවිත් හිටියේ සිසිල් බාකර් මහත්මයා. ඔහු කිව්වා,

' බර්ල්ස්ටන් මන්දිරයේ මහා අපරාධයක් සිද්ධ වෙලා, සාජන්ට්. ජෝන් ඩග්ලස් මහත්තයාව මරා දමලා. ඉක්මනට එන්න'

එහෙම කිව්ව ඔහු ඉක්මනින් ආපහු ගියා. මේ මිනීමැරුම ගැන සසෙක්ස් පොලිස් ස්ථානයට දැනුම් දීල, මමත් සූදානම් වෙලා බර්ල්ස්ටන් මන්දිරය වෙත ගියා. මං එතෙන්ට යනකොට ඒ දොළහ පසුවුණා විතරයි.

එතැනට ළඟාවෙද්දී මං දැක්කා, දිය අගල හරහා දමන පාලම පහත් කරලා ඇති බව. පහන් දල්වලා තිබුණු බව ජනෙල් වීදුරු තුළින් පෙනුණා. මුළු නිවසේම මහත් කලබලයක් හැටි තිබුණා. සුදුමැලි වූ සේවකයින් විසිත්ත කාමරයේ එක් තැනක රැස් වෙලා හිටියා. ඉදිරිපස දොර අසල, ප්‍රධාන මෙහෙකරු ඒම්ස් හිටියේ අප්‍රමාණ භයකින්. තමන්ගේ හැඟීම් පාලනය කරගෙන ගැඹුරු කල්පනාවකින් හිටියේ බාකර් මහත්මයා පමණයි.

සිද්ධිය වූ ස්ථානයට ඔහු මාව කැඳවාගෙන ගියා. ගමේ වෛද්‍යවරයා වන වුඩ් දොස්තර මහත්මයත් එතැනට ආවේ ඒ වෙලාවේ. මිනීමැරුම සිදුවුණු කාමරයට අපි තුන්දෙනා ඇතුළු

වුණේ එකට. ඒමිස් අප පිටිපස්සෙන් ඇවිත් දොර වහල දැම්මා, සේවිකාවන්ට මේ අනතුර නොපෙනෙන විදියට.

සිරුර වැටිල තිබුණේ කාමරය මැද උඩු බැලි අතට. ඔහු වැටී සිටියේ දෑත් දෙපා හතර අතට විහිදුවාගෙන. ඔහුගේ රාත්‍රී ඇඳුමට පිටතින් රෝස පැහැති, ගෙදරට අඳින ලිහිල් කබායක් ඇඳ සිටියා. ඔහුගේ දෙපා වල සෙරෙප්පු කුට්ටමක් තිබුණා. මේසය උඩ තිබුණු ලාම්පුව අරගෙන, ජෝන් ඩග්ලස් අසලින් දණගසාගත් දොස්තර වුඩ් සිරුර පරීක්ෂා කර බැලුවා. ඔහු මියගිහින් බව දොස්තර මහත්තයාට බැලූ බැල්මට තේරෙන්න ඇති. ඩග්ලස්ට බොහොම දරුණු විදියට තුවාල සිදුවී තිබුණා. ආයුධය ඔහුගේ පපුව හරහා වැටී තිබුණා.

ඒක හරි පුදුමාකාර ආයුධයක්. කොකා ගස්සන තැනට අඩියක් පමණ ඉදිරියෙන් තුවක්කු බටය කියතකින් කපා දමා තිබුණා. එය පතරොම් තුවක්කුවක්. වෙඩිල්ල වැදී තිබුණේ මුහුණට ඉතාම කිට්ටුවෙන් බව පැහැදිලියි. ඒ මොකද වෙඩි පහරෙන් මුහුණ හා හිස්කබල සුනු විසුණු වී ගොස් තිබුණා. කාණු දෙකෙන්ම එකම පැරේට වෙඩි දෙකක් පත්තු වී, දරුණු විනාශයක් වෙන ආකාරයට, කොකා ගස්සන ලීවර දෙකම කම්බි වලින් එකට බැඳ ඇති බව දකින්නට ලැබුණා.

මේ සිද්ධියේ බරපතලකම හා විශාල වගකීම නිසා මේක ඉහළ නිලධාරියෙක්ට බාර දිය යුතු එකක් බව මං තේරුම් ගත්තා.'

'සසෙක්ස් පොලීසියේ ලොකු මහත්තුරු එනතුරු අපි කිසි දෙයක් අල්ලන්නේ නැතුව ඉමු' මං කිව්වා.

'මම දන්නවා අපි කිසිදේකට අත තියන්නේ නෑ. ඒ ගැන වගකීම මං භාරගන්නවා. සිද්ධ වෙච්ච හැටියටම තමා ඔය ඔක්කොම තියෙන්නේ ' සිසිල් බාකර් පැවසුවා.

'මේක සිද්ධ වුණේ කීයට විතරද ?'

'හරියටම එකොළහමාර වුණා විතරයි. මං ඇඳුම් මාරුකරන්න

පටන් අරගෙන තිබුණෙවත් නෑ. මං ගිනි උදුන ළඟ වාඩිවෙලා ඉන්න කොට වෙඩි සද්දයක් ඇහුණා. ඒක ඒ තරම්ම උස් හඬින් ඇහුණෙත් නෑ. මං ඉක්මනට පහළට දුවගෙන ආවා. මං හිතන්නේ තත්පර තිහක් ගතවෙන්න නෑ මට මෙතනට එන්න'

'දොර ඇරලද තිබුණෙ ?'

'ඔව් දොර ඇරලයි තිබුණෙ. චාල්ස් අසන් අභිංසකයා. මිය පේන විදියට වැටිල හිටියා. කාමරේ මේසය උඩ ඉටිපන්දම දල්වලා තිබුණා. මිනිත්තු කිහිපයකට පස්සේ මමයි ලාම්පුව පත්තු කළේ.'

'ඔබ දැක්කෙ නැද්ද කවුරුවත් ?'

'නෑ. මට ඇහුණා චාල්ස් නෝනා තරප්පුවේ පහළට දුවගෙන එන සද්දෙ. මං ඉක්මනට ආපහු දිව්වා. මට ඕනෙ වුණා ඈට මේ භයානක දර්ශනය බලන එක වලක්වන්න. ඇලන් මහත්මිය ඇවිත් ඈටව ආපහු එක්ක ගියා. ඒ වෙන කොට ඒමිස් එතැනට ඇවිත්. අපි දෙන්නා අයෙමත් කාමරය ඇතුළට දිව්වා.'

'ඒ වුණත් කොහොමද කවුරුවත් මේ මන්දිරය ඇතුළට ආවේ? මං අහල තියෙනවා දිය අගල හරහා තියෙන පාලම් රට ඉහළට ඔසවනවා කියලා ?'

'ඔව්. ඒක ඉහළට ඔසවලයි තිබුණේ, මං පහත්කරවන තුරු.'

'එහෙම නම් මිනීමරුවා කොහොමද පැනල ගියේ? ඒක වෙන්න බැරි දෙයක් !. චාල්ස් මහත්තය තමන්වම වෙඩි තියාගන්න ඇති ?'

'ඒක තමයි අපිත් මුලින් හිතුවෙ. ඒ වුණත් මේ බලන්න! ජනෙල් තිරය පසෙකට ඇද්ද බාකර් තරමක් විශාල ජනෙල් විවෘතව ඇති හැටි පෙනුවා දුන්නා.

'දැන් බලන්න මෙතන'

ජනෙල් පඩිය මත තැවරුණු ලේ පැල්ලමක් පහන් එළියේ

ආධාරයෙන් මට දක්නට ලැබුණා. එය, ලේ තැවරුණු සපත්තු හෝ පෙරේප්පු පැළඳි පුද්ගලයෙකු ජනෙල් පඩියට නැගීම නිසා සිදුවූවක් බව පැහැදිලියි.

'කවුරු හරි මේතනට නැගලා තියෙනවා. එළියට පැන ගැනීමට.'

' ඔබ කියන්නේ අපරාධකාරයා වතුරට බැහැල අගලෙන් එගොඩ වුණා කියලද ? '

'හරියටම හරි.'

වෙඩි තැබීම සිදුවෙලා තත්පර කිහිපයකින් ඔබ මෙතැනට ආව නම්, ඔය වෙලාවේ ඔහු ඉන්න ඇත්තේ දිය අගලෙ ?'

' මට ඒ ගැන කිසිම සැකයක් නෑ. දෙයියනේ මං ජනේලෙ ළඟට ගිහිං බැලුවෙ නෑනේ. ඒ වුණත් ඔබට පෙනෙනවා ඇති ඇරපු ජනේලය, තිරයෙන් වැසිලා තිබුණෙ. ඒක හින්ද මට ඒක සිහියට ආවෙ නෑ. ඊට පස්සෙ මට ඇහුණා ඩග්ලස් මහත්මිය පහළට බහින අඩි සද්දෙ. මං කොහොමද ඇයට කාමරේට ඇතුළු වෙන්න ඉඩ දෙන්නෙ. මේක ඇයට දරාගන්න නොහැකි තරම් භයානක දර්ශනයක්.'

'භයානක දර්ශනයක් තං තමයි.' වෛද්‍යවරයා පැවසුවේ කැබලි වලට කැඩී ගිය හිසත්, කිසි තැන වීසි වී තිබුණු මස්කැබලි හා ලේ විල දෙස බලමින්.

'බර්ල්ස්ටන් වල කෝච්චි දෙකක් හැප්පුණු වෙලාවේ දැක්කට පස්සෙ, මේ තරම් දරුණු විදියට තුවාලයක් සිදුවෙලා තියෙනවා දැක්කෙ අදයි.'

පොලිස් නිලධාරියාගේ සටහන් පොතේ අඩංගු කරුණු අනුව දැනගැනීමට ලැබුණු විස්තර පහත පළවෙයි.

'ඒ වුණත් මං අහන්නෙ...' පොලිස් සාජන්ට් කතාව පටන් ගත්තේය.

"දිය අගලට බැහැලා, වතුරේ ඇවිද්දගෙන ගිහිං මිනිහා පැනලා ගියා කියමුකෝ. ඒත් පාලම ඉහළට ඔසවලා තිබුණා නං ඔහු කොහොමද ගේ ඇතුළට ආවෙ ?"

"අන්න ඒක තමයි ප්‍රශ්නෙ" බාකර් පිළිතුරු දුන්නේය.

"ඊයෙ හවස පාලම ඉහළට එසෙව්වෙ කීයට විතරද ?"

"හවස හය විතර වුණා" ඒම්ස් පිළිතුරු දුන්නේය.

"මං අහලා තියෙන්නේ ඒක ඔසවන්නෙ හතරහමාරට විතර කියලා ?"

"ඊයේ ඩග්ලස් මහත්මියගෙ හිතවතුන් වගයක් හවස තේ වලට මෙහේ ආවා. තේ පානයෙන් පස්සෙ ඔවුන් පිටවෙලා යනතුරු පාලම ඔසවන්න, මට විදියක් තිබුණේ නෑ. ඔවුන් ගියාට පස්සෙ මමයි දඟරය කරකවල පාලම එසෙව්වෙ"

"එහෙම නං අපට හිතාගන්න තියෙන්නේ මේකයි. පිටකින් කවුරු හරි ආවා නම්, ඔවුන් හැන්දෑවේ හයට කලින් පාලම හරහා ඇවිත්, ගේ ඇතුළෙ හැංගිලා ඉඳලා තියෙනවා; එකොළහට ඩග්ලස් මහත්මයා කාමරයට එනතුරු."

"ඒක වෙන්න පුළුවනි. ඩග්ලස් මහත්තයා හැමදාම රෑට නිදියන්න කලින් ගේ වටේම යනවා. ඒ පහන් ගැන පරීක්ෂා කරල බලන්න. ඒවා ඉවර වෙලා ඔහු මෙතැනට ආවා. ඔහු එනතුරු සැඟවිලා සිටි මිනිහා ඔහුට වෙඩි තිබ්බා. ඊට පස්සෙ තුවක්කුව එතැන දාලා ජනේලයෙන් පැන ගියා. මට හිතෙන හැටියට ඒක සිදුවුණේ ඔය ආකාරයටයි. පෙනෙන්න තියෙන කාරණා වලටත් ඒක ගැළපෙනවා" බාකර් කියා සිටියේය.

මෘත ශරීරය අසල බිම වැටී තිබූ කාඩ්පතක් පොලිස් නිලධාරියා ගේ අවධානයට යොමු විය.

එහි, V.V.341

යනුවෙන් තීන්තෙන් ලියා තිබිණ.

'මේ මොකක්ද ?'

බාකර් ඒ දෙස බැලුවේ මහත් උනන්දුවෙනි.

'මාත් මෙච්චර වෙලා ඒක දැක්කෙ නෑ. මිනිමරුවා දල ගිය එකක් වෙන්න ඇති.'

' ඩී. ඩී 341. මට නං මේකෙන් මොකුත් තීරණගන්න බැහැ. ඩී. ඩී. කියන්නේ කාගෙ හරි නමක මුල අකුරු වෙන්න පුළුවන්. ඔබට මොනවද සොයා ගන්න හැකිවුණේ ඩොක්ටර් මහත්තයා ?'

ගිනි උදුන සමීපයේ කළාලය මත, ලොකු ප්‍රමාණයේ සැහෙන තරම් බර මිටියක් බිම වැටී තිබිණ. සිසිල් බාකර් ඒ අසල තිබූ පිත්තල ඇණ කිහිපයක් දෙසට නිලධාරියාගේ අවධානය යොමු කළේය.

'ඩග්ලස් මහත්තයා ඊයේ බිත්තියේ පින්තූර එල්ලාපු තැන් වෙනස් කළා. මං දැක්කා ඔහු පුටුවක් උඩ නැගලා අර පින්තූරය එල්ලපු හැටි. ඒකයි මිටියක් මෙතනට ආවේ.'

'අපි ඒක තිබුණු තැනට දමු.' පාක්හර්ස් පැවසුවේ සැකයෙනි.

'මේ ප්‍රශ්නය විසඳන්න නම් පොලීසියේ ඉන්න හොඳම මොළකාරයො ටික ඕන වේවි. ලන්ඩන් වලින්ම ඇවිත් මිසක් මේක නං විසඳන්න වෙන්නෙ නෑ.'

පහන අතින් ගෙන නිලධාරියා කාමරය වටේම පරීක්ෂාකර බැලුවේය.

'ආ... මේ මොකක්ද ?' ඔහු ඇසුවේ ජනෙල් තිර එක් පසකට ඇද දමමිනි.

'මේ ජනෙල් රෙදි පහත දැමීමේ හේතුව කියාවද ?'

'ලාම්පු පත්තු කළ වෙලාවේ. ඒ කියන්නේ හවස 4 ට ටිකකට පස්සෙ' ජේම්ස් කීය.

'කවුරු හරි මෙතැන හැංගිලා ඉඳපු බව ඇත්ත.'

කාමරය මුල්ලේ මඩ සහිත සපත්තුවක අඩි සලකුණු වැදී තිබුණු පැටි පහන් එළියෙන් පැහැදිලිව දිස්විය.

'මගේ අදහසට මටත් එකඟවෙන්න සිදුවෙනවා බාකර් මහත්තයා. හැන්දෑවේ හතරට ජනෙල් තිර ඇද්දට පස්සෙ, හවස හයට පාලම ඔසවන්න කලින්, ඒ අතර කාලෙ අපරාධකාරයා මෙතට රිංගාගෙන තිබෙනවා. ඔහුට දකින්න ලැබුණු පළමුවෙනි කාමරය මේක නිසා, එයට ඇතුළු වෙලා හැංගෙන්න ඇති. වෙන හැංගෙන්න සුදුසු තැනක් නැති නිසයි ජනෙල් තිර පිටුපස ඒ සඳහා තෝරා ගන්න ඇත්තෙ. ඒ ටික නම් පැහැදිලියි. ඔහුගේ ප්‍රධාන අරමුණ වෙන්න ඇත්තේ වටිනා දේවල් සොරකම් කරගෙන යෑමයි. එහෙත් බලාපොරොත්තු නොවූ විදියට ඩග්ලස් මහත්තයා හමුවුණු නිසා, ඔහු ඩග්ලස්ව මරා දමල පැන ගියා!'

'මං තේරුම් ගන්නෙත් ඒ විදියට තමා.' බාකර් එකඟ විය.

'ඒ වුණත් මගේ අදහස නම් වටිනා කාලය නේද මේ අපි නාස්ති කරන්නෙ ? මිනිහ මේ පැත්තෙන් පැනලා යන්න ඉස්සරවෙලා තරකද පළාතම සෝදිසි කරලා බැලුවොත් ?'

පාක්නට් මොහොතක් කල්පනා කළේය.

'පාන්දර හයෙන් ඉස්සර වෙලා මෙතෙන් පිටවෙලා යන්න කෝච්චි නෑ. ඒ නිසා ඔහුට ඒ ක්‍රමයට යන්න බෑ. කලිසම් කකුල් වලින් වතුර බේරි බේරි මහපාරේ ඇවිද ගෙන ගියොත් කවුරු හරි ඔහුව දකින්න ඉඩ තියෙනවා.

කොහොම වුණත් තවත් පොලිස් නිලධාරියෙක් ඇවිත් මෙතැන රාජකාරි භාරගන්න තුරු මට මෙතනින් යන්නත් බෑ. ඒ වගේම ඔබ සියලු දෙනාටමත් මෙහෙන් යන්න අවසර නෑ.'

වෛද්‍යාචාර්යා පහන ළං කරගෙන මළ සිරුර තවදුරටත් පරීක්ෂා කළේය.

'මේ ලකුණ මොකක්ද ? අපරාධයත් එක්ක මේකෙ මොකක් හරි සම්බන්ධයක් තියෙන්න පුළුවන්ද ?'

මෘත ශරීරයේ දකුණු අතේ වැලමිටේ සිට ඇඟිලි දක්වාම කොටස විවෘතව තිබිණි. බාහුවේ මැද හරියේ ඇතුළු පැත්තේ තිබුණේ එක් අපූර්ව ලකුණකි. කවයක් මැද පිහිටි ත්‍රිකෝණයක සලකුණක් වූ එය, පුළුමැලි පමණ මහ රුහිරු පැහැයෙන් පිහිටා තිබිණ.

'මේක පච්ච කෙටීමක් නොවෙයි.' වෛද්‍ය වුඩ් පැවසුවේ තම උපැස් යුවළ තුළින් එය තවදුරටත් පරීක්ෂා කරමිනි.

'මං කවදාවත් දැකලා නෑ මෙහෙම දෙයක්. අර හරකුන්ගේ හමේ ගහනව වගේ මේ මිනිස්සයටත් හංවඩු ගහල තියෙනවා. ඒත් ඒක මොන අදහසකින් කරපු එකක්ද ?'

'මොන අදහසකින් කරපු දෙයක්ද කියන්න නං මම දන්නෙ නෑ. ඒත් පහුගිය අවුරුදු දහය තිස්සෙම ඩග්ලස්ගෙ අතේ මේ ලකුණ මම දැකලා තියෙනවා.'

'ඒ වගේම මමත් දැකලා තියෙනවා.'

මෙහෙකරු ඒමිස් කීය.

'මටත් බොහොම වෙලාවල හිතිල තියෙනවා මොකක්ද මේ ලකුණ කියලා.'

'එහෙනම් ඉතින් අපරාධයට ඒකෙ ඇති සම්බන්ධයක් නෑ.' නිලධරයා පැවසීය.

'කොහොම වුණත් මේක අරුම පුදුම දෙයක්. මේ සිද්ධිය සම්බන්ධව නැත්තම් එකසේම අරුම පුදුම දේවල්. ඒ ගමන මොකක්ද?'

ඩග්ලස්ගේ ඉදිරියට දිගුවී තිබුණු අතේ ඇඟිලි ප්‍රදේශය පෙන්වමින් ඒමිස් මහත් විස්මයට පත්වූ හඬින් හැඬීය.

'මහත්තයාගෙ මඟුල් මුද්දත් අරං ගිහිං !'

"මොකක් ?"

"ඇත්තෙන්ම ඔව්. මහත්තයගෙ වම් අතේ සුළැඟිල්ලේ තිය තියෙනව ජෝද රන් කැටියක ලකුණ තියෙන මුද්දක්. ඊට ඉහළින් තිබුණා වාම් මගුල් මුද්දක්. මැදැඟිල්ලේ තිබුණා, දගර වැටුණු සර්පයෙකුගේ හැඩය ගනිපු සර්ප මුද්දක්. රත්කැටි මුද්දත්, සර්ප මුද්දත් තියෙනවා. මගුල් මුද්ද නෑ."

"ටිම්ස්ගේ කතාව ඇත්ත" සිසිල් බෝකර් කීය.

"මම කියන්නේ මගුල් මුද්ද ගනිපු පුද්ගලයා, රත්කැටි මුද්ද තියන එක ගලවලා අරගෙන, ඊට පස්සෙ මගුල් මුද්ද ගලවලා තමන් තියාගෙන, රත්කැටිය ආපහු දාල තියෙනවා ?"

"එක හරි"

හැණවත් පොලිස් නිලධාරියා හිස සැලුවේය.

"මට නං පෙනෙන්නේ පුළුවන් ඉක්මනට මේක, ලන්ඩනයේ උසස් නිලධාරීන්ට භාරදුන්නු තරමට හොඳයි. වයිට් මේසන් මහත්තයා හොඳහැටි දන්නවයෙක්. මේ පළාත් වල සිද්දවෙන අපිරහස් එකක් නිසා මේසන් මහත්තයාට විසඳන්න බැරි වේවා නොමවී. ඒ වුණත් මේ වැඩේට නං මං හිතන්නේ කිසුවක් ලන්ඩනයෙන් ආධාර ගන්න වෙයි වගේ. අපි වගේ මිනිස්සුන්ට නං මේක හොයාගන්නවත් අමාරු වැඩියි. ඒ මට කියන්න මං ලැජ්ජා වෙන්නෙ නෑ."

# 4

## ගනදුර

මර්ල්ස්ටන්හි සාජන්ට් විල්සන්ගෙන් ලැබුණු පණිවුඩය අනුව සසෙක්ස්හි පොලිස් නිලධරයා, පාන්දර තුනට මර්ල්ස්ටන් මන්දිරය වෙත පැමිණියේය. පාන්දර පහයි හතළිහේ දුම්රියෙන් ස්කොට්ලන්ඩ් යාඩ් රහස් පොලිසියට පණිවුඩයක් එවූ නිසා, එය පිළිගැනීමට දහවල් දොළහට මර්ල්ස්ටන් දුම්රිය ස්ථානය වෙත පැමිණ සිටියේය.

උස, මහත ශරීරයකින් හෙබි වයිට් මේසන් පැළඳ සිටියේ ට්වීඩ් රෙද්දෙන් මැසූ, ලිහිල් ඇඳුමකි. ඔහුගේ රතු පැහැති මුහුණෙහි දිස්වූයේ නිහඬ, එමෙන්ම සැහැල්ලු පැවතුම් විලාසයකි. පෙනුමෙන් ඔහු ගම්බද ගොවියෙකු හෝ වෙන යම් රැකියාවක් කළ අයෙකු මෙන් දිස්වුවා මිස, ඔහුට පොලිසියේ අපරාධ පරීක්ෂකයෙකුගේ පෙනුමක් නම් නොවීය.

'මේක නම් අන්තිම අමාරු ගැටලුවක් මැක්ඩොනල්ඩ් මහත්තයා' වයිට් මේසන් නැවත නැවතත් කීවේය.

'ඒක දැනගත්ත හැටියෙම මැස්සො එනවා වගේ පත්තර කාරයො මෙතැනට එක වැටෙයි. උන් ඇවිල්ල හොස්ස දාන්න ඉස්සර වෙලා අපේ රාජකාරි ඒක ඉවර කරගන්නයි මං බලාපොරොත්තු වෙන්නෙ. නැත්නං ඒ කොල්ලො එහේ මෙහේ දුව පනින්න ගත්තාම හෝඩුවාවල් ඔක්කොම අවුල් වෙනවා. මට මතක ඇති කාලෙක මේ වගේ දෙයක් දකින්න ලැබුණේ නෑ. මේකෙ සමහර දේවල් ඔබට නම් තේරුම් ගත හැකිවේවි හෝම්ස් මහත්තයා . අපි වැඩ කටයුතු ඉවර කරන්න කලින්, වෛද්‍යවරුන්ටත් මේ ගැන අදහස් තියේවි වොට්සන් මහත්තයා. කරුණාකරල මේ පැත්තෙන් එන්න මහත්වරුනි.

ඔබතුමන්ලාට නවාතැන් ගන්න වෙස්ට් විල් ආම්ස් තානායම වෙන් කරලයි තියෙන්නේ. මෙහේ නවතින්න තැනක් තියෙන්නෙ එච්චරයි. එතැන හොඳ පිරිසිදු තැනක් බව මට අහන්න ලැබුණා.'

මිනිත්තු විස්සක් ගතවෙද්දී තානායමේ විසිත්ත කාමරය තුළ, අපරාධය පිළිබඳව වයිට් මේසන් කළ විස්තරයට අපි සවන් දුන්නෙමු. කලින් පරිච්ඡේදයේ මා සඳහන් කළේ අපට ඔහුගෙන් අසන්නට ලැබුණු කථාන්තරයයි. මැක්ඩොනල්ඩ් වරින්වර යමක් සටහන් කර ගත්තේය. හෝම්ස් එය අසා සිටියේ දැඩි අවධානයෙනි. ඉතා දුර්ලභ පැළෑටියක් සොයාගත් උද්භිද විද්‍යාඥයෙකු එය නිරීක්ෂණය කරන්නාක් මෙන්, විශේෂ විස්මය පළ කරමින් ඔහු සවන් දුන්නේ ඉමහත් ආශාවෙනි.

'හරිම පුදුමයක්නෙ, මේ වගේ අපූරු විදියකට කාරණා සිද්ධ වුණු අපරාධයක් නෑ. මට මතක් කරන්නත් අමාරුයි.'

'මං දැනගත්තා හෝම්ස් මහත්තයා, ඔබ මේ වගේ දෙයක් කියන බව.'

වයිට් මේසන් පැවසුවේ මහත් සන්තෝෂයෙනි.

'මම අර මිටිය පරීක්ෂා කරල බැලුවා. මට ඒ වැඩේට දොස්තර මහත්තයත් උදව් වුණා. මිටියෙන් පහර දීපු බවට සලකුණු මොකුත් නෑ. මං හිතුවා ඩග්ලස් මහත්තයා, ආත්මාරක්ෂාව සඳහා මිනීමරුවට මිටියෙන් පහරදීල ඇති කියලා. ඒත් කිසිම ලකුණක් නෑ.'

'ඒකෙන් මොකුත් ඔප්පු වෙන්නෙ නෑ. මිටියෙන් පහරදීමෙන් සිදුවුණු මිනීමැරුම් තියෙනවා. ඒත් මිටියේ කිසි සලකුණක් නැතිව' මැක්ඩොනල්ඩ් කීවේය.

'ඒක ඇත්තයි. ඊට පස්සේ මම තුවක්කුව පරීක්ෂා කළා. යොදාගෙන තිබුණේ රත් මුනිස්සම් සහිත පතරොම්. කොකා හැප්පවීමේදී කාණු දෙකේම උණ්ඩ එකවර පිටවෙන්න ලීවර දෙකම කම්බි වලින් එකට ගැටගහල. අපරාධකාරයා ඒ විදියට තුවක්කුව සූදානම් කරගත්තෙ, මිනිහ දැනගෙන හිටියා ඔහුට ලැබෙන්නෙ එකම අවස්ථාවයි කියලා. තුවක්කුවේ යකඩ බටය කපලා නිසා ආයුධයේ සම්පූර්ණ දිග අඩි දෙකයි. කෙනෙකුට ඒක පහසුවෙන් කබාය යටින් හංගාගෙන ගෙනියන්න පුළුවනි.

තුවක්කුව සාදපු සමාගමේ නම සම්පූර්ණයෙන්ම සඳහන් වෙලා නෑ. නමුත් P.E. N. අකුරු බටයේ ඉතිරි වූ කොටසේ සඳහන් වෙලා තිබුණා. ඉතිරි කොටස කැපූ කෑල්ලත් සමග ඉවත්වෙලා ගිහින්.'

' ඒකේ උඩ කුඩා රැල්ලක් වැනි චිත්‍රයක් සමග ලොකු P අකුරක්. ඊළඟට කුඩා E සහ N අකුරුද ? හෝම්ස් ඇසීය.

'ඇත්තෙන්ම ඔව්'

'එහෙනම් පෙන්සිල්වේනියා සුළු අවි සමාගම. ආයුධ නිෂ්පාදනය ගැන ප්‍රසිද්ධ ඇමරිකන් සමාගමක්' හෝම්ස් කීය.

වයිට් මේසන් හෝම්ස් දෙස බැලුවේ පුදුමයෙනි.

'හරිම පුදුමයි හෝම්ස් මහත්තයා, විශිෂ්ටයි. ඒ කාරණය හරිම ප්‍රයෝජනවත් වේවි. මුළු ලෝකයේම ආයුධ සමාගම් වල නම් ඔබේ මතකයේ තබා ගන්නවාද ?' මැක්ඩොනල්ඩ් ඇසීය.

'ඒක ඇමරිකන් ආයුධයක් බවට සැක නෑ. මං අහල තියෙනවා, බටය කෙටි වෙන්න කපාපු තුවක්කු ඇමරිකාවේ සමහර පළාත්වල භාවිතා කරනවා කියලා. මේ නිවසට ඇතුළුවෙලා ඩග්ලස් මහත්තයා මරාදාපු නැත්තා ඇමරිකන් කාරයෙක් බවට සාක්ෂි තියෙනවා.' වයිට් මේසන් පැවසීය.

එහෙත් මැක්ඩොනල්ඩ් ට ඒකහාවූයේ නැත.

'ඔයා මේ නිගමනයන්ට එළඹෙන වේගෙ කොහොම වැඩියි. පිටසින් අමුත්තෙක් ගේ ඇතුළට ආව බවට සාක්ෂියක් තවමත් මට අහන්න ලැබුණේ නෑ !'

' විවෘතව ඇති ජනේලය, ජනෙල් පඩියේ ලේ, රහස් සංකේතයක් සඳහන් කාඩ්පත, කාමරේ මුල්ලක සපත්තු අඩි සලකුණු, තුවක්කුව !'

'කලින් සැලසුම් කරලා සූදානම් කර ගන්න බැරි කිසිදෙයක් නෑ මිතුර. ඩග්ලස් ඇමරිකන් ජාතිකයෙක්. නැත්තං කාලයක් ඇමරිකාවේ ජීවත්වූ කෙනෙක්. බාකර් වුණත් එහෙමයි. මෙහෙට

ඇමරිකන් සම්බන්ධයක් ඇතිවෙන්න, පිටසින් ඇමරිකන් අමුත්තෙක් ගේන්න ඕනෙම නෑ ?"

"ඒම්ස් , ප්‍රධාන මෙහෙකරුවා....."

"ඔහු ගැන මොනවද ? ඔහු විශ්වාස කටයුතු කෙනෙක්ද?"

"ඔහු අවුරුදු දහයක් සර් චාල්ස් බැස්කවිල් ළඟ සේවය කරල තියෙනවා. ඔහු පර්වතයක් වගේ නොසැලෙන, විශ්වාස කටයුතු මිනිහෙක්. ඩග්ලස්ල ළඟ අවුරුදු පහයි. ඒත් මේ වගේ තුවක්කුවක් ගෙදර තියෙනවා නම් කවදාවත්ම දැකලා නෑ."

"තුවක්කුවේ බටය කියතකින් කපල තියෙන්නේ, කාටත් නොපෙනෙන්න සඟවා තැබීමේ අදහසින්. ඒක ඕනෙම කුඩා පෙට්ටියක දාල තියන්න පුළුවනි. මේ තුවක්කුව මේ ගෙදර තිබුණේ නෑනෑ කියලා ඒම්ස්ට පුළුවන්ද දිවුරන්න ?"

"කොහොම වුණත් ඔහු මේක දැකල නැති බවයි කියන්නෙ"

"මම නං කවුරුත් විශ්වාස කරන්නෙ නෑ පිටින් කවුරුවත් මේ ගෙදරට ආව කියල. ඒක නං කොහොමවත් වෙන්න බෑ. මේ දක්වා අහන්න ලැබිල තියෙන කරුණු වල හැටියට අපට එහෙම හිතන්න පුළුවන්ද හෝම්ස් මහත්තයා ? ඔබ මොකද කියන්නේ?"

"මැක් මහත්තයා. ඔබ ඒ මතයට විරුද්ධ ඇයි කියලා අපට පෙන්වලා දෙන්න.

"ඔය කියන කාලේ මිනිහෙක් ආව කියමුකො. මිනිහ හොරෙක් නෙමෙයි. අතුරුදහන් වෙච්ච මඟුල් මුද්දෙනුත්, දමල තියෙන කාඩ් පතෙනුත් හිතන්න පුළුවන් මේක මොකක් හරි පෞද්ගලික ප්‍රශ්නයක් නිසා සිද්ධවුණු එකක් කියල. හොඳයි මෙන්න අපරාධකාරයෙක් රහසින් ගෙට ඇතුළු වෙනවා, මිනිහෙක් මැරීමේ අදහසින්. ඔහු දන්නවා ඔහුට බේරිලා පැනගන්න තියෙන ලොකුම අපහසුව දිය අගල කියලා. මොකක්ද ඔහු තෝරා ගන්න ආයුධය ? ඔබ කියාවි ලෝකෙ තියෙන හඬ අඩුම ආයුධය කියලා. එතකොට ඔහුට පුළුවන්, තමන් ආපු

රාජකාරිය ඉවර කරලා, ජනේලයෙන් එළියට ගිහිං, දිය අගල හරහා ගමන් කරලා, හෙමින් පැරේ පැනගන්න. ඒ විධියට වුණොත් නම් අපට ඒක විශ්වාස කරන්න පුළුවනි. ඒ වුණාට එහෙම එක මිනිහෙක් ගෙනෙව්ද, මේ ලෝකේ තියෙන ගම්බද වැඩිම ආයුධය? එතකොට මුළු ගෙදරම ඉන්න මිනිස්සු අවදි වෙලා එතැනට දුවගෙන එනවා. ඒ මිනිස්සුන්ට අහුනොවී මිනු දිය අගලෙනුත් එතෙර වෙන්න බලාපොරොත්තු වෙන්නෙ කොහොමද ? ඒ කතාව විශ්වාස කරන්න පුළුවන්ද හෝම්ස් මහත්මයා ?'

'ඔබ ඉදිරිපත් කරන කරුණුත් බොහොම තර්කානුකූලයි මැක් මහත්තයා. ඒවටත් අපට පිළිතුරු දෙන්න සිදුවෙනවා. වයිට් මේසන් මහත්තයා ඔබ දිය අගල පිටත මායිම පරීක්ෂා කරල බැලුවද? ඒ තියන්නේ කවුරු හරි අගලෙ බැහැල ඇවිත් ඒ පැත්තෙන් එගොඩ වෙලාද කියලා ?'

'එතැන මොන ආකාරයකවත් සලකුණක් නෑ හෝම්ස් මහත්තයා. තමුන් ඒ ඉවුර හදල තියෙන්නේ ගල් වලින් ඒ නිසා සලකුණු තියේවි කියලා බලාපොරොත්තු වෙන්නත් බෑ.'

'අඩි පාරවල් හෝ වෙනත් සලකුණු මොකුත්වත් ?'

' කිසිම දෙයක් නෑ'

'හොඳයි එහෙම නම්, ඔබේ විරුද්ධත්වයක් නැත්නම් දැන් අපි බර්ල්ස්ටන් මන්දිරයටම ගිහිං පරීක්ෂා කරල බලමු.'

'මාත් මේ ඒක කියන්නයි හැදුවෙ. මට උවමනා වුණේ යන්න කලින් අපි දන්න සියළුම විස්තර ඔබට කියන්න. එහෙම නං යමු වොට්සන් මහත්තයා. වෙලාව ආවම ඔබේ කථාන්තර පොතේ අප ගැනත් සඳහන් කරාවි කියල අපි බලාපොරොත්තු වෙනවා'

වයිට් මේසන් කීය.

අපි , ඒ ගම්බද මාවතේ ඇවිද ගියෙමු . කප්පාදු කළ එල්ම් ගස් වලින් සෙවණ වූ එය, කොළවර වූයේ පැරණි කාලයේ

උද්‍යානයකිනි. බර්ල්ස්ටන් මන්දිරය පිහිටා තිබුණේ උද්‍යානය මැදයි. දහවල් හිරු රැස් , අගලේ දිය මත වැටීම නිසා එය කැඩපතක් මෙන් බැබලිණි. පුළුල් දිය අගලට නුදුරුව, දැවයෙන් නිමකොට තිබූ, එසවිය හැකි පාලම අපි දුටුවෙමු.

අවුරුදු තුන්සියයක් පැරණි බර්ල්ස්ටන් මන්දිරය සමාජ සංසිද්ධි කොපමණකට මුහුණ දී ඇතිද ? උපන් දින උත්සව, විවාහ මඟුල් උත්සව, ගම්මඳු නැටුම්, දඩයක්කාරයින්ගේ සම්භාෂණ,රැස්වීම් ආදී සිය දහස් ගණනක් උත්සව එහි පැවැත්වී ඇතිවා නිසැකය. වයෝවෘද්ධ වියට පත්ව ඇති මෙම මැදුර, ඛේද ජනක ලෙස වැගිරුණු ලෙයින් අපවිත්‍ර වීම ශෝචනීය කරුණකි.

'අර තියෙන්නේ ජනේලය, අර පාලමට දකුණු පැත්තෙන් තිබෙන එක. ඔය ඇරල තියෙන හැටියටම තමා, ඊයෙ රෑත් ඒක තිබුණේ.'

'මිනිහෙකුට රිංගලා යන්න අපහසු තරමට ඒක පටු වගෙයි පෙනෙන්නෙ.'

'ඔව්. ගියා නම් මහත මිනිහෙක් නොමෙයි. හෝම්ස් මහත්තයා, ඔබට හෝ මට වුණත් ඒකෙන් රිංගලා යා හැකි නොවැ?'

'දිය අගලේ මායිම, අසලට පැමිණි හෝම්ස්, එහි එතෙර මායිම දෙස පරීක්ෂාවෙන් බැලුවේය. ඉන්පසු කළු ගල් වලින් තනා තිබූ දිය"අගලේ කාප්පයද, එතැනින් පිටත තණ බිස්සද පරීක්ෂා කළේය.

'මමත් හොඳ හැටි බැලුවා හෝම්ස් මහත්තයා. කවුරුවත් දිය අගලෙන් මේ පැත්තට නැගපු බවට සලකුණක් නෑ. ඒ වුණත් පැනල යන කෙනෙක් සලකුණක් තියල යාවියැ ?'

'හරියට හරි. සලකුණක් මොකට තියනවද ? මේ වතුර හැම තිස්සෙම මේ වගේ බොර පාටද ?'

'සාමාන්‍යයෙන් වතුර බොරයි. දොළ පාරෙන් මෙතනට එන

වතුරේ කිරිමැටි දියවෙලාමයි එන්නෙ."

"අගල කොච්චර ගැඹුරුද ?"

"ඉවුරු වලට කිට්ටුව අඩි දෙකක් පමණ. මැද හරියේ අඩි තුනයි."

"එහෙම නම්, මෙතෙක් එගොඩ වෙන්න ගිහිං මිනිහෙක් වතුරේ ගිලිල මැරුණා කියන අදහස අපට බැහැර කරන්න පුළුවනි ?"

"අහොයි ඔව්. ළමයෙකුට වුණත් එහෙර වෙන්න පුළුවනි වතුරේ ගිලෙන්නෙ නැතුව."

අපි පාලමෙන් එගොඩ වූයෙමු. වයස් ගතවූ, ඒ නිසාම කේඩෑරි වූ පුද්ගලයකු විසින් අපව පිළිගන්නා ලදී. ඔහු ප්‍රධාන සේවක ඒම්ස් බව අපට දැනගන්නට ලැබිණ. ස්වාමියාගේ මරණය නිසා ඇතිවූ කම්පනයෙන් ඔහු සුදුමැලි වී සිටියේය. ගමේ පොලීසියේ සාජන්ට් විල්සන් තවමත් සිටියේ ඛේදවාචකය සිදුවූ කාමරය තුළයි. වෛද්‍යවරයා පිටව ගොස් තිබිණ.

"අලුතෙන් මොකුත් දැනගන්න ලැබුණද විල්සන් ?"

"මොකුත් නෑ මහත්තයා."

"හොඳයි. දැන් ඔබට ගෙදර යන්න පුළුවනි. සෑහෙන්න මහන්සි ඇති නේ. උවමනා වුණොත් අපි පණිවුඩයක් එවන්නම්. ප්‍රධාන මෙහෙකරුට එළියෙ රැඳී ඉන්න කියන්න. සිසිල් බාකර් මහත්මයා, ඩග්ලස් මහත්මිය, හා සේවිකාව එක්ක අපි ඉක්මනට කථා කරන්න බලාපොරොත්තු වෙන බව ඒම්ස් අතේ දන්වල යවන්න.

හොඳයි මහත්වරුනි. දැන් මං කැමතියි මේ සිද්ධිය මට පෙනෙන හැටි ඔබට විස්තර කරන්න. ඊට පස්සේ ඔබට පුළුවනි ඔබේ නිගමන වලට එන්න."

වයිට් මේසන් තම මතය ඉදිරිපත් කිරීම ඇරඹීය.

"මේක සිය දිවි නසාගැනීමක් නම්, අපට මෙන්න මේ දේවල් සැලකිල්ලට ගන්න වෙනවා. මුලින්ම මේ මිනිහා තමන්ගේ මහුල් මුද්ද ගලවලා හංගලා තියනවා. ඊට පස්සේ මිනුගේ පිට කබාය ඇඳගෙන ඇවිත්, කොහෙන් හරි මධ වීකකුත් පාගාගෙන ඇවිත් කිරි රෙද්දකට පිටුපසින් හිටගෙන ඉන්නවා. මොකටද ? කවුරු හරි මිනුව මරා දමන්න ඇවිත් හිටි බව අනික් අයට පෙන්වන්න. ඊළඟට ජනේලය ඇරලා, ජනෙල් පඩිය මත ලේ පැල්ලමක් තියලා....."

"ඇති , ඇති. මේක සිය දිවි නසාගැනීමක් කියන එක අපට අමතක කරන්න පුළුවනි". මැක්ඩොනල්ඩ් පැවසුවේය.

"මටත් හිතෙන්නෙත් එහෙමයි. එහෙම නම් මේක මිනීමැරුමක් විය යුතුයි. එවිට අපට සොයන්න සිදුවෙනවා මිනීමැරුම කළේ පිටතින් ආ කෙනෙක්ද, ගෙදර කෙනෙක්ද කියලා.

අපි මුලින්ම උපකල්පනය කරමු මේක ගෙදරම වාසය කරන එක් අයකු හෝ වැඩි ගණනක් විසින් කරන ලද්දක් කියලා. මිනුන් මේ මිනුස්සයව මෙතනට ගෙන්වා ගත්තේ අවට පරිසරය බොහොම නිහඬ , එහෙත් කවුරුත් නිදි නැති වෙලාවක. ඊට පස්සේ මොකද කරන්නේ ? මීට කලින් මේ ගෙදර තිබෙනවා කවුරුත් දැකලා නැති, ලෝකෙ තියන ශබ්ද වැඩිම තුවක්කුවකින් වෙඩි තියනවා. ඊක හරියටම මිනීමැරුම කළේ කොහොමද කියලා අනෙක් අයට දන්වන්න වගේ... සිද්ධිය ඒ ආකාරයට වුණා කියලා හිතන්නත් අමාරුයි. එහෙම නේද මහත්වරුනි?"

"ඒකත් වෙන්න බෑ."

"වෙඩි ශබ්දය ඇහුණට පස්සේ මෙහාට එන්න වැඩිම උණොත් මිනිත්තුවක් යන්න ඇති කියලයි කවුරුත් කියන්නේ. සිසිල් බාකර් මහත්තයා පමණක් මක්කොටම කලින් මෙතැනට ආව බව කියනවා. මම හිතන්නේ, ඒ මිනිත්තුවක කාලය තුළ මිනීමරුවා ගෙයි මුල්ලේ සපත්තුවක සලකුණ තියලා, ජනෙල්

පඩියේ සෙරෙප්පුවකින් ලේ පැල්ලමකුත් සලකුණු කරලා, මැරිච්ච මිනිහගේ අතින් මගුල් මුද්දත් ගලවාගෙන, ජනේලය ඇර පැනලා ගියාද ? ඒක නම් වෙන්න බෑ කොහොමටවත්.'

'ඔව්. මම ඒක බොහොම පැහැදිලිව ඉදිරිපත් කළා. මමත් ඔබ සමග එකඟ වෙනවා.' හෝම්ස් කීය.

'හොඳයි. එහෙම නං අපට ආපහු යන්න වෙනවා මේක පිටින් ආපු කෙනෙක් කරපු අපරාධයක් කියන උපකල්පනයට. එතකදි ප්‍රශ්න කීපයක් මතු වුණත් කිසිවක් වෙන්න බැරි දේවල් නොවෙයි.

හදිසි හොරකම්කාරයෙක් හෝ වෙනත් මිනිසෙක් ගෙට ඇතුල්වුණා. අමුත්තන් කිහිප දෙනෙක් නිවසේ සිටි නිසා දොර ඇරලයි තිබුණේ. ඒ නිසා ඔහුට ගෙට ඇතුළු වීම අපහසු වුණේ නෑ. ඔහු සාමාන්‍ය ගෙවල් බිඳින හොරෙක් වෙන්නත් පුළුවනි. වින්ලස් මහත්තයා ජීවිතයේ වැඩි කාලයක් ඇමරිකාවේ ගතකරපු කෙනෙක්. මේ තුවක්කුව ඇමරිකානු එකක් බව පැහැදිලියි. ඒ නිසා මේක පෞද්ගලික කෝන්තරයක් මත සිදුවූ මිනීමැරුමක් කියන එකයි වඩාත් පිළිගන්න පුළුවන්.

ඔහුට දකින්න ලැබෙන පළමුවෙනි කාමරය මේක නිසා, අපරාධකාරයා එතනට රිංගලා තිර රෙද්දක් පිටිපස්සේ හැංගුණා. ඒ එකොළහ පසුවෙන තුරු ඔහු එතැන හැංගිලා හිටියා. වින්ලස් මහත්මිය කියනවා, ස්වාමි පුරුෂයා ඇය සිටි තැනින් පිටවෙලා ඇවිත් මිනිත්තු කිහිපයකින් වෙඩි ශබ්දය ඇසුණු බව. ඒ නිසා වින්ලස් මහත්මියත්, අපරාධකාරයත් මුහුණට මුහුණ හමුවුණා නම්, ඒ මිනිත්තු කීපයකට පමණයි.'

'ඉටිපන්දමෙන් ඒ බව ඔප්පුවෙනවා.' හෝම්ස් කීය.

'ඇත්තෙන්ම ඔව්. අලුත් ඉටිපන්දමෙන් අගල් භාගයක් වත් දැවිල නෑ. වින්ලස් එය මේසය උඩ තබන්න ඇත්තේ ඔහුට වෙඩි තියන්න ඉස්සර වෙලා. නැත්නම් ඉටිපන්දම බිම වැටී තියෙන්න ඕන. මෙයින් අපට කියන්න පුළුවනි, ඔහු කාමරයට

ඇතුළු වූ විගසම වෙඩි තියලා නෑ. ඊළඟට බාකර් මහත්මයා කාමරයට එනකොට ඉටිපන්දම දල්වලා, ලාම්පුව නිවලා.'

'ඒක පැහැදිලියි.'

' හොඳයි එහෙම නම්, ඩග්ලස් මහත්තයා කාමරයට ඇතුළු වෙලා, ඉටිපන්දම මේසය උඩ තබනවා කියමුකෝ. තිර රෙද්ද පිටුපස හැංගිලා ඉන්න මිනිහා එළියට එනවා. ඔහු ඩග්ලස්ට තුවක්කුව එල්ල කරලා මඟුල් මුද්ද ඉල්ලනවා. මඟුල් මුද්ද ඔහුට මොකටද ? දෙයියෝ තමා දන්නේ. ඒත් එය සිදුවුණු ආකාරය එහෙම විය යුතුයි. ඩග්ලස් මුද්ද දුන්නා. ඊට පස්සේ පොර බැදීමකින් පසු හෝ එබැන්නක් නැතුව ඔහු ඩග්ලස්ට වෙඩි තියනවා. මිනීමරුවා තමන් අතේ තිබුණු තුවක්කුවත්, රහස් ඇස සංඥාවක් සහිත කාඩ් පතක් එතැන දමලා, ජනේලයෙන් එළියට පනිනවා. ඔහු අගලට බැහැල, විකුරේ ගමන් කරන අතරෙයි සිසිල් බාකර් අපරාධය ගැන දැනගන්නේ. ඒ කරුණු වල ගැළපීම කොහොමද හෝම්ස් මහත්තයා ?'

' අහං ඉන්න ආසයි. ඒත් විශ්වාස කරන්න ටිකක් අමාරුයි'

'මිත්‍රප්පයෝ, ඕක නං කොහොමවත් වෙන්න බෑ. වෙනිං එකක් කිව්වත් එච්චරයි ' මැක්ඩොනල්ඩ් මහතාවත් කීය.

' මේ මිනිහව මැරුවා. කවුරු වුණත් ඒක කාලේ වෙනත් ආකාරයකට කියල මට ඔප්පු කරන්න පුළුවන්. ඔහුට ආපසු පැනගන්න තිබෙන වෙලාව තවත් අඩුවෙන විදියට ඔහු එය කළේ ඇයි ? නිශ්ශබ්ද ආයුධයක් යොදා ගත්තොත් පමණයි, ඔහුට බේරිලා යන්න පුළුවන්. එහෙම එකේ පතරොම් තුවක්කුවක් පාවිච්චි කරන්නෙ මොකටද ? මෙකට විසඳුමක් දෙන එක දැන් ඔබට භාරයි හෝම්ස් මහත්තයා. වයිට් මේසන්ගේ පැහැදිලි කිරීම විශ්වාස කරන්න අමාරු බව ඔබ පිළිගන්න නේ ?'

'මේක ගැන මතයක් පළකරන්න ඉස්සර වෙලා මං කැමතියි තවත් විස්තර ටිකක් දැනගන්න.' පැවසූ හෝම්ස් මළසිරුර අසල දණගසාගෙන තම දෙනෙත් ඒ දෙසට යොමු කළේය.

'අපොයි මේ තුවාල බොහොම දරුණුයි. ඒම්ස්ට ටිකකට මෙහෙට කතා කරන්න. .... ඒම්ස්, ඩග්ලස් මහත්තයගෙ බාහුවේ තියෙන, මේ කවයක් මැද ත්‍රිකෝණ ලකුණ ඔබ නිතර දැක තිබෙන එකක් වෙන්න ඇති ?'

'නිතර දැක තිබෙනවා මහත්මයා '

'ඒකෙන් අදහස් කෙරුණේ මොකක්ද කියන එක කවදාවත් ඔබට දැනගන්න ලැබුණේ නෑ ?'

'නෑනෑ මහත්තයා '

'මේ කණ ගැසීම සිදුකරද්දී ඔහුට ලොකු වේදනාවක් දැනෙන්න ඇති. පිළිස්සීමක් බවට කිසිම සැකයක් නෑ. ඩග්ලස් මහත්තයාගෙ නිකටෙ ප්ලැස්තර කෑබැල්ලක් තිබෙනවා. ඒ ගැන ඔබට මොනවද කියන්න පුළුවන්?'

'ඊයෙ උදේ ඩග්ලස් මහත්තයා රැවුල කපද්දී ඔහු අතින් දැලි පිහියට මුහුණ කැපුණු බව කිව්වා.

'ඔහු අතින් වෙනදටත් එහෙම සිදුවෙනවද ?'

'සෑහෙන කාලෙකින් නම් එහෙම වෙලා නෑ '

' වැදගත් කරුණක් ! ඒක සමහර විට අහම්බෙන් වුණු සිදුවීමක් වෙන්නත් පුළුවනි. නැත්නම් මොකක් හරි අනතුරක් අහළග බව දැනගිලා මානසික කැළඹීමෙන් වුණා වෙන්නත් පුළුවනි. ඊයේ දවස තුළ ඩග්ලස් මහත්තයාගේ හැසිරීමේ මොකකවත් වෙනසක් ඔබට පෙනුණාද ඒම්ස් ?'

'මට හිතෙනවා ඔහු තරමක් කලබලයට පත්වෙලා, කැලඹුණු ස්වභාවයෙන් හිටියේ කියලා '

' හරි. ඔහුට ඉව වැටිලා තිබෙනවා, අන්තරායදායක තත්ත්වයක් ගැන. අප ටිකක් ඉදිරියට යනවා නේද මහත්වරුනි. සාක්ෂි විමසීම ඔබ කරනවාද මැක් මහත්තයා ?

'නැහැ හෝම්ස් මහත්තයා. ඔබම එය කරන එක වඩාත් හොඳයි '

"හරි. අපි දැන් මේ කාඩ් පත ගැන බලමු. මේකෙ සටහන් දේ ගැන ඔබට මොනවද කියන්න පුළුවන් ජේම්ස් ?"

"මොකුත් නැහැ මහත්මයා."

ලියන මේසය වෙත ගිය හෝම්ස් එහි තිබූ තීන්ත බෝතලයෙන් ස්වල්පයක්, තීන්ත පොවන කඩදාසිය මතට හැළුවේය.

" කාඩ්පත ලියල තියෙන්නේ මේ කාමරයේදී නොවෙයි. මේක කළු තීන්ත. කාඩ් පතේ ලියල තියෙන්නෙ දම්පාට තීන්තෙන්, බොහොම ගනකම් අකුරු සහිත පෑනකින්. ඉතින් මහත්තයාට මොනවද හිතෙන්නේ ?"

" මට හිතෙනවා මෙය රහස් කල්ලියකට සම්බන්ධ දෙයක්. ඔහුගේ අතේ තිබෙන ලාංඡනයෙනුත් ඒ බව තහවුරු වෙනවා"

"මටත් හිතෙන්නේ එහෙමයි." වයිට් මේසන් කීය.

"එහෙම නං අපි යම් උපකල්පනයක් ප්‍රකාශ කරමු. එයින් අපේ ගැටළුව කොයි තරම් දුරට විසඳෙනවද බලමු. එවැනි රහස් සංගමයක සාමාජිකයෙක් මෙහෙට ඇතුළු වුණා. ඔහු චාල්ස් මහත්තයාට වෙඩි තියලා, දිය අගල තරණය ඇවිද ගිහින් පැන යනවා. ඊට කලින් ඔහු අර ගුප්ත පණිවුඩයක් අඩංගු කාඩ්පත දමා යනවා. ඒක පත්තර වල පළවුණාම සංගමයේ අනිත් සාමාජිකයන්ට දැනගන්න පුළුවන් පළිගැනීමේ කටයුත්ත සම්පූර්ණ බව. ඒ නිගමන වල මොකුත් වැරැද්දක් නැ. එහෙම නේද ?" හෝම්ස් පැවසීය.

"ඔව්."

"ඒත් ඇයි මේ තුවක්කුව ?"

" අන්න හරි"

"ඊළඟට ඇයි මගුල් මුද්ද."

"ඒක හැබෑව"

'විලාපට ඇයි කවුරුන් පැහැසරුවකු අත්අඩංගුවට ගන්න බැරිවුණේ. ? දන් දවල් දෙකක් පහුවෙලා. මං විශ්වාස කරනවා මෙතැන සිට පැහැසුම් හතලිහක් විතර, පැමි පොලිස් හටයෙක්ම පෙනා ඇඳුම් සහිත හාදුතන මිනිහෙක් ගැන සෙවිල්ලෙන් ඇති කියලා ?'

'ඒය එලෙසම සිදුවෙනවා හෝම්ස් මහත්තයා '
වයිට් මේසන් පිළිතුරු දුන්නේය.

'එක්කෝ මිනු ඉක්මනට ඇඳුම් මාරු කර ගත්තා. එහෙමත් නැත්නම් මිනුට නිට්ටුවෙන් හැංගෙන්න තැනක් තිබුණා. ඒ මිසක් මිනුට පහසුවෙන් ගැලවීමක් නම් නෑ. ඒත් කවුරුත් මිනු අල්ල ගන්න ආරංචියක් නෑ'

ජනේලය වෙත ගිය හෝම්ස්, ජනෙල් පඩියේ තිබූ ලේ පැල්ලම තම උත්තල කාචයෙන් පරීක්ෂා කර බැලුවේය.

'මේක පැහැදිලිවම පාවහන් නිසා ඇතිවූ සටහනක්. පැහෙන්න පළලයි. ඇවිදින කොට විතක් පය බිකල ගතියක් ඇති කෙනෙක් වගෙයි පෙනෙන්නේ. සාමාන්‍ය මුල්ලේ මඩ සහිත පාවහන් සටහන් කීපයක් තියෙනවා. එතැන සටහන නියම හැඩයක් ඇති සහන්ගු සලකුණක් කියල මට හිතෙනවා. මොනවද මේ මේසය යට තියෙන්නේ ?'

'වයිල්ස් මහත්තයා කාය වර්ධන ව්‍යායාම කරන බර ඉසිලීමේ කට්ටලය ' ඒමිස් කීය.

'බර කට්ටලයක් මෙතන නෑ. එක පැත්තකට දන යකඩ බර පමණයි මෙහි තියෙන්නේ ?'

' මේ ගැන මම දන්නෙ නෑ හෝම්ස් මහත්තයා. එහෙම නම් තියෙන්නෙ ඇත්තෙ එකයි. මං මීට මාස ගණනකින් දැක්කෙ නෑ'
'බර ඉසිලීමේ කට්ටලයක එක පැත්තකට පමණක් යකඩ බර....... '

හෝම්ස් ඒ ගැන යමක් කීමට පටන් ගත්තා පමණි. දොරට

කට්ටු කරන හඬකින් ඔහුගේ කථාවට බාධා ඇතිවිය.

අව් රශ්මියට නිරාවරණය වීම නිසා සම සඹ පැහැ ගැන්වුණු, සම්පූර්ණයෙන්ම රැවුල මුඩු කළ, උස පුද්ගලයෙක් අප දෙසට එබිකම් කළේය. ඒ හැනැත්තා සිවිල් බාකර් බව සිතාගැනීමට මට අපහසු නොවීය. ඔහු තම තියුණු නෙත් යුවල අප වෙත යොමු කළේ ප්‍රශ්නාර්ථ බැල්මක් හෙළමිනි.

" ඔබට බාධා කරන්නට සිදුවීම ගැන කණගාටුයි. ඒත් අලුත්ම ආරංචිය ඔබ වෙත දැනුම් දිය යුතුයි"

"කවුරු හරි පොලිස් අත් අඩංගුවට පත්වෙලාද ?"

"එහෙම වාසනාවක් නැ. ඒ වුණත් ඔහුගේ බයිසිකලය හම්බවෙලා තියෙනවා. ඇවිත් බලන්න, මන්දිරයේ දොරටුවට යාර සියයක් ඇතුලත ඒක තියෙන්නේ "

බයිසිකලය සඟවා තිබී ඇත්තේ කැලෑවේ පඳුරු කිහිපයක් තුලයි. රජ් - විට්වර්ත් වර්ගයේ බයිසිකලයක් වූ එය, සෑහෙන තරම් පාවිච්චි කොට තිබූ එකක් විය. දුර ගමනක යෙදුණු බව පෙන්වමින් බයිසිකලය පුරා මඩ විසිරී තිබිණ. එයට සවිකොට තිබූ කුඩා බෑගයක තිබී තෙල් කෑන් එකක් හා ඇණ තදකරන යතුරක්ද අපට හමු විය. එහෙත් අයිතිකරුවා හඳුනාගත හැකි කිසිදු ලකුණක් එහි නොතිබිණි.

"බයිසිකලයේ අංකය ලියාපදිංචි කරල තිබුණොත් පොලීසියට ඒක ලොකු පහසුවක් වේවි. ඔහු ගියේ කොහේටද කියල හොයාගන්න බැරිවුණත්,ඔහු ආවේ කොහෙන්ද කියල හොයාගන්න බලමු. මේ මිනිහා බයිසිකලය දාල ගියේ ඇයි ? ඊළග ප්‍රශ්නය, ඔහු බයිසිකලය නැතිව ගියේ කොහේටද ? අපට නම් මේ සිද්ධිය ගැන කිසිම හෝඩුවාවක් ලැබෙන පාටක් නැ හෝම්ස් මහත්තයා"

"මොනවද ? අපට ලැබුණේ නැ ? හරි පුදුමයි! " හෝම්ස් පිළිතුරු දුන්නේය.

## 5

## විස්මයජනක සිදුවීමේ කොටස් කරුවෝ

'හෝම්ස් මහත්තයා. ඔබට කන්තෝරු කාමරයේ බලන්න ඕන කරන ඔක්කොම බලා ගත්තද ?'

වයිට් මේසන් ඇහුවේ අප යළිත් නිවසට ඇතුළු වෙද්දීය.

'දැනට අවශ්‍ය තරම්' මැක්ඩොනල්ඩ් පවසද්දී එය අනුමත කරමින් හෝම්ස් හිස සැලීය.

'එහෙම නම් මේ ගෙදර පදිංචිකාරයින් ගෙන් සාක්ෂි අහන්න දැන් ඔබ කැමති වේවි. කෑමකන කාමරය ඒ සඳහා අපි යොදා ගනිමු. ඒම්ස් ඉස්සරවෙලා ඔබම එන්නකො. ඇවිත් අපට කියන්න ඔබ දන්න දේවල්'

'ඩග්ලස් මහත්තයලා බර්ල්ස්ටන් වලට මුලින්ම ඇවිත් පදිංචි වුණු වෙලාවේ තමයි මම මෙහේ රස්සාවට බැඳුනෙ. ඒ අවුරුදු පහකට කලින්. ඩග්ලස් මහත්තයා ඇමරිකාවේදී මුදල් උපයා ගනිපු ධනවතෙකු බව මට අහන්න ලැබුණා. මා මීට කලින් සේවය කරපු තැන්වල ස්වාමිවරුන්ට වඩා ඩග්ලස් මහත්තයා කරුණාවන්ත, අනුකම්පා සහගත ස්වාමියෙක්. ඔහු කිසිසේත් බිය සුළු පුද්ගලයෙක් නොමෙයි. බර්ල්ස්ටන් වල අපි මෑත කාලෙ දැන හිටිය නිර්භීතම තැනැත්තා ඔහුයි කිව්ව හැකි. අගල හරහා දමූ පාලම, හැමදාම රෑට ඔසවලා තිබ්බෙත් භයකට නොමෙයි, ඒක පැරණි චාරිත්‍රය නිසා. ඩග්ලස් මහත්තයා පැරණි චාරිත්‍ර වලට බොහොම ගරු කළ කෙනෙක්. ඔහුට ලන්ඩනයට යන්න සිද්ධවුණේ බොහොම කලාතුරකින්. ඔහු ගමෙන් පිට ගියේම නෑ. නමුත් මේ අපරාධය සිද්ධවෙන්න කලින් දවසේ, ඔහු බඩු වගයක් ගේන්න ටන්බ්‍රිජ් වෙල්ස් නගරයට ගියා. ඒ ගිහිං ආවට පස්සෙ තමයි ඔහුගේ කලබලකාරී ගතිය මට දකින්න ලැබුණේ. ඔහු සාමාන්‍යයෙන් ඉවසිලිවන්ත, බොහොම සන්සුන් කෙනෙක්. නමුත් එද හරිම නොඉවසිලිවන්ත, නොසන්සුන් ගතියක් පෙනෙන්න තිබුණා.

මේ අපරාධය සිදුවන වෙලාවෙ මම නිදාගන්න ගිහින් හිටියෙ නෑ. මං හිටියෙ ගේ පිටිපස්සෙ හරියෙ, කෑම සූදානම් කරන කාමරයේ. හවස් වරුවෙ අමුත්තන් ආ වෙලාවෙ පාවිච්චි කළ හැඳි හැරැප්පු හා පිඟන් කෝප්ප පිරිසිදු කරලා, මම ඒවා අල්මාරි වල අසුරමින් හිටියේ. එතකොට තමයි බොහොම ශබ්දයෙන් සීනුව නාද කරන හඬ මට අහන්න ලැබුණේ. වෙඩි හඬක් මට ඇහුණෙම නෑ. කෑම සූදානම් කරන කාමරයත් ඉස්සරහ පැත්තත් අතරේ දොරවල් කීපයක්ම වහලා තිබුණේ. ඒ නිසා ශබ්දය නෑසුණු එකේ පුදුමයක් නෑ. මෙහෙකාරියට සීනුව නාද වෙන ශබ්දය ඇහිලා ඇයත් දුවගෙන ආවා. ගෙයි ඉස්සරහ පැත්තට අපි දෙන්න ගියේ එකටමයි.

අපි තරප්පු පෙළේ පහත කෙළවරට ළං වෙනකොට අපි දැක්කා ඩග්ලස් මහත්මිය, තරප්පු පෙළේ උඩ ඉඳලා පහළට බහිනවා.'

'ඇය බොහොම කලබල වෙලා වගේ දුවගෙනද ආවේ?' හෝම්ස් ඇසීය.

'නෑ, එහෙම කලබල වුණු බවක් පෙනුණෙ නෑ'

'ඔබේ කථාව දිගටම කියන්න.'

'ඇය තරප්පු පෙළේ පහත අඩියෙන් බිමට බහින කොටම සිසිල් බාකර් මහත්තයා කන්තෝරු කාමරේ ඉඳල එළියට දුවගෙන ආවා. ඔහු ඩග්ලස් මහත්මිය කාමරේ ඇතුළට යන එක අවහිර කරලා, ඇයට ආපහු උඩ තට්ටුවට යන්න කියලා ආයාචනය කළා.

'දෙවියන්ගෙ නාමෙන් ආපහු ඔබේ කාමරයට යන්න ! අහිංසක ජැක් මරණයට පත්වෙලා ! ඔබට කළ හැකි දෙයක් නෑ. දෙවියන්ගෙ නාමෙන් ආපහු යන්න !'

තරමක් වෙලා එහෙම ආයාචනා කළාට පස්සෙ ඩග්ලස් මහත්මිය යළිත් උඩ තට්ටුවට ගියා.

'ඇය විලාප හඬලු කෑගැහුවද ?'

'නෑ'

'ඇය මොනම විදියකින්වත් කෑගැහුවේ හෝ හැඬුවේ නෑ?'

'නෑ'

'චාල්ස් මහත්මිය උඩට කැඳවාගෙන ගියේ මෙහෙකාරිය - ඇලන්. ඇය ඉන්පසු චාල්ස් මහත්මිය සමග නිදන කාමරයේ රැඳී සිටියා.

ඊට පස්සේ මම බාකර් මහත්මයා සමග කන්සෝර්ද කාමරයට ඇතුළු වුණා. පොලීසියට දකින්න ලැබුණු ඒ විදියටම, වෙච්ච සිදුවීම් අප දුටුවා. ඒ වෙලාවේ ඉටිපන්දම් දල්වලා තිබුණා, අපි ජනේලය තුළින් පිටතට එබී බැලුවා. නමුත් ඒ තිබුණු ඝන අන්ධකාරය නිසා කිසි දෙයක් දකින්න ලැබුණේ නෑ. කිසිම හඬක් ඇහුණෙත් නෑ. අපි ඊට පස්සෙ සාලෙට ආවා. මම තමයි පාලම පතන් කළේ. ඊට පස්සෙ බාකර් මහත්තයා පොලීසියට දැනුම් දීම සඳහා ඉක්මනට පිටත් වෙලා ගියා.'

මෙහෙකාරිය වූ ඇලන් මහත්මියගේ සාක්ෂියෙන්ද, ඒමිස්ගේ සාක්ෂිය තවදුරටත් තහවුරු විය.

'ඒමිස් වැඩ කරමින් හිටි තැනට එවා, මගේ කාමරය කන්සෝර්ද කාමරයට කිට්ටුයි. මම නිදාගන්න සූදානම් වෙද්දී තමයි සීනුව තදින් නාද වෙනවා අහන්න ලැබුණේ. මගේ කන ඇහීම ටිකක් අඩුයි. මොකද ඒ නිසා වෙන්න ඇති මට වෙඩි ශබ්දයක් ඇහුණේ නැත්තේ. ටිකකට කලින් මට ලොකු ශබ්දයක් ඇහුණා. මං හිතුවෙ ඒ දොරක් වහන ශබ්දයක් කියලා. හැබැයි ඒක ඇහුණේ සීනුව නාද වෙන්න පැහෙන වෙලාවකට කලින්. අඩු ගණනෙ පැය බාගෙකටවත් කලින්.'

'ගේ ඉස්සරහට ගියාම ඔබ මොනවද දැක්කේ ?'

'බාකර් මහත්තයා කන්සෝර්ද කාමරයෙ ඉඳලා එළියට

ආවා. ඔහුගේ මුහුණ හොඳටම සුදුමැලි වෙලා. ඔහු කැළඹීමට පත්වෙලයි හිටියෙ. ඔහු ඩග්ලස් හෝනාට අවසර කරලා, ආපහු යන්න කිව්වා. ඇය ඊට දුන්නු පිළිතුර මට ඇහුණෙ නෑ. හෝනා උඩට එක්කගෙන ගිහින් ඇයත් එක්කම ඉන්න කියලා මාසර් මහත්තයා මට නියම කළා."

"ඊළඟට ඔබ මොනවද කළේ ?"

"මම හෝනාව කාමරේට එක්ක ගෙන ගිහිං ඇයව සනසන්න උත්සාහ කළා. ඇය හරියට කලබල වෙලා හිටියෙ. මුළු ඇඟම වෙව්ලනවා. හෝනා ආයෙත් පහළට බහින්න උත්සාහ කළේ නෑ. ඈ ගිහින් ඇඳ අසල වාඩිවෙලා දෑතින් මුහුණ වසාගෙන හිටියා. මේ වෙනකොට අනිත් සේවකයො ඔක්කොම නින්දට ගිහිං. මේ කලබලය ඔවුන්ට දැනගන්න ලැබුණේ පොලීසිය එන්න ටිකකට ඉස්සර වෙලා. ඔවුන් නිදාගන්නෙ මන්දිරයෙ පිටුපසම කොටසෙ නිසා කිසිදෙයක් ඇහුණෙ නැති එකේ පුදුමයක් නෑ."

මෙහෙකාරිය හරස් ප්‍රශ්න ඇසීමකට භාජනය කරන ලදී. එහෙත් ඇය විටින්විට නැගූ අඳෝනා සහ පළකළ විස්මය හැරුණු විට අමතර කිසිවක් දැනගන්නට නොලැබිණ.

ඉන්පසු සාක්ෂි දීම සඳහා කැඳවන ලද්දේ සිසිල් මාසර් මහතායි. මේ වන විටත් පොලීසියට දන්වා තිබූ කරුණු හැරුණු විට ඔහුට අලුතෙන් කීමට තිබුණේ ඉතා ස්වල්පයකි.

" මිනීමරුවා පැනල ගියේ ජනේලයෙන් කියන එක මට හොඳටම විශ්වාසයි. ඒ මොකද ජනෙල් පඩියේ ලේ පැල්ලම ඒ බව ඔප්පු කරන්න පැහැදිලි සාක්ෂියක්"

"අපරාධකාරයා දිය අගලෙන් එගොඩවුණු ආකාරය ගැන ඔබ තවමත් දරන්නේ කලින් දැරූ මතයමද ?"

"ඔව්. ඒ විධියට හැර, බේරිලා යා හැකි වෙනත් ක්‍රමයක් ගැන මට තාං හිතාගන්න අමාරුයි."

'අපරාධකාරයා තවමත් හම්බවෙලා නෑ. ඒ ගැන ඔබේ අදහස මොකක්ද ?'

' මොකුත් හිතාගන්න බෑ.'

'අර හමුවෙලා තියෙන බයිසිකලය ඔහුගේ. බයිසිකලයක් තිබුණා නං ඇයි ඔහු ඒකෙන් පැනල ගොයියෙ ?'

'ඒ ගැනත් මට මොකුත් කියන්න අමාරුයි.'

' ඔහු අගලෙ වැටිල, දියේ ගිලී මියගියා කියල ඔබ හිතනවද?'

'ඒක නං කොහොමටවත් වෙන්න බෑ. අගලෙ වතුර අඩි තුනකට වඩා නෑ.'

'ඔබ හිතන හැටියට මේ මිනීමැරුමට හේතුව මොකක්ද?' මැක්ඩොනල්ඩ් ඇසීය.

'ඩග්ලස් බොහොම නිශ්ශබ්ද කෙනෙක්. ඔහුගේ ජීවිතේ සමහර කාල පරිච්ඡේද ගැන කිසිම දවසක අපි කාටවත් කිසිම සඳහනක් කළේ නෑ. ඩග්ලස් ඇමරිකාවට ගිහිං තියෙන්නෙ බොහොම තරුණ කාලෙ. එහේදී ඔහුට විශාල මුදලක් උපයා ගන්න හැකිවුණා. මට ඔහු මුලින්ම හමුවුණේ කැලිෆෝනියාවේදී, බෙනිටෝ කැන්‍යොන් කියන ස්ථානයේ රන්කරන් පතලක. අපි දෙන්නා හවුලේ ගැරීම් කටයුතු කළා. ඒකෙන් අපට සෑහෙන්න වාසිවුණා. ඒත් ඩග්ලස් එක්වරම ඔහුගේ හවුල විකුණාදාල ඇමරිකාවෙන් පිටවෙලා එංගලන්තයට ආවා. ඒ කාලෙ ඔහුගේ පළමුවෙනි බිරිඳ මියගිහින්.

ඊට පස්සේ මමත් සෑහෙන මුදලක් උපයාගෙන එංගලන්තයට ආවා. අපේ මිත්‍රකම අලුත් වුණා. ඩග්ලස්ගෙ කථාබහෙන් එක දෙයක් මට තේරිලයි තිබුණේ. ඒ, මොකව හරි භයානක දෙයක්, කොයි මොහොතේ හරි තමන් වෙත ළඟාවේවි, කියන බියෙන් තමා ඔහු ජීවත් වුණේ. ඔහු සිටිහැටියේම කැලිෆෝනියාවෙ රන් ආකාරය අත්ඇරදල නිශ්ශබ්ද පළාතකට ඇවිත් ජීවත් වුණෙත් ඒ

සිද්ද බව හිතාගන්න පුළුවනි. මට හිතෙන හැටියට මොකක් හරි රහස් කල්ලියක්, වැග්ලස්ව මරන්න හොය හොයා හිටියෙ. ඔහුව මරා දමන තුරු ඔවුන්ගේ උත්සාහය අත්නොහරින බවත් මට වැග්ලස්ගෙ කතාවෙනෙත් තේරුණා. ඒත් ඒවල විස්තර ඔහු මට කවදාවත් කිව්වෙ නෑ. අර කාඩ්පතේ ලකුණු කරල තියෙන්නෙත් ඒ රහස් සංගමයේ පණිවුඩයක් වෙන්න ඇති."

"ඔබ වැග්ලස් මහත්තයා සමග කැලිෆෝනියාවේ කොච්චර කාලයක් ජීවත් වුණාද ?"

"ඔක්කොම අවුරුදු පහයි."

"ඒ කාලෙ ඔහු අවිවාහක කියලද ඔබ කිව්වෙ ?"

"ඔහුගේ බිරිඳ මිය ගිහිං හිටියේ."

"ඔහුගේ පළවෙනි බිරිඳ මොන ප්‍රදේශයක කෙනෙක්ද කියල ඔබට කියල තියෙනවද ?"

"නැහැ. මට මතකයි ඔහු කිව්වා, ඇය ජර්මන් සම්භවය තිබූ කාන්තාවක් කියලා. මං ඇගේ පින්තූරය දැකල තියෙනවා. ඇය ඉතාම සුරූපී කාන්තාවක්. මට ඔහු හමුවූ අවුරුද්දට කලින් අවුරුද්දේ උණසන්නිපාතයෙන් ඇය මියගිහින් තිබුණා."

"ඔහුගේ අතීත ජීවිතයට බැඳුණු විශේෂ සම්බන්ධතාවයක් ගැන ඔබට දැනිල තියෙනවද ? ඇමරිකාවේ යම්කිසි විශේෂ ප්‍රදේශයක් ගැන ඔහුගේ සම්බන්ධයක් එහෙම ඔබට තේරිල තියෙනවද ?"

"මට මතකයි ඔහු චිකාගෝව ගැන කථා කළා. ඔහු ඒ නගරය හොඳින් දැන හිටියා. ඔහු එහේ රස්සාවක් කරල තිබුණා. තවත් ඔහු කිව්වා ගල් අඟුරු හා යකඩ කර්මාන්තය කෙරුණු ප්‍රදේශ ගැන. ඔහු ඒ කාලෙ ජනපද ගණනාවක සංචාරය කරල තිබුණා."

"ඔහු දේශපාලනයට සම්බන්ධ වෙලා ක්‍රියා කළාද ? මේ

ඔබ කියන කල්ලිය දේශපාලන සම්බන්ධතාම තිබෙන එකක්ද ?'

'නැහැ. ඔහුගේ දේශපාලන අදහස් තිබුණේ නෑ.'

'ඔබට හිතෙන්නෙ නැද්ද, මේසන් ඩග්ලස් මහත්තයා කළ අපරාධයකට සලිගැනීමක් වශයෙන් සිදුකළ එකක් කියලා ?'

'කිසිසේත් නැහැ. ඔහුට වඩා අවංක, අහිංසක පුද්ගලයෙක් මට ජීවිතේටම මුණ ගැහිල නෑ.'

'කැලිෆෝනියාවෙ ජීවත්වෙන කාලෙ, ඔහුගේ තේරුම් ගන්න අමාරු සිදුවීම් හැසිරීම් එහෙම තිබුණද ?'

'ඔහු වඩාත්ම කැමැති වුණේ අපේ ගැරුම් පොළට වෙලා වැඩකටයුතු වල යෙදෙන්නමයි. පුළුවන් හැම වෙලාවකම ඔහු අනෙක් මිනිසුන්ව මගහැරියා. අන්න ඒ නිසයි මං මුලින් කිව්වේ ඔහු පසුපස්සෙන් එළවාගෙන එන කාගෙන් හරි හැංගිලයි හිටියෙ කියල. ඊළඟට ඔහු එක්වරම, හැමදේම අත්හැරදල යුරෝපයට එන්න තීරණය කළාම මගේ සැකය වඩාත් තහවුරු වුණා. මං හිතන්නේ ඔහුට මොනාක් හරි ළඟ එන අනතුරක් ගැන ඉව වැටුණා. ඒ මොකද, ඔහු එහෙන් පිටවෙලා ඇවිත් සුමානයක් ගියේ නෑ, ඔහු හොයාගෙන ආවා නාඳුනන මිනිස්සු දුසිම් බාගයක් විතර.'

'මොන වගේ මිනිස්සුද ?'

'බොහොම දරුණු පෙනුමක් තිබුණු මිනිස්සු. ඔවුන් ඇවිත් ඇහුවෙ ඩග්ලස් කෝ කියලා. ඔහු එහෙන් අයින්වෙලා යුරෝපයට ගිය බව මම කිව්වා. ඔවුන් ආවෙ හොඳකට නම් නෙමෙයි. ඒ බව නම් පැහැදිලිව පෙනුණා.'

'මේ මිනිස්සු ඇමරිකන් ජාතිකයොද ? කැලිෆෝනියාවෙ අයද ?'

'කැලිෆෝනියාවෙන්ද මං දන්නෙ නෑ. හැබැයි ඇමරිකන් කාරයො බව නම් ඇත්තයි. උන් ආපහු යන්න පිටත් වුණාම මට ඇතිවුණේ ලොකු සැනසීමක්.'

" ඒ අවුරුදු හයකට කලින් ?"

" අවුරුදු හතකට කිට්ටුයි."

" ඊට කලින් ඔබ දෙදෙනා අවුරුදු පහක් කැලිෆෝනියාවේ ජීවත් වෙලා තිබුණා. ඒ කියන්නේ මේ පටලැවිල්ල අවුම ගණනේ අවුරුදු එකොළහකටවත් පරණයි ?"

"ඒක හරි."

" මේක මහා දරුණු කෝන්තරයක් විය යුතුයි. එහෙම නැත්නං ඔය තරං දීර්ඝ කාලයක් පළිගැනීමට බලා ඉඳීවි කියල කියන්න බෑ."

" මට හිතෙන්නේ මේ ප්‍රශ්නය බියකරු හෙවනැල්ලක් වගේ ජීවිත කාලයක්ම ඔහුට හොල්මන් කරා කියලයි. කොයි වෙලාවක වත් ඒක ඔහුගේ සිතෙන් ඉවත් වුණේ නෑ."

" තවුත් මෙහෙම දෙයක් තියෙනවා. යම් කෙනෙකුට තමන්ගේ ජීවිතයට එල්ලවුණු අනතුරක්, තර්ජනයක් ගැන දැනගන්න ලැබුණා කියමුකෝ. ඒ මොකක්ද කියල දන්නවා නං ඔහුට කරන්න තියෙන්නෙ පොලිස් ආරක්ෂාව ඉල්ලා සිටීමයි. ඒ බව ඔබට හිතෙන්නේ නැද්ද ?"

" මේ අන්තරායදායක තත්ත්වය සමහර විට පොලිසියට ආරක්ෂාව සපයන්න බැරි විදියේ එකක්ද දන්නෙ නෑ. මටට කිව යුතු තව කරුණක් තියෙනවා.ඔහු කොයි වෙලෙත් තමන් ළඟ ආයුධයක් තබාගෙනයි හිටියේ. හැම විටකම සාක්කුවේ රිවෝල්වරය සූදානම්ව තිබුණා. අවාසනාවකට වගේ මේ සිද්ධිය වුණු වෙලේ, ඔහු ඇඳුම් මාරු කරල, ගෙදරට අඳින ලිහිල් කබාය ඇඳගෙන හිටියේ. රිවෝල්වරය තිබුණේ උඩ තට්ටුවේ නිදන කාමරේ. මං හිතන්නෙ පාලම උඩට එසෙව්වට පස්සෙ තමන්ට බය වෙන්න දෙයක් නෑ කියල ඔහුගෙ හිතේ තියෙන්න ඇති "

" මං කැමතියි මේ කාල වකවානු ගැන තව ටිකක් පැහැදිලි කරගන්න " මැක්ඩොනල්ඩ් කීය.

'දැන් ඩග්ලස් කැලිෆෝනියාවෙන් ඇවිත් අවුරුදු හයක් වෙනවා. ඊළඟ අවුරුද්දේද ඔබත් එහෙන් අස්වෙලා ආවා. එහෙම නේද ?'

'ඔව්'

'ඔහු විවාහ වෙලා අවුරුදු පහක් ගතවෙනවා. ඒ කියන්නේ ඔබ ආපහු ආව කාලෙ තමා ඔහු විවාහ වෙලා තියෙන්නේ ?'

'මං ආපහු ඇවිත් මාසෙකින් පස්සෙ තමයි, ඔහුගෙ විවාහ මංගල්‍යය පැවැත්වුණේ. මං තමයි ඔහුගෙ දෙවැනි මනමාලයා හැටියට හිටියේ.'

'විවාහ වීමට කලින්, ඔබ ඩග්ලස් මහත්මියව හඳුනනවද?'

'නෑ. මං ඇය ගැන දැන හිටියේ නෑ. මං එංගලන්තයෙන් ගිහිං අවුරුදු දහයක් නේ'

'නමුත් ඊට පස්සෙ ඔබට ඇයව නිතර නිතර හමුවුණා?'

සිසිල් බාකර් රහස් පරීක්ෂකයා වෙත හෙළුවේ තියුණු බැල්මකි. මද වේලාවක් බලාසිට, ඔහු කථා කළේය.

'ඊට පස්සේ මට ඔහුව නිතර නිතර හමුවුණා. ඇයව හමුවුණා නං ඒ කොහොමද? මිනිහෙක් එක්ක මිත්‍ර සම්බන්ධයක් තියාගන්න බෑ, ඒ මිනිහගෙ ගෑනිව පේන්නෙ නැතිවෙන්න. මොනව හරි අයුතු සම්බන්ධයක් තිබුණා කියල ඔහේ හිතේ මවා ගන්නව නං........................'

'මං කිසිම දෙයක් හිතේ මවාගන්නෙ නෑ බාකර් මහත්තයා. මේ සිද්ධියට අදාළ හැම දෙයක් ගැනම මා විමසිලිමත් විය යුතුයි. ඔබේ සිතට වේදනාවක් දෙන්න මං අදහස් කළේ නෑ'

'සමහර විමසීම් වලින් සිත් වේදනා ඇතිවෙනවා' බාකර් පැවසුවේ කෝපයෙනි.

'අපට උවමනා කරන්නේ සත්‍යය පමණයි. ඔබගේත්

අනෙක් අයගේත් යහපත සඳහා මේ ප්‍රශ්නය තේරුම් බේරුම් කරගත යුතුයි. ඔබගේත් ඩග්ලස් මහත්මියගේත් තිබුණු හිතවත්කම ගැන ඩග්ලස් මහත්තයාගෙ අනුමැතියක් තිබුණාද ?'

බාකර්ගේ මුහුණ සුදුමැලි විය. ඔහුගේ දෑත් වෙවුලන්නට පටන් ගත්තේය.

' මේ වගේ ප්‍රශ්නයක් අහන්න ඔහේට තියෙන අයිතිය මොකක්ද?. ඔහේල පවත්වන පරීක්ෂණයට ඒක අදාළ වෙන්නෙ කොහොමද ? ' බාකර් කෝපයෙන් කෑගැසුවේය.

' හොඳයි. මම ආයෙමත් එම ප්‍රශ්නයම අහනවා '

' ඒකට පිළිතුරු දීම මම ප්‍රතික්ෂේප කරනවා'

' පිළිතුර දීම ඔබ ප්‍රතික්ෂේප කරන්න. ඒත් ඒ ප්‍රතික්ෂේප කිරීම ම පිළිතුරක් බව මතක තියාගත්තොත් හොඳයි. මොනව හරි හංගන්න දෙයක් නැත්නම් පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරන්නෙ නැහැ නේ.'

ඔහුගේ කළු, ඝන ඇහිබැම රැළි ගන්වා, බාකර් මොහොතක් ගැඹුරු කල්පනාවක යෙදුණේය. දෙතොලග සිනහ රැල්ලක් මතු කරගෙන, ඔහු අප දෙසට හැරී පිළිතුරු දීමට පටන් ගත්තේය.

' හොඳයි. මං හිතන්නේ මේ මහත්තුරු තමන්ට නියමිත රාජකාරියයි කරන්නෙ. එයට අවහිර කරන්න මට අයිතියක් නැ. මං ඔබෙන් ඉල්ලා හිටින්නෙ මේ කාරණය ගැන ඩග්ලස් මහත්මියගෙන් ප්‍රශ්න කරන්න එපා. ප්‍රශ්න කරලා ඇයව හිරිහැරයට පත්කරන්න එපා. දැනටමත් ඇය බලවත් කම්පනයට පත්වෙලයි ඉන්නෙ.

මම ඇසූ දේ ගැන මං කියන්නම්. අපේ ඩග්ලස්ගෙ එකම එක දුර්වල තැනක් තිබුණා. ඒ තමා ඊර්ෂ්‍යාව. ඔහු මට ඉතාම කැමැත්තෙන් හිටියා. ඒ තරම් ලෙන්ගතු කමක් හිතවත් කමක් වෙන කිසිම මිත්‍රයෙකුගෙන් ලැබෙයි කියල මම හිතන්නේ නැ. ඒ වගේම ඔහු තමන්ගේ බිරිඳටත් හරි ආදරයෙන් හිටියා. ඔහු ඉතාම

ප්‍රිය කළා මම නිතරම මෙහේ එනවා දකින්න. ආයේ නැතොත් පණිවුඩ එවල මාව ගෙන්වා ගන්නවා.

" ඒ වුණත් මායි ඩග්ලස් මහත්මියයි කතාබහ කළොත් , නැත්නම් මා පළකල මතයකට ඈ එකඟත්වය පළකළොත් ඔහුගේ සිතේ තද ඊර්ෂ්‍යාවක් ඇතිවුණා. එතකොට ඔහුට හරියට තරහ යනවා. ඊළඟට මහ තර්ක කථාවල් තමා ඔහුගේ කටින් පිටවෙන්නෙ. ඔය තත්ත්වය නිසා, මං කී සැරයක් නං මේ ගෙදරින් පිටවෙලා ගිහින් තියෙනවද ? මේ ගෙදර පැත්ත පළාතට එන්නෙ නෑ කියල දිවුරලා තියෙනවද ? මින්න ඉතිං ඊට පස්සෙ ඔහු මට ලියුම් පිට ලියුම් එවනවා, පණිවුඩ එවනවා. තමන් අතින් වෙච්ච වරද ගැන දුක්වෙලා ආයාචනා කරනවා. ඒ නිසාද මට ආපහු එන්න සිද්ධ වුණා. ඒව කොහොම වුණත් මං ඔබට පැහැදිලි කරලා කියන්නම් මහත්වරුනි, මනුස්සයෙකුට කවදාවත් ඉන්න නෑ ඒ වගේ ආදරවන්ත, විශ්වාසවන්ත බිරිඳක්. මා ගැන කියන්න කියෙන්නොත්, ඔහුට පක්ෂපාත, අවංක, ළෙන්ගතු මං වගේ මිත්‍රයෙක් ඔහුට කවදාවත්ම ඉන්න නෑ. එච්චරයි "

බාකර් මෙය සඳහන් කළේ තම හද පත්ලෙන්ම නැගී ආ අවංක හැඟීමක් ලෙසයි. එහෙත් රහස් පරීක්ෂක මැක්ඩොනල්ඩ් නම් මේ මිනිසාට එතැනින් අත්හැර දැමුවේ නැත.

" මියගිය තැනැත්තාගේ මඟුල් මුද්ද ඔහුගේ අතින් ගලවාගෙන ගිහිං තියෙන බව ඔබ දන්නවා නේද ?"

" ඒ වගෙයි පෙනෙන්නෙ" බාකර් පිළිතුරු දුන්නේය.

" මොකද පෙනෙන්නෙ කියල කියන්නෙ ? ඔබ දන්නවා ඒක සත්‍යයක් බව ?"

" නෑ. මං අදහස් කළේ ඩග්ලස්ම මඟුල් මුද්ද අතෙන් ගැලෙව්වද දන්නෙ නෑ."

" මේ අවස්ථාවේ මුද්ද අතුරුදහන් වීමෙන් පෙන්වන්නේ ඩග්ලස්ගෙ විවාහයත් මිනීමැරුමත් අතර සම්බන්ධයක් ඇති බව නේද ?"

බාකර් තම දෑදර හැකිළුවේ තමාට කිසිවක් තේරුම් ගැනීමට අපහසු බව හඟවමිනි.

" මං දන්නෙ නෑ එහෙත් ඔබ මොනවද අදහස් කරන්නෙ කියලා. ඒ වුණත් ඔබ කියන්නෙ මේ ඩග්ලස් මහත්මිය චපල ගැහැනියක් කියලද...... ?"

බාකර්ගේ දෑස් එක් මොහොතකට කෝපයෙන් දිලිසුණේය. බලවත් උත්සාහයක් දරා තම හැඟීම් පාලනය කරගත් ඔහු,

"... එහෙම නම් මට කියන්න තියෙන්නෙ, ඔබලා යන්නේ වැරදි පාරක. එච්චරයි."

මැක්ඩොනල්ඩ් ප්‍රශ්න ඇසීම අවසන් කළ නිසා ඊළඟට ෂර්ලොක් හෝම්ස්ගෙන් ප්‍රශ්නයක් යොමු විය.

" බාකර් මහත්තයා, ඔබ කාමරයට ඇතුළු වෙන කොට මේසය උඩ ඉටිපන්දම දල්වලා තිබුණා. එහෙම නේද ?"

" ඔව් "

"ඒකෙ එළියෙන් ඔබ දැක්කා බොහොම දරුණු දෙයක් සිදුවී ඇති බව ?"

" ඇත්තෙන්ම ඔව් "

"ඔබ වහාම උදව් ඉල්ලා සීනුව නාද කළා ?"

"ඔව්"

"ඔවුන් ඉතා ඉක්මනින් පැමිණියාද ?"

"මිනිත්තුවකින් පමණ "

" නමුත් ඔවුන් පැමිණි පසු දැක්කේ ඉටිපන්දම නිවා ඇති බවත්, ලාම්පුව දල්වා ඇති බවත්. ඒක හරි පුදුමයි ?"

එම ප්‍රශ්නයට දිය යුතු පිළිතුරක් ගැන සිතාගත නොහැකිව

බාකර් යළිත් වරක් කල්පනා කළේය.

" මට නං ඒක පුදුමයක් පෙනෙන්නෙ නැහැ හෝම්ස් මහත්තයා. ඉටිපන්දමෙන් වැටුණේ දුර්වල ආලෝකයක්. මට එක්වරම හිතුණේ හොඳ ආලෝකයක් ලබාගන්න. ලාම්පුව තිබුණේ මේසෙ උඩ. ඉතින් මං ඒක පත්තු කළා "

" ඊට පස්සෙ ඉටිපන්දම නිව්වා ?"

" ඔව් "

හෝම්ස්ගෙන් වෙනත් ප්‍රශ්න ඉදිරිපත් නොවීය. අප සියලු දෙනා වෙත තියුණු බැල්මක් හෙළූ බාකර්, කාමරයෙන් පිටවී ගියේය. එම බැල්මේ ගැබ්ව තිබුණේ අප වෙත දක්වන අප්‍රසාදය හා විරෝධය යයි මට සිතිණි.

මීළඟට ඩග්ලස් මහත්මිය අප වෙත පැමිණියාය. සැහෙන තරම් උස, එමෙන්ම ඉතා ශෝභා සම්පන්න කාන්තාවක වූ ඇගේ වයස අවුරුදු තිහක් පමණ වන්නට ඇත. එතරම් සුහදශීලී බවක් ඇගේ මුහුණෙන් නම් පළ නොවිණි. කෙසේ වෙතත්, මා දකින්නට බලාපොරොත්තුව සිටි, කම්පනයට, චිත්ත වේදනාවට හා බලවත් ශෝකයට පත්වූ ස්වභාවයක් ඇගෙන් නම් දිස් නොවීය. මුහුණ මඳක් සුදුමැලි වී තිබුණත්, ඈ හැඟීම් පාලනය කරගෙන සිටි බව පැහැදිය. දුක්බර දෙනෙතකින් ඇය අප දෙස හෙළුවේ ප්‍රශ්නාර්ථ බැල්මකි.

" ඔබ මොකුත් හොයාගත්තෙ නැද්ද තවම ?" ඇයගේ කටහඬේ ගැබ්ව තිබුණේ කිසියම් බලාපොරොත්තුවක් නොව, භයක් යයි මට එක්වරම හැඟිණි. මෙය මා සිතේ මවාගත් දෙයක්ද?

" අපි හැම උත්සාහයක්ම දරනවා, ඩග්ලස් නෝනා. සුළු දෙයක් වත් අපි නොසලකා හරින්නෙ නෑ.ඒ ගැන මම සහතික වෙන්නම් " වයිට් මේසන් කීය.

" පල්ලි කීයක් වියදම් වුණත් කමක් නෑ. අපි සම්පූර්ණ උත්සාහය යෙදිය යුතුයි "

'ඔබට මේ සිද්ධිය ගැන දන්න සියලුම දේ කියන්න පුළුවන් නම්, සමහර ගැටළු සහිත තැන් විසඳා ගැනීම පහසු වේවි '

'මං දන්නෙ නෑ, මගෙන් ලැබෙන තොරතුරු වලින් ඔබට ප්‍රයෝජනයක් ලැබේවිද කියලා. ඒ වුණත් මං සූදානම් දන්න සියල්ලම ඔබට කියන්න '

'අපට සිසිල් බාකර් මහත්තයාගෙන් දැනගන්න ලැබුණා ඔබට සිද්ධිය වුණු කාමරයට ඇතුළුවෙන්න ඉඩ නොලැබුණු බව'

'ඔව්. ඔහු මට අවහිර කරල ආපහු යන්න කිව්වා '

' වෙඩි ශබ්දය ඇසුණු විගස ඔබ පහළට දුවගෙන ආවද?'

'මගේ ඩ්‍රෙසිං ගවුම ඇඳගෙන පහළට ආවා'

' වෙඩි ශබ්දය ඇසිලා කොච්චර වෙලාවකට පස්සෙද, බාකර් මහත්තයා ඔබට අවහිර කළේ ? '

'මිනිත්තු කිහිපයක් වෙන්න ඇති. ඔය වගේ මොහොතක කොයි තරම් වෙලාවක් ගතවුණාද කියල හරියටම කියාගන්න අමාරුයි. මට කරන්න කිසි දෙයක් ඉතුරු වෙලා නෑ. ඒ නිසා ආපහු යන්න කියලා බාකර් මහත්තයා ඉල්ලා හිටියා. ඒක මහා භයානක සිහිනයක් වගේ'

'ඔබේ ස්වාමිපුරුෂයා පහළ තට්ටුවට ගිහිං කොයි තරං වෙලාවකට පස්සෙද වෙඩි ශබ්ද ඇහුණේ ? '

'මට ඒක කියන්න බැහැ. ඒ මොකද ඔහු ඇඳුම් මාරු කරන කාමරේ ඉඳලයි ගියේ. ඔහු පිටවෙලා යනවා මට ඇහුණේ නෑ. ඔහු හැමදාම රෑට ගේ වටේම ගිහිං පරීක්ෂා කරල බැලුවා. ඔහුගේ හිතේ භයක් තිබුණා නං මං දන්න තරමින් ඒ ගින්නට පමණයි.

'ඔය ප්‍රශ්නෙම තමයි මමත් අහන්න සූදානම් වුණේ. ඔබට

ඔබේ ස්වාමි පුරුෂයා හමුවුණේ ඔහු ආපසු එංගලන්තයට ආවට පස්සෙ. එහෙම නේද ?"

"ඔව්. අපි විවාහ වෙලා දැන් අවුරුදු පහක් වෙනවා."

"ඇමරිකාවේ ඔහුට මුහුණ පාන්න වුණු සිදුවීම් ගැන ඔහු ඔබ එක්ක කතා කරල තියෙනවද ? ඔහුට අන්තරාවක් තර්ජනයක් එල්ල විය හැකි දෙයක් ගැන ?"

පිළිතුරක් දීමට පෙර ඩග්ලස් මහත්මිය මඳ වේලාවක් කල්පනා කළාය.

"ඔව්. එල්ල විය හැකි අනතුරක් ගැන, නිතරම ඔහුගෙ හිතේ තිබුණු බව මට තේරුම් ගියා. ඒත් ඒ ගැන වැඩිදුර කතා කිරීමට ඔහු කැමති වුණේ නෑ. ඒ මං ගැන සැකයක් තිබිල නෙමෙයි. අපි දෙන්න බොහොම ආදරයෙන් හා සම්පූර්ණ විශ්වාසයෙන් හිටියා. මං ඒ අනතුර, තර්ජනය ගැන දැනගත්තොත්, ඒ ගැන සිතමින් මං භයෙන් කල් ගෙවාවි කියන එකයි ඔහුගෙ අදහස වුණේ."

"කොහොමද ඉතින් ඔබ මේ ගැන දැනගත්තේ ?"

ඩග්ලස් මහත්මියගේ මුහුණ ක්ෂණික සිනහවකින් ආලෝකමත් විය.

"ස්වාමි පුරුෂයෙක් කොහොමද ඔහුගෙ ආදරණීය බිරිඳට නොකියා ජීවිත කාලයක්ම රහසක් සඟවලා තියාගන්නෙ ? ඇමරිකාවෙ ඔහු ගතකළ ජීවිතය ගැන නොකියන එකෙන්ම මට තේරුණා, ඒකෙ මොකක් හරි රහසක් තියෙන බව. ඔහුගේ කටින් සමහර වෙලාවල පිටවුණු වචන වලින් මට ඒක තේරුණා. නාඳුනන මිනිස්සු හදිසියේ දකින්න ලැබුණ වෙලාවට, ඔවුන් දිහා සැක සහිත අයුරෙන් බැලූ හැටියෙන් මට ඒක තේරුණා. බොහොම බලවත් සතුරන් කීපදෙනෙක් ඔහු පිටුපස හොයි මොහොතේ හෝ එයි කියන සැකයෙන් තමා ඔහු ජීවත් වුණේ. ඔහු ඒ වෙනුවෙන් ආරක්ෂාව සලසා ගත්ත හැටියෙන් මට ඒ බව තේරුණා. අවුරුදු ගණනාවක් තිස්සෙ මං ඒක දැන හිටියා. ඒ

නිසාම තමයි ආපහු ගෙදර එනවා කිව් වෙලාවට වඩා ඔහු ප්‍රමාද වුණෙත් මං හරි භයට පත්වුණේ.

'ඔහු ගේ කටින් පිටවුණු වචන වලින් ඔබට යමක් තේරුණා කිව්වනේ. මොනවද ඩග්ලස් මහත්මිය ඒ වචන ?" හෝම්ස් ඇසීය.

' බිහිසුණු නිම්නය - මං ඒ ගැන ඇහුවාම ඒක තමයි ඔහු දුන්නු පිළිතුර.

'මං බිහිසුණු නිම්නයේ ජීවත්වුණු කෙනෙක්. මට තවම ඒකෙන් එළියට එන්න ලැබුණේ නැහැ.'

ඔහු එහෙම කිව්වාම, කීප පාරයක්ම මං ඇහුවා මහතයි ඔය කියන බිහිසුණු නිම්නයෙන් එළියට එන්න අපට කවදාවත් ලැබෙන්නෙ නැද්ද ? කියල. ඒකට ඔහු කිව්වෙ,

'වෙලාවකට මට හිතෙනවා අපට කවදාවත් ඒකෙන් එළියට එන්න ලැබෙන එකක් නැ කියල.'

' ඔබ ඔහුගෙන් අහන්න ඇති, මොකක්ද මේ බිහිසුණු නිම්නය කියන එකෙන් ඔහු අදහස් කළේ කියල ?'

'මං ඇහුවා. ඒ වෙලාවට ඔහුගෙ මුහුණේ ඇති වුණේ ඉතා බියජනක ඉරියව්.

'අපි දෙන්නාගෙන් එක් කෙනෙකුගේ ජීවිතයට ඒක හෙවනැල්ල වැටිල හොල්මන් කරන එක මදෑ. දෙවියන්ගේ පිහිටයි! මබට නං ඒක හෙවනැල්ල වැටෙන්න එපා.'

ඔහු දුන්නෙ එවැනි පිළිතුරක්. මේ නිම්න භූමිය ඔහු ඇත්ත වශයෙන්ම කාලයක් ජීවත්වුණු තැනක්. එතැනදී ඔහුට මොනවා හරි දරුණු දෙයකට මුහුණ පාන්න සිදුවෙලා තිබෙනවා. ඒක මට විශ්වාසයි. නමුත් ඒ ගැන ඊට වඩා දෙයක් කියන්න මං දන්නෙ නෑ.'

'ඔහු කවදාවත් කාගෙවත් නම් සඳහන් කළේ නැද්ද ?

'එරස් දඩයමේ ගිහින් සිදුවෙච්ච අනතුරකින් තුවාල වෙලා සැරට උණ ගත්තා. උණ විකාරයෙන් ඔහු දෙඩවන්න පටන් ගත්තා. ඒ වෙලාවේ ඔහුගේ කටට නිතරම ආව වචනයක් මට හොඳට මතකයි. ඒ - මැක්ගිනිටි. ඔහු ඒ දේවල් කිව්වේ හිතේ කෝන්තියෙන්, ඒ වගේම තරමක් භයට පත්වුණු ආකාරයෙන්. මැක්ගිනිටි, බොඩි මාස්ටර්, සංස්ථායමේ නායකතුමා, ඒව තමා ඔහු දෙඩෙව්වේ. ඔහු අසනීපයෙන් සුවය ලැබුණාට පස්සෙ මං ඇහැව්වා,

'කව්ද ජැක්, බොඩිමාස්ටර් මැක්ගිනිටි කියන්නේ ? කාගෙ බොඩි (ශරීරයට) ද ඔහු නායකයා වුණේ ? කියල

' දෙවියන්ට ස්තුති වේවා. මගේ ශරීරයට නං නෙමෙයි' ඔහු පිළිතුරු දුන්නේ සිනාසෙමින්. ඊට වැඩි දෙයක් මට ඔහුගෙන් අහගන්න බැරිවුණා. නමුත් මේ මැක්ගිනිටිත් බිහිසුණු ජීවිතය කියන නැතත් අතරේ සම්බන්ධයක් නම් තියෙනවා.'

' තවත් එක් කාරණාවක් මට ඔයාගෙන් අහන්න ඕන. ඔබට ඩග්ලස් මහත්මයා හමුවුණේ ලන්ඩනයේ නේවාසිකාගාරයක නැවතී ඉන්න කාලෙ. එහෙම නේද ? ඊට පස්සෙ ඔබ දෙදෙනා විවාහ ගිවිස ගත්තා. ඔබේ විවාහ මංගලයය පිළිබඳව මොනවත් අභිරහසක් තිබුණාද ? ගුප්ත ස්වභාවයක් එහෙමත් නැත්නම් අනුවේදනීය ප්‍රේම සම්බන්ධයක් තිබුණාද ?'

' ප්‍රේම සම්බන්ධයක් නම් තිබුණා. ඒක හැමවිටම දකින්න ලැබෙන දෙයක් නේ. නමුත් ඔබ කියන විධියේ ගුප්ත බවක්, අභිරහසක් නම් තිබුණේ නෑ'

'ඩග්ලස් මහත්තයාට පෙර, ඔබ හා විවාහ ගිවිස ගත්තු වෙනත් කෙනෙක් හෙම හිටියෙ නැද්ද ?'

'නෑ. මං සම්පූර්ණයෙන්ම නිදහසේ හිටියෙ.'

'ඔහුගේ මඟුල් මුද්ද ගලවාගෙන ගොස් ඇති බව ඔබට අහන්න ලැබෙන්න ඇති. ඒ ගැන ඔබට මොනවද හිතෙන්නේ ?

අපි හිතමු ඔහු විස්තර හෙළි නොකළ, අතීත ජීවිතයේ සතුරෙක් ඇවිත් මේ අපරාධය සිදුකළා කියලා. ඒත් ඔහුගේ මඟුල් මුද්ද ගලවාගෙන යන්න හේතුව මොකක්ද ?"

කාන්තාවගේ මුහුණේ සිහින් සිනහ රැල්ලක් ඇඳී එය එක් නිමේෂයකින් මැකී ගිය බව සහතික වශයෙන්ම මම දුටුවෙමි.

" ඒක නම් මම දන්නෙ නෑ. ඒක හරි පුදුමාකාර වැඩක්"

'හොඳයි. මේ වෙලාවෙ අපට ඔබෙන් දැනගන්න උවමනා එපමණයි. තවත් ප්‍රශ්න මතුවුණොත් ඒවා එන හැටියට ඉදිරිපත් කරන්නම්.'

ඇය හුනස්සෙන් නැගී අප දෙස පරීක්ෂාවෙන් බැලුවාය. එහි ගැබ්ව තිබුණේ

'මං කිව් සාක්ෂි වලින් ඔබ, මා ගැන ඇති කරගත් ආකල්පය මොකක්ද ? ' යන්න බව මට සිතිණි. අපට හිස නමා ආචාර කොට, ඇය එතැනින් ඉවත්ව ගියාය.

'ඇය ලක්ෂණ කාන්තාවක්. ඉතාම ලක්ෂණ කාන්තාවක් 'මැක්ඩොනල්ඩ් පැවසුවේ ඇ පිටව ගිය පසුයි. මේ බාකර් කියන මිනිහා මෙහේ නිතර නිතර ගැවසිච්ච කෙනෙක්. ඔහුට තියෙන්නෙ ගැහැනියකගේ හිත් ඇදගන්න පුළුවන් පෙනුමක්, ගති පැවතුම්, කථා විලාසයක් . ඔහුම පිළිගන්නවා මියගිය ඩග්ලස්, බාකර් හා ඩග්ලස් මහත්මිය අතර ඇති හිතවත් කමට ඊර්ෂ්‍යාවෙන් සිටියේ කියල. ඇයි ඊළඟට අතුරුදහන් වෙච්ච මඟුල් මුද්ද ? මැරිච්ච මිනිහෙකුගේ ඇඟිල්ලෙන් මඟුල් මුද්දක් උදුරලා ගන්න මිනිහා මොන මිනිහෙක්ද ? ඔබ මොනවද මේ ගැන කියන්නේ හෝම්ස් මහත්මයා ?"

" මේ අවස්ථාවේ මගේ මිත්‍රයා සිටියේ කල්පනා සයුරේ කිමිදෙමිනි. වෙනත් ලොවකට පිවිසී අයුරෙන් ගැඹුරෙන්ම කල්පනා කරමින් සිටි ඔහු, එක් වරම සීනුව නාද කොට ඒම්ස් කැඳෙව්වේය.

'ජේම්ස් කෝ සිසිල් බාකර් මහත්තයා ?'

'බොහොම ඉන්න මහත්තයා. මං ඉක්මනින් බලන්නම්'

ජේම්ස් ඉක්මනින් ආපසු ආවේය.

'බාකර් මහත්තයා ගෙයින් පිටතට ගිහින්. ඔහු උද්‍යානයේ ඉන්නවා'

'ජේම්ස්, බාකර් මහත්තයා, ඊයෙ රෑ මම සමග කාන්තෝරු කාමරයට ඇතුළු වුණා නේ. එතකොට ඔහු පැළැඳ සිටි සාටකත් මොනවද කියල ඔබට මතකද ?'

'ඔව් මහත්තයා. ඔහු පැළැඳගෙන හිටියෙ, නිදන කාමරයට පළඳින සෙරෙප්පු කුට්ටම. ඔහු පොලීසියට යන්න සූදානම් වෙද්දි, මම යි සපත්තු කුට්ටම ගෙනැත් දුන්නෙ.'

'කෝ ඒ සෙරෙප්පු දැන් !'

'අන්න හවිමන් සාලෙ, අර පුටුවක් යට තියෙන්නෙ'

'බොහොම ස්තුතියි ජේම්ස්. ඒවා අපට වැදගත් වෙනවා. අපරාධය සිදුවෙච්ච තැන පා සටහන් තුනක් තියෙනවා. එයින් බාකර් මහත්තයගේ පා සටහන් මොනවද, පිටින් ආපු ඒවා මොනවද කියල අපට වෙන්කරල අඳුනාගන්න ඕන වෙවි.'

'ඔව් මහත්තයා. මං දැක්කා ඒ සෙරෙප්පු වලත්, මගේ සපත්තු වලත් අඩිය ලෙයින් පොඟ වෙලා තියෙනවා'

'කාමරේ තිබෙන ලේ විලේ හැටියට, ඒක පුදුමයක් නෑ, හොඳයි ජේම්ස්, උවමනා වුණොත් අපි ඔබට යළි කැඳවන්නම්'

මිනිත්තු කිහිපයකට පසු අපි කාන්තෝරු කාමරයට පැමිණියෙමු. බාකර්ගේ සෙරෙප්පු කුට්ටම හෝම්ස් ගෙන ආවේය. ජේම්ස් පැවසූ ආකාරයට එහි අඩිය ලෙයින් පෙඟී, කළු පැහැ ගැන්වී තිබිණ.

' පුදුමයි ! ' ජනේලයෙන් වැටුණු ආලෝකයෙන් සෙරෙප්පු පරීක්ෂා කරමින් හෝම්ස් පැවසීය.

' හරිම පුදුමයි !'

එක්වරම ක්‍රියාත්මක වූ හෝම්ස් එයින් එක් සෙරෙප්පුවක් ජනෙල් පඩියේ තිබූ ලේ පැල්ලම මත තැබුවේය. ලේ පැල්ලම සෙරෙප්පුවේ අඩියට සෑම අතකින්ම - ප්‍රමාණයෙන්, හැඩයෙන් හා අඩියේ සටහනින් සමාන විය. හෝම්ස්ගේ මුවගට නැගුණේ ජයග්‍රාහී සිනහවකි.

' මනුස්සයෝ, එසේ කිසිම සැකයක් නෑ ! ජනෙල් පඩියෙ ලේ සහිත අඩි සටහන කියල තියෙන්නෙ කාකර්.සපත්තුවකින් සැදෙන අඩි සලකුණකට වඩා ඒක පෑහෙන්න පළලයි. ඒ උණත් මට මේක තේරුම් ගන්න අමාරුයි. මොකක්ද හෝම්ස් මහත්තයා මෙතන මේ කෙරෙන සෙල්ලම ?' මැක් ඩොනල්ඩ් ඇසීය.

' ඔව් මොකක්ද මේ සෙල්ලම ? මොකක්ද මේ සෙල්ලම ?' ෂර්ලොක් හෝම්ස් එයම ප්‍රතිරාවය කළේය.

' මං කිව්වෙ නැද්ද ? මං කිව්ව නේද මේක විසඳන්න අමාරු මහා ගැටළුවක් කියලා'

වයිට් මේසන් පැවසුවේ මහත් සතුටිනි.

# 6

## අරුණෝලු

රහස් පරීක්ෂකයන් තිදෙනාට සාකච්ඡා කරගැනීමට කරුණු රැසක් තිබිණ. ඔවුනට එය සිත්සේ කරගැනීමට ඉඩ හැර, අපේ නවාතැන් පොළ වූ තානායම වෙත තනියම යෑමට මම තීරණය කළෙමි. එහෙත් ඊට පෙර මෙම මන්දිරය වටා පිහිටි පෞරාණික බර්ල්ස්ටන් උද්‍යානය නැරඹීමට මට සිතිණ.

උද්‍යානය, බර්ල්ස්ටන් මන්දිරය තරම්ම පැරණි එකකි. එය වටේටම පිහිටියේ විවිධ ආකාරයට කප්පාදු කළ ' යූ ' ගස් සමූහයකි. ඊට ඇතුළතින් තණකොළ වැවූ විශාල මිදුලක්ද , ඒ මැද සාදා තිබූ සූර්ය ඝටිය (සන්ඩයලය) ක්ද විය.

කාන්තෝරු කාමරයේ ලේ විලක් මැද වැටී තිබුණු මළසිරුර දැකීමෙන් මගේ සිත දැඩි කම්පනයකට පත්ව තිබිණ. උයනේ සොබා සිරි නැරඹීමෙන් මගේ සිත සන්සුන් කරගැනීමට හැකිවේ යයි මම සිතුවෙමි. නොයෙක් වර්ග වල අලංකාර මල් පඳුරු අතරින් වැටුණු, ගස්වලින් සෙවණ වූ, පටු මාවත් දිගේ මම සෙමෙන් ඇවිද ගියෙමි. එහෙත් බලාපොරොත්තු නොවූ සිදුවීමකට මුහුණ දීමට මට සිදුවිය. එයින් වූයේ මගේ සිත යළිත් ඛේදවාචකය දෙසටම ඇදී යාමයි.

උද්‍යානය වටේම 'යූ' ගස් පේළියක් ඇති බව මම කලින් සඳහන් කළෙමි. මෙම ගස් ඉතා ළං ළංව පිහිටා තිබිණ. එකිනෙක පැටලී වැඩුණු අතුරිකිලි නිසා, කප්පාදු කළ මේ මල්වැට තාප්පයක ස්වභාවය ගත්තේය. තරමක් උස්ව පිහිටි මේ මල්වැටෙන් ආවරණය වී, බර්ල්ස්ටන් මැදුර පැත්තෙන්, ගලින් තැනූ උද්‍යාන බංකුවක් තිබිණි. මම ඒ දෙසට ඇවිද ගියෙමි. දෙදෙනෙකුගේ කතාබහක් මගේ දෙසවණට වැටිණ. පිරිමියෙකුගේ ගැඹුරු කටහඬකින් යම් ප්‍රකාශයක් කෙරිණි. ඊට පිළිතුරු ලෙස මිණි කිංකිණි සලන්නාක් වැනි, කාන්තාවකගේ මියුරු සිනාහඬක් මට අසන්නට ලැබිණ.

මොහොතකින් මා සිටියේ මල්වැට කෙළවරයි. බංකුවේ වාඩිවී සතුටු සාමීචියක යෙදී සිටියේ සිසිල් බාකර් හා ඩග්ලස් මහත්මිය දෙදෙනායි ! මගේ දෑස් ඔවුන් වෙත යොමු වුවත් ඔවුහු මා නොදුටුවහ. ඇගේ ප්‍රීතිමත් ස්වභාවය දුටු මම පුදුමයෙන් ගල් ගැසුනෙමි. ස්වල්ප වේලාවකට පෙර, නිවස තුළදී ඇය සිටියේ බලවත් ශෝකයෙන් හා කම්පනයෙනි. දැන් ඇගේ දෑස් ප්‍රීතියෙන් බබලයි. සිය හිතවතා කළ යම් විහිළුවකට යළිත් ඇගේ මුහුණේ සිනහව පිරී ඉතිරී යාමට ආසන්නය. මිනුගේ කඩවසම් මුහුණේ සිටුණේද සිනහවකි. එහෙත් එක් නිමේෂයකින් ඒ සියල්ලම වෙනස් විය. මා ඇවිද එනු දුටු වහාම, මුහුණු දෙකටම වෙස් මුහුණු පැළැඳුවාක් මෙන් බලවත් ශෝකයක් ආරූඪ විය. ඔවුහු පහත් හඬින් වචනයක් දෙකක් ඉක්මනින් හුවමාරු කරගත්හ. සිසිල් බාකර් බංකුවෙන් නැගිට මා දෙසට ඇවිද ආවේය.

'සමාවෙන්න මහත්තයා, ඔබ දොස්තර වොට්සන් නේද ?'

'මම හිස නමා ආචාර කළෙමි. එහෙත් මගේ සිතේ ඔවුන් ගැන ඇති වූ කලකිරීම මුහුණෙන් ප්‍රකාශ වන්නට ඇතිවා නියතය.

' ෂර්ලොක් හෝම්ස් මහත්තයා සමග ඇවිත් ඉන්නෙ වොට්සන් මහත්තයා වෙන්න ඇති කියල අපි නිකමට හිතුවා. ඒ මොකද ඔබ දෙදෙනා මිත්‍රයින් බව ප්‍රසිද්ධ කාරණයක් නෙ. ඔබ කැමතිද ඇවිත් ඩග්ලස් මහත්මිය එක්ක ටිකක් කථා කරන්න?'

මම ඔහු පිටුපසින් ගමන් ගත්තෙමි. මගේ මුහුණෙන් දිස්වන්නට ඇත්තේ රළු පෙනුමක් බව නියතය. නිවසේ ඉදිරිපස කාමරයක හතර අතට ගාත් විහිදුවාගෙන, ලේ විලක් මැද මියගොස් සිටින පුද්ගලයාගේ රුව මගේ සිතේ මැවෙයි. එය සිදු වී ගතවී ඇත්තේ පැය කීයද ? එහෙත් ඔහුට අයිති උද්‍යානයේ පඳුරක් පිටුපස ඔහුගේ බිරිඳත් හොඳම මිතුරාත් ප්‍රීතියෙන් සිනාසෙමින්, මුතුළ් කරමින් ! කෑම කාමරයේදී ඇගේ ශෝකය ගැන මමද ශෝක වීමි. දැන් ඇගේ මුහුණේ ඇත්තේ ආයාචනාත්මක

මැල්වමකි. එය යන්තමට හොයාගෙන තිස් මැල්වමත් මම ඇය දෙස බැලීමි.

"ඔබට හිතෙනවා ඇති මට තියෙන්නෙ අනුකම්පා විරහිත නපුරු හදවතක් කියල ?"

"ඒක ඉතින් මට දැනගන්න උවමනා කාරණයක් නෙමෙයි" මම කීවෙමි.

"මේ කාරණය කවදාවත් තේරුම් ගන්න දවසක ඔබ මට සමාව දේවි. ඔබට තේරුම් ගන්න නැති නම්...."

"බොට්සන් මහත්තයාට ඔබ තේරුම් ගන්න අවශ්‍ය නෑ, ඔහු කිව්වේ මේක ඔහුට දැනගන්න ඕන එකක් නෙමෙයි කියල" මාකර් චිත්‍රා කීවේ ඇගේ කතාවට බාධා කරමිනි.

"ඔව්. ඒක හරි. එහෙනං මට සමාවෙන්න. මං ටිකක් ඇවිදින්න යනවා" එසේ පවසා මිදුලෙන් සමුගැනීමට සූදානම් වුණෙමි.

"බොට්සන් මහත්තයා, එක මොහොතක් නැවතිලා මේක්ත මේ දේය අහනවද ?" ඇය ඉල්ලා සිටියේ මෘදු කටහඬිනි.

"මේ පුත්තයාට, මේ ලෝකෙ ඉන්න වෙන කාටත් වඩා පිළිතුරු දීමට සුදුසු පුද්ගලයා ඔබයි. මේක මගේ සිතට ලොකු පහසුවක් ගෙන දෙන්න පුළුවන් කාරණයක්. සර්ලොක් හෝම්ස් මහත්තයාත්, පොලීසියත් අතර තිබෙන සම්බන්ධතාවය වෙන කාටත් වඩා හොඳින් දන්නෙ ඔබයි. අපි යම්කිසි කාරණයක් රහසිගතව හෝම්ස් මහත්තයාට දැනුම් දුන්නොත්, ඒක අනිවාර්යයෙන්ම පොලීසියට දන්වන්න ඔහුට සිදුවෙනවද ?"

"ඔව් අන්න ඒක තමයි අපට දැනගන්න ඕන සරල කියෙන්නෙ. හෝම්ස් මහත්තයා පෞද්ගලික පරීක්ෂණය පවත්වන්නෙ තනියමද, නැත්නම් පොලීසියත් සමඟ හවුලෙද ?" මාකර් ඇසීය.

"මේ වගේ කාරණාවක් ගැන ඔබ මතක් එක්ක සාකච්ඡා කරන එක හරිද මං දන්නෙ නෑ."

"වොට්සන් මහත්මයා මං ඔබට ආයාචනා කරනවා. මේ කාරණය පැහැදිලි කරල දුන්නොත් ඒක අපට - විශේෂයෙන්ම මට කරන ලොකු උදව්වක්" ඇගේ කටහඬේ යම්කිසි අවංක, බැගෑපත් ස්වභාවයක් ඇතැයි මට සිතිණ.

" හෝම්ස් මහත්තයා ස්වාධීනව වැඩ කරන පෞද්ගලික රහස් පරීක්ෂකයෙක්. ඔහුට සාමාන්‍ය නියෝග වලට කීකරු වෙන්න අවශ්‍ය නෑ. ඔහුට සාධාරණ යයි හිතෙන ආකාරයට ක්‍රියා කරන්න තහනමකුත් නෑ. ඒත් මේ අපරාධය ගැන හවුලේ පරීක්ෂා පවත්වන පොලිස් නිලධාරයන්ට පක්ෂපාත බවක් දක්වන්න ඔහු බැඳී සිටිනවා. අපරාධකාරයෙක් නීතිය ඉදිරියට ගෙනෙන්න පුළුවන් සාක්ෂි, හෝම්ස් මහත්තයා ඔවුන්ට හංගන එකක් නෑ. ඊන් එහාට මට මොකුත් කියන්න බෑ. වැඩිදුර විස්තර ඕනෙ නං මං ඔබව හෝම්ස් මහත්තයා වෙත යොමු කරන්නම්."

මම ඔවුන්ගෙන් සමුගත්තෙමි. සෑහෙන දුරක් ඇවිද ගොස් මම ආපසු හැරී බැලුවෙමි. ඔවුනු තවමත් බංකුවේ එකට වාඩිවී මහත් උනන්දුවෙන් සාකච්ඡාවක යෙදී සිටියහ.

" ඒ දෙන්නව විශ්වාසයට ගන්න මං කොහොමටවත් කැමති නෑ වොට්සන්."

මා දුටු දේ ගැන විස්තර කළ විට හෝම්ස් පිළිතුරු දුන්නේය.

එද සවස්වරුව බර්ල්ස්ටන් මන්දිරයේ පරීක්ෂණ පවත්වා හෝම්ස් කාමරයට පැමිණෙන විට සවස පහ පසු වී තිබිණ. අධික වෙහෙස නිසා පිපාසයෙන්, බඩගින්නෙන් පෙළී සිටි ඔහුට ආහාරපාන ඇණවුම් කළෙමි.

"එයාල වික්ක රහස් කියාගන්න බෑ වොට්සන්. තුමන්ත්‍රණය කිරීම හා "මිනීමැරීමේ චෝදනාව" යටතේ අත්අඩංගුවට ගැනුණොත් ඔවුන් ලොකු අමාරුවක වැටෙනවා."

"ඔබ හිතන්නේ තත්ත්වය ඒ තරමට බරපතලයි කියලද ?

"මගේ මිතුවන් වොට්සන්. දැන් මම බිත්තර තුනක් කාල ඉවරයි. මේ හතරවැනි බිත්තරයත් කාල ඉවර කළාට පස්සෙ, උද්ගත වී ඇති තත්ත්වය ගැන ඔබට පහදල දෙන්න මම සූදානම්."

කරතල පාන් පෑහෙන ප්‍රමාණයක් ගිල දමමින් සිටි හෝම්ස් මා දෙස බලා සිටින්නේ දඟකාර විලාසයකිනි. ඔහුගේ කෑම රුචිය විශාල වශයෙන් වැඩිවී තිබීම පරීක්ෂණය සාර්ථක වීගෙන එන බවට ලකුණකි. ගැටළුවක් ඉදිරියේ පරාජයට පත්වෙද්දී හෝම්ස් කෑමට අත වත් නොතබයි. දින ගණන් කුසගින්නේම කල්පනා කරමින් කාලය ගත කරයි. එහෙත් අද තත්ත්වය ඊට වෙනස්ය.

"මං කියන්නේ නෑ අපි මේ ගැටළුව සම්පූර්ණයෙන්ම විසඳ අවසන් කියල. නමුත් හැසිරුණු බර ඉසිලීමේ කට්ටලයේ බර හමුවුණාට පස්සෙ....."

"බර ඉසිලීමේ කට්ටලයේ බර ?"

"මට පුදුමයි වොට්සන්. මුළු ගැටළුවම රඳා පවතින්නේ එක් දෙයක් මත. ඔබට ඒ බව තවමත් වැටහුණේ නැද්ද ? ඒ තමයි ඩග්ලස් මහත්තයාගෙ කාය වර්ධන බර ඉසිලීමේ උපකරණයේ අතුරුදහන් වී ඇති පෙත්ත සොයා ගැනීම. ඔබට ඔය තරම් මුණ හරක් කරගන්න ඕනෙ නෑ. ඔබට රහසක් කියන්නම් වොට්සන්. මං හිතන්නෙ නෑ අපේ මැක් මහත්තයට වත් වයිට් මේසන් මහත්තයට වත් බර ඉසිලීමේ කට්ටලයේ වැදගත්කම තේරුම් ගියා කියල.

එක පැත්තකට විතරක් බර යොදල, මස් පිඬු වඩවා ගන්න ව්‍යායාම කරන කෙනෙක් ගැන ඔබට හිතාගන්න පුළුවන්ද ? ශරීරයේ එක් පැත්තක් විතරක් වර්ධනය වෙලා, කොඳු නාරටිය පැත්තකට ඇදවෙලා, වක ගැහිලා ! හරිම සංවේග ජනක දර්ශනයක් වොට්සන්."

කෑම කා අවසන් කළ හෝම්ස් පයිප්පය දල්වා ගෙන කතාව පටන් ගත්තේය.

"අපට හැම දෙයක්ම පටන් ගන්න සිදුවෙලා තියෙන්නෙ මහ බොරුවකින් වොට්සන්. එකිනෙකට ගැළපීමක් නැති

කාරණා වලින් පිරුණු මහා බොරුවක්. අපේ හිත්වලට බලෙන් කාවද්දන්න හදන අමූලික බොරුවක්. බාකර් කියන සම්පූර්ණ කතාවම පට්ටපල් බොරුවක්. තමුන් බාකර්ගේ කතාවලට හොඳින් ගැලපෙන විදියට ඩග්ලස් මහත්මියත් කට උත්තර දෙනවා. එතකොට ඇගේ කතාවත් අර වගේම බොරු. ඔවුන් දෙදෙනාම එකතු වෙලා බොරු ගොතා කියපු කුමන්ත්‍රණයක් !

ඔන්න එතකොට තමයි අපට පැහැදිලිවම ප්‍රශ්නයක් මතුවෙන්නෙ. ඇයි ඔවුන් බොරු ගොතා කියන්නේ ? ඔවුන් මේ තරම් මහන්සි වෙලා හංගන්න හදන සත්‍යය මොකක්ද ? අපි උත්සාහ කරලා බලමු මේ බොරුව පිටුපස්සට ගිහිං ඇත්ත හොයාගන්න පුළුවන්ද කියලා.

මං කොහොමද දන්නේ ඔවුන් බොරු කියන බව? මේක හොසැලකිලිමත් ලෙසට ගෙතූ බොරුවක් බවට සාක්ෂි තියෙනවා. අපරාධකාරයා මිනිය මැරුවට පස්සේ, මිනිත්තුවකට අඩු කාලයකදී ලොකු වැඩ කොටසක් කරනවා. ඔහු මළ සිරුරේ එක් මුද්දකට ඇතුළෙන් තිබුණු මඟුල් මුද්ද ගලවලා අරගෙන, උඩින් තිබුණු මුද්ද ආපහු තිබුණු තැනටම දානවා. අපරාධයක් කරලා පැනල යන්න සූදානම් වෙන කෙනෙක් මෙවැනි දෙයක් කරාවිද? ඒ විතරක් නෙමෙයි අර කාඩ් පතත් එතන දමනවා. මිනිත්තුවක් ඇතුළත මේ ඔක්කොම කරන්න පුළුවන්ද ? මං කියන්නේ කොහොමටවත් බෑ.

ඔබට තර්ක කරන්න පුළුවන් ඩග්ලස්ව මරන්න ඉස්සර වෙලා මුද්ද ලබාගන්නා කියල. ඉටිපන්දම දල්වලා තිබුණේ ඉතාම සුළු කාලයයි. ඒකෙන් පැහැදිලි වෙනවා ඒ දෙන්න අතරේ දීර්ඝ හමුවීමක් තිබුණේ නැහැ කියල. අපට අහන්න ලැබුණේ ඩග්ලස් බොහොම නිර්භීත කෙනෙක් කියලයි. එහෙම කෙනෙක්, ඕය ඉල්ලන ඉක්මනට තමන්ගෙ මඟුල් මුද්ද කාටවත් දේවිද ? ඉල්ලූ හැටියෙම නෙමෙයි, ඔහු කොහොමටවත් මඟුල් මුද්ද දෙයි කියල හිතන්න පුළුවන්ද ? නෑ නෑ වොට්සන්. ඒක ඒ විදියට නං සිද්ධ වෙන්න බෑ. මිනීමරුවා මියගිය පැහැත්තා සමඟ සැහෙන

වෙලාවක් ඉඳලා තියෙනවා. ඒ වෙලාවෙ ලාම්පුව දල්වලා තිබිලා තියෙනවා. ඒ ගැන මට කිසිම සැකයක් නෑ.

මරණය සිදුවෙලා තියෙන්නෙ වෙඩි පහරින්. ඒ නිසා වෙඩිල්ල පත්තු වෙලා තියෙන්නෙ, ඔය අපට කියන වෙලාවට සැහෙන වෙලාවකට කලින්. ඒ වුණත් වෙඩි ශබ්දයක් වගේ එකක් ලේසියෙන් වරදින්න විදියක් නෑ. ඒ නිසා අපි මැදිවෙලා ඉන්නෙ බාකර් සහ ඩග්ලස් මහත්මිය හොඳට හිතා මතා සැලැසුම් කළ කුමන්ත්‍රණයකට. ඊට අමතරව මට මතක් කරන්න පුළුවන්, ජනෙල් පඩිය මත, පෙරෙප්පුවෙන් මල් සැල්ලමක් තිබ්බෙ බාකර් කියල. ඒ මොකටද ? පොලිසිය නොමඟ යැවීමට. එතකොට තමයි බාකර් අමාරුවේ වැටෙන තාලෙට කාරණා හොඳ වෙන්නෙ.

දැං අපි අනෙකම් විමසා ගත යුතු ප්‍රශ්නයක් තියෙනවා. මිනීමැරුම ඇත්තටම සිදුවුණේ කීයටද ? රෑ දහයමාරටත් නොයෙක් වැඩ කටයුතු සඳහා සේවකයො ගේ ඇතුළෙ එහා මෙහා ගියා. ඒ නිසා ඊට පස්සෙ තමයි මොකක් හරි සිදුවුණේ. දහයට ගහලියන්න වෙන කොට ජීම්ස් ඇරෙන්න අනිත් හැමෝම සේවකයෝ ඔවුන්ගේ කාමරවලට ගිහිං. ජීම්ස් විතරක් කෑම සූදානම් කරන කාමරයේ හිටියා.

මම පිටත්වෙලා ආවට පස්සෙ මැක්ඩොනල්ඩුයි මමයි පොඩි පරීක්ෂණයක් කළා. මැක්ඩොනල්ඩ් සන්හෝර් කාමරේ හිටියදී මම කෑම සූදානම් කරන කාමරයේ හිටියා. ඒ කාමර දෙක අතර කාමර, පැසේජ් වල දොරවල් ඔක්කොම වැහුවා. කොපමණ උත්සාහ කළත් මැක්ඩොනල්ඩ්ට හැකි වුණේ නෑ, මං හිටිතැනට ඇහෙන විදියට කිසිම ශබ්දයක් නගන්න.

නමුත් මෙහෙකාරියගේ කාමරයේ හිටියම තත්ත්වය ඊට වඩා වෙනස්. එක තියෙන්නේ සන්හෝර් කාමරයට වැඩි ඈතකින් නෙමෙයි. ඒ නිසා කෙනෙක් උස් හඬකින් කතා කළොත්, මෙහෙකාරියගේ කාමරයට යන්තමට ඇහෙනවා. පතොරම් තුවක්කුවේ වෙඩිල්ල නිකුත් වෙලා තියෙන්නේ ඩග්ලස්ගේ මුහුණට හොඳටම කිට්ටුවෙන්. ඒ නිසා වෙඩි ශබ්දය සෑහෙන තරමකින්

අඩුවූ බව අපට හිතාගන්න පුළුවනි. කෙසේ වෙතත් ඒ වෙඩි හඬ මොහොතාරියගේ කාමරයට යන්තමට ඇහෙන්න ඇති. ඇයම පිළිගන්නවා ඇගේ කන් ඇසීම අඩුයි කියලා. කොහොම වුණත් ඇය අපට කිව්වා සීනුව නාද කරන්න පැය භාගයකටවත් කලින් දොරක් වහන ශබ්දයක් වගේ එකක් ඇයට ඇහුණා කියලා. ඒ කියන්නේ දහයයි හතළිස්පහට. මට කිසිම සැකයක් නෑ ඇයට ඒ ඇහුණේ වෙඩි ශබ්දය. අන්න ඒ වෙලාවේ තමයි මරණය සිද්ධ වුණේ.

ඒක සත්‍යයක් නම්, බාකර් හා ඩග්ලස් මහත්මිය දෙදෙනා මිනීමරුවොන් නොවෙයි නම්, දැන් අපි ගැඹුරට කල්පනා කළ යුතු ප්‍රශ්නයක් මතු වෙනවා. වෙඩි ශබ්දය ඇහුණු දහයයි හතළිස් පහේ ඉඳල සීනුව නාද කළ එකොළහයි කාල වෙනතුරු මේ ජෝඩුව මොකද කළේ ? ඇයි ඔවුන් වෙඩිල්ල පත්තු වුණු වහාම සේවකයින් කැඳෙව්වේ නැත්තෙ ? අන්න ඒකයි අපට මුහුණ දෙන්න වෙන ප්‍රධාන ප්‍රශ්නය. ඔය ප්‍රශ්නයට පිළිතුරක් තියෙනවා නම් අපේ ගැටළුව විසඳීමේ පියවර කිහිපයක් ඉදිරියට ගිහින් '

' මට නං විශ්වාසයි මේ දෙන්න අතරේ මොකක් හරි සුලුපග කමක් තියෙන බවට. මිනිහ මැරිලා පැය කීපයක් යන්න කලින් තව මිනිහෙක් එක්ක මුකුළු හිනා දල සන්තෝස වුණේ ඒ ගැනි මහ හිතක් පපුවක් නැති ගෑනියෙක් මම හිතමි.

'මම හරි. සිද්ධිය වුණු වෙලාවේ ඇගේ හැසිරීම ගැන හිතමු. එවැනි හැසිරීමක් ආදරවන්ත බිරිඳකගෙන් අපට බලාපොරොත්තු වෙන්න පුළුවන්ද ? ඔබ දන්නවා වොට්සන්, කාන්තා පක්ෂය මුළු හදවතින්ම අගය කරන කෙනෙක් නොවෙයි මම. ඒ වුණත් ජීවිතේ අත්දැකීම් වලින් මට කියන්න පුළුවන් , තමන්ගේ ස්වාමි පුරුෂයා මියගිය වෙලාවේ, මිනුගේ මිනිය බලන්න එපා කියල තවත් මිනිහෙක් කියන වචනයකට ආදරවන්ත බිරිඳක් කන් දේවිද ? මං හිතන්නේ නෑ. මං කවදාහරි කසාද බැන්දොත් වොට්සන්, මං බලාපොරොත්තු වෙනවා මගේ බිරිඳ මට වඩා, අනුකම්පා සහගත හැඟීම් ඇති කැනැත්තියක් බවට පත්කරන්න. සැමියාගේ මළසිරුර යාර ගණනක් දුරින් තිබෙද්දී, ඒක නොබලා,

මෙහෙකාරියත් එක්ක නිදන කාමරයට යන තිරිදත් ? මේක බොහොම දුර්වල අධ්‍යක්ෂණයකින් රඟ දක්වපු නාට්‍යයක්. කෝ අර කාන්තා පක්ෂය එක්වරම නඟන විලාපය, අඳෝනාව ? රහස් පරීක්ෂණ සෙනුයේ ආධුනිකයෙකුට වුණත් මේක කල්තියා සැලසුම් කළ කුමන්ත්‍රණයක් බව තේරෙනවා.'

'ඔබ එහෙම නම් ස්ථිර වශයෙන්ම හිතන්නේ මේ අපරාධයට වගකිව යුතු, බාකර් සහ ඩග්ලස් මහත්මිය කියලද?' මම ඇසීමි.

'ඔබේ ප්‍රශ්නයේ බොහොම දරුණු විධියේ සෘජු භාවයක් තියෙනවා වොට්සන්. ඒ ප්‍රශ්නය මා වෙතට එන්නේ වෙඩි උණ්ඩ වගේ. ඔබ මෙහෙම අහන්න:

මේ දෙන්නා මිනීමැරුම ගැන සත්‍යය දන්නවාද ? එතකොට මට එක හිනින්ම 'ඔව්' කියන පිළිතුර දෙන්න පුළුවනි. ඔවුන් ඇත්ත දන්න බව ගැන කිසිම සැකයක් නෑ. ඒත් ඔබේ බරපතල චෝදනාව ගැන නම් තවමත් ඒ තරම් පැහැදිලිතාවයක් නෑ.

අපි මෙහෙම හිතමු. දෙදෙනෙකු අතර තියෙනවා සහතම් ආදරයක්. ඔවුන් බලාපොරොත්තු වෙනවා ඔවුනට අවහිර කරන පුද්ගලයාව මෙලොවින් තුරන් කරන්න. මේක අපේ හිතේ ගොඩ නගා ගන්න විශාල උපකල්පනයක් පමණයි. සේවකයින්ට අපි බොහොම සූක්ෂ්ම ලෙස ප්‍රශ්න, හරස් ප්‍රශ්න රාශියක් ඉදිරිපත් කළා. ඒ කිසි එකකින් අපේ උපකල්පනය ඔප්පු වෙන්නේ නෑ. එච්චර විතරක් නෙමෙයි. ඩග්ලස් ජෝඩුව ඉතා ආදරයෙන් විවාහ ජීවිතය ගතකළ බවට අපට පැහෙන්න සාක්ෂින් ලැබෙනවා.'

උද්‍යානයේදී මා දුටු ප්‍රීතිමත් සිනහවකින් බබලන රුවැති මුහුණ මගේ සිහියට නැගිණ.

' ඒක නං කවදාවත් ඇත්ත වෙන්න බෑ හෝම්ස්. '

' හොඳයි. අඩු වශයෙන් ඔවුන් පිටට ඇඟෙව්වෙ එහෙමයි. එහෙම නං අපි හිතමු මේ දෙන්නා කවුරුත් රවටන කපටි

බුද්ධියෙන් පිරුණු ජෝඩුවක් කියල. මෙයාල සැලැසුම් කරනවා ස්වාමිපුරුෂයා මරා දමන්න. ඒ මනුස්සයත් කොයි වෙලේ හෝ භයානක අන්තරාවක් හිසමත කඩා වැටෙන්න පුළුවන් තත්ත්වයේ ඉන්න කෙනෙක්....'

'.... එහෙම කියන්නෙත් මේ ජෝඩුව විතරයි නේ'

'වොට්සන් ඔබ කියන්නේ මේ දෙන්නා මුල ඉඳලම කියන සෑම දෙයක්ම බොරුයි කියලද ? ඔබේ අදහසේ හැටියට මේ සැඟවුණු අනතුරක් ගැන කතාව, හැන්නම් රහස් කල්ලියක් ගැන කියන ඒව බොරු? බිහිසුණු නිමිත්තය, මැක්ගිනිටි ලොක්කා, ආදී සෑම එකක්ම බොරු ඒවා ? අත්හැර දමා ගිය බයිසිකලය, මළ සිරුර ළඟ තාබීපත ජනෙල් පඩියේ ලේ පැල්ලම, ඔබ නොව නගන උපකල්පනයට ගැලපෙනවා. ඒ වුණත් ඇයි ඇමරිකන් ආයුධයක් ? ඇයි මහ හඬක් නගන පතරෝම් තුවක්කුවක් ? ඔවුන් කොහොමද සියයට සියක් විශ්වාස කරන්නෙ ඩම්බල් ඇහිල කවුරුවත් හොරෙන් කියල ? අර මහ සද්දෙට දොරක් වැහුණු හඬ මොකක්ද කියල බලන්න මෙහෙකාරිය නොපැමිණි එක අහම්බෙන් සිදුවූ එකක්. සමහර විට ඇය එන්න ඉඩ තිබුණා. ඔබ කියන අපරාධකාරයින් ජෝඩුව ඇයි එය මේ විධියට කළේ ?'

'ඒව පැහැදිලි කරන්න හේතු ඉදිරිපත් කරන්න අමාරු බව මං පිළිගන්නවා.'

'ඊළඟට ගැහැනියක් ඇගේ ආදරවන්තයා එක්ක එකතු වෙලා සැමියා මරන්න සැලැසුම් කරනවා. ඒ මනුස්සයා මැරුණු වහාම මගුල් මුද්ද ගළවලා අරගෙන, ඔවුන් අපරාධකාරයො කියන සැකය ප්‍රසිද්ධ කරාවිද? ඊළඟට ඕනෙම ආධුනික රහස් පරීක්ෂකයෙකුට වුණත් තේරෙනවා, පැනල යන අපරාධකාරයෙකුට ඕන කරන පළමුවෙනි දේ බයිසිකලය. ඇයි ඔවුන් බයිසිකලය සඟවලා ඉතුරු කළේ ?

'මට නං කිසි දෙයක් තේරුම් ගන්න බෑ.'

'මේ ඔක්කොම සිද්ධීන් එකට පැටලිලා තියෙන හැටියට

කිසිම මිනිහෙකුට තේරුම් ගන්නවත් තේරුම් කරන්නවත් බැ, මුද්දිය වඩවන ආභාසයක් හැටියට අපි මෙහෙම දෙයක් සිතේ මවා ගනිමු. මේ ඩග්ලස් කියන මනුස්සයාගේ තියෙනවා, ඔහු ලැජ්ජාවට පත්කළ හැකි යම්කිසි අපරාධයක් පිළිබඳ රහසක්. මේ හේතුව නිසා පළිගැනීමට පිටින් ආපු කෙනෙක් ඩග්ලස්ව මරාදමනවා. මට තවමත් තේරුම් කරන්න බැරි හේතුවක් නිසා මේ ඝාතකයා ඩග්ලස්ගෙ මුද්දත් අරගෙන යනවා. මේ පළිගැනීමේ සමහර විට ඩග්ලස්ගේ පළමු විවාහයට සම්බන්ධයක් තියෙන්න පුළුවන්. ඒ නිසයි මඟුල් මුද්ද.

ඝාතකයා පිටවෙලා යන්න කලින් බාකර් හා ඩග්ලස් මහත්මිය කාමරයට ඇතුළු වෙනවා. එතකොට මේ සාහසිකයා තර්ජනය කරනව, ඔහුව අල්ලල පොලිසියට භාරදෙන්න හැදුවොත් මේ ජෝඩුව අතරේ තියෙන රහස් හාදකම් නම් ප්‍රසිද්ධියට පත්කරනවා කියල. ජෝඩුව ඒ තර්ජනයට භයවෙලා ඔහුට යන්න ඉඩ හරිනවා. ඔහුට යෑම පහසුවෙන්න පාලම පහත් කරලා, ගියාට පස්සේ පාලම උඩට ඔසවනවා. ඒක කිසිම සද්දයක් නොදැනෙන්න කරන්න පුළුවන් වැඩක්. යම්කිසි හේතුවක් නිසා ඔහු පැනයන්නේ පයින්. එයේ කාලේ ඒ ක්‍රමය වඩා ආරක්ෂා සහිත වුවත් නිසා විය හැකියි. බයිසිකලය අනෙක් අයට හමුවෙන්නේ, අපරාධකාරයා ආරක්ෂා සහිතව කොහේට හරි පැනගන්නට පස්සෙ. මේ දක්වා අපි කරපු උපකල්පන සිදුවිය හැකි ඒවා. එහෙම නේද ?

" ඔව් එහෙමයි කියමු "

" අපි මතක තියාගන්න ඕන වොට්සන් මෙතන සිද්ධවෙලා තියෙන්නෙ ඉතාම සුවිශේෂ සිදුවීමක්. මේ ජෝඩුව තේරුම් ගන්නවා, ඔවුන් වැරදි කළත් නැතත්, මැදි වෙලා ඉන්නේ උභතෝකෝටික ප්‍රශ්නයකට. මේ අපරාධය ඔවුන් විසිනම සිදු කළා කියල චෝදනාවක් එල්ල වෙන්නත් පුළුවන්. එහෙමත් නැත්නම්, අපරාධය සිදුවෙද්දී ඇස් කන් පියාගෙන, නොදන්නවා වාගේ හිටියා කියන චෝදනාව එල්ල වෙන්නත් පුළුවන්. ඒව බොරු කියල ඔප්පු කරන්න ඔවුනට අපහසුයි.ඒ නිසා බොහොම

ඉක්මනට, නොසැලකිලිමත් ලෙස මේසට පිළියමක් යෙදුවා. අපරාධකාරයා පැනල ගියා කියල පෙන්වන්න, බාකර්ගේ පෙරෙප්පු අඩියේ ලේ ගාලා, ජනෙල් පඩිය මත සටහනක් තැබුවා. පැය බාගයක් විතර ගත කරලා, ඔක්කොම සූදානම් කරල ඉවර වුණාට පස්සේ, අනතුර මේ දැන් සිද්ද වුණා වගේ, සීනුව නාද කරලා සේවකයන්ට දැනුම් දුන්නා.

' ඔබ කොහොමද මේවා ඔප්පු කරන්නෙ ? '

පිටින් ආපු කෙනෙක් ඉන්නවා නම්, ඔහුව සොයා ගැනීමට හැකි විය යුතුයි. ඒකෙන් සියල්ල හොඳින් තහවුරු වෙනවා. නමුත් එහෙම බැරි වුණොත් අපරාධ පරීක්ෂණය සඳහා යොද ගත හැකි සුළු තව තුනක් තියෙනවා. අර කාන්තාර් කාමරයේ තනිවම හැන්දෑවරුවක් ගත කළොත් මට සෑහෙන පිහිටක් වේවි '

' හැන්දෑවරුවක් තනියම ?'

' මං හිතාගෙන ඉන්නේ තව විනාඩියකින් ඒ ඇත්තේ යන්නයි. මං එම්සට ඒ බව දැනුම් දීලයි ආවේ; මිනීහ බාකර්ට ඒ හැටිම කැමැත්තක් නැති හැඩයි. ඒ කාමරේට වෙලා විනාක් වෙලා වාඩිවෙලා ඉඳලා මං බලන්න ඕන, කාරණා ටිකෙන් ටික මට අවබෝධ වෙන්න පටන් ගනීවිද කියලා. වොට්සන් මිත්‍රයා, ඔහේට නං හිනා ! හොඳයි අපි බලමුකෝ. ඒක නෙමෙයි. ඔබ ළඟ තිබුණා නේද ලොකු කුඩයක් ?'

' මේ තියෙන්නෙ '

'මට ඒක ගෙනියන්න දෙන්න පුළුවන්ද ?'

' අනේයි පුළුවනි. ඒ වුණත් අනතුරුදායක සත්ත්වයක් ආවොත් ආයුධයක් හැටියට මේකෙං ඇති වැඩක් ...... '

'නෑ නෑ වොට්සන්. දරුණු අනතුරක් එල්ල වේවි කියල හිතන්න බෑ. එහෙම තිබුණා නං මං ඔබටත් එන්න කියනව නේ. මං මේ තවමත් බලාගෙන ඉන්නේ අපේ රහස් පරීක්ෂකයො දෙන්න එනකං. ඔවුන් ටන්බ්‍රිජ්වෙල්ස් වලට ගියා, බයිසිකලේට

අයිතිකාරයෙක් හොයන්න පුළුවන්ද බලන්න."

මැක්ඩොනල්ඩ් හා වයිට් මෙයින් ආපසු එනවිට රෑ බෝවී තිබිණ. අපේ පරීක්ෂණය ගැන වැදගත් කරුණු රැසක් සොයාගෙන ඔවුන් ආපසු ආවේ ජයග්‍රාහී ලීලාවෙනි.

"මේ සිද්ධියට පිටතින් කෙනෙක් ඇත්තටම සම්බන්ධද කියන එක ගැන මගේ හිතේ ලොකු සැකයක් තිබුණා. දැන් ඉතින් ඒ සැකය නම් ඉවරයි. බයිසිකලයත් අඳුනා ගත්තා. අපට මිනී කරන මිනිහා ගැන විස්තරයකුත් ලැබුණා. ඒක අපට යන්න තියෙන දිගු ගමනේ හොඳ පිම්මක්."

"මටත් හිතෙනවා ඒක අවසානයේ ආරම්භය කියල. මගේ හද පත්ලෙන්ම නැගෙන සුභ පැතුම් ඔබට පිරිනමන්න මං කැමතියි" හෝම්ස් කීය.

"වේල්ලස් මහත්තයා කලින් දවසේ ඉඳල බොහොම කැලැඹීමෙන් හිටියා කියලා ඒමිස් කිව්වනේ. මට හිතුණා මිනිහට ඒ ප්‍රශ්නය ඇතිවෙන්න ඇත්තෙ ටන්බ්‍රිජ් වෙල්ස් වලදී කියල. ඒකත් එද මිනිහ එහෙට ගිහිං ආවේ. අනෙක මිනීමරුවෙක් බයිසිකලයකින් ආව නම් ටන්බ්‍රිජ් වෙල්ස් වලින් ආව කියල හිතන්න හේතු තියෙනවා.

අපි මේ බයිසිකලය අරගෙන ගිහිං, හෝටල් වලින් විමසමින් ගියා. ඊගල් කොමර්ෂල් හෝටලයේ කළමනාකාරයා කිව්වා දින දෙකකට කලින් එහේ නවාතැන් ගන්න ආව හාග්‍රීව් නම් තැනැත්තෙකුට අයිති බයිසිකලය මේක බව. හාග්‍රීව් ළඟ තිබිල තියෙන්නේ, බයිසිකලය සහ තරමක බෑගයක් පමණයි. මිනිහ හෝටලයේ ලියාපදිංචි වෙලා තියෙන්නේ ලන්ඩන් වල ඉඳල ආව කියල. තමුන් ලිපිනයක් දීල නෑ. බෑගයත් එහි අඩංගු දේවලුත් එංගලන්තයේ ඒවා. තමුන් මිනිහ ඇමරිකන් ජාතිකයෙක් බවට සැකයක් නෑ."

"බොහොම හොඳයි. මං මෙහෙට වෙලා මගේ මිතුරත් එක්ක උපකල්පනයන් ගොඩ නංවමින් ඉන්න අතරේ ඔබ දෙදෙනා ඉතා සාර්ථක වැඩ කොටසක් ඉටු කරලා නෙ. ඔබ අපට පාඩමක්

උගන්නනවා මැක් මහත්මයා."

" ඒක හරි හෝම්ස් මහත්මයා."

" හැබැයි මගේ උපකල්පනයටත් මේ පොයා ගැනීම් හොඳින් ගැලපෙන්න පුළුවනි."

මම කීවෙමි.

" ඒක වෙන්නත් පුළුවනි. නොවෙන්නත් පුළුවනි. ඉතිං මැක් මහත්මයා ඔබේ කතාව දිගටම කියන්න. මිනිහව අඳුනාගන්න පුළුවන් කාරණා මොකුත් නැද්ද ?"

"බොහොම ටිකයි. ඒ මොකද අන් අයට ඔහු අඳුනාගැනීමේ ලකුණු ඉතුරු නොකරන්න හැකිවිට උවමනාවෙන්ම පරෙස්සම් වෙලා තියෙනවා. අපි ඔහුගේ කාමරය පරීක්ෂා කළා. ලියුම් කවදාසි මොකුත් නෑ. ඔහුගේ ඇඳුම් වල ලකුණක්වත් නෑ. කාමරේ මේසය උඩ තිබුණා මේ ප්‍රදේශයේ පාපැදි මාර්ග සිතියමක්. ඔහු හෝටලෙන් පිටවෙලා තියෙන්නෙ ඊයෙ, උදේ කෑමෙන් පස්සෙ. ඊට පස්සේ ඔහු ගැන මොකුත් ආරංචියක් නෑ."

"අන්න ඒකයි හෝම්ස් මහත්මයා මට ඇතිවුණු ගැටළුව. ඔහු ගැන ප්‍රචාරයක් උවමනා නැත්නම්, ඔහුට කරන්න තිබුණෙ ආපහු ඇවිත්, සාමාන්‍ය සංචාරකයෙක් වගේ හෝටලේ නැවතිලා ඉන්න එකයි. ඔහු ආපහු ආවෙ නැති එකෙන් වෙන්නෙ ඒ බව හෝටලයේ කළමනාකරු පොලිසියට දන්වන එකයි. එතකොට, ඔහුගෙ අතුරුදහන් වීමත්, මිනීමැරුමත් අතර සම්බන්ධය ගැන පොලිසියත් හොයන්න පටන් ගන්නවා."

" ඔව්. කොහොමටත් එහෙම හිතන්නත් පුළුවනි. කොහොම වුණත් ඔහුගේ උපාය සාර්ථක වෙලා තියෙන බවයි පෙනෙන්නෙ. කෝ තවමත් කවුරුත් අත් අඩංගුවට ගත්ත බවට ආරංචියක් නැහැනෙ. ඔහුගෙ බාහිර පෙනුම ගැන මොනවද විස්තර ?"

මැක්ඩොනල්ඩ් ඔහුගේ සටහන් පොත පරීක්ෂා කළේය.

" අඩි පහයි අඟල් නමයක් පමණ උසයි. වයස පනහක්

පමණි. හිසකෙස් තැනින් තැන සුදු වෙලා. සුදු වෙගෙන යන උඩු රැවුලක්. වක් වූ නාසයක්. මුහුණ බොහොම නපුරු විදිහේ සහ සිතෙන එකක්, එච්චරයි. හෝටලේ සේවකයින් කාටත් එකඟවෙන්න පුළුවන් වුණේ මේ ටිකට විතරයි."

"මුහුණේ විදිය ඇරුණොත් අනිත් විස්තර ටික නම් ඉතින් ඩග්ලස් මහත්තයටත් ගැළපෙනවා. වයස පනහක් පමණ, එම උසමයි, හිස කෙස්, උඩු රැවුල ඒ වගේමයි. තවත් මොනවද ඔබට දැනගන්න ලැබුණේ ?"

"ඔහු ඇඳගෙන සිටියේ ඇගට තදවෙන තාලේ ගනකම් ජැකට් එකක් සහ අළු පැහැති ගත රෙද්දෙන් මැසූ සූට් එකක්. ඊට උඩින් කහ පැහැති කෙටි මිට කබායක් හා රෙදි වලින් තැනූ තොප්පියක් පැළඳ සිටියාලු."

"තුවක්කුව ?"

"ඒක දිගින් අඩි දෙකකටත් අඩුයි. ඔහුගේ බෑගයේ ඒක පහසුවෙන් දාගන්න ඇති. අර කහපාට කෙටි කබාය ඇතුළේ තුවක්කුව අපහසුවකින් තොරව එහා මෙහා ගෙනියන්න ඇති."

"මේ කාරණය කොහොමද අපේ ප්‍රධාන සිද්ධියට සම්බන්ධ වෙන්නෙ ?" හෝම්ස් ඇසීය.

"ඇයි හෝම්ස් මහත්තයා මේ මිනිහ අල්ලා ගත්තම අපේ වැඩේ සම්පූර්ණයි නෙ. ඔහුගේ විස්තර දැනගන්න ලැබිලා මිනිත්තු පහකින් , විදුලි පණිවුඩ මගින් මං ඒක රටපුරාම යැව්වා, දැනටමත් අපි සෑහෙන දුර ගිහිං.

අපි දැන් දන්නවා හාග්‍රීව් කියල කියාගන්න මේ ඇමරිකන් කාරයා ඔහුගේ බෑගයත්, බයිසිකලයත් අරං ටන්බ්‍රිජ් වෙල්ස් වලට ආවා. බෑගයේ තිබෙනවා බඩිය කොට වෙන්න කපපු තුවක්කුවත්. ඔහු ආවේ අපරාධයක් කරන චේතනාවෙන්. ඊයේ ඔහු තුවක්කුව, මිට කබාය අස්සේ රිඳවාගෙන හෝටලයෙන් පිටවෙලා ආවා. ඔහු එනවා කවුරුත් දැක්කෙ නෑ. උද්‍යානයේ ගේට්ටුව

ළඟට එන්න ඔහුට ගම් කරනා ගමන් කරන්න ඕනෙම නෑ. ඒ වගේම පාරේ ඔහු තරම් බයිසිකල් කාරයා යනවා. ඔහු තම බයිසිකලය පඳුරු අතරේ හංගලා, චාල්ස් මහත්තයා එළියට එනතුරු, පඳුරු අතරෙම හිටියා. මේ පතරෙම් තුවක්කුව නිවසක් ඇතුළේ පාවිච්චි කරන්න නොගැලපෙන ආයුධයක් වුණත්, ඔහු බලාපොරොත්තු වෙන්න ඇත්තේ ඒක ගෙයින්, පිටත පාවිච්චි කරන්න. මේ ආයුධයෙන් ඔහුට ලොකු වාසියකුත් තිබෙනවා. එකක් එල්ලය ලේසියට වරදින්නෙත් නෑ. අනෙක සතුන් දඩයම් කරන මේ ගම්බද පළාත්වල මිනෙ ගම්බද කවුරුත් ඒ හැටි ගණං ගන්නෙත් නෑ.

' ඒ සක්සුදකාම හරිම පැහැදිලියි '

'හාමුත් මොකද වුණේ ? චාල්ස් එළියට ආවේ නෑ. ඉතින් මේ මිනිහා මොකක්ද ඊළඟට කරන්නෙ ? බයිසිකලය එහෙමම තියෙද්දී ඇඳිරි වැටෙන කොට බර්ල්ස්ටන් මන්දිරයට ළං වුණා. ඔහු දැක්කා පාලම් පහත් දලා: ළඟපාතක කිසිවෙක් නෑ. හදිසියේ කවුරු හරි හමුවුණොත් මොනවා හරි බොරුවක් කියන්න සූදානම් වෙලා ඔහු කෙලින්ම මන්දිරය ඇතුළට ආවා. කිසිකෙනෙක් හම්බ වුණේ නෑ. දකින්න තිබෙන පළමුවෙනි කාමරයටම ඔහු රිංගුවා. තිරින් තිර රෙද්දක් පිටුපස හැංගුණා.

ඊට පස්සෙ ඔහු දකින්න ඇති පාලම් ඉහළට එසවෙන හැටි. ඔහු තියාගන්නා දිය අගලෙන් එගොඩ වෙලා පැනගන්න. චාල්ස් ඔහුගේ වැඩ කටයුතු ඉවර වෙලා, කාමරයට එනතුරු හාන්සිව බලාගෙන හිටිය, ඒ එකොළහයි කාල වනතුරු. චාල්ස් ආව ගමන් ඔහුට වෙඩි තියලා අපරාධකරුවා පැන ගියා. ඔහු දැනහිටියා බයිසිකලය ගැන විස්තරයක් හෝටල් සේවකයන් පොලිසියට දේවි කියලා. ඒ නිසා ඔහු බයිසිකලය එහෙමම තියන්න ඇරලා, වෙනත් ක්‍රමයකින් ලන්ඩනයට හරි, හැංගෙන්න සූදානම් කරගනිපු තැනකට හරි පිටත් වුණා. ඒ අදහස ගැන මගෙ මොකද කියන්නෙ හෝම්ස් මහත්තයා ?'

' බොහොම හොඳයි මැක් මහත්තයා. ඒ විසඳීම පැහැදිලියි.

හැබැයි මගේ කථාන්තරය මෙතැනින් ඉවරයි. නමුත් මං කථාන්තරය ඉවර කරන්නේ මෙහෙමයි. මේ අපරාධය සිද්ධුණේ දහයයි හතළිස් පහටයි. එකොළහයි කාලට නොවෙයි. ඒ මොකද බාකර් මහත්තයාගෙ සහ ඩග්ලස් මහත්මියගේ කුමන්ත්‍රණයක් තිබෙනවා සාක්ෂිය හංගන්න. එක්කෝ ඔවුන් මිනීමරුවාට පැනලා යන්න ඉඩ හැරියා. නැත්නම් අඩු තරමින් මිනීමරුවා පැනලා යන්න කලින් කාමරයට පැමිණුණා. ඊළඟට ඔවුන් මිනීමරුවා පැනලා ගිය බව පෙන්වන්න ජනෙල් පඩියේ ලේ තවරලා සාක්ෂි ගොතුවා. ඊළඟට මං හිතන්නේ ඔවුන් පාලම පහත් කරලා, මිනීමරුවාට පැනලා යන්න ඉඩ සැලැස්සුවා කියලයි. කථාවේ පළමුවෙනි කොටසට මං දෙන විසඳුම මේකයි.'

'හෝම්ස් මහත්තයා. ඔබ කියන කතාව ඇත්ත නම් අපි එක අභිරහසකින් අඩිය තියන්නේ තවත් අභිරහසකට නොවැ?

'මැක්ඩොනල්ඩ් පැවසුවේ පුදුමයෙනි.

' ඒක කලින් එකටත් වඩා පැටලිලි සහිත එකක්. මේ ගෑනි ජීවිතේටම ඇමරිකාවට ගිහිපු කෙනෙක් නොවෙයි. ඇමරිකන් මිනීමරුවෙකුට රැකවරණ සලස්සන්න තරම්, ඔහුත් එක්ක ඇගේ තියෙන්න පුළුවන් සම්බන්ධය මොකක්ද ? ' ඒ ඇහුවේ වයිට් මේසන්ය.

'මේ ප්‍රශ්න වලට තවමත් හරි හැටි පිළිතුරු නැති බව මං පිළිගන්නවා. අද රෑට මටම විශේෂ ආකාරයෙන් පරීක්ෂණයක යෙදිල බලන්න මං බලාපොරොත්තු වෙනවා. සමහර විට ඒකෙන් මොනව හරි හොයාගන්න පුළුවන් වේවි.

'හෝම්ස් මහත්තයා, අපි එන්නම් ඔබේ උදව්වට ?

' අපොයි එපා ! මට උදව්වට උවමනා කරන්නෙ වොට්සන් මහත්තයාගේ කුඩය සහ අන්ධකාරය විතරයි. අනිත් එක්කෙනා අපේ හිතවත් ඒම්ස්. ඔහුගේ සහයෝගයත් මට ලැබෙනවාට කිසිම සැකයක් නෑ. මගේ සිතුවිලි හැම එකක් ම ගිහිං නතර වෙන්නෙ

එක මුලික ප්‍රශ්නයක් ළඟ. කාය වර්ධන ව්‍යායාම් කරලා ඔහුගේ සරීරයේ හැඩය සකස් කරගන්න හදන මිනිහෙක් ඇයි එක් පැත්තක් පමණක් බරට තියෙන බර ඉසිලීමේ කට්ටලයක් පාවිච්චි කරන්නේ ?'

හෝම්ස් ආපසු පැමිණෙන විට මැදියම් රෑ පසුවී තිබිණ. ඔහු දොර අරින හඬින් මම අවදිවීමි.

'මොනවද හෝම්ස් ඔබට හොයාගන්න පුළුවන් වුණේ ?'

ඔහු ඉටිපන්දම අතින් ගෙන මං අසලින් සිටගෙන සිටියේය.

'වොට්සන් මං ප්‍රශ්නයක් අහන්නම්. ඔබට හය හැද්ද පිස්සෙක් එක්ක එකම කාමරේ නිදාගන්න ? මොළේ නරක් වෙච්ච මිනිහෙක් එක්ක ?'

' පොඩ්ඩක්වත් බය නෑ '

'හැබෑට ? එහෙම නම් කොච්චර වාසනාවන්ද ?' පැවසූ ඔහු යළි එක් වචනයක් හෝ කථා නොකොට නින්දට ගියේය.

# 7

## ගැටළුවට විසඳුම

පසුවද උදෑසන තේ පානයෙන් පසු අපි බර්ල්ස්ටන් පොලිස් ස්ථානය වෙත පිටත්ව ගියෙමු. මැක්ඩොනල්ඩ් හා වයිට් මේසන් දෙදෙනා බරපතල රාජකාරියක නියැලී සිටියහ. ඔවුනට ලැබී තිබුණු ලිපි හා විදුලි පණිවුඩ, රාශියක් මේසය මත ගොඩ ගසා තිබිණ. ඔවුනු ඒවා තේරීමේ යෙදී සිටියහ. එයින් තුනක් ඉතා ප්‍රවේශමෙන් පැත්තක තබා තිබිණි.

" අර කකහං ඊංගලා ගිය බයිසිකල් කාරයා ගැනද තවමත් හොයන්නෙ ? මොනාවද ඒ තක්කඩියා ගැන අලුත්ම ආර්-ංචි ?" හෝම්ස් ඇසුවේ ප්‍රීතිමත් විලසිනි.

" ඔහුව දකින්න ලැබිල තියෙනවා සීප තැනකම. රිච්මන්ඩ්, නොටිංහැම්, සවුතැම්ටන්, ලෙස්ටර්, ඩර්බි සහ තවත් තැන් දහතරක. තැන් තුනක - ලිවර්පූල් ,ලෙස්ටර් හා හැම්ෂයර් වල ඔහු වැරදිකාරයා බව පැහැදිලිවම හඳුනාගෙන, අත් අඩංගුවටත් අරගෙන. කහ කෝට් කාරයින්ගෙන් රටම පිරිල වගේ "

" අනේ මදියනේ ! " හෝම්ස් කීවේ අනුකම්පා සහගත අයුරිනි.

" අපි අර සම්මුතියකට ආව නේ මුලින්ම , මම කැමති ආකාරයකට පරීක්ෂණය කරල මං කැමති විදියට ප්‍රතිඵල ඔබට දෙන්නම් කියල. ඒ නිසා මගේ අසම්පූර්ණ උපකල්පන ඔබට ඉදිරිපත් කරන්න මං කැමති නෑ. ඒ වුණත් මැක් මහත්තයා,වයිට් මේසන් මහත්තයා: මං ඔබට පොඩි අවවාදයක් දෙන්න කැමතියි. ඔය සෙවිල්ල අත්හැර දමන්න ! "

මේසන් හා මැක්ඩොනල්ඩ් දෙදෙනා මේ සුප්‍රසිද්ධ රහස් පරීක්ෂකයා දෙස බලා සිටියේ මහත් පුදුමයෙන් ගල් ගැහුණාක් මෙනි.

'ඔබ කියන්නේ මේ සෙවිල්ලෙන් වැඩක් නෑ කියලද ?'

"ඔබ කියන්නේ මේ පෙට්ටියෙන් වැඩක් නෑ කියලයි. නමුත් සත්‍යය සොයා ගැනීමෙන් වැඩක් නෑ කියල මං කියන්නෙ නෑ."

ඒ වුණත් මේ බයිසිකල් කාරයා ! ඔහු හිතේ මවාගන්න දෙයක් නෙමෙයි ? අප ළඟ ඔහුගේ සම්පූර්ණ විස්තරයක් තියෙනවා. ඔහුගෙ බයිසිකලය? බෑගය ? ඒ යකා කොහේ හරි ඉන්න ඕන. ඉතිං අල්ල ගත්තම මොකද වෙන්නෙ ?"

"ඔව්, ඔව්, ඒක ඇත්ත. ඔහු කොහේ හරි ඉන්න ඕන. අපට ඔහුව අල්ල ගන්න පුළුවන්. ඒකෙ කිසිම සැකයක් නෑ. නමුත් මං කැමති නෑ ඔබ පිටිමඟනිට වලයි ලිවර්පූල්වලයි එහෙ මෙහේ රස්තියාදු වෙනවා දකින්න. මට විශ්වාසයි, ප්‍රශ්නය ලඟාගන්න අපට කෙටි මඟක් තියෙනවා."

"හෝම්ස් මහත්තයා. ඔබ සාධාරණ මොනවා හරි හංගාගෙන ඉන්නවා. ඒක හරි නෑ."

"ඔබ මගේ ක්‍රම ගැන දන්නවනෙ. මං ඒක හංගල තියාගන්නේ ටිකාම කෙටි කාලයයි. මට ඕන කරන්නෙ මට ලැබිල තියෙන තොරතුරු නිවැරදිද කියල ඇත්ත හැර දැනගන්න විතරයි. ඊට පස්සෙ, මං ඔක්කොම ඔබට භාරදීල ලණ්ඩනයට යනවා. මගේ රහස් පරීක්ෂණ ජීවිතයේ මේ වගේ සංකීර්ණ, ඒ වගේම සිත්ගන්නා සුළු වෙනත් පරීක්ෂණයක් ගැන මට නං හිතාගන්නවත් බෑ."

"මට නං මේ මොකවත් තේරුම් ගන්න බෑ, හෝම්ස් මහත්තයා. ඊයෙ රෑ අපි වින්ස්ලිප් පොලිස් ඉඳල ආව වෙලාවෙ ඔබ මොකක්ම කිව්වෙ නෑ. අපේ සොයාගැනීම් ගැන ඔබ ඒකග වුණා. පරීක්ෂණය ගැන දැන් අමුතු අදහසක් දරන්න, ඒ එළිවෙන කොට ඔබට මොකද වුණේ ?"

"හොඳයි ඔබ අහන නිසා කියන්නම්. ඊයේ රෑ මං පැය කිහිපයක්ම ඩර්ල්ස්ටන් මන්දිරයේ ගතකළා."

"ඉතිං මොකද වුණේ ?"

' ඒ ගැන දැනට මට දෙන්න පුළුවන් සාමාන්‍ය පිළිතුරක් විතරයි. බර්ල්ස්ටන් මන්දිරය ගැන පැරණි විස්තර ටිකක් මට කියවන්න ලැබුණා.

පළමුවන ජේම්ස් රජු මවුනු පළඳවලා අවුරුදු පනහට පස්සෙ තමයි මේ මැදුර ගොඩනගලා තියෙන්නේ. මෙන්න අහගන්න. මේ පත්‍රිකාව පුරුවිටු දුම්කොළ කඩයකින් මං මිලට ගත්තේ පැන්සයකට.'

හෝම්ස් කුඩා පත්‍රිකාවක් සාක්කුවෙන් එළියට ඇද්දේය.

' ජැකොබියානු ගෘහ නිර්මාණ ශිල්පය අනුව ඉදිකරන ලද දිය අගල් සහිත පෞරාණික මන්දිර කිහිපයෙන් , කවමක් හොඳින් ආරක්ෂා වී ඇති එක් මන්දිරයකි, බර්ල්ස්ටන් මන්දිරය. මෙම මැදුර... '

'හෝම්ස් මහත්තයා. ඔබ අපට විහිළු කරනවද?'
මැක්ඩොනල්ඩ් ඇසුවේ කෝපයෙනි.

' අයි අයියෝ මැක් මහත්තයා ! ඔන්න ඔබට කේන්ති යනවා. ඔහොම ටිකක් ඉවසන්න.

... ඉතින් ... 1644 දී පාර්ලිමේන්තු කර්නල් වරයකු විසින් මෙම ස්ථානය අත්පත් කරගන්නා ලදී. සිවිල් යුද්ධය පැවැති සමයේ චාල්ස් රජතුමා දින කිහිපයක් මෙහි සැඟවී සිටියේය. පසු කාලයෙක දෙවැනි ජෝර්ජ් රජතුමාද මෙම ස්ථානය නැරඹීමට පැමිණ ඇත '

' ඕකෙං අපට ඇති වැඩේ මොකක්ද හෝම්ස් මහත්තයා?'

' අපට ඇති වැඩේ ? අපට ඇති වැඩක් නැ මෙකෙන් ?මගේ හිතවත් මැක්මහත්තයා. අපේ වෘත්තියේ හැටියට, යමක් පුළුල්ව නිරීක්ෂණය කිරීම අත්‍යවශ්‍යම දෙයක්. හොඳයි ඔබට ඉවසුම් නැති නිසා බර්ල්ස්ටන් මන්දිරයේ ඉතිහාසය කියන එක මම නවත්තන්නම්.

ඊයෙ ඊ මං එහි ගිය බව ඔබට කිව්ව නේ. බාකර් මහත්මයා හෝ ඩග්ලස් මහත්මිය හමුවෙලා ඔවුනට බාධා කරන්න මං අදහස් කළේ නෑ. අනෙක මට දැනගන්න ලැබුණා ඇය ඒ තරම් දුක් දොම්නසකින් කාලය ගත නොකරන බව. එපමණක් නොවෙයි, ඇය රාත්‍රි භෝජනය අඩුවක් පාඩුවක් නැතිව හොඳින් අනුභව කර ඇති බව. මං ගියේ අපේ මිතුරක් ඒම්ස් මහත්තයා හමුවෙන්න. කාටවත් නොකියා කාන්තෝරු කාමරයේ සැඟෙන වෙලාවක් වාඩිවෙලා හිටින්න ඔහු මට ඉඩ සැලසුවා'.

' මොනවා ? අර............ අර............ ඒකත් තිබියදී ?

මට පුදුමයෙන් කෑගැසිණ.

'නෑ නෑ. දැන් ඒ ඔක්කොම අස්පස් කරලා කලින් තිබුණු විදියටම. මං එතැන පැය කාලක් ගතකළා.'

' ඔබ මොකද කළේ ?'

'මං අර බර ඉසිලීමේ උපකරණයේ එක් පැත්තකින් අඳුරුදහන් වුණු යකඩ බර ටික හෙව්වා. අන්තිමට ඒක හම්බ වුණා.'

'කොහේ තිබිලද?'

' හෝ මට තව ටිකක් විස්තර කියන්න ඉඩ දෙන්න. මං ඔබට ඔක්කොම හෙළිකරන බවට පොරොන්දු වෙනවා.' හෝම්ස් පැවසීය.

' ඔබේ කොන්දේසි වලට යටත්වෙන්න අපට සිදුවෙනවා. නමුත් මේ පරීක්ෂණය අත්හැරල දාන්න කියල ඔබ කිව්වාම... මොකක්ද නිසාද අපි මේක අත්හැරල දාන්නෙ ?

'මොකක් නිසාද දාන්නවද? ඔබ තවම තේරුම් අරගෙන නෑ ඔබ මොකක් ගැනද හොයන්නේ කියලා.'

' අපි හොයන්නෙ ජෝන් ඩග්ලස් මරාදැමීම ගැන.'

"ඔව් ඔව් ඒක හැබෑව. ඒ වුණත් අර බයිසිකල් එකේ පැනලා ගිය අද්භූත පුද්ගලයා ගැන හොයන්න කරදර වෙන්න එපා."

"මොනවද ඉතිං අපි දෙන්නාට කරන්න කියන්නෙ ?"

"ඔය දෙන්නා......... ඔව් ඔය දෙන්නා මේ ගම්මානයේ සුන්දර දර්ශන බලන්න ටිකක් ඇවිදින්න යන්න. මට අහන්න ලැබුණා කෙන්ට්, සසෙක්ස් ප්‍රාන්ත වල කොටසක් වැහිල තියෙන ටිල්ට් වනාන්තරයේ ඉතාම සිත්ගන්නා සුළු දර්ශන බර්ල්ස්ටන් මායිමේ ඉඳල නරඹන්න පුළුවන් කියලා. හොඳ හෝටලෙකින් දවාලට කෑම ටිකක් කන්න. මේ පැත්ත ගැන මං වැඩියම දන්නෙ නැති නිසා අහවල් හෝටලේ කෑම හොඳයි කියල නං කියන්න අමාරුයි. ටිකක් ඇවිදලා, හැන්දෑවුණාට පස්සෙ...."

"මනුස්සයෝ ! විහිළු කිරීමෙත් සීමාවක් තියෙනවා !" මැක්ඩොනල්ඩ් කෝපයෙන් කෑගැසීය.

"හොඳයි, හොඳයි, ඔබ කැමැති විදියට දවස ගත කරන්නකෝ. මගේ අවශ්‍යතාවයක් නෑ" හෝම්ස් මැක්ගේ උරහිස මත අත තැබුවේ සුහද ලීලාවෙනි.

"හැබැයි ඇඳිරි වැටෙන්න කලින් මෙහෙදී නොවරදවාම මාව හමුවෙන්න. මැක් මහත්තයා මතකයි නේ. ඇඳිරි වැටෙන්න කලින් නොවරදවාම මාව හමුවෙන්න"

"අන්න ඒ පාර විහිළු විකාර අත් ඇරියා වගේ"

"කොහොම වුණත් ඔබ බාකර් මහත්තයට පොඩි ලියුම් කැල්ලකුත් ලියන්න ඕන. මේ විදියට ලියන්න. පුළුවන්ද ?"

**ප්‍රිය මහත්මයාණෙනි,**

**බර්ල්ස්ටන් මන්දිරය වටා ඇති දිය අගල හිස්කොට, එය පරීක්ෂා කිරීමට මවිසින් තීරණය කොට ඇත. එහි......"**

"ඒක කොහොමවත් වෙන්න බෑ. මං ඒ ගැන හොයල බැලුවා"

'මෙන්න මෙන්න මැක්මහත්තයා... ඔය මං කියන වැඩේ කරන්නකෝ... ලියන්න ලියුම....

**.... අපරාධ පරීක්ෂණය සඳහා ප්‍රයෝජනවත් යමක් එහි තිබීමට ඉඩ ඇතැයි අපි විශ්වාස කරමු. ඒ සඳහා කටයුතු සියල්ල සූදානම් කොට අවසන්. සේවකයන් හෙට උදේ පාන්දරම බයේ දිය පහර වෙනත් පැත්තකට හරවනු ඇත...."**

'කොහොමටවත් වෙන්න බෑ.'

**".... කල්තියා ඔබට දැනුම් දීම සුදුසු යයි මම කල්පනා කළෙමි."**

දැං ඕක අත්සන් කරල හවස හතර වෙනකොට බේකර් මහත්තයාට යවන්න, පණිවුඩකාරුවකු අතේ. ඒ වෙලාවට අපි මෙතනදී හමුවෙමු. මට සහතික කරල කියන්න පිළිවන් මැක්මහත්තයා මේ පරීක්ෂණයේ අවසානයට අපි ඇවිත් ඉන්නේ.'

හවස හතරට හමුවෙද්දී, අපි මහත් උද්යෝගයෙන් සිටියෙමු. එහෙත් පොලිස් නිලධාරීන් දෙදෙනා සිටියේ නොසන්සුන් භාවයෙනි.

'මහත්වරුනි, ඔබට අද බලන්න පුළුවන් මා යම් නිගමන වලට එළැඹිලා තියෙන්නෙ සාධාරණවද කියල. අද බොහොම සීතල හැන්දෑවක, රාජකාරි කරන්න වෙලා තියෙන්නෙ. මං දන්නේ නෑ අපේ පරීක්ෂණයට කොයි තරම් වෙලා ගතවෙයිද කියලා. ඒ නිසා මං ඔබෙන් ඉල්ලා සිටිනවා හොඳ උණුසුම් කබා වලින් සැරසිලා එන්න කියලා. අප යා යුතු තැන්වලට ඇඳිරි වැටෙන්න ඉස්සර වෙලා යන එක බොහොම වැදගත්. එහෙනං පිටත්වෙමු.'

චර්ල්ස්ටන් මන්දිරය වටා විශාල ඉපැරණි උද්‍යානයක් පිහිටා ඇති බව මම ඔබට මුලදී පැවසුවෙමි. මෙම විශාල උයන වටා පිහිටි ආරක්ෂක වැටට පිටතින් අපි ගමන් ඇරඹුවෙමු. සෑහෙන දුරක් ගමන් කළ පසු, වැටට සවිකොට තිබූ කණු කිහිපයක් ඉවත්වීම නිසා සැදුණු කපොල්ලක් අපට දක්නට ලැබිණ. අපි එතැනින් චර්ල්ස්ටන් උයනට ඇතුළුවීමු.

දැන් ඇඳිරි වැටීමට පටන්ගෙන ඇත. අපි හෝම්ස් පිටුපසින්

ගමන් ගත්තෙමු. අන්ධකාරය ක්‍රමයෙන් දැඩිවෙයි. අපි විශාල ගස් වලින් සෙවණ වූ පඳුරු කිහිපයක් ඇති තැනකට පැමිණියෙමු. මෙය පිහිටියේ බර්ල්ස්ටන් මන්දිරයේ ප්‍රධාන දොරටුව හා පාලම ඉදිරිපිටයි. පාලම තවමත් ඔසවා තැබ. අපි පඳුරු අතරේ සැඟවුණෙමු.

'දැන් ඉතින් මොකද කරන්නේ ?' මැක්ඩොනල්ඩ් ඇසුවේ තරමක් නොසතුටු ස්වරයකිනි.

'ටිකක් ඉවසීමෙන් බලාගෙන ඉඳිමු. වැඩි සද්දයක් හෙම නොකර' හෝම්ස් පිළිතුරු දුන්නේය.

'අපි මොකක් නිසාද මෙහාට ආවේ ? මීට වඩා අවංකව කරුණු හෙළිකරන්න හෝම්ස් මහත්මයා'

වයිට් මේසන් ඉල්ලා සිටියේය. ඊට පිළිතුරු වශයෙන් හෝම්ස්ගේ මුවගට නැගුණේ සිනහවකි.

'වොට්සන් කියනවා මම උපතින්ම නාට්‍ය කාරයෙක් කියලා. කලාවට නැඹුරු වූ අදහස් මගෙන් නැත්තෙම නෑ. ඒ නිසා මං වඩා කැමතියි මගේ නාට්‍යය රඟ දක්වීමේදී අධ්‍යක්ෂණය සාර්ථකව කරන්න. අපේ රස්සාව හරිම ඒකාකාරී මහා කම්මැලි එකක් නේ මැක් මහත්මයා. ඉතින් ප්‍රතිඵල ලබා ගැනීමේදී විනෝදාස්වාදයක් ලැබෙන විදියට ජවනිකා සැකසුවේ නැත්නම් ඇති වැඩේ මොකක්ද ? දැන් ඉතින් පොඩ්ඩක් ඉවසමු. ප්‍රතිඵල ලැබෙම ඒවි.

'මං හිතනවා අපි සීතලෙන් වෙවුලලා මැරෙන්න කලින් ඔය ප්‍රතිඵල ඒවි කියලා'

මැක්ඩොනල්ඩ් පිළිතුරු දුන්නේ උපහාසයෙනි.

අපට දීර්ඝ වේලාවක් එලෙස බලා සිටීමට සිදුවිය. දිය අගල සිප ආ සිසිල් සුළඟේ දැඩි සීතල අපේ ඇටකටු වලටද කාවැදිණ. බර්ල්ස්ටන් ගේට්ටුව අසලින් එක් පහනකද, කන්තෝරු කාමරයේ තවත් පහනකද ආලෝකය දිස්විණි. ඒ හැර වටේටම පැවැතියේ

දැඩි ගන අඳුරක් හා නිසලතාවයකි.

'අපට තව කොච්චර වෙලාවක් මේ විදියට ඉන්න වෙනවද? විළහට මොකක් බලන්නද අපි මේ ඉන්නෙ ?' වයිට් මේසන් ඇසුවේ තවත් ඉවසීමට බැරිම තැනයි.

'අපරාධකාරයෝ ඒ ගොල්ලන්ගෙ ගමන් බිමනුත් දුම්රිය පිටත්වෙනවා වගේ කාල සටහනකට කරනව නං අපට හරි පහසුයි. එහෙම නම් තව කොච්චර වෙලා ඉන්න වේවිද කියල මට කියන්න පුළුවනි. මොකක් බලන්නද ඉන්නේ කියල ඇහුව නේ ? අන්න අරහ බලන්න !'

හෝම්ස් එසේ පවසද්දී කාන්තෝරු කාමරයේ ආලෝකය ආවරණය වන සේ කෙනෙකු එය ඉදිරිපසින් පසුකරන අයුරු අපට දකින්නට ලැබිණ. අප සිටියේ කාන්තෝරු කාමරයේ ජනේලයට අඩි සියයකට නුදුරිනි. අන්තිමේදී ජනෙල් පියන විවෘත විය. කිසිවෙකු ජනෙල් කවුළුව තුළින් හිස දමා අන්ධකාරය දෙස බලන අයුරු මඳ ආලෝකයෙන් අපට දිස් විය. තමා කිරීමට යන රහස් වැඩක් ගැන කවුරුන් හෝ බලා සිටින්නේද යන්න පරීක්ෂා කිරීමට මෙන් ඔහු කිහිපවරක්ම වටපිට බැලුවේය.

ඉන්පසු අගලේ වතුර කලතන හඬක් අපට අසන්නට ලැබිණ. ඔහු , තමා අත තිබූ යමක් වතුරට දමා, කිසිවක් සොයන්නාක් මෙන් දිය අගල කුරු ගාන්නට පටන් ගත් බව අපට වැටහිණ. ඔහුට අවශ්‍ය දෙය හමුවූවා විය යුතුය. එක් වරම මසුන් මරන්නකු බිලී බාන්නාක් මෙන්, විශාල වටුම් දෙයක් ඔසවා එය ජනෙල් කවුළුව තුළින් ගෙය ඇතුළට ගත්තේය.

'හරි යමු ! යමු !' හෝම්ස් කෑගැසීය.

අගල හරහා පනවා තිබූ පාලමෙන් වේගයෙන් දිවගොස් සීනුව නාද කළෙමු. දොර වහා විවෘත විය. ඇතුළත සිටියේ ඉමහත් පුදුමයට පත් ඒම්ස්ය. ඔහු පසෙකට තල්ලු කරමින් හෝම්ස් දිවගියේ කාන්තෝරු කාමරයටයි. ලාම්පුවද අතැතිව සිටි සිසිල් බාකර් අප දෙස බලා සිටියේ පුදුමයෙනි.

"මේක යකාගෙ වැඩක් නේ. මොකක්ද මේකෙ තේරුම ? මොකක් පස්සෙන්ද කුඹුසෙල රළුවන්නේ ?"

"මෙන්න මේක පස්සෙන් තමයි අපි රළුවන්නේ, බාකර් මහත්තයා. මම මේ දැන් දිය අගලෙන් බිලී බාගත්ත පොදිය පස්සේ."

"මේක මෙතන තියෙන බව ඔබේ දැනගත්තෙ කොහොමද?" බාකර් හොම්ස්ගෙන් විමසුවේ මහත් පුදුමයෙනි.

"මම ඒක එතැනට දාපු නිසා."

"කුඹුසෙ ඒක එතැනට දාපු නිසා ? කුඹුසේ ?"

"මං ඒක අතපු තිබුණු තැනටම දාපු නිසා කිව්වොත් වඩාත්ම නිවැරදියි. මැක් මහත්තයා මතට මතක නේද අර යකඩ බර අතුරුදහන් වෙච්ච ඒක ගැන මං මවිතයට පත්වුණා. වතුර පිරුණු තැනක් ළඟකම තියෙනවා නම්, බරක් අතුරුදහන් වෙලා නම්, මොනව හරි වතුරේ ගිල්වන්න ඒක යොදගන්න ඇති කියල මම නිගමනය කළා. මට කාමරයට එන්න ඒමිස් උදව් කළා. වොට්සන්ගේ කුඩේ කොක්ක පාවිච්චි කරලා ඊයේ රෑ මට හැකිවුණා, මේ පොදිය දියෙන් ගොඩට අරගෙන පරීක්ෂා කරල බලන්න.

තමුන් මේ පොදිය මුලින්ම මෙතැනට දැම්මෙ කවුද කියන එක සොයාගැනීම වැදගත්ම කාරණයක්. කුමින් දිය අගල හිස් කරන බව දැනුම් දුන්නාම, පොදිය මේක ඇතුලට දාපු පුද්ගලයා කවදාවර වැටුණු තමන් මේක ඉවතට ගන්න බවට සැකයක් නෑ. ඒක කළේ කවුද කියන එකට සාක්ෂි කාරයා හතර දෙනෙක් ඉන්නවා. කුමින් බාකර් මහත්තයා, මේවට උත්තර දීමට දැන් ඔබේ වාරය"

වතුර බේරෙමින් තිබූ පොදිය මේසය මතට ගත් හෝම්ස්, එය ගැටගසා තිබූ නූල ගලවා දමා පොදිය විවෘත කළේය. එහි තිබී මිනු මුලින්ම අතට ගත්තේ බර ඉසිලීමේ කට්ටලයේ යකඩ

බවයි. ඒවා මේසය යටට දැමූ හෝම්ස් විළුඹට යපන්නු කුට්ටමක් අතට ගත්තේය.

“මේ සපත්තු වල ඉදිරිපස ඇඟිලි ආවරණය කරන කොටසේ හැටියෙන් ඔබට අඳුනාගන්න පුළුවන් මේවා ඇමරිකානු ඒවා බව”

ඉන්පසු ඔහු එළියට ගත්තේ කොපුවක අසුරා තිබූ දිගු උල් පිහියකි. අවසන් වශයෙන් එකට ඔතා තිබුණු අළු පැහැති ඇඳුම් කට්ටලයක්, යට ඇඳුම්, මේස් හා කහ පැහැති උඩු කබායක්ද දිග හැරියේය.

“ඇඳුම් නම් ඔහු කැනඩාවෙන් හොයාගන්න පුළුවන් ඒවා. ඒත් මේ කහපාට කබායෙන් නම් වැදගත් කරුණු හෙළිදරව් වෙනවා. ඔබට පෙනෙනවා ඇති, බටය කපා දැමූ තුවක්කුව හංගාගෙන යන්න පුළුවන් විදියට ඇතුළු පැත්තේ සාක්කුවක් මහලා තියෙන හැටි. මේ ලේබලය බලන්න - නීල්, ඇඳුම් මහන්නෝ, වර්මිසා, ඇමරිකා එක්සත් ජනපදය. පාසල් පුස්තකාලයේ පොත් කීපයක් විමර්ශනය කරන්න මට විදුහල්පතිතුමා ගෙන් අවසර ලැබුණා. ඒකෙන් මං දැනගත්තා වර්මිසා කියන්නේ උතුරු ඇමරිකාවේ සුප්‍රසිද්ධ ගල් අඟුරු හා යකඩ ඉල්ලම් හාරන ප්‍රදේශයක පිහිටි කුඩා නගරයක් කියලා.

බාකර් මහත්තයා මට මතකයි ඔබ කිව්වා, ඩග්ලස් මහත්තයාගෙ පළමුවෙනි බිරිඳ ගල් අඟුරු ආකර පිහිටි ප්‍රදේශයක කෙනෙක් කියලා. ඉතින් මට නිගමනය කිරීමට හැකි වුණා V.V. කියන අකුරු දෙකෙන් හැඟවෙන්නේ Vermissa Valley හෙවත් වර්මිසා නිම්නය කියන එක බව. එහෙම නම් මේ මනුස්සයා ඝාතනය කිරීමට නියෝජිතයන් එව පිහිටුණු නිම්නය එයම විය හැකියි. ඒවා බොහොම පැහැදිලියි. ඉතින් බාකර් මහත්තයා දැන් ඔබේ කතාවට බාධා කරන්න මම කැමති නෑ”

මේ ශ්‍රේෂ්ඨ රහස් පරීක්ෂකයා සියල්ල හෙළි කරද්දී සිසිල් බාකර්ගේ මුහුණේ දකින්නට ලැබුණු හැඟීම් රැසකි. කෝපය, විස්මය හා සංත්‍රාසය, පිළිවෙළින් ඇතිවී යළිත් නැතිවී ගියේය.

"ඔබ මිය කර· දේවල් දන්න එකේ ඉතුරු ටිකත් ඔබම කියන්නකො ගොම්ස් මහත්තයා."

මාකර් කථාව ඇරඹුවේ උපහාසාත්මක ලෙසයි.

" කිසිම ප්‍රශ්නයක් නෑ, මට කවත් හුඟක් දේවල් කියන්න පුළුවන්. ඒත් ඒක ඔබේ කටෙන් පිටවුණොත් තමා ඒකේ අලංකාරය තියෙන්නෙ."

" ඔබට කියන්නෙත එහෙමද හැබැට ? මෙතන රහසක් තියෙනවා නං ඒක මගේ රහසක් නෙමෙයි. ඒ නිසා මම ඒක හෙළිකරන කැනැත්තා වෙන්න කැමති නෑ."

" හොඳයි, ඔබ උත්තර දෙන්නෙ ඒ කාලෙවද ? එහෙම නම් අපි වරෙන්තුවක් ලබාගෙන ඔබව අත්අඩංගුවට ගන්න තුරු, අපේ ආරක්ෂාවේ යටතේ රඳවා ගන්න වෙනවා." වයිට් මෙසේ පැවසීය.

" කමුතෙලාට කැමති මිනා ඉටි ලෙසියක් කරගන්නවා" මාකර් නිර්භයව පැවසුවේය.

ඉදිරි ගමන එතැනින් ඇනහිටින බව පෙනෙන්නට තිබිණ. මිනුගේ කටෙන් එක් වචනයක් වත් ලබාගැනීම අපිරු වනු ඇතැයි, ගල් පිළිමයක් මෙන් මුහුණ සාද ගත් මාකර් දුටු මට අවබෝධ විය. අවිවල් කළ දෙර අසාර්න් අපේ කථාවට සවන් දී ඇති එක්ලස් මහත්මිය කාමරයට ඇතුළු වූවාය.

" ඔබ අප වෙනුවෙන් මොනොම දේවල් කළා කිසිල් අනාගතයේදී එයින් මොන මොන ප්‍රතිඵල ලැබුණත් ඔබ අප වෙනුවෙන් නොපැහෙන්න වෙහෙසුණා."

" මට පැහෙන්න මහන්සි වුණා. මිනැවටත් වඩා " ගොම්ස් කීය.

" මගේ අනුකම්පාව සම්පූර්ණයෙන්ම ඔබට හිමි වෙනවා එක්ලස් මහත්මිය. මං මගෙන් ඉල්ලා සිටිනවා මේ ප්‍රශ්නය අප විසඳන්න යන ආකාරය ගැන විශ්වාසය තියන්න කියලා. ඔබේ

කැමැත්තෙන් සියලුම දේ පොලීසියට පහදල දෙන්න. ඔබ දෙස්තර වොට්සන් මාර්ගයෙන් මට යම් කිසි ඉගියක් කළා. ඒ ගැන වැඩිදුර නොහිතා අත්හැර දුන් එක මගේ වැරැද්ද. ඒ වෙලාවෙ මං හිතුවෙ ඔබත් මේ අපරාධයට හවුල්කාරයෙක් කියල. දැන් මට සහතිකයි ඔබ අහිංසක බව. ඒ වගේම ඩග්ලස් මහත්තයටම කියමු ඔහුගේ කථාව කියන්න කියල "

හෝම්ස්ගේ වචන ඇසූ ඩග්ලස් මහත්මිය මවිතය පළකරමින් කෑගැසුවාය.

එහෙත් ඊළඟට ඉමහත් පුදුමයෙන් කෑගැසුණේ මට සහ රහස් පරීක්ෂකයන් දෙදෙනාටයි. එක් වරම අඳුරු මුල්ලක බිත්තිය තුළින් මිනිසෙකු මතුවිය ! ඒ දෙසට හැරුණු ඩග්ලස් මහත්මිය ඒ දෙසට දුවගොස්, දෑතින්ම ඔහුව බද ගත්තාය. බාකර් ඔහුගේ එක් අතකින් අල්ලා ගත්තේය.

" මේ විදිය වඩා හොඳයි ජැක්. මට විශ්වාසයි මේ විදිය හොඳයි කියල " ඇය කීවාය.

අඳුරේ සිට ආ, ඒ අද්භූත පුද්ගලයා ආලෝකයට මුහුණදීමට අපහසු බවක් දැක්විය. ඔහුගේ කඩවසම් මුහුණේ තිබුණේ නිර්භීත භාවය දිස්වන අළු පැහැති නෙත් යුවළකි. පැසීගෙන එන උඩු රැවුලක්ද ඉදිරියට නෙරා ආ නිකටක්ද ඔහු සතුවිය. අප සියලු දෙනා දෙසම මද වේලාවක් පරීක්ෂාවෙන් බලා සිටි ඔහු, ඉන්පසු කෙළින්ම පැමිණියේ මා ඉදිරියටයි. ලිපිගොනුවක් වැනි කඩදසි මිටියක් ඔහු මා අත තැබුවේ මා පුදුමයට පත්කරමිනි.

" මං ඔබ ගැන අහල තියෙනවා වොට්සන් මහත්තයා " ඔහුට තිබුණේ ඇමරිකානු උච්චාරණයකි.

"මෙතැන ඉන්න අයගෙන් ඉතිහාසඥයා ඔබ නේ. ඔබට මේ වගේ කථාවක් කවදාවත් ලියන්න ලැබිල නැතුව ඇති. ඒ ගැන මගේ අන්තිම ඩොලර් එක දක්වා ඔට්ටු අල්ලන්න මං ලෑස්තියි.

මටත් කැමති මිනෑම ආකාරයකට කථාව කියන්න. ඒත් කාරණා ටික මෙච්චයි. මං දැන් දවස් දෙකක් කුටියට වෙලා. එළිය ලැබෙන හැටියට දවල් දවස පුරා මං කළේ ඔය විස්තරය ලියන එකයි. මං මේක සතුටින් පිළිගන්වන්නේ ඔබටයි ඔබේ පාඨකයන්ටයි. බිහිසුණු නිම්නයේ කථාන්තරය මෙන්න මේකයි."

"ඒක ඔබේ අතීත කථාව නේ ඩග්ලස් මහත්තයා. දැන් අපි කැමතියි ඔබේ වර්තමාන කථාව අහන්න" හෝම්ස් කීය.

"එය ඔබට නොවරදවාම කියනවා මහත්තයා."

"මේකෙ අගක් මුලක් මට නං තේරුම් ගන්න බෑ. බර්ල්ස්ටන් මන්දිරයේ ජෝන් ඩග්ලස් මහත්තයා ඔබද ? එහෙම නම් දැන් දින දෙකක් තිස්සේ, හැඩිලා කියලා අපි පරීක්ෂණ පැවැත්තුවේ කාගේ මරණයටද ? ඊළඟට මොන ලෝකෙකින්ද ඔබ මෙහේට පහළ වුණේ ? මට නං පෙනෙන්නෙ ඔබ මහ පොළොවෙන් මතුවෙච්ච භූතයෙක් වගේ !"

"අන්න මැක් මහත්තයා ඔබ අර ඓතිහාසික කථාන්තරය අඩංගු ලියවිල්ල නොකියවූ එකේ වරද !" හෝම්ස් පැවසුවේ දබරැඟිල්ල ඔසවමින්.

"චාල්ස් රජතුමා බර්ල්ස්ටන් මන්දිරයේ හැංගිලා හිටිය එක ගැන එහේ කොයිතරම් හොඳ විස්තරයක් තිබුණද ? ඒ කාලෙ මිනිස්සු ඔහේ ආවට ගියාට හැංගුණේ නැහැ. හැංගෙන්න ඉතාම හොඳ තැනක් හොයාගෙන තමයි එය කළේ . එක සැරයක් පාවිච්චි කළ තැනක් යළිත් පාවිච්චි කරන්න බැරිකමක් නැති බව මං දැන හිටියා. මගේ ලොකු විශ්වාසයක් තිබුණා ඩග්ලස් මහත්තයා ඇත්තෙ මේ වහළ යටමයි. කියල"

"ඉතින් කොයිතරම් කාලයක් අපිව මේ විදියට රැවැට්ටුවද හෝම්ස් මහත්තයා ? පොලිස් නිලධරයා ඇසුවේ කෝපයෙනි.

"ඒක මොහොතකටවත් නෑ. ඊයෙ රෑ තමයි මගේ හිතට මේ ගැන වැටහුණේ. අද හැන්දෑව වෙනතුරු ඒක ඔප්පු කරගන්න

ක්‍රමයක් නෑ. ඒකයි අද ඔබ දෙදෙනාට ගමේ ඇවිදින්න සිහි-පොඩි විවේකයක් ගන්න කිව්වේ. මං මේක මොනවා කරන්නද?

දිය අගලෙ තිබිල ඇඳුම් පොදිය හමුවුණාම මං දැනගත්තා අපට දකින්න ලැබුණු මිනිය කොහොමවත් ඩග්ලස් මහත්තයා ගෙ වෙන්න බැරි බව. එහෙම නම් කාගෙද ඒ මිනිය ? ඒක ටන්බ්‍රිජ් වෙල්ස්වල ඉඳල ආපු බයිසිකල් කාරයාගෙ විය යුතුයි. ඉතින් මට හිතාගන්න සිදුවුණා ඩග්ලස් මහත්තයාට මොකද සිද්ධ වුණේ කියල. බොහොම දුරට ඉඩ තියෙන්නේ ඔහු බිරිඳගේ සහ මිත්‍රයාගේ උදව් ඇතිව මේ ඇතුළේ හැංගිල ඉන්න. ඊළඟට මගේ සිහියට නැගුණේ, ඒ වගේ හැංගෙන කෙනෙකුට අවශ්‍ය පහසුකම් මේ මන්දිරයේ තියෙන බව. ඉතින් ඩග්ලස් මහත්මයා එහෙම හැංගිලා ඇත්තේ එක් විශේෂ හේතුවකට. මොකක්ද ඒ ? මේ කලබලය සංසිඳෙන තුරු ඉඳල ඊට පස්සෙ මෙතනින් පැනගන්න."

"ඔව්, ඔබේ නිගමනය හරි" ඩග්ලස් එහෙම කීය.

"මං දන්නෙ නෑ ඔබේ රටේ - බ්‍රිතාන්‍ය නීතිය අනුව මට හිමිවෙන්නෙ මොන වගේ ඉරණමක්ද කියල. ඒ නිසා මට හිතුණේ මේ සිද්ධියෙන් ඉවත් වෙලා යන එකයි නුවණට හුරු පියවර කියලා. අනෙක් අතට මං පස්සෙන් හැමදාමත් එළවන පිස්සු බල්ලන් රැලෙන් සදහටම ගැලවෙන්න මේ අවස්ථාව යොද ගත හැකි බව මට තේරුණා.

මතක තියාගන්න මහත්තයා. ලැජ්ජා විය යුතු කිසි දෙයක් මං මුල සිට අග දක්වාම කරල නැහැ. අවස්ථාවක් ආවොත් ඒ හැමදේම නැවත කරන්නත් මං පසුබට වෙන්නේ නැහැ. මගේ කථාව කියෙව්වම ඔබට තීරණය කරන්න පුළුවනි මං හරිද වැරදිද කියලා.

මං ඔබට සම්පූර්ණයෙන්ම ඇත්ත කියන්නම්. ඒක මට විරුද්ධව සාක්ෂියක් හැටියට පාවිච්චි කළත් ප්‍රශ්නයක් නෑ. අතීත කථාව ඔක්කොම මේ ලියවිලි මිටියේ තියෙනවා. ඒක ඇහෙන්න දිග කතාවක්. ඒ නිසා මං මෙහෙම පටන් ගන්නම්.

මිනිසුන් කණ්ඩායමක් ඉන්නවා මාත් එක්ක දරුණු වෛරයකින්. ඔවුන් තමන්ගේ අන්තිම ඩොලරය දක්වා වියදම් කරන්න ලෑස්තියි මාව මරා දමන්න. ඔවුන් ජීවත්ව ඉන්න තුරු මගේ ජීවිතේට කිසිම ආරක්ෂාවක් නෑ. ඔවුන් චිකාගෝවේ ඉඳල කැලිෆෝනියාවට මාව හොයමින් මා පසුපස එළවාගෙන ආවා. අන්තිමට මං ඇමරිකාවෙන් පැනගත්තා. ඊට පස්සේ එංගලන්තයට ඇවිත් විවාහ වෙලා, මේ නිස්සබ්ද ගම් පළාතේ පදිංචි වුණා. මං හිතුවේ මෙහෙට වෙලා මගේ ජීවිතේ අවසාන කාලයේ නිදහසේ ඉන්න පුළුවන් වේවි කියලයි.

මං මගේ බිරිඳට කිසිදෙයක් කිව්වේ නෑ. මං මොකටද ඇයව මේකට ගාව ගන්නෙ ? මේ විස්තර දැනගත්තා නං ඇයට සැනසිල්ලේ ජීවත්වෙන්න ලැබෙන්නේ නැහැ. මගේ අතින් සමහර විට වචනයක් දෙකක් කියවිලා ඇති. ඒත් කථාන්තරය මොකක්ද කියල ඇය දැන හිටියේ නෑ. යාන්තම් දැන හිටියත් ඒ තරමටමයි. මේක සිද්ධ වෙච්ච දවසෙ ඔය විස්තර ඔක්කොම තේරුම් කරල දෙන්න වෙලාවක් තිබුණෙ නෑ. දැන්නම් ඇ ඔක්කොම දන්නවා. දැන් මට හිතෙනවා ඇයට ඒව කියල තිබුණා නං වඩා හොඳයි කියලා. එහෙම වුණත් මං ඒ විදියට කළේ වැඩි හොඳටයි.

ඉතින් මහත්වරුනි, මේ සිද්ධිය වුණු දිනයට කලින් දවසේ මම බඩු වගයක් ගැනීමට ටන්බ්‍රිජ් වෙල්ස් වලට ගියා. මට එක් වරම හදිසියේ දකින්න ලැබුණා මිනිහෙක් පාර දිගේ ඇවිද ගෙන යන හැටි. මං ඔහුව දැක්කේ බොහොම යන්තමින්. ඔය වගේ දේවල් බොහොම ඉක්මනට මට පෙනෙනවා. ඔහු කවුද කියල මතක් කරගන්න ඒ බැල්ම මට පැහුණා. ඒ තමයි සතුරන් අතර සිටි මගේ පරම සතුරා. බඩගිනි වුණු ව්‍යාඝ්‍රයෙක් මුවෙකු පස්සේ එළවාගෙන යනවා වගේ ඔහු මා පස්සෙ එළවාගෙන එන බව මං දැන හිටියා. එද මට තේරුණා අනතුරක් අත ළඟ බව. මං ගෙදර ඇවිත් ඒකට සූදානම් වුණා. මං තීරණය කළා තනියම සටන් කරලා මේ ප්‍රශ්නය විසඳා ගන්න. 1876 කාලයේදී එක්සත් ජනපදයේ මගේ මිතුරන් අතර, මං ප්‍රසිද්ධ වෙලා හිටියෙ නිතරම වාසනාව හිමිවන්නෙක් හැටියට. වාසනාව තවමත් මා ළඟ තියෙන

ඒක ගැන මගේ හිතේ කිසි සැකයක් තිබුණෙ නෑ.

ඊළඟ දවසේ මං බොහොම ප්‍රවේශම් වුණා. ගෙයින් එළියට බැහැලා උද්‍යානයටවත් ගියේ නැහැ. එහෙම නොගිය එක හොඳට ගියා. නැත්නං මං ආයුධය ගන්න කලින් ඔහුගේ පහරෙම තුවක්කුවේ වෙඩිපහරකට ගොදුරු වෙනවා සිකුරුයි. හැන්දෑ වෙලාවේ පාලම අහලට එපෙව්වාට පස්සෙ තමයි මගේ හිතට ලොකු සැනසීමක් ආවෙ.

මං හීනෙකින්වත් හිතුවෙ නැහැ ඔහු ගෙට ඇතුල්වෙලා මං එනතුරු සූදානමින් ඉඳීවි කියල. මං පුරුදු විදියට ගේ වටේ ඔහි-පවිත්තා කරලා, ගෙදරට අඳින ලිහිල් කබාය ඇඳගෙන, පුරුදු විදියට කන්තෝරු කාමරයට ගියා. කාමරයට ඇතුළුවුණා විතරයි, මහා අනතුරක් අසලින් බව මට ඉවෙන් වගෙ දැනුණා. මං හිතන්නෙ ජීවිත කාලයක් පුරා දරුණු අන්තරාවන්ට මුහුණ දුන්නු කෙනෙකුට - මං අනිත් අයට වඩා ඒවට මුහුණ දුන්නු කෙනෙක්. එහෙම කෙනෙකුට අනතුරක් ඉව කිරීමේ ශක්තියක් තිබෙනවා. ඒක ඉව වැටුණත් අනතුර මොන වගේ එකක්ද කියන එක මට එක්වරම වැටහුණේ නෑ. හැබැයි එක් ක්ෂණයකින් මම දැක්කා තිර රෙද්ද යටින් බූට් සපත්තුවක්. එතකොට මට තේරුණා වැඩේ.

මගේ අතේ තිබුණා දැල්වපු ඉටිපන්දම. ඒත් සාලෙ ලාම්පුවෙ එළිය, ඇරල දාල තිබුණු දොර නිසා කාමරේ ඇතුළටම වැටිල තිබුණා. ඉටිපන්දම මේසය උඩ සවිකරලා, මං මිටිය ගන්න පැන්නා. මං දැක්කා පිහිතලයක දිස්නයක්. ඒත් ඒකෙන් මට අනින්න කලින් මිටියෙන් පහරක් ඔහුට එල්ල කරගන්න මට හැකිවුණා. ඔහුගෙ ඇගේ කොහේට හරි මිටි පහර වැදෙන්න ඇති. ඒ මොකද පිහිය බිම දිගේ විසිවෙලා ගියා. එක් මොහොතකින් ඔහු කබාය අස්සෙන් තුවක්කුව අරගෙන මට වෙඩි තියන්න සූදානම් වුණා. මං ඔහු වෙතට කඩා පැන්නා. ඔහු කොකා ගස්සන්න කලින් මම තුවක්කු බටයේ එල්ලුණා. ඊට පස්සේ තුවක්කුව උදුරා ගන්න අපි පොර බැදුවා. ඒ සටන මිනිත්තුවක් විතර තියෙන්න ඇති. ඒක තමයි ජීවිතයක් මරණයක් අතර සටන.

තුවක්කුව අත ඇරුණු මිනිහට මරණය. ඔහුටත් තුවක්කුව අත ඇරුණේ නෑ. හැබැයි පොර බැදිල්ලෙදී, එක් නිමේෂයකට තුවක්කු කට ඔහු දෙසට එල්ල වුණා. මං කොහොම හරි සොකා ගැස්සුවා. කාණු පදෙක්ම උණ්ඩ ඔහුගේ මුහුණටමයි වැදුණේ.

ඊට පස්සෙ උණේ මොකක්ද ? මට තේරුණා මං මේ බලාගෙන ඉන්නෙ ටෙඩී බෝල්ඩ්විින්ගෙ මිනිය දිහා බව. එදා ටන්බ්‍රිජ් වේල්ස් වලදී යන්තම්ට දැකලා මට ඔහු හඳුනාගන්න හැකිවුණා. ඒත් මේ තියෙන හැටියට නං එයාගෙ අම්මටවත් ටෙඩී බෝල්ඩ්වින් අඳුනාගන්න ලැබෙන්නෙ නෑ. මිනිස්සු මැරිල තියෙන හැටි මං දැකල තියෙනවා. ඒත් මේක දැකල මට ක්ලාන්ත විගෙන ආවා.

වෙඩි සද්දෙ ඇහිල බාකර් කාමරේට දුවගෙන එනකොට මං හිටියේ මේසේ පැත්තක එල්ලිලා. මගේ බිරිඳ පහළ තට්ටුවට දුවගෙන එන හඬ මට ඇහුණා. ඉක්මනට දොර ළඟට ගිහිං ඇයව නවත්වන්න මට හැකිවුණා. ඒක ගැහැනියකට බලන්න පුළුවන් දර්ශනයක් නොමෙයි. අපි හිතුවා ගෙදර අනෙක් අයත් දුවගෙන ඒවි කියලා. 'නමුත් කවුරුත් ආවෙ නැහැ. අපට තේරුණා මේ කලබලය ඔවුනට දැනුණේ නැති බව.

නියම අදහසක් මගේ හිතට ආවෙ ඔන්න ඔය වෙලාවෙ තමා. මේ බලන්න..'

වයල්ප් නමින් අප හැඳිනගත් තැනැත්තා ඔහුගේ කමිස අතේ කෙළවර උඩට ඇද තම බාහුව අපට පෙන්වීය. මෘත ශරීරයේ අත දුටු කවයක් මැද ත්‍රිකෝණයක ලකුණ - හණ ගැසූ සලකුණ, ඔහුගේ අතේද එම ආකාරයෙන්ම හණ ගසා තිබිණ.

'මේක ඔහුගේ අතේ තියෙනව දැක්කම තමයි මේ අදහස මගේ හිතට ආවෙ. උස, ශරීර ප්‍රමාණය, කොණ්ඩෙ පිස්සොරත් මගේ වගේ. මුහුණ තමි වෙනස්. නමුත් මුහුණ දැන් සීසීකඩ ගිහින්. කවුද මේ යකාව අඳුනන්න පුළුවන් ? මගේ ඇඳුම් ටික ඔහුට අන්දවන්න බාකර්ටයි මටයි ගතවුණේ පැය කාලයයි. ඊට පස්සේ ඔහුගෙ ඇඳුම් ටිකට යකඩ බරකුත් දාල ගැටගැහුවා. මගේ

මිනිය ළඟ දාල යන්න ඔහු ගෙනා කාඩ් පත, ඔහුගෙ මිනිය ළඟ වැටී තිබුණා.

මගේ මුදු ටිකත් ඔහුගෙ අතේ දැම්මා. ඒත් මඟුල් මුද්ද නම් මගේ ඇඟිල්ලෙන් ගොලවන්න බෑ. ඒක දැම්ම දවසට පස්සේ කවදාවත් මඟුල් මුද්ද මගේ අතෙන් ගැලෙව්වෙ නෑ. ගලවන්න ඕන කමක් තිබුණත් කියත් තලේකින් කපල මිසක් ගන්න බෑ. මගේ මඟුල් මුද්ද ටෙඩ් බෝල්ඩ්වින්ගෙ අතේ දාන්න මට උවමනාවක් තිබුණ කියන්නත් බෑ. පැලැස්තර කැබැල්ලක් අරගෙන මගේ මුහුණ කැපිල තිබුණ තැනටම ඔහුගේ මුහුණෙත් ඇලෙව්වා. එතැනදී ඔබට වැරදුණා ෂර්ලොක් හෝම්ස් මහත්තයා. පැලැස්තර කැබැල්ල ගැලෙව්ව නම් ඔබට දකින්න තිබුණා ඊට යටින් තුවාලයක් නැති බව.

ඔන්න ඔච්චරමයි වුණේ. මං බලාපොරොත්තු වුණේ හැංගිල ඉඳලා පස්සේ රටෙන් පැනගන්න. ඊට පස්සේ මගේ 'වැන්දඹුවට' මා ගිය තැනකට එන්න ලැබුණා නම් අපට ජීවිතේ ඉතිරි කාලය හොඳින් ගතකරන්න තිබුණා. මං පණපිටින් ඉන්න තුරු මගේ හතුරෝ උන්ගේ උත්සාහය අත්හැර දාන්නේ නෑ. නමුත් බෝල්ඩ්වින් ඔහුගේ කාර්යය සාර්ථකව ඉටු කළා කියල පුවත් පත් මගින් දැනගන්න ලැබුණා නම් මගේ ප්‍රශ්න සියල්ල අවසන් වෙනවා.

මේ ඔක්කොම ඔහාර්ට්ටයි මගේ බිරිඳටයි තේරුම් කරල දෙන්න ඒ තරම් වෙලාවක් තිබුණෙ නෑ. ඒ වුණත් මට උදව් ගන්න උවමනා පමණට ඔවුන් එය තේරුම් ගත්තා. හැංගෙන ස්ථානය ගැන මං කලින් දැනහිටියා. මේ හැංගෙන තැන ගැන ඒම්සුත් දැන හිටියා. නමුත් මේ වෙලාවෙ ඒක ඔහුගේ ඔළුවට ආවෙ නෑ. මං එතනට වෙලා හැංගිලා හිටියා. ඔහාර් ඉතිරි රාජකාරි හොඳින් ඉටුකළා.

ඔහු ජනේලය ඇරල, ජනෙල් පඩිය මත ලේ පැල්ලමක් සලකුණු කළා. ඊළඟට සීනුව නාද කළා. ඊට පස්සෙ සිද්ධවුණු සියල්ල ඔබ දන්නවා. ඉතින් මහත්වරුනි ඔබ කැමති දෙයක්

කරන්න. මං කිව්වේ සම්පූර්ණ සත්‍යයයි. ඉතින් දෙවියන් වහන්සේගේ පිහිටෙන් මට ලැබේවා. ඉංග්‍රීසි නීතිය යටතේ මගේ ඉරණම මොකක්ද? මං ඒක මගෙන් දැනගන්න කැමතියි.'

මද වෙලාවක නිහඬතාවයක් පැවැතිණි. එය අවසන් කරමින් කථාව ඇරඹුවේ හෝම්ස්ය.

'ඉංග්‍රීසි නීතිය ලෝකයේම සාධාරණ නීතියක්. එහෙත් ඔබට හිරිහැරයක් වෙන්නෙ නෑ. නමුත් මේ නීතිය සොයාගෙනමද ඔබ ජීවත්වෙන නගරය, නීතිය, ඊට අනුව විය යුතු ආකාරය, ඔබ සාසනය කළ යුතු ආකාරය ආදිය දැන සිටියෙ ?'

'ඒක නම් මම දන්නෙ නෑ.'

හෝම්ස්ගේ මුහුණ සුදුමැලි විය.

'කතාව එතැනින් දුරට ගෙන යන්න තැනක් නැහැ වගෙයි එංගලන්ත මහත්තයා. එංගලන්තයේ නීතියටත් ඇමරිකාවේ සතුරන්ටත් වඩා භයානක දේවලට ඔබට මුහුණ දෙන්න සිදුවෙන්න පුළුවනි. ඒ නිසා මගේ අවවාදය හිතට අරගෙන දිගටම නුවණින් වෙන්න.'

ඉතින් මගේ දයාබර පාඨකය, එංගලන්තයේ සසෙක්ස් ප්‍රාන්තයේ බර්ලිස්ටන් මන්දිරයෙන් ඉවත්ව, මා සමග දුර බැහැර ගමනක් යාමට සැරසෙන මෙන් ඔබට ආරාධනා කරමි. ඔබ වර්තමානයෙන් අවුරුදු විස්සක් ආපස්සට ගෙන යාමට මම අදහස් කරමි. එමෙන්ම අපේ ගමන සැතපුම් දහස් ගණනක් බටහිර දෙසටයි. එවිට ඉතාම සුවිශේෂ ආකාරයක බිහිසුණු කථාවක් ඔබට කියන්නම්. එය කොපමණ බිහිසුණු ද යත් විශ්වාස කිරීමටත් අපහසුයි.

එක් කථාවක් කීමට පටන්ගෙන, එය අවසන් නොකොට තවත් එකකට පනිනවා යයි සිතන්න එපා. මීළඟ කොටස කියවා ගෙන යද්දී එය එසේ නොවන බව ඔබට වැටහේවි. මා ඒ පුරාණ තොරතුරු පවසා, ඔබ ඔබේ අභිරහස විසඳා ගත් පසු, බේකර් වීදියේදී අපි නැවත හමුවෙමු.

# දෙවැනි කොටස

## ස්කෝර සංගමය

### 1

### ඔහු

මේ 1875 වසරේ පෙබරවාරි මස හතරවැනි දින සන්ධ්‍යා කාලයයි. හිම කැටිව මෙම පෙදෙසට මෙවර බොහෝ දරුණු ලෙස බලපා ඇත. ගිල්මවින් කළු වැටි හරහා වැටී තිබුණු දුම්රිය මාර්ග පවා හිමෙන් වැසී ගියේය. එහෙත් එවන් වාෂ්ප බලයෙන් ක්‍රියා කළ හිම නගුල් මගින් දුම්රිය මාර්ගය පිරිසිදු කිරීමේ කටයුතු නිතර සිදුකෙරිණි. එහෙයින් දුම්රිය ගමනාගමනය බාධාවක් නොමැතිව සිදුවිය.

පහළ තැනිතලාවේ පිහිටි ස්ට්‍රැන්විල් ගම්මානයත්, වර්මිසා නිම්නයේ ඉහළ කෙළවරේ පිහිටි වර්මිසා නගරයත් මේ දුම්රිය මාර්ගයෙන් සම්බන්ධව විය. එය කළු බෑවුම් සහිත අති දුෂ්කර දුර්ග මාර්ගයක් විය. ගල් අඟුරු ආකර සහ යකඩ නිෂ්පාදනය කළ කර්මාන්තශාලා වලින් මේ නිම්න භූමිය පිරී පැවතිණි. ඒවායේ සේවය කළ කම්කරුවන්ගේ නිවාස වලින් අවට භූමිභාගයද ජනාවාස වෙමින් පැවතිණි.

මෙය පැති දුම්රිය මාර්ගයක් පමණක් විය. එහෙත් මග දෙපස ඉඩ ඇති සෑම තැනකම, අඟුරු මාර්ග පතකා, ගල් අඟුරු හා යපස් පිරවූ ප්‍රවාහණ කැබිරි එක පෙළට ගාල්කර තිබිණ. එය දකින විට එක්වරම සිහියට නැගෙන්නේ ඇමරිකා එක්සත් ජනපදයේ, මේ පාර් කතරේ පොළොව යට සැඟවී, මහා ධන සම්පත් තිබීමේ ආශ්චර්යය ගැනයි. හරිතවන් තැනිතලා, කොළවන්, නිල්වන් ජලාශ ආදියෙන් සපිරුණු පාරවක් තිබී දැක ඇති කිසිවකු, මෙම අඟුරු ගිරි දුර්ග හා වනගත බිම්, වටිනාකමින් පැහැවී ඇතැයි සිහිනෙන්වත් සිතන්නට ඇත්ද ? ගල් අඟුරු හා යකඩ කර්මාන්තය ඇරඹීමත් සමගම හොඳින්ම නුවූණු, ඉතා අසංඛ්‍ය ජන සමූහයක් මේ පෙදෙසට සංක්‍රමණය විය.

දැන් ඇඳිරි වැටෙන්නට පටන් ගෙන ඇත. දුම්රියේ මගීන් ගෙන යන ප්‍රධාන මැදිරියේ ලන්තෑරුම් දල්වන ලදී. එහි මගීහු විස්සක් හෝ තිහක් අසුන් ගෙන සිටියහ. මෙයින් වැඩිදෙනෙකු කම්කරුවෝ වූහ. නිම්නය පහළ තිබූ කර්මාන්ත ශාලා සහ වැඩබිම් වල සේවයේ යෙදුණු ඔවුහු, දවස අවසානයේ නිවෙස් බලා යමින් සිටියහ. මුහුණු ආවරණය වන තරමට හැවරුණු ගල් අඟුරු දූවිල්ල නිසාත්, රැගෙන ගිය ආකර ලන්තෑරුම් නිසාත් ඔවුන් ආකර සේවකයන් බව සිතාගත හැකිවිය. දුම්වැටි දල්වාගෙන එකට එක්වී සාකච්ඡාවේ යෙදී සිටි ඔවුහු, මැදිරියේ එක් කෙළවරක අසුන් ගෙන සිටි නිලධාරීන් දෙදෙනෙකු වෙත වරින්වර අවධානය යොමු කළහ. නිල ඇඳුමින් මෙන්ම, කමිස වල තිබූ ලාංඡන, පදක්කම් වලින්ද මේ පොලිස් නිලධාරීන් බව පහසුවෙන් හඳුනාගත හැකිවිය.

ඉහත කී පිරිසට අමතරව මේ දුම්රිය මැදිරියේ සිටියේ කම්කරු ස්ත්‍රීන් යයි සිතිය හැකි කිහිප දෙනෙකු, සුළු වෙළෙඳුන්ගේ පෙනුමැති දෙතුන් දෙනෙකු සහ තවත් එක් පුද්ගලයෙකි. ආසනයක කෙළවරට වී, කවුළුවෙන් ඉවත බලාගෙන සිටි ඔහු තරුණයෙකි. ඔබේ අවධානය ඔහු වෙත යොමු කිරීම වටී.

මධ්‍යම ප්‍රමාණයේ ශරීරයක් තිබූ මෙම තරුණයාගේ වයස අවුරුදු තිහක් පමණ විය යුතුය. පැහැපත් සමක් තිබූ ඔහු උපැස් යුවළක් පැළැඳ සිටියේය. අසල අසුන් ගෙන සිටි මගීන් දෙස ඔහු වරින්වර විමසිලිමත් බැල්මක් හෙළුවේ, කිසිවක් කතාවක් ගොඩනගා ගැනීමේ අපේක්ෂාවෙනි.

අසලම සිටි කම්කරුවකු සමග කතාබහක් ඇරඹීමට උත්සාහ කළත් ඔහුට ලැබුණේ කෙටි, රළු පිළිතුරු පමණකි. ඉන් කවුළුවෙන් ඉවත බලාගත්තේය. සුපුරුදු නිහඬතාවය රැකීමට අවසානයේ ඔහු තීරණය කළා විය යුතුය.

අඳුර තුළින් දිස්වූයේද එතරම් පියකරු දසුනක් නොවේ. දිගින් දිගටම ගොඩගසා තිබුණේ එක්කෝ යපස් උණුසිරීමෙන් ඉතිරි වූ යබොරය. නැතහොත් ගල් අඟුරු කඳුය. ගල් අඟුරු ආකර

වලින් අහසට විහිදෙන දුම් බට සහ එක ගොඩේ පිහිටා තිබුණු ලැයි පෙළවල්ද ඒ අතර දක්නට ලැබිණ. සෑම දුම්රිය පොළකම ඊස්නකා සිටියේ ආහාර වල සේවය කරන කම්කරු පිරිස්ය.

වර්මියා ප්‍රදේශයේ යකඩ හා ගල් අඟුරු වැඩබිම් වැදගත් මහත්වරුන්ට විවේක සුවය විඳීමට හෝ නැරඹීමට යාමට සුදුසු තැන් නොවේ. හතරවටින්ම දක්නට ලැබුණේ එදවේල සරිකර ගැනීම සඳහා කෙරුණු ජීවන අරගලයයි. කිරීමට තිබුණු වැඩ කොටස ඉතා කර්කශ විය. එම වැඩ කිරීමට සිටියේද එවැනිම කර්කශ මිනිසුන් සමූහයකි.

තරුණ දුම්රිය මගියා නම් මේ පෙදෙසට අමුත්තෙකු බව දක්නට තිබිණ. මැදිරි කවුළුවෙන් ජීවිත දර්ශන ඔහු නැරඹුවේ ඉමහත් උනන්දුවෙනි. විටෙක ඔහු සාක්කුවෙන් පිටු කිහිපයකින් සමන්විත ලිපියක් එළියට ගත්තේය. එය වරින් වර කියවා බලමින් එහිම යමක් සටහන් කළේය. මීළඟට ඔහු ඇතුළත කබායේ සාක්කුවකින් එළියට ගත්තේ සුවිශේෂ භාණ්ඩයකි. එය නම් මෙවැනි සියුමැලි තරුණයෙකු සතුව ඇතැයි බලාපොරොත්තු විය නොහැකි එකකි. ඒ ඉතා විශාල ප්‍රමාණයේ නාවික හමුදා රිවෝල්වරයකි. ඔහු එහි උණ්ඩ තැන්පත් කරන මංජුසාව ආලෝකය දෙසට හරවා කරකවමින්, එහි ඇතුළත පරීක්ෂා කර බැලීය. වෙඩි උණ්ඩ කොපුවල තඹ පැහැය හා දීප්තය පැහැදිලිව පෙනිණි. ඒ අනුව රිවෝල්වරයේ කාණු සියල්ලේම උණ්ඩ පුරවා සූදානම්ව ඇති බව අවට සිටියවුන්ට පැහැදිලි විය. එම ආයුධය ඔහු ඉක්මනින් ඇතුළත සාක්කුවකට දමා ගත්තත් ළඟින් අසුන්ගෙන සිටි කම්කරුවෙකුගේ අවධානයට එය ලක්විය.

'ආයුබෝවන් මිත්‍රයා. ඕහේ නම් ඕනෑම දේකට සූදානමින් නේද ?'

තරුණයා ලැජ්ජාශීලී සිනහවක් පෑවේය.

'අපොයි ඔව්. අපේ ගම් පළාතේ නම් මේක හදිස්සියට ඕන වෙන බඩුවක්'

'කොහේද ඒ ?'

'විශාලගොඩ'

'මේ පළාතට අලුත්කෙනෙක්ද ?'

'ඔව්'

'මහත්ට මෙහෙදිත් ඕක උවමනා වෙන්න ඉඩ තියෙනවා ඉලන්දාරියා'

'හැබෑට ?' තරුණයා විමසුවේ මහත් උනන්දුවෙනි.

'මෙහේ සිද්ධ වෙන දේවල් ගැන තමුසෙට අහන්න ලැබිල නැද්ද ?'

'විශේෂ යමක් අහන්න ලැබිල නෑ'

'මං හිතුව මුළු රටටම ඒක ප්‍රසිද්ධයි කියලා. මහත්ට ඉක්මනට අහන්න ලැබෙයි. මේ පැත්තෙ එන්න හිතුණෙ මොකද?'

'මට අහන්න ලැබුණා, මහන්සි වෙලා වැඩ කරන්න කැමැති කෙනෙකුට මෙහේ රස්සාවක් හොයාගන්න පුළුවන් කියලා'

'මහත් විප්ලවීය සමිතියෙ සාමාජිකයෙක්ද ?'

'ඔව්'

'එහෙනං මහත්ට රස්සාවක් ලැබෙයි. මහත්ට යාළුවො කවුරුත් ඉන්නවද මේ පැත්තෙ ?'

'කවුම නෑ. ඒ වුණත් මට තියෙනවා යාළුවො වගේ ඇසිකාර ගැනීමට පිළිවෙලක්'

'ඒ කොහොමද?'

'මම නිදහස් චින්තන සහෝදරත්ව සංගමයේ සාමාජිකයෙක්. ඒකෙ ශාඛාවක් නැති නගරයක් මේ ඇමරිකා එක්සත් ජනපදයේ නෑ. ඒකෙ ශාඛාවක් තියෙනව නං, එහෙනම් මට මිත්‍රයෝ ඉන්නවා'

එමම ප්‍රකාශයෙන් අනතුරුව බොහෝ කලබල වූ අයුරක් පෙනිණ. දුම්රිය මැදිරියේ ජනෙල් මගින් දෙස මිනු බැලුවේ සැකයෙනි. පනල් කම්කරුවෝ තමන්ගේම සාකච්ඡාවක යෙදී සිටියහ. පොලිස් නිලධාරියන් දෙදෙනා සිටියේ නිදි කිරමින්. තරුණයා හා කතාබහ කළ හැත්තෑත්තා එහා අසුනෙහි හැසිට, තරුණ අමුත්තා අසලටම පැමිණ, එහි හිඳගත්තේය. ඉන්පසු තරුණයා වෙත අත දිගු කළ මිනු,

'දෙන්න අත'

තරුණයා හා වැඩිහිටියා අතට අත දී ආචාර කරගත්හ.

'මට පේනවා ඔබ කියන්නෙ ඇත්ත බව. ඒ වුණත් පරෙස්සම් වෙන එක වැඩිය හොඳයි.' එසේ පැවසූ වැඩිහිටියා ඔහුගේ දකුණු අත, තම දකුණු ඇහිබැම දක්වා එසවීය. තරුණයා ඔහුගේ වම් අත තම වම් ඇහිබැම දක්වා එසවීය.

'අන්ධකාර රාත්‍රිය අප්‍රිය ජනකයි' වැඩිහිටියා කීය.

'ඔව් අමුත්තන්ට සංචාරය සඳහා' තරුණයා පිළිතුරු දුන්නේය.

'ආ... ඒ ඇති. මං තමයි ජකුන්ලන් සහෝදරයා, 341 වැනි ගාඩාව, චර්මිසා නිමිතය. ඔබ හමුවීම ගැන හුඟක් සතුටුයි.'

'ස්තුතියි. මං ජෝන් මැක්මයෝ සහෝදරයා. 29 වැනි ගාඩාව, චිකාගෝව. ගාඩා නායකතුමා ජේ. එච්. ස්කොට්. මේ තරම් ඉක්මනට අපේ සහෝදරයෙක් හමුවෙන්න මං හරිම වාසනාවන්තයි'

'අපේ කාණ්ඩෙට මෙහෙත් හුඟක් ඉන්නවා. චර්මිසා නිමිතයේ තරම් සාර්ථකව අපේ ව්‍යාපාරය පවත්වාගෙන යන්නෙ නැතුව ඇති වෙන කොහේවත්. ඔබ වගේ තරුණයෙක් අපට බොහොම ප්‍රයෝජනවත්. ඒත් ඔබ වැනි හුරුබුහුටි ඉලන්දාරියෙකුට චිකාගෝවේ රස්සාවක් හොයාගන්න අමාරුයි කියන එක අහන්නත් පුදුමයි'

'කොහේද ඒ ?'

'චිකාගෝව'

'මේ පළාතට අලුත්කෙනෙක්ද ?'

'ඔව්'

'ඔහේට මෙහෙදිත් ඕක උවමනා වෙන්න ඉඩ තියෙනවා මූලන්ද්‍රියා'

'හැබෑට ?' තරුණයා විමසුවේ මහත් උනන්දුවෙනි.

'මෙහේ සිද්ධ වෙන දේවල් ගැන කලින්ම අහන්න ලැබිල නැද්ද ?'

'විශේෂ යමක් අහන්න ලැබිල නෑ'

'මං හිතුව මුළු රටටම ඒක ප්‍රසිද්ධයි කියලා. ඔහේට ඉක්මනට අහන්න ලැබේවි. මේ පැත්තෙ එන්න හිතුණෙ මොකද?'

'මට අහන්න ලැබුණා, මහත්තයාලා වැඩ කරන්න කැමැති කෙනෙකුට මෙහේ රස්සාවක් හොයාගන්න පුළුවන් කියලා'

'ඔහේ වෘත්තීය සමිතියෙ සාමාජිකයෙක්ද ?'

'ඔව්'

'එහෙනං ඔහේට රස්සාවක් ලැබේවි. ඔහේට යාළුවො කවුරුත් ඉන්නවද මේ පැත්තෙ ?'

'කවුරුම නෑ. ඒ වුණත් මට තියෙනවා යාළුවො ටිකක් ඇසුරු කර ගැනීමට පිළිවෙළක්'

'ඒ කොහොමද?'

'මම නිදහස් විත්තක ගොඩ්වාර්ත සංගමයේ සාමාජිකයෙක්. ඒකෙ ශාඛාවක් නැති නගරයක් මේ ඇමරිකා එක්සත් ජනපදයේ නෑ. ඒකෙ ශාඛාවක් තියෙනවා නං, එහෙනම් මට මිත්‍රයන් ඉන්නවා'

මෙම ප්‍රකාශයෙන් අසන්නා බොහෝ කලබල වූ අයුරක් පෙනිණ. දුම්රිය මැදිරියේ අනෙක් මගීන් දෙස ඔහු බැලුවේ සැකයෙනි. පතල් කම්කරුවෝ තමන්ගේම සාකච්ඡාවක යෙදී සිටියහ. පොලිස් නිලධාරයන් දෙදෙනා සිටියේ නිදි කිරමිනි. තරුණයා හා කතාබහ කළ තැනැත්තා වහා අසුනෙන් නැගිට, තරුණ අමුත්තා අසලටම පැමිණ, එහි හිඳගත්තේය. ඉන්පසු තරුණයා වෙත අත දිගු කළ ඔහු,

'දෙන්න අත'

තරුණයා හා වැඩිහිටියා අතට අත දී ආචාර කරගත්හ.

'මට පෙනෙනවා, ඔබ කියන්නෙ ඇත්ත බව. ඒ වුණත් පරෙස්සම් වෙන එක වැඩිය හොඳයි.' එසේ පැවසූ වැඩිහිටියා ඔහුගේ දකුණු අත, තම දකුණු ඇහිබැම දක්වා එසවීය. තරුණයා ඔහුගේ වම් අත තම වම් ඇහිබැම දක්වා එසවීය.

'අන්ධකාර රාත්‍රිය අප්‍රිය ජනකයි' වැඩිහිටියා කීය.

'ඔව් අමුත්තන්ට සංචාරය සඳහා' තරුණයා පිළිතුරු දුන්නේය.

'ආ... ඒ ඇති. මං තමයි ස්කැන්ලන් සහෝදරයා, 341 වැනි ශාඛාව, වර්මිසා නිම්නය. ඔබ හමුවීම ගැන හුඟක් සතුටුයි.'

'ස්තූතියි. මං ජෝන් මැක්මර්ඩෝ සහෝදරයා. 29 වැනි ශාඛාව, චිකාගෝව. ශාඛා නායකතුමා ජේ. එච්. ස්කොට්. මේ තරම් ඉක්මනට අපේ සහෝදරයෙක් හමුවෙන්න මං හරිම වාසනාවන්තයි.'

'අපේ කාණ්ඩෙට මෙහෙත් හුඟක් ඉන්නවා. වර්මිසා නිම්නයේ තරම් සාර්ථකව අපේ ව්‍යාපාරය පවත්වාගෙන යන්නෙ නැතුව ඇති වෙන කොහේවත්. ඔබ වගේ තරුණයෙක් අපට බොහොම ප්‍රයෝජනවත්. ඒත් ඔබ වැනි හුරුබුහුටි ඉලන්දාරියෙකුට චිකාගෝවේ රස්සාවක් හොයාගන්න අමාරුයි කියන එක අහන්නත් පුදුමයි'

'එක සරම රජ්ජාවල් නම් එහෙ තියෙනවා...'

'ඉතින් ඇයි එහෙන් ආවෙ ?'

හිස මඳක් ඒ දෙසට දිගු කොට, පොලිස් නිලධරයන් පෙන්වූ මැක්මිලන් සිනාසුණේය.

'අර උන්නැහේල කැමති වෙච්ච එක දැනගන්න'

'ඇයි ප්‍රශ්නද ?' ස්කැන්ලන් ඇසුවේ කෙඳිරිලි හඬිනි.

'බරපතල ඒවා'

'හිරේ යන්න වෙන ඒවාද ? '

'ඊටත් එහා'

'මිනීමැරීමක්........ ?'

'ඕව ගැන දැන්ම කියන්න බෑ, කාරණය මහ ලුහුක් නිසා මට විකාරයෝගෙන් පිටවෙන්න සිද්දවුණා. ඒ වික දැනගන්නම ඔහේට ඇතිනේද ? ඔය වගේ දේවල් හාර අවුස්සල ප්‍රශ්න කරන්න ඔහේ කවුද ?'

තරුණයා පැවසුවේ කෝපයෙනි. ඔහුගේ උපැස් යුවළ පිටුපස පිහිටි අළු පැහැති දෙනෙත් වලින් පිළිබිඹු වූයේ ක්ෂණික කෝපයයි.

'හරි හරි යාළුවා. මහට කේන්ති ගන්න එපා. මගේ මොන වැරැද්දක් කරල තිබුණත්, අපේ සහෝදරයා ඔයාව සතුටින් පිළිගනීවි. දැං ඉතිං කොහේද මේ යන්නෙ ?'

'වර්මිසා'

'ඒ කියන්නෙ වීලහට එන ඇන්ටැනි දුම්රියපොළ.. කොහේද ඔබ නවාතැන් ගන්නෙ ?'

පාක්කුවෙන් ලියුම් කවරයක් එළියට ගත් මැක්මහෝන්, අඳුරු පහනේ ආලෝකයට එය ළං කොට කියවීමට පටන් ගත්තේය.

"මේ තියෙන්නෙ ලිපිනය - ජේකබ් කාල්වර්, කෙවින් වීදිය. විසාගෝවිල මං අඳුනන මිනිහෙක් තමයි මෙතැන රේකම්දරු කළේ. එයා කිව්වා එතැන නේවාසිකාගාරයක් කියලා"

"ඒ ගැන විස්තර නම් මං දන්නෙ නෑ. වර්මිසා වල සිද්දිය ගැන මට ඒ තරම් දැනුමක් නෑ. මං වුන්නේ හොබ්සන්ස් පැච් වල. කොච්චිය දැන් ළං වෙන්නේ එතැනටයි. වෙන් වෙන්න කලින් මං ඔබට පොඩි අවවාදයක් දෙන්නම්. ඉලන්දරියා ඔහේට වර්මිසා වල මොකක් හරි ප්‍රශ්නයක් තියෙනව නම් කෙළින්ම යන්න අපේ සංගමේ කාර්යාලයට, ගිහිං හම්බවෙන්න මැක්ගින්ටි ලොක්කා. එයා තමයි වර්මිසා ශාඛාවෙ නායකතුමා. ජැක් මැක්ගින්ටි චණ්ඩියාගෙ අනුදැනීම නැතිව මේ පළාතේ කිසි දෙයක් සිද්ධ වෙන්නෙත් නෑ. සිද්ධ වෙන්නත් බෑ. එහෙනම් අපි හැන්දෑවෙලා වක, සංගමේ කාර්යාලයේදී නැවත හමුවෙමු. මතකයි නේ මං කියපු දේ. කරදරයක් නං මැක්ගින්ටි ලොක්කා හම්බවෙන්න"

ස්කැන්ලන් දුම්රියෙන් බැස ගියේය. මැක්මහෝන් යළිත් තනිවම කල්පනා කරන්නට පටන් ගත්තේය. දැන් සම්පූර්ණයෙන්ම ඇඳිරි වැටී ඇත. යපස් පිරිසිදු කොට, ලෝදිය පසාපන කම්හල් වල උදුන් වලින් නැගෙන ගිනිජාලා මගින්, තැනින් තැන ආලෝකමත් වී ඇත. ගල් අඟුරු ආකර වල ඉල්ලම් පොළොව මතුපිටට ගෙනෙන දඹරයේ යකඩ දම්වැල් එකට ගැටෙන විට නිකුත්වෙන හඬ මහා කන්දෙස්කිරියාවකි. එයද නොනැවතී ඇසෙයි.

"මං හිතන්නේ අපායත් ඔය වගේ ඇති"

යමෙකු පවසනු ඇසිණ. හැරී බැලූ මැක්මහෝන් දුටුවේ ගිනිජාලා දෙස බලා සිටිනා පොලිස් භටයෙකි.

" ඒ වුණත් අපි මෙහේ දන්නා හඳුනන හොර තක්කඩින්, මිනීමරුවන්ට වඩා දරුණු යමපල්ලෝ ඒ අපායෙ ඉන්නවද කියන

එක මට නං අවිශ්වාසයි. ඉලන්දාරියා...... තමුසෙ මේ පළාතට අලුත්කෙනෙක් වගේ ?

'ඔව් මං අලුත්කෙනෙක් තමා. ඉතිං තමුසෙට මොකද ?'

මැක්මිලන් පොලිස් භටයාට පිළිතුරු දුන්නේ කිසිදු ගරු සරුවක් නොමැතිවයි.

'ඉලන්දාරියා. මෙන්න මේකයි තමුසෙට දෙන්න තියන අවවාදෙ. මෙහෙදි යාළුවො තෝරගන්න කොට විතක් පරිස්සම් වෙනවා. මයික් ස්කැන්ලන් හරි එයාගේ කල්ලියෙ අය හරි යාළුවො හැටියට තෝරගන්න එක නං ඒ තරම් නුවණට හුරු වැඩක් නෙමෙයි.'

'මගේ යාළුවො කවුරු උණාම තමුසෙට මොකද ?'

මැක්මිලන් කෝපයෙන් කෑගැසුවේය. දුම්රිය මැදිරියේ සිටි සියල්ලන්ගේම අවධානය ඔහු වෙත යොමු විය.

'මං ඇහුවද මිටි තමුසෙලාගෙන් යාළුකමට ගන්න හොඳ කවුද කියල ? එහෙම නැත්තම් තමුසෙලා හිතන්නෙ, මං තමුසෙලාගෙ උදව් නැතුව ඇවිද ගන්න බැරි කැදයෙක් කියලද? තමුසෙලා ගෙන් මොනව හරි ඇහුව නම් ඒකට උත්තර දෙනවා, නැත්තං කටවහගෙන ඉන්නවා. මං තමුසෙලාගෙන් මොනව හරි අහව් කියලද හිතාගෙන ඉන්නෙ ? දෙයියම්පා ! ඒකට නං සෑහෙන කලක් ගතවෙයි.'

පොලිස් භටයා වහා මුහුණ දිගු කරමින් ඔහු දත් විලිස්සාගෙන කෑගැසුවේ ගොරවන බල්ලෙකු ලෙසයි.

තමන් හිත හොඳින් දුන් අවවාදයට මෙසේ කෝපයෙන් කඩා පැනීම ගැන, යහපත් ගතිගුණ තිබූ පොලිස් නිලධාරියෝ පුදුමයට පත්වූහ.

'ඔහේත් එක්ක තරහට කිව්ව දෙයක් නෙමෙයි මිත්‍රයා. ඔහේ මේ පළාතට අලුත් කියල අපට පෙනුණා. ඔහේගේ වැඩි හොඳටයි අපි ඒ උපදේශය දුන්නෙ'

"මං මේ පළාතට අලුත් බව ඇත්ත. ඒත් තමුසෙලාටත්, තමුසෙලාගෙ පොලිස් කමුදාව ඒත් මට අලුත් නෑ" මැක්මහෝන් යළිත් ගෙරෙව්වේය.

"පොලීසිය කියන්නේ කොහෙත් එකයි. සාටවත් ඒවා ඕන කරන්නෙ නැති වෙලාවට එනවා උපදෙස් දෙන්න...."

"මං හිතන්නේ වැඩි දවස් යන්න කලින් අපට මිනෙව් මුණ ගැහේවි. මට පේන්නෙ හැටියට නම් ඔහු බොහොම විශේෂ කෙනෙක්"

එක් පොලිස් භටයෙක් කීය.

"මටත් එහෙම හිතුණා. ළපටිම කමුරැවෙඩු ආයෙත්."

අනෙක් භටයා ඇවිසීය.

"මං තමුසෙලාට භය නෑ. අන්න ඒක මතක තියාගන්නවා. මගේ නම දැන් මැක්මහෝන් සේර්ජන්ට්ද ? තමුසෙලාට මාව හම්බවෙන්න ඕන නං එනවා වරමිසාවට කෙටියෙන් විදියට. මං නවතින්නේ ජේසන් ආප්ටර්ගේ තට්ටුවේ. මං තමුසෙලාට නොපෙනෙන්න හැංගෙන්නෙ නෑ. මියි. ඒ නම්, දවල් නම්. මං ලෑස්තියි ඕන වෙලාවක මුහුණට මුණ හම්බවෙන්න. ඒ ටික හොඳට මතක තියාගන්නවා"

අමුත්තාගේ නිර්භීත හැසිරීම ගැන පතල් කම්කරුවෝ පුදුමයෙන් කසුකුසු ගෑමට පටන් ගත්හ. සමහරු අමුත්තාට අනුකම්පා කළ අතර සමහරු නිර්භීත ක්‍රියා පිළිවෙත අගය කළහ. පොලිස් භටයෝ මිටුනොවුන් අතර කතාබහ යළි ඇරඹූහ.

මිනිත්තු කිහිපයකට පසු දුම්රිය, නැවතුම් පොළට ළඟා විය. වරමිසා, මෙම මාර්ගයේ පිහිටි ප්‍රධානම නගරයයි. බොහෝ දෙනෙක් දුම්රියෙන් බැසීමට සූදානම් වූහ. මැක්මහෝන්ද තම මල්ල කරේ දමාගෙන දුම්රියෙන් බැස්සේය. ඔහු වෙත පැමිණි පතල් සේවකයෙක් මැක්මහෝන්ගේ පිටට තට්ටු කළේය.

'අහන්නත් සන්තෝසයි යාළුවා ! පොලිස් කාරයොන්ට කථා කරන්න ඕන හැටි තං ඔයත් හොඳට දන්නවා.' ඔහු මැක්මහෝන් ඇමතුවේ ගරුසරු ඇතිවයි.

'මගේ කථාකරන හැටි අහගෙන ඉන්න, මට ආස හිතුණා. කෝ දෙන්න ඔය මල්ල. කාල්ටර්ගේ බෝඩිමට යන පාර මං පෙන්වන්නම්. මාත් ගෙදර යන්නෙ එතනින් තමයි.'

පතල් කම්කරුවෝ සැහෙන ගණනක් මිතුසිලි අයුරින් මැක්මහෝන්ට 'සුභ රාත්‍රියක්' පැතුහ. වර්චිපාරේ අඩියක් තැබීමටත් පෙර මැක්මහෝන් නම් මේ ප්‍රචණ්ඩකාරී තරුණයා, එහි සුවිශේෂ චරිතයක් බවට පත්ව හමාරය.

මෙම නිම්න බිම නිෂණය අරක්ගත් පෙදෙසකි. නගරයේ සිතුගේ සිත් වඩාත් කලකිරවන දසුනකි. විශාල කර්මාන්ත ශාලා වල උදුන් වලින් අහස උසට ඇදෙන ගිනි ජාලා සහ යෝධ දුම්බට වලින් පිටවූ දුම්රැගුවෙන් යම්කිසි චමත්කාර ජනක ස්වභාවයක් ඇතිවූ බව සැබෑය. එහෙත් නගරය පුරා දැකිය හැකිවූයේ අපිරිසිදු කම හා දිළිඳුකමයි. දියවෙන හිම හා මිශ්‍ර වූ දූවිලි වලින් වීථි පුරා මඩගොහොරු පැදී තිබිණි. ගෑස් ලාම්පු වලින් මහ දෙපස ආලෝකමත් විය. එහෙත් එයින් පෙන්වා දෙනු ලැබුවේ, ලැලි වලින් තැනූ මුඩුක්කු ගෙවල් වල අපිරිසිදු ආලින්ද පමණයයි.

නගරය මධ්‍යයට පැමිණෙද්දී ඔහුට දක්නට ලැබුණේ හොඳින් ආලෝකමත් කොට තිබූ කඩ සාප්පු පේළියකි. ඒ සමගම විශේෂ මත්පැන් පානය කළ හැකි තැබෑරුම් හා දූ කෙළියෙහි යෙදිය හැකි සූදු පොළ වල අඩුවක් නොවීය. පතල් කම්කරුවෝ ඉතා මහන්සියෙන් උපයාගත් මුදල් විශාල වශයෙන් මෙම තැන් වලට පූජා කළහ.

'අර තියෙන්නෙ සංගම් කාර්යාලය' මහ පෙන්වන්නා කීවේ විශාල තැබෑරුමක් පෙන්වමිනි. එය මත්පැන් හලකට වඩා විශාල හෝටලයක් යයි සිතිය හැකි තරමට පෙනුමෙන් සමාන විය.

'ජැක් මැක්ගිනස් තමයි එතැන ලොක්කා'

'මිනිහ මොන වගේ කෙනෙක්ද ?'

'මොනවා? තමුසෙ මැක්ගින්ටි ගැන අහල නැද්ද ?'

'ඔහේ දන්නවනේ මං මේ පැත්තට අලුත්කෙනෙක් බව. ඉතිං මං කොහොමද මෙහේ ලොක්කො ගැන දන්නෙ ?' මැක්මඩෝ පිළිතුරු දුන්නේය.

'ඒකත් හරි තමයි. ඒ උණත් මං හිතුව මිනිහගෙ නම රට පුරාම ප්‍රසිද්ධයි කියල. එයා ගැන ඔය පත්තර වලත් නිතර නිතර සඳහන් වෙන්නෙ'

'මොනව සම්බන්ධයෙන්ද ?'

'ඇයි........ ?' පතල්කරුවා කටහඬ මඳක් බාල කළේය.

'.............. වැඩ කටයුතු ගැන'

'මොන වැඩ කටයුතුද ?'

'දෙයියෝ සාක්කි ! උන්නැහේ තමුසෙ නං හරි පුදුමාකාර මිනිහෙක්. මේ පළාතෙ තියෙන්නෙ එකම ජාතියක වැඩ කටයුතු විතරයි. ඒ තමයි ජගාර සංගමයේ වැඩ කටයුතු......'

'මට මතකයි ජගාර සංගමය ගැන මං චිකාගෝවෙදී පත්තරවල කියෙව්වා. මිනීමරුවො කල්ලියක් නේද ?'

'ෂට් ! ෂට් ! තමුසෙගෙ කට පරෙස්සම් කර ගන්නවා' අනෙකා අනතුරු ඇඟෙව්වේ මැක්මඩෝගේ කටෙන් පිටවූ වචන වලට භයෙන් ත්‍රස්ත වෙමිනි.

'පාර තොටේදී ඔය විදියට කතා කළොත් තමුසෙට වැඩිකල් පණපිටිං ඉන්න ලැබෙන්නෙ නෑ මෙහේ. මීට වඩා සුළු දේවල්වලටත් මිනිස්සු මැරෙනකං ගුටිකාල තියෙනව මේ පළාතෙ'

'ඒ ගොල්ල ගැන මං මොකුත්ම දන්නෙ නෑ. පත්තරේ කියවන්න ලැබුණු දෙයක් තමයි මං කිව්වෙ'

'මං කියන්නෙ නෑ ඔහේ කියපු දේවල් බොරු කියල' ඔහු

වටපිට බැලුවේ නම් කතාවලට සවන් දෙන කිසිවකු ළඟක සිටීදැයි සැක හැරගැනීමටය.

"මිනිස්සු පරලොව යවනවා කියන එකට නියම වචනෙ මිනීමැරුම් නම්, ඒක මෙහේ තියෙනවා. මින තරම්. වැඩිත් එක්ක දෙවියොත් දන්නවා ඒක. ඒත් අලුතෙන් ආපු මහත්තයා, මිනීමරන එක සම්බන්ධයෙන් නම්, ඇත් මැක්මින්ට්ගෙ නම ගැටෙන්න කුස්මෂ්ටින් පිටකරන්න එපා. කටින් පිටවෙන මිනාම කොඳිරිල්ලක් ගිහිං හටකින්නෙක ඔහුගේ කනේ. මැක්මින්ට් කියන්නේ ඒව අමිනක කරල දන මිනිහෙක් හෙම නොවෙයි.

මගේ කොයක චවාකෑන් පොල අන්න අරක. එකෙ අයිතිකාරයා ජේකබ් ගොල්ඩර්. මේ ටවුමෙ ජීවත්වෙන අවංකම මිනිස්සු අතර ජේකබ් ගොල්ඩරුත් එක්කෙනෙක් කියල ඔබට තේරුම් ගන්න ලැබේවි."

"හොඳයි එහෙම නම්. ඔබට බොහොම ස්තූතියි."

ඔහුගෙන් සමුගත් මැක්මබෝ, සිඩ්‍රු මල්ලද කරට ගෙන කුස්මන් ගම්තින් හොය් නේවාසිකාගාරයේ දොරට තට්ටු කළේය.

දොර එක්වරම විවෘත විය. එහෙත් දොර විවෘත කළේ ඔහු බලාපොරොත්තු වූ ආකාරයේ කෙනෙකු නොවේ. ඒ තරුණ කාන්තාවකි. ලුහුරු පැහැයට හුරු රන්වන් කෙස් කළඹක්ද, කළු පැහැති දෙනෙත් යුවළක්ද සතු, ඉතා සුරූපී තරුණියක වූ ඇයගේ කිලුණේ, ජර්මන් පරපුරකින් පැවත එන පෙනුමකි. ඇය දුටු මැක්මබෝට සිතුණේ මෙතරම් සුන්දර සිතුවමක් තමා කවදාවත් දැක නැති බවයි. මබේ පිළුණු අලංකාර පුෂ්පයක් දුටුවාක් මෙන් මැක්මබෝ පුදුමයට පත්විය. ඔහුට කතාකර ගැනීමට පවා නොහැකි විය. නිශ්ශබ්දතාවය බින්දේ ඇයයි.

"මං හිතුව දොරට තට්ටු කළේ කාන්තා කියල" ඇය පැවසුවේ ජර්මන් බසට හුරු උච්චාරණයක්ද සහිතවයි.

"ඔබ ආවේ කාන්තා හමුවෙන්නද ? ඔහු නගරයට ගියා. දැන් ළඟ එනවා ඇති"

'නෑ, හදිස්සියක් නෑ. කොහොත් මට රෙකමදරු කළා නවාතැන් ගැනීමට මේ ගෙදර හොඳයි කියලා. දැන් මට පෙනෙනවා මිනුගේ කථාව ඇත්ත බව'

'ඔබ බොහොම ඉක්මනට තීරණ ගන්නවා'

ඇය පැවසුවේ සිනාමුසු මුහුණෙනි.

'ඇස් නොපෙනෙනා අන්ධයෙක් හැර වෙන ඕනෙම කෙනෙක් ගන්නේ ඒ තීරණයයි'

'එන්න මහත්තයා ගේ ඇතුළට. මම එමී කාර්ටර් ජෙනෙවිය - කාර්ටර් මහත්තයාගේ දුව. මගේ අම්මා මිය ගිහින්. හෝටාසිකාගාරයේ වැඩකටයුතු ඔක්කොම බලාගන්නේ මං තමයි. තාත්තා එහාතුරු දුස්තර්න කාමරේ තිබී උදන ලගින් වාඩිවෙන්න. ආ......... මිය ගිහ්ගෙ තාත්තා. දැන් බැරිය මුහුත් එක්ක කතාබහ කරගන්න.'

නරඹාරු සිරුරක් ඇති වයස්ගත කාර්ටර් මහතා ගෙට ඇතුළු විය. තමාගේ අවශ්‍යතාවය ගැන අමුත්තා ඔහුට දැනුම් දුන්නේය.

'මේ හෝටාසිකාගාරය මට රෙකමදරු කළේ විකාගෝවේ මටි කියල මනුස්සයෙක්............'

'මං කැමතියි ඔබට නවාතැන් දෙන්න. හැබැයි මගේ කොන්දේසි වලට එකඟ වෙනව නම්. දුඹුම් බීමම සහ කෑම බීම ගාස්තුව සතියට ඩොලර් හතයි. ඒක සතිය මුලදීම ගෙවන්න ඕන. තවත් තීති තියෙනවා......'

මිනුගේ සියළුම කොන්දේසි වලට මැක්මෙඩෝ එකඟවිය. සතියක මුදල් විගසම ගෙවීය. ඔහුට මුදල් අගහිගයක් තිබූ බවක් නොපෙනිණි.

නීතියේ රැහැණට අසුනොවීමට පළා යන බව දුම්රියේදී හෙළි කළ ජැක් මැක්මෙඩෝ, ජේකබ් කාර්ටර්ගේ හෝටාසිකාගාරයේ මෙසේ නවාතැන් ගත්තේය.

2

# නායක තුමා

මැක්මයෝර්, ගිය මිතුම නැනත තැපී පෙනුණු අයෙකි. සතියක් ගතවීමටත් පෙර කාල්ටර්ගේ නවාතැනේ ජනප්‍රියම නේවාසිකයා වූයේ මේ තරුණයායි. මේ ස්ථානයේ නේවාසිකව සිටි දහදෙලොස් දෙනා, කර්මාන්තශාලා හා වෙළඳ ආයතන වල සේවය කළ සාමාන්‍ය ලිපිකරුවෝ වූහ. හැන්දෑ කාලයේ නවාතැනේදී හමුවූ විට සතුටු සාමීචියේ යෙදීම ඔවුනගේ සිරිත විය. එවැනි වේලාවල මියුරුම හඬින් ගීයක් ගැයීමට හැකියාව තිබුණේ මැක්මයෝර්ටයි. කවුරුත් ප්‍රබෝදයට පත්කරන, විහිළු කතාවක් ඔහුගේ මුවේ නිතරම සූදානමින් තිබිණ. වචනවම සිත් ඇදගන්නා සුළු, ආශිය කථා කියමි පුතියා වූයේද මැක්මයෝර්මය.

කෙසේ වෙතත් ඔහු ඉතා ඉක්මනින් කෝපයට පත්වන්නෙක් බව කාල්ටර් නිවසේ වැසියන්ට දැන ගන්නට ලැබිණ. නීතියටත්, එය ආරක්ෂා කරන පොලිස් නිලධරයන් කෙරෙහිත් ඔහු දැක්වූයේ දැඩි පිළිකුලකි. එය සමහරුන්ගේ සතුටට හේතු වුවත් අනෙයෝ ඉන් අපමණ කයට පත්වූහ.

කාල්ටර් මහතාගේ දියණියගේ රූප ශෝභාව ගැන සියල්ලන්ම ඉදිරියේ වර්ණනා කිරීමට මැක්මයෝර් පසුබට නොවීය. ඇය දුටු පළමු දිනයේම තමා වශීවූ බව හේ පැවසීය. දෙවැනි දිනයේදී ඔහු එවී කාල්ටර්ට තම ආදරය ප්‍රකාශ කළේය. ඔහු අධෛර්යයට පත් කිරීමට කාල්ටර් මෙනෙවිය පැවසූ දේ අප්‍රමාණය. එහෙත් මැක්මයෝර් කොයෙි එය ගණනකටවත් ගත්තේ.

'ඇයි එවී වෙන කවුරුත් ඉන්නවද ඔයාගෙ අත ගන්න බලාගෙන ? ඒ වෙන කවුරුත් එක්කෙනා නම් පුදුම අවාසනාවන්තයෙක්. එයාට කියන්න වෙන කවුරු හරි හොයා ගන්න කියලා. ඒ වෙන කවුරුවත් එක්කෙනා නිසා, මගේ හදවත දිනාගත් ඔයාව අමතක කරන්න කියලද එවී කියන්නෙ ? ඔයා ඕනෙ තරම් බෑ, බෑ, බෑ, කියන්න. ඔයා ඔව් කියන දවසකුත් එවි. එතෙක් මං බලාගෙන ඉන්නම්. මං තවම තරුණයි. මට තව ඕන

කාලයක් මලාගෙන ඉන්න පුළුවනි" මැක්ස්වෙල් නැවත නැවතත් කීවේය.

අයිරිෂ් ජාතිකයන්ට උරුම, මුඛරි කමින්, අන් අයගේ සිත් දිනා ගැනීම සඳහා චාටු බස් පැවසීමට හැකියාවක් මැක්ස්වෙල්ට නොඅඩුව තිබිණි. නොයෙක් දේශවල සංචාරය කිරීමෙන් ඔහු ලද අත්දැකීම් හා ඔහු වටා ඇති අබිරහස් ස්වභාවය, එවීගේ සිත් ඇදගැනීමට වැඩි පුළුපුකමක් විය. ඔහුගේ ගම වූ අයර්ලන්තයේ බොහෝ ප්‍රාන්තයේ සුන්දර මිටියාවත් හා නිල්වන් කඳුපෙත් ගැන ඔහු කළ විස්තර ඇය අසා සිටියේ ඉතා ආශාවෙනි. මේ හැම දෙයකින්ම එවී ෆාල්ට්රිගේ ආදරය වියතෙන් වීසා දිනා ගැනීමට මැක්ස්වෙල් සමත් විය.

"එවී, ඔයා ගිහිං තියෙනවද, ඇමරිකාවේ උතුරේ තියෙන ප්‍රාන්ත වලට ?"

"නෑ"

"මං කාලයක් මිච්ගන් වල ජීවත්වුණා. ඊට පස්සේ මං හිටියේ චිකාගෝ වල. ඩිට්‍රොයිට් වලට උතුරෙන් තියෙන නගර හැම එකකටම මං ගිහින් තියෙනවා. ඒවල තමයි දැව කර්මාන්තය වැඩියෙන්ම කෙරෙන්නේ"

"ඔයා මොනවද එහෙදී කළේ?"

"මං දැව කැපීමේ, දැව ඉරීමේ කර්මාන්ත ශාලාවල වැඩ කළා"

"ඉතින් එහෙං ආවේ ඇයි ?"

"එහෙදී මට මුහුණ දෙන්න වුණේ මහ පුදුමාකාර අත්දැකීම් වලට. ඊට පස්සේ මං ඉක්මනින්ම තීරණය කළා එහෙන් පිටවෙලා එන්න."

"මොකක්වත් කරදරයක්ද ?"

"ඒවා ඉතාමත්ම පෞද්ගලික, බොහොම රහසිගත ඒවා. ඒ

නිසා ඒ ගැන වැඩිදුර කතා කරන්න මං කැමති නෑ. යාළුවො මැක්සොයම් අත්හැර දල, කාලුතාන පලාතකට එන්න සිද්ධවුණු එක තමා මට ඉවසන්න බැරි'

මේ සියල්ල රට් අසා සිටියේ, සහදුවෙන්ම ආදරයකට පෙරළීමට ඉඩ ඇති අනුකම්පාවෙන් හා ශෝකයෙනි.

හොඳ අධ්‍යාපනයක් ලබා තිබූ නිසා මැක්සිමෝට ශීඝ්‍රම ලිපිකරුවෙකු ලෙස තාවකාලික රැකියාවක් ලබාගත හැකිවිය. දිවා කාලය සම්පූර්ණයෙන්ම වාගේ රැකියාව සඳහා වැය කිරීමට ඔහුට සිදුවිය. මේ නිසා නිදහස් විත්තක සංගමයේ නායකතුමා හමුවීමට යාමට ඔහුට අවස්ථාවක් නොලැබිණ.

දිනක් හැන්දෑවේ ඔහු හමුවීමට පැමිණි අමුත්තෙකි. ඒ, එදා උම්බ්‍රියේදී ඔහු හඳුනාගත් මයිකල් ජකැන්ලන්ය. සිහින් මිටි සිරුරක් තිබූ ජකැන්ලන්, මැක්සිමෝ දකින්නට ලැබීම ගැන සතුටට පත්විය. විස්කි වීදුරුවක් දෙකක් පානය කිරීමෙන් පසු ඔහු කෙලින්ම කාරණාවට පිවිසුණේය.

'මැක්සිමෝ, මට මතක තිබුණා ඔයාගේ නවාතැන ගැන. ඒ නිසාදයි මං බය නැතුව ආවෙ. ඔයත් අපේ නායකතුමා හම්බවෙන්න ගියේ නැති එක ගැන අහන්නත් පුළුවයි. මැක්සිමෝට ලොක්කා බලන්න නොගියේ මොකද ?'

'මට රස්සාවක් හොයාගන්න සිද්ධවුණා නේ. ඒ නිසා වෙලාවක් තිබුණේ නෑ.'

'මොනා එකකට වෙලා නැති වුණත් මේ වැඩේට වෙලාවක් තියාගන්නව මනුස්සයෝ. ඔයාට දෙයියන්ගෙම පිහිටයි ! මෙහේ පදිංචියට ඇවිත් පළමුවෙනි උදැසනම සංගම් කාර්යාලයට ගිහිං ඔයාගෙ නම ලියාපදිංචි කරගන්න එකයි කරන්න තිබුණේ. එහෙම නොකළ එක මහ මෝඩ කමක්. නොගිහිං ඉඳල තමුසෙ ලොක්කට මාට්ටු උණොත් නෙම ? එහෙම නොවුණොත් හොඳයි. එච්චරයි මට කියන්න තියෙන්නෙ'

ඒ අසා මැක්මහොන් පුදුමයට පත්විය.

'මං සංගමයේ සාමාජිකයෙක් වෙලා දැන් අවුරුදු දෙකක් වෙනවා. ඔය විධියට යන යන තැන කාමරවල ලොක්ක ළඟට ගිහිං ලියාපදිංචි වෙන්න ඕන බවක් නම් තාං අහල නෑ ?'

'විකාශනත්වෙ එහෙම වෙන්න ඇති'

'ඉතින් මෙහෙ කියන්නෙත් ඒ සංගමයම නේ ?'

'එහෙමද ?' ස්කැන්ලන්ගේ මුහුණෙන් ප්‍රකාශ වූයේ භයානක හැඟීමය.

'ඇයි එහෙම නේද ?'

'මගෙට පුරවින් නව මාසෙකින් පස්සෙ මාත් එක්ක ඒ ගැන කියන්න.

මං අද කෝච්චියෙන් බැහැල ගියාට පස්සෙ, මගේ පොලිස් කාරයින්ට බොහොම සැරට කතා කලා කියල මට අහන්න ලැබුණා?'

'කමුසෙ කොහොමද ඒක දැනගත්තෙ ?'

'ඒ කතාව හැමතැනම පැතුරුණා. හොඳට හරි නරකට හරි මේ වගේ කතාවක් හැමතැනම ආරංචි වෙනවා.'

'මං ඒ මිල්ලන්ට කිව්වා උන් ගැන මගේ හිතේ තියන දේ'

'දෙවියම්පා ! මැක්ගිනට් නම් ඔහේට බොහොම කැමති වෙයි'

'මොනවා ? මිනිහටත් පොලීසිය පේන්න බැරිද ?'

ස්කැන්ලන් මහ හඬින් සිනාසීමට පටන් ගත්තේය.

'කොල්ලො. උඹ ගිහිං ලොක්කට හම්බවෙයං. එහෙම නොගියොත් පොලීසිය නෙමෙයි උඹවත් පේන්න බැරුව යාවි.

මගේ අවවාදෙ අහල ඉක්මනට පලයං"

☆ ☆ ☆

එදා සවස් වරුවේ මැක්සිමොවිට තවත් සම්මුඛ සාකච්ඡාවකට මුහුණදීමට සිදුවිය.

එමී ගැන ඔහු දැක්වූ උනන්දුව ක්‍රම ක්‍රමයෙන් වැඩිවෙද්දී ඒ ගැන ඇගේ පියාටද දැනගන්නට ලැබිණ. ජේකබ් කාල්වර්ගේ පෞද්ගලික කාමරයට පැමිණෙන ලෙස මැක්සිමොවිට ආරාධනයක් ලැබිණ. අනවශ්‍ය වැල්වටාරම් කිසිත් නොමැතිව කාල්වර් කෙලින්ම මාතෘකාවට එළඹුණේය.

"ඉලන්දරියා. මට පේන්නේ තමුසේ මගේ එමී ගැන අදහසක් ඇති කරගෙන වගෙයි. ඒක හරිද ? නැත්නම් මටද වැරදුණේ ?"

"ඔව්. ඒක හරි"

"එහෙනං මට තමුසෙට කියන්න තියෙන්නෙ; එහෙම වැඩක් නෑ. තමුසෙට කලින් ඇගේ කැමැත්ත ගත්තු කෙනෙක් ඉන්නවා"

"ඇය ඒ බව මට කිව්වා"

"එහෙනං ඇය සියල්ල කියල තියෙන්නෙ ඇත්තයි. ඇය කිව්වද ඒ කවිද කියල ?"

"නෑ. මං ඇගෙන් ඇහුවා. ඒ වුණාට කියන්නේ නෑ"

"පුංචි කෙල්ල. ඒකිට හිතෙන්න ඇති මගේ බය වෙලා මෙහෙන් පැනල යාවි කියල"

"බයවෙලා පැනල යාවි ?" මැක්සිමෝ තදින්ම කෝපයට පත්විය.

"ඔව් ඉලන්දරියා. ඒ මිනිහට භය වෙන්න නම් ලැජ්ජා වෙන්න දෙයක් නෑ. ඒ තමයි ටෙඩ් බෝල්ඩ්වින්"

'කවුද ඒ යකා ?'

'ප්‍රකාර සංගමේ ඉහළ නිලධරයෙක්'

'ප්‍රකාරයො ? මං උන් ගැන අහල තියෙනවා. මෙහේ ඉන්නවලු ප්‍රකාරයො, අරහෙ ඉන්නවලු ප්‍රකාරයො. ඒ වුණාට කියන්නෙ මොකොහොම නෙමින්. සොඳිරිලි නැවෙන්. මොනවටද කවුසෙල කිය හැටි කියවෙලා ඉන්නෙ ? කව්ද මිය ප්‍රකාරයො කියන්නෙ ?'

සාජන්ට්ද අනෙක් අය මෙන් තමාගේ කටහඬ මඳක් බාල කළේය.

'ප්‍රකාරයො කියන්නේ නිදහස් චින්තන සංගමයේ සාමාජිකයෝ !'

'මමත් ඒ සංගමයේ සාමාජිකයෙක්' මැක්මෙඩෝ පිළිතුරු දුන්නේය.

'මොනවා උඹ ? උඹත් ඒ සංගමයේ සාමාජිකයෙක් ? ඒ බව කලින් දැනගෙන හිටිය නං මං උඹට මෙහේ නවාතැන් දෙන්නෙ නෑ. කියටවත්. සතියකට ඩොලර් සියක් දෙනව කිව්වත් මෙහේ නවත්න ගන්නෙ නෑ.'

'ඒ සංගමේ ඇති වැරැද්ද මොකක්ද ? ඒක තියෙන්නෙ අසරණ අයට ආධාර කරන්න, සවුරුන් එකමුතුවෙලා හොඳ මිත්‍රත්වයක් තබාගන්න. සංගමේ නීතිරීති වලින්ම ඒක කියනව නේ ?'

'සමහර තැන්වල එහෙම වෙන්න ඇති. ඒ වුණාට මෙහේ එහෙම නෑ !'

'මෙහේ මොනවද කෙරෙන්නෙ ?'

'මෙහේ ඒක මිනීමරණ සංගමයක්'

'ඔබ කොහොමද ඒක ඔප්පු කරන්නෙ ?'

'බොරු කරන්නෙ ? ඔය සංගමයෙන් කරපු මිනීමැරුම් පනහකට විතර තියෙනවා, ඒක බොරු කරන්න. මිල්මන් කොහොමද මැරුණේ ? වැන්ෂෝස්ට්ට මොකද වුණේ ? ඊළඟට නිකල්සන් පවුලට අත්වුණු ඉරණම මොකක්ද ? නාකි හයාම් මහත්තයා, පුංචි බිලී ජේම්ස්. ඒ වගේ තව මිනිස්සු ගොඩක් කොහොමද මැරුණේ ? ඒක මිනීමරණ සංගමයක් බව නොදන්න මිනිහෙක් හරි ගැහැනියක් හරි මේ නිම්න බිමේ ඉන්නවද ?

'මේ බලන්න මාස්ටර් මහත්තයා. ඔය කතාව ඉල්ලා අස්කර ගන්න. මං මේ නගරයට අලුත්කෙනෙක් බව දන්නවා. නිදහස් චින්තන සංගමය සම්පූර්ණයෙන්ම අවිහිංසාවාදී එකක්. ඇමරිකා එක්සත් ජනපදයේ එක් කෙළවරක ඉඳලා අනෙක් කෙළවරට මේ සංගමයේ ශාඛා පැතිරිලා තියෙනවා. ඒ හැමතැනකම ඒවා අවිහිංසාවාදී ඒවා. මෙහේදි ඒ සංගමයට මං බැඳෙන්න හදන කොට ඔබ කියනවා ඒක මිනීමරු සංගමයක්ලු. මං හිතන්නේ, වැරදි මතයක් ප්‍රකාශ කිරීම ගැන ඔබ මගෙන් සමාව ඉල්ලන්න ඕන. එහෙම නැත්තං එහෙම කතාවක් කිව්වේ ඇයි කියලා නිදහසට කාරණා කියන්න'

'මට ඔයාට කියන්න තියෙන්නෙ එක දෙයයි. ඒක මුළු ලෝකෙම දන්නවා ඉලන්දාරියා. නිදහස් චින්තන සංගමය කිව්වත් ස්කෝරර් සංගමය කිව්වත් දෙකම එකයි. දෙකේම නායකයා එක්කෙනෙක්. ඕට විරුද්ධව ඔබ කතා කළොත් ඔබව මරාදමනවා. ඒක නැවත නැවතත් ඔප්පු වෙලා තියෙන දෙයක්.'

'ඒව නිසාං කවකයා. මං කියන්නේ ඔප්පු කරල පෙන්වන්න'

'තමුසෙ මේ පළාතෙ තව ටිකක් කල් ජීවත් වුණොත් ඇත්ත මොකක්ද කියල තේරුම් ගන්න පුළුවනි. තමුසෙත් එයින් එක්කෙනෙක් බව මට අමතක වුණා. වැඩි දවස් යන්න කලින් තමුසෙත් උන් වගේ කරන් වෙයි. උන්නැහේ ! තමුසෙට පුළුවන් වෙනින් තවාතැනක් හොයාගන්න. එකෙක් මෙහේ යනවා එනව මගේ එටිව බදින අදහසින්. ඒ මදිවට තව එකෙක් මගේ බෝඩිමේ, තවාතැන් කාරයෙක් හැටියට. ඔව්, හෙට ඉඳන් මගේ වෙනින්

තවාතැනක් හොයා ගන්නවා හොඳයි !

දැන් මිනුගේ තවාතැනෙන් පමණක් නොව, ආදරවන්තිය ඊවිගෙන් ද ඈත්වී යාමට මැක්මෙඩොට සිදුවී ඇත. මිනුගේ සිතට ඇතිවූයේ බලවත් ශෝකයකි. එද හැන්දෑවේ ඇය තනිවම විසිත්ත කාමරයේ සිටිනු මිනුට දක්නට ලැබිණ.

'ඊවී, ඔයාගෙ තාත්තා මට මෙහෙන් අස්වෙලා යන්න කිව්වා. මට දාල යන්න වෙන්නෙ මගේ කාමරය විතරක් නම් මට ඒක ප්‍රශ්නයක් නෑ, නමුත් ඔයාව දාල යන්න වෙන එක ගැනයි මට දුක. මට ඔයා නැතුව ජීවත්වෙන්න බෑ'

'මොකවද මැක්මෙඩෝ මහත්තයා මේ කියන්නෙ ? මං කිව්ව නේද මම ඉක්මනද වැඩියි කියල. මං මිනු හා විවාහ වෙන්න පොරොන්දු වෙලා ඉවරයි. ඉතින් මම කොහොමද තවත් කෙනෙකුට පොරොන්දු වෙන්නෙ ?'

මුලින්ම ඔයාගෙ ආදරය ඉල්ලාගෙන ආවෙ මම නෑ. ඔයා මට කැමති වෙනවද ඊවී?'

'මං දෙවියන් වහන්සේගෙන් හැමදාමත් අහන්නෙ මුලින්ම ඔයාව එව්වෙ නැත්තෙ ඇයි කියලා'

දෑතින් මුහුණ වසාගත් ඊවී ඉකි ගසමින් හඬන්නට පටන් ගත්තාය.

'ඊවී, දෙවියන් වහන්සේගේ නාමයෙන් ඔයාගෙ ආදරය එහෙමම තියෙන්න අරින්න. ඒක වෙනස් කරන්න එපා. ඔයා වුණා කියන පොරොන්දුවක් නිසා, ඔයාගෙත් මගෙත් අපි දෙන්නගෙම ජීවිත කාලකණ්ණි කරන්නද ඔයා හදන්නෙ ? ඔයාගෙ හදවත ඔයාට තෝරා දුන්නු මාර්ගයේ ගමන් කරන්න පොළඹිය. කාරණා හරි හැටි තේරුම් නොගෙන වුණු පොරොන්දුවට වඩා ඒක පරෙස්සම්'

මිනු ඇයගේ අතින් අල්ලා ගත්තේය.

'ඔයා පොරොන්දු වෙන්න එපා මාත් එක්ක යන්න එනවා කියල. අපි දෙන්නා මේ ප්‍රශ්නයට එකට මුහුණ දෙමු.'

'වෙන කොහේට හරි ගිහිං ?'

'නෑ, මෙහෙදී'

'නෑ නෑ ජැක්. මෙහෙදී ඒවට ඉඩ නෑ. ඔයාට බැරිද මාව වෙන කොහේට හරි අරගෙන යන්න ?'

මැක්මර්ඩෝගේ සිතේ ඇතිවූයේ විසඳා ගැනීමට අපහසු ගැටළුවකි. එය එක් මොහොතකට මුහුණෙන් පිළිබිඹු විය. එහෙත් එය වහා අවසන් වූ බව පෙන්වමින් මුහුණේ හැඟීම් දැඩිවිය.

'නෑ, මෙහෙදී. මුළු ලෝකයම ආවත් මං ඔයාව බේරාගන්නවා. වෙන කොහේදිවත් නෙමෙයි මෙහෙදීම.'

'ඇයි ඉතින් අපට මෙහෙන් යන්න බැරි ?'

'මට මෙහෙන් යන්න බෑ එටී.'

'ඒ ඇයි ?'

'මාව මෙතනිං එළවා දැම්ම කියල මට හිතුණොත් ඊට පස්සෙ මට ආපහු ගෞරවයක් ඇතිව ජීවත්වෙන්න බෑ. අපි මොනවටද බය වෙන්නෙ. අපි නිදහස් රටක ජීවත්වෙන නිදහස් මිනිස්සු. අපි දෙන්නා එකිනෙකාට ආදරේ නම් ඒකට අවහිර කරන්න කාටවත් බෑ.'

'ඔයා දන්නෙ නෑ ජැක්. ඔයා මෙහෙට ඇවිත් තවම දවස් කීයද ගත වුණේ ? ඔයා දන්නේ නෑ මැක්ගින්ටිගෙ හැටි. ඔයා ස්කෝවරයන්ගෙ හැටි මොකුත් දන්නෙ නෑ.'

'මං උන්ව දන්නේ නෑ. හැබැයි මං උන්ට බයත් නෑ. මං බොහොම දරුණු මිනිස්සු එක්ක එකට ජීවත්වෙලා මිනිහාට ආශ්‍රය කරලා තියෙනවා එටී. මං උන්ට බය වුණේ නෑ. අන්තිමට උන් මට බය වුණා මිසක්. මෙච්චර කාලෙකට හැමදාමත් ඒකමයි

වුණේ. ඔයාගෙ කතන්දර කියන විදියට මේ මිනිස්සු දිගින් දිගටම අපරාධ කරල තියෙනව නම්, ඒව කලේ කවුද කියලත් මිනිස්සු දන්නවා නම්, ඇයි උන්ව නීතිය ඉදිරියට ගෙනාවේ නැත්තෙ ?"

"ඒකට හේතුව එයාලට විරුද්ධව සාක්ෂි දෙන්න කිසි කෙනෙක් ඉදිරිපත් නොවෙන එකයි. එහෙම සාක්ෂි දුන්නොත් ඒ මිනිහට විලාසයට මාසයක් ජීවත්වෙන්න ඉඩ ලැබෙන්නෙ නෑ. එච්චර විසරක් නෙමෙයි. ඒ ගොල්ලන්ගෙම මිනිස්සු ඉන්නව, ඕනෙ වෙලාවක උසාවියක සාක්ෂි දෙන්න සූදානම්. මේ මිනීමරුවා, සිද්ධිය වුණු වෙලාවේ එතැනින් බොහොම ඈත තැනක ඉන්නවා ඇහින් දැක්ක, කියල දිවුරා කියා සිටින්න උන් සූදානම්. පුදුමයි ජැක්, ඔබ මේව පත්තරවල කියවල නැද්ද ? මං අහල තිබුණෙ මුළු එක්සත් ජනපදය පුරාම හැම පත්තරයකම මේවා පළවෙනව කියල"

"ඔව් පත්තරවල ඔය ගැන මං ටිකක් කියවලා තියෙන බව ඇත්ත. ඒ වුණත් මං හිතුවෙ ඒව පත්තර කාරයො ගොතපු කතා කියල. මේ මිනිස්සු මෙහෙම කරන්න යම්කිසි හේතුවක් ඇති. සමහරවිට මුලින්ම අසාධාරණයක් සිද්ධ වෙලා ඇති. එයින් බේරෙන්න මෙහෙම කරනවද දන්නෙ නෑ ?"

"එපා ජැක්. මං කැමති නෑ ඔය හේතුව අහන්න. එයා කියන්නෙත් ඔය විකාරයි. අර අනිත් එක්කෙනා"

"කවුද බෝල්ඩ්වින්ද ? එයා දෙන හේතුවත් ඒකද ?"

"ඒ නිසා තමයි මට එයාව පිළිකුල්, මං ඔයාට ඇත්තම කියන්නම් ජැක්. මං ඒ මිනිහට කොහොමටවත් කැමති නෑ. ඒ වුණාට මං ඔහුට භයයි. මං ගැනත් මට බයයි. ඊට වඩා භය උන් මගේ තාත්තාට මොනව හරි කරදරයක් කරාවි කියල. උන් ගැන මගේ හිතේ ඇතිවෙන ඇත්තම හැඟීම කිව්වොත් ? එහෙම වුණොත් අපට මුහුණ දෙන්න වෙන්නෙ මහ විනාශයකට. අපට ජීවත්වෙන්න ඕන නිසයි, මං බෝල්ඩ්වින්ට මේ විදියට පොරොන්දුවක් දීල ඉන්නෙ. ජැක් ඔයාට මාව අරගෙන කොහේට හරි යන්න පුළුවන් නම් ? අපි තාත්තවත් අරගෙන යමු යන

තැනකට. මේ තපුරු මිනිස්සුන්ට එන්න බැරි නුගක් ඈත තැනකට ගියොත් අපට සැනසිල්ලේ ජීවත්වෙන්න පුළුවන්'

මැක්මයෝර්ගේ සිතේ දෙගිඩියාවක් ඇතිවී සිතුවිලි අතර මහ අරගලයක් පැන නැගී ඇති බැව් පැහැදිලිය. කළ යුතු දේ සිතාගත නොහැකිව , තීරණයක් ගත නොහැකිව, ඔහු ගැටළුවකට මුහුණ දුන්නේය. අවසානයේ ඔහු සිත දැඩි කර ගත්තේය.

'ඔයාටවත් ඔයාගෙ කාන්තාවටවත් මොකුත් කරදරයක් වෙන්නෙ නෑ එපි. වැඩිකල් යන්න ඉස්සර වෙලා ඔයාට පෙනේවි, මමත් මිය මිනිස්සු ඔක්කොටම වඩා දරුණු මිනිහෙක් බව.'

'ලෝකෙ කොහේට ගියත් මට ඔයාව විශ්වාසයි ජැක්'

මැක්මයෝර් මහ හඬින් සිනාසුණේය.

'දෙයියෝ සාක්කි. ඔයා මං ගැන දන්නෙ මොනවද ? ඔයා හරි අහිංසක කෙනෙක් එපි. මගේ සිතේ තියන අදහස් මොනවද කියල ඔයා දන්නෙ නෑ... ආ..... කවුද අපට මේ අමුත්තෙක් එන්නෙ?'

දොර එක්වරම විවෘත විය. එහි ඇතුළු වූයේ තරුණයෙකි. කිසිදු ආචාරශීලී බවකින් තොර ඔහුගේ හිටුමේ උඩඟු ලීලාවකි. මැක්මයෝර්ගේ වයසේ, එතරම්ම උස මහත පුද්ගලයෙකු වූ ඔහු තව්වසම් තරුණයෙකු විය. එහෙත් ඔහුට තිබුණේ කුඩිරු නෙත් යුවළකි. උකුස්සෙකුගේ හොටයක් වැනි වක් වූ නාසයකි. ගිනි උදුන අසල වාඩිවී කතාබහ කරමින් සිටි දෙදෙනා වෙත ඔහු හෙළුවේ කෝපාවිෂ්ට බැල්මකි.

සුදුමැයටත් හිනියටත් සක් එපි එක්වරම නැගී සිටියාය.

'ඔබ දකින්න ලැබීම ගැන සන්තෝෂයි බෝල්ඩ්වින් මහත්මයා. ඔබ මං හිතුවට වඩා කලින් ඇවිත්. එන්න ඇවිත් වාඩිවෙන්න'

දැන් හිරෙන් තබාගෙන මැක්මර්ඩෝ දෙස මඳ වෙලාවක් බලාසිටි බෝල්ඩ්වින්

'මේ කවුද ?' යයි ඇසීය.

'මම අඳුනන කෙනෙක්. අපේ නේවාසිකාගාරේ අලුත් නේවාසිකයෙක් - මැක්මර්ඩෝ මහත්මයා'

දෙදෙනාම ඔළුව, හිස් නමන් කොට ආචාර කරගත්හ. එහෙත් ඒ උඩඟු රළු ආකාරයකටයි.

'ෂැෆ්ටර් මෙනෙවිය ඔයාද තමුසෙට කියන්න ඇති, අපි දෙන්නා අතරේ තියෙන සම්බන්ධය ගැන.......'

බෝල්ඩ්වින් පැවසීය.

'ඔබ දෙදෙනා අතර එහෙම සම්බන්ධයක් තියෙන බව මං දැනගෙන හිටියෙ නෑ ?'

'නෑ ? හොඳයි එහෙනං දැන්වත් දැනගන්නවා. මේ තරුණ කාන්තාව අයිති මටයි. ඒක හොඳට හිතට ගන්නවා. මෙහෙනිං එළියට බැස්සොත් තමුසෙට පෙනේවි, මේ වෙලාව සක්මන් කරන්න හොඳ හැන්දෑවක් කියල'

'ස්තුතියි. මේ වෙලාවෙ සක්මන් කරන්න යන්න මට කිසි උවමනාවක් නෑ' මැක්මර්ඩෝ පිළිතුරු දුන්නේය.

'නැද්ද ?' බෝල්ඩ්වින්ගේ දෑස් කෝපයෙන් දිලිසෙන්නට විය.

'එහෙම නං තමුසෙට උවමනාව තියෙන්නෙ සණ්ඩුවකට පැටලෙන්නද මිනිහෝ ?'

'ඔව්. සණ්ඩුවකට නං මං ලෑස්තියි. ඒ තරම් මිහිරි වචනයක් ඔහේගෙ කටින් පිටවුණේ නෑ'

'අයියෝ ජැක්, දෙවියන්ගේ නාමෙන් පාවුලෙට ඉන්න ජැක්. මිනු ඔබට තුවාල කරාවි ජැක්'

සිහියට පත් වී නැගැහුනාය.

'මහෝ.... ඇයි ? දැන් යාළුකම ඒ තරම් දුර දිග ගිහින්ද?'

'අයියෝ වෙච්. ඒකත් ඉවසන්න බෑ ගොතුවෙන්. වෙඩි මයා මට කවදාහරි ආදරය කළා නම් කාරුණිකකරලා මේ මත්සකම අමතක කරලා දන්න'

'මං කියන්නෙ එවී මේක අපටම විසඳගන්න දීල මයා පැත්තකට උණෙනාත් හොඳයි කියල'

මැක්මවෝ කීය.

'එහෙමත් නැත්නං, බෝල්ඩ්වින් මහත්මයා අපි බනිමු පාරට. මේ ගොවිතැනිල්ලට එහා පැත්තෙ ලොකු හිස් ඉඩමක් තියෙනවා'

'මං උඹට හොඳ පාඩමක් උගන්වන්නං. මගේ දූත් අයිතිකිලු කරගන්න මට උවමනාවක් නෑ. මං වැඩ කරපුතු ඉවර කරන්න ඉස්සර වෙලාම උඹට කියනවයි, මේ ගෙදර පය ගොගහ හිටිය නෑ හොඳයි කියල' බෝල්ඩ්වින් කීය.

'දැන් හොඳම වෙලාව'

'මට හොඳ වෙලාව තෝර ගන්නෙ මම. ඒක මට ඉතුරු කරපං. දැන් මෙන්න මේක බලපං'

බෝල්ඩ්වින් තම සාක්කුව අත උඩට හැකිළුවේය.

කවයක් මැද පිහිටි ත්‍රිකෝණයක ලකුණක් බාහුවේ මැද කණගසා තිබිණි.

'උඹ දන්නවාද මේකෙ තේරුම ?'

'මම දන්නෙත් නෑ. ඒකෙන් මට ඇති වැඩකුත් නෑ'

'හරි, උඹට දැනගන්න ලැබේවි. ඒක මට පහසුව කරලා කියන්න පුළුවන්. උඹට කවත් නාකි වෙන්න ඉඩ තියන්නෙ නෑ

මිනිහෝ. උඹට අහගන්න පුළුවන් ඒ ගැන. එවී මෙනවිය ගෙන්.

එවී.... දැන් උඹ මං ළඟට දණ ගාගෙන වරෙන්.... උඹට ඇහුණද ? වරං දණගාගෙන. එතකොට මං කියන්නම් උඹට දෙන දඬුවම මොකක්ද කියල.. උඹ වපුරපු දේවල් උඹටම කපාගන්න සිද්ධවේවි. දෙයියම්පා !'

එවී හා මැක්මයර් දෙස කෝපයෙන් පිපිරෙමින් බලාසිටි මෝල්ඩිවින් ඉන්පසු දොර වේගයෙන් වසාදමා යන්නට ගියේය. මැක්මයර් හා තරුණිය මොහොතක් නිශ්ශබ්දව බලා සිටියහ.

'ඔයා බොහොම නිර්භීතයි ජැක්. ඒත් දැන් ඒකෙන් වැඩක් නෑ. ඔයා කොහොම හරි මෙහෙන් පැනල යන්න. අද රෑටම පැනල යන්න. ඔව් අද රෑටම යන්න. නැත්තං ඔහු ඔබව මරා දමනවා සිකුරුයි. ඔහුගේ ඇස් දෙකේ තිබුණු මිනීමරු බැල්ම මට තේරුණා. මැක්ගින්ටි ලොක්කාගෙ දූතයෙක් විතර ඇරවිරයො ආවම ඔයා බේරෙන්නෙ කොහොමද ?'

ඇගේ ග්‍රහණයෙන් මිදුනු මැක්මයර්, ඇය පුටුවක වාඩිකළේය.

'එවී ඔයා මං ගැන කල්පනා කරල ඔයාගෙ හිත කලබල කරගන්න එපා. මමත් නිදහස් චින්තක සංගමයේ සාමාජිකයෙක්. මං ඔයාගෙ තාත්තාට ඒ බව දැනුම් දුන්න විතරයි. මාත් උන් වගේම හොඳ මිනිහෙක් නොවෙන්න පුළුවන්. මං ඒ බව හෙළිකළ නිසා ඔයා මට වෛර කරන්න පටන්ගනීවි ?'

'ඔයාට වෛර කරන්න ? මගේ පණ තියෙන තුරු මට ඒක කරන්න බෑ ජැක්. මං අහල තියෙනවා අනෙක් පළාත්වල, මේ සංගමේ සාමාජිකයන් ගේ කිසි වැරැද්දක් නෑ කියල. මෙහේ අය තමයිලු මේ මිනී මර මර දරුණු අපරාධ කරන්නෙ. මං කොහොමද ඔයා ගැන තරහක් හිතන්නෙ ? ඔයත් එයින් එක්කෙනෙක් නම් ඔයාට කියන්නෙ දැන් ඉතින් මැක්ගින්ටිව හමුව වෙන්නයි. ඉක්මන් කරන්න ජැක්. මෝල්ඩ්විින්ට කලින් ඔයා ගිහිං මැක්ගින්ටිට කරුණු කියන්න. නැත්තං උන් පිස්සු බල්ලො වගේ

ඔයා පිටිපස්සෙන් එළවන්න පටන් ගනීවි.'

'මාත් හිතුවෙ ඒක තමයි. මම දැනම ගිහින් ඒක විසඳගන්න බලන්නම්. ඔයාගෙ තාත්තට කියන්න අද රෑටත් මං මෙතන් නවතින බව. හෙට උදේට මං අලුත් තැනක් හොයාගන්නම්.'

මැක්ගින්ටිගේ යෝධ තැබෑරුම පිටින් පිරිදී අනුශාසක ගින්නෙන් පිරී පැවතිණි. නගරයේ වංචනිකයින්, මංකොල්ලකාරයින්, හොරුන් හා මිනීමරුවන්ගේ නිජබිම වූයේ එයයි.

මැක්ගින්ටි ජනප්‍රිය පුද්ගලයෙකු විය. කතාබහ කරන ඕනෑම කෙනෙකුට එක්වරම සිතුණේ ඔහු විනෝදකාමී ප්‍රසන්න පුද්ගලයෙකු ලෙසයි. එහෙත් ඔහුගේ ඒ ප්‍රසන්න මුහුණ, මැක්ගින්ටිගේ සත්‍ය ස්වභාවය වසා තිබූ වෙස් මුහුණක් විය. වර්මිස්සා නිම්නයේ සිට සැතපුම් සියක් දුරට ජනතාව ඔහු කෙරෙහි දැක්වූයේ අප්‍රමාණ භයකි. මැක්ගින්ටිගේ හොඳ හිත සියලු දෙනාටම අත්‍යවශ්‍ය විය. එහෙයින් ඔහුගේ තැබෑරුම කිසිවෙකුට අමතක කළ හැකි තැනක් නොවිය.

මැක්ගින්ටි සතුව තිබුණේ අවශ්‍ය වූ විට, කිසිදු සැකක් නොමැතිව ක්‍රියාවට නැංවීමට හැකිවූ ඇඟබලය පමණක් නොවේ. රජයෙන්ද ඔහුට බලතල ලැබී තිබිණි. ජෝන් මැක්ගින්ටි මහත්තයා ගේ පුන සිද්ධිය වෙනුවෙන් රජය මගින් පත්කළ නිලධරයෙක් විය. ඔහු මහනගර සභාවේ ප්‍රධාන මන්ත්‍රීවරයා විය. මාර්ග සංවර්ධන කොමසාරිස් වරයා විය. මෙම තනතුරු සඳහා ඔහු පත්කර ගන්නා ලද්දේ ඔහුගේ ඇබිත්තයන්ගේ උත්සාහයෙනි. මැක්ගින්ටි බලයට පත්වූ පසු ඔවුනට විවිධ අල්ලස්, දූෂණ, වංචා කරගෙන යාමට හැකි විය.

වරිපනම් හා බදු ලෙස මහජනයාගෙන් විශාල වශයෙන් මුදල් අයකරගන්නා ලදී. එහෙත් මහජනයා වෙනුවෙන් සැලසුණු සේවාවක් නැත. මහජන මුදල් කෝටි ගණනින් වංචා කරද්දී අල්ලසට යට වූ ගණකාධිකාරීවරු ඒවා යට ගැසූහ. බියෙන් ත්‍රස්තව සිටි මහජනතාවට නිහඬවම කප්පම් ගෙවීමට සිදුවිය.

ඒ ගැන කථා කිරීමට හෝ විරෝධය පළකිරීමට කිසිවෙක් උත්සාහ නොකළේය. එසේ කළහොත් බලාපොරොත්තු නොවූ ආකාරයක හදිසි මරණයකට ගොදුරු වීමට සිදුවන බව ඔවුහු දැන සිටියහ.

කාලය මෙසේ ගත වෙද්දී පරුෂාරම සිටි මැක්ගිනටි සෞභාග්‍යය කරා ගමන් කළේය. අවුරුද්දෙන් අවුරුද්ද, ඔහුගේ කමිසයට සවිකරන දියමන්ති ඇල්ලු පළඳනා සංඛ්‍යාව වැඩිවිය. කරේ පැළඳ සිටි රන් දම්වැල් වල ගණකම හා බර වැඩිවිය. ඔහුගේ මදපොන සම්භාෂණ ශාලාව තව තවත් ප්‍රමාණයෙන් විශාල විය. නගරයේ විනෝද කටයුතු සඳහා වෙන් කොට තිබූ කොටසේ විශාල ඉඩ ප්‍රමාණයක් මැක්ගිනටිගේ අවන්හලෙන් ගිලගෙන තිබිණි.

තල්ලු කළ හැකි පැද්දෙන දොර තෑරගෙන මැක්මහෝන් අවන්හලට ඇතුළුවිය. මත්පැන් වලින් නිකුත් වූ හුමාලය සහ දුම්වැටි වලින් නැගුණු දුමාරයෙන් වාතය අපිරිසිදු වී තිබිණ. රැස්ව සිටි සෙනඟ මැදින් මැක්මහෝන් ඉදිරියටම ගමන් ගත්තේය. අවන් හල ඇතුළත හොඳින් ආලෝකමත් කර තිබිණ. ඒ අතර සෑම බිත්තියකම සවිකර තිබූ කැඩපත් වලින් සිදුවූ පරාවර්තනය නිසා ඇතුළත ආලෝකය වඩාත් තීව්‍ර විය. සේවකයෝ කිහිප දෙනෙක් අමුත්තන් සඳහා මත්පැන් සූදානම් කරමින් සිටියහ.

අවන්හලේ ඈත කෙළවරේ සිටි පෙත්තිමත් ශරීරයක් තිබූ එක් දැවැන්ත පුද්ගලයෙකි. කුරුට්ටුවක්ද කටේ රුවාගෙන සිටි මේ පුද්ගලයා වෙන කවුරු විය හැකිද මැක්ගිනටි ලොක්කා මිස? ඔහුගේ මුහුණ සම්පූර්ණයෙන්ම කළු පැහැති රැවුලකින් වැසී තිබිණි. කොණ්ඩය කඩා කොලරය දක්වා දික්ව වැඩී ඇත. ඔහුගේ සමේ තිබුණේ ඉතාලි ජාතිකයන්ට උරුම දුඹුරු පැහැයට තුරු පුදනි. යන්තමින් වපරට තිබූ කළු දෙනෙත් නිසා ඔහුට තිබුණේ දුෂ්ට පෙනුමකි.

ලොක්කා දෙස හොඳින් බලා සිටි මැක්මහෝන් මොහොතකින් ඉදිරියට ගියේය. මැක්ගිනටිගේ සුළු විහිළු වලට පවා හොක්

නමැලා සිනාසෙමින්, ඉවත්ව යන් කියමින් ඔහු පිටවරා ගමන සිටියේ ඇම්බැට්ටයන් පිරිසකි. ඔහුන් දෙසට කල්ලපාරමින් තිරසිතව ඉදිරියට ගිය මැක්ෆින්ට්, ලොක්කා දෙස එක රැල්ලේ බලා සිටියේය.

- 'ඉලෙක්ට්‍රීසා, තමුසෙ කවුද කියලා මට මතකයක් නෑ?'

'මං රෙජිනෝට අමුත්තෙක් මැක්ෆින්ට් මහත්තයා'

'වැදගත් ප්‍රභූවරයෙකුට ගරුසරු ඇතිව කතා කරන්න බැරි තරමට තමුසෙ අලුත් වෙන්න බෑ?'

'ඉලෙක්ට්‍රීසා, එතුමා තමයි මැක්ෆින්ට් නාගරික මන්ත්‍රීතුමා'

සිසියටත් කීය.

'සමාවෙන්න මන්ත්‍රීතුමා, මේ පැත්තෙ පිරිස් ටිකක් වලට මං තවම අලුත්. මෙහාට ඇවිත් මිනිසුන්ව හැඳුනගන්න කියලා මට අවවාදයක් ලැබුණා'

'මය මං ඉන්නෙ තමුසෙට දකින්න. ඉතිං එච්චරයි නේ? .......... තමුසෙට මොනාද මං ගැන හිතෙන්නේ?'

'ඒ ගැන කියන්න තරම් ප්‍රශ්නයක් නැතියි. ඒ වුණත් මගේ ශරීරයේ තරමටම හදවතත් කාර්‍යශීලිවෙන්න නම්, මගේ මනුසෙ හිතනු ගොඩනඟන්නට අත්හිතවක් කියනවා නම්, ඒට වැඩිය හොඳයුත් කියන නෑ' මැක්ෆින්ට් කීය.

'දෙවියනේ ! අයිරිෂ් ජාතිකයන්ගේ කටහැඬක් තව මං තමුසෙට හොඳයි කියනවා.' මැක්ෆින්ට් පැවසුවේ මේ කාර්‍යයට පිළිතුරු දිය යුත්තේ කුමන ආකාරයකින් දැයි සිතාගත නොහැකිවය.

'එහෙනං, මගේ පොතුම් හොඳයි කියල තමුසේ පිළිගන්නවා?'

'සහතිකෙනම්' මැක්ෆින්ට් පිළිතුරු දුන්නේය.

'තමුසෙට උපදෙස් ලැබුණා ඇඩ්ලර් මාව හම්බවෙන්න කියලා?'

'ඔව්'

'කාගෙන්ද?'

'ගාඩා අංක 341 චර්චිලයාගෙ, මයිකල් ජකැන්ලන් සහෝදරයාගෙන්. ඔබේ පුරවැසි හා සමීප හැඳුනුම් කමිස් පතා මං සපිදිය පුරන්න කැමතියි මන්ත්‍රීතුමා'

එසේ පැවසූ මැක්ම්වෝර් මිනු වෙත ගෙනාවින් තිබුණු තත්වැන් වීදුරුව ඉහළටම ඔසවා, තහනට ගෙන ගොල ගැටවිය. ඒ සමගම අසේ පුළුයිල්ල ඉහළට ඩිලු කළේය.

මැක්ම්වෝර්ව අකා හොඳින් නිරීක්ෂණය කරමින් සිටි මැක්ගිනර්ටිගේ සත ඇහිබැම ඉහළට එසවිණි.

'ආ.........එිකත් එහෙමද? මේවා ගැන මං තව ටිකක් හොඳින් කරල බලන්න ඕන. තමුසෙගෙ නම මොකක්ද කිව්වෙ?'

'මැක්ම්වෝර්'

'තව ටිකක් මෙහාට ලං වෙන්න මැක්ම්වෝර් මහත්තයා. තව වචනෙ සිරි අරගෙන මිනිස්සු විශ්වාසෙට ගන්නෙ නෑ, මේ පළාතෙ. ඒ වගේම මගේ කටින් පිටකරන ඕනෑකොම අපි විශ්වාස කරන්නෙත් නෑ. මේ පැත්තට ටිකකට එන්නකො. මේ කාමරුම පිටිපස්සට'

මත්පැන් අඩංගු පිප්ප ගොඩකට කිසිව කාමරයක් එහි තිබිණ. මැක්ම්වෝර් ඇතුළුව පසු දොර වසා දැමූ මැක්ගිනර්ටි පිප්පයක් මත වාඩිවිය. තරුණයාගේ සහරාකිරම මත ගැනීමට මෙන්, තම වරළ දෑසින් මැක්ම්වෝර්ව හොඳින් නිරීක්ෂණය කරමින්, මැක්ගිනර්ටි ලොක්කා මිනිත්තු කිහිපයක් ගත කළේය. කිසිවට මැක්ම්වෝර් මුහුණ දුන්නේ පුසන්න අයුරෙනි. එක් අතක් සාක්කුවේ දමාගෙන සිටි ඔහු අනෙක් අතෙන් තම උඩුරැ

පැහැති ලබු කවුළ කරකවමින් සිටියේය. එක්වරම රිවෝල්වරයක් එළියට ඇදගත් ලොන්සා එය මැක්මහෝන් දෙසට එල්ල කළේය.

'එයි මේ මලපෑ- විහිළුකාරයා, අපිත් එක්ක සෙල්ලම් කරන්න හොම ලෑස්ති වුණොත් ඒක වැඩි දවස් කරන්න ලැබෙන්නෙ නෑ'.

'මේක නම් පුදුම විදියේ පිළිගැනීමක් නේ'

මැක්මහෝන් කීවේ කර්කශ උඩඟු ස්වරයෙනි.

'නිදහස් විත්තා සංගමයේ සහෝදරයෙක් චිට වලාකයට ආවම නායකතුමා අපව පිළිගන්නේ මෙහෙමද?'

'ඔව්, අපිත ඒක කම්ප උඹට ඔප්පු කරන්න සිදුවන්නේනම් . එහෙම බැරිවුණොත් උඹට දෙයියන්ගෙම පිහිටයි. මොන ගාඩියෙන්ද උඹ පටන්ගත්තේ ?'

'29 වැනි ගාඩියට, චිකාගෝ'

'කවදද?'

'1872 ජුනි මාසෙ 24 වැනිද'

'කණ්ඩායමේ නායකතුමා?'

'ජේම්ස් එච්. ස්කොට්'

'කවිද උඹේ දිස්ත්‍රික්ක පාලකයා'

'බාතොලමියු විල්සන්'

'හ්ම්, කටපාඩම් විදියට ප්‍රශ්න වලට උත්තර නම් දුන්නා. උඹ මෙහේ මොකද කරන්නේ?'

'රස්සාවක් කරන්න ආවෙ, ඔබ වගේම. ඒ වුණත් අඩු පඩියකට'

'අහන ප්‍රශ්න වලට පටස්ගාලු උත්තර නෑ ලැබෙනවා?'

'කවදත් මගේ පතාව ඉස්මත්'

'වැඩත් ඉස්මත්ද?'

'මාව හොඳින් දන්න මිනිස්සු කියනවා වැඩත් ඉස්මත් කියලා'

'හොඳයි. උඹ හිතාගෙන ඉන්නවාට වඩා ඉස්මතට අපි පෝලිසි කරල බලනවා. මේ සල්ලාගෙ ගාමිනි ගැන මොනවද උඹ අහල කියන්නෙ ?'

'මෙහෙන් ගාමාජිකයෙක් වෙන්න පුළුවන්, බොහොම නිර්භීත, එවිතර කොහොතුට විතරයි කියල මං අහල තියෙනවා'

'උඹ අහපු එක හරි. මොකද උඹ විකාශෙට අත ඇරල ආවෙ?'

'ඒක මං කියන්නේ නෑ'

මැක්කින්ටි දැස් ලොකු කොට මැක්මඩෝ දෙස බැලුවේය. කිසිදිනෙක කිසිවෙකු තමාට මේ අයුරින් පිළිතුරු දී නැත.

'මොකද යකෝ උඹ ඒක කියන්නෙ නැත්තේ?'

'සංගමයේ සහෝදරයින් අතර බොරු කියන්න තහනම්'

'ඒ කියන්නේ ඇත්ත කතාවය කියන්න බැරි තරම් නරකයි?'

'ඔව්. එහෙම කියන්න පුළුවනි'

'මේ බලනවා උන්නැහේ. සාණ්ඩියාගෙම නායකයා හැටියට, අතීතය හෙළිකරන්නෙ නැති මිනිහෙක්ව ගාමාවට බඳවා ගනියි කියල උඹ හිතනවද?'

කළ යුතු දෙයක් සිතාගත නොහැකිව මැක්මඩෝ ගැටළුවකට

මැදිරි දොරත් දිස්විය. මිනු ඇඟිලිගා පාත්තුවකින්, කැලු පුවත්පතක් කැබැල්ලක් එළියට ගත්තේය.

'එහෙත් හෙළිකරලා මාව පාවා දෙන්නෙ නැ නේද?'

මැක්මහොන්ගේ කටින් පිටවිය.

'දෙනව මං උඹට හොඳ කම්මුල් පාරක්, ඒ වගේ කතා මට කිව්වොත්.' මැක්කින්ටයර් කෑගැසුවේ දැඩි කෝපයෙනි.

'මට කරි මිත්‍රතුමා, මං මගෙන් සමාව ඉල්ලනවා. ඒ වචන මගෙ කටින් පිටවුණේ වැරදීමෙන් කල්පනා නොකර. මං දන්නවා නම් කාරයට සම්බුණාම මට ආරක්ෂාව ලැබෙන බව. පත්තර කැල්ල කියවල බලන්න.'

මැක්කින්ටයර් එය කියවා බැලුවේය.

1874 අප්‍රේල් අටවැනි දිනයේදී වික්ටෝරියාවේ මෙල්බන් නගර වීදියේ ලේක් අවන්හලේදී ජොසෆ් පින්චර් නම් නැතැත්තෙකු වෙඩි තබා මරා දැමීම ගැන එහි සඳහන්ව තිබිණි.

'ඇයි වැඩක්ද?'

'මැක්මහොන් නිහ නැලීය'

'මොකද උඹ උගේ වෙඩි තිබ්බෙ?'

'ආණ්ඩුවට උදව්වක් හැටියට. මං සල්ලි අච්චු ගැහුවා. ආණ්ඩුවේ ඩොලර් කාසිවල තරම්ම මගේ කාසිවල රත්තරන් තිබ්බා. ඒ වුණාට එව අච්චු ගහන්න වියදම් වෙන්නේ ටිකක් මුදලයි. මේ මිනිහා පින්චර් තමයි මගේ උදව් කාරයා. එයා තමයි සල්ලි මාරු කරල දැම්මේ.'

'මොකක් කරේ?'

'එයා තමයි හොර සල්ලි, සාමාන්‍ය රජයේ මුදල් විදියට මහජනයා අතරට දැම්මේ. එකපාරටම උන කියාපි, පොලිසියට

ඔත්තුව දෙනවා කියලා. මං හිතන්නෙ උඹ ඔත්තුව දුන්නා. එක හරියට බැඩිකාරයෙ කියල හොයන්න මං බලාගෙන හිටියෙ නෑ. උඹට ඔච්චි කියලා මං පැන්න ගල් අඟුරු ආකර පැත්තට

'ඇයි ගල් අඟුරු ආකර පැත්තට ?'

'ඒ මොකද මට අහන්න ලැබුණා මේ පළාත්වල පොලීසිය එච්චර කඳින් හොයන්නෙ නෑ කියල'

මැක්ගින්ටි සිනාසුණේය.

'උඹ ඉස්සර වෙලා හොර සල්ලි අච්චු ගැහුවා. චිකාගොව මිනිමැරුවා, ඊට පස්සෙ මේ පැත්තට පැනලා ආවා, අපි උඹව ආදරයෙන් පිළිගනීවි කියල හිතාගෙන?'

'ඔව්'

'හොඳයි. උඹව හොඳහොඳම දියුණු වෙන්න පුළුවන් මිනිහෙක් වගෙයි පෙනෙන්නෙ. උඹට තවමත් පුළුවන්ද ඒ විදියට සල්ලි අච්චු ගහන්න?'

මැක්මර්ඩෝ සාක්කුවෙන් අසූ දහ රන්කාසි අහුරක් ගත්තේය.

'මේවා ෆිලඩෙල්ෆියාවෙ ආණ්ඩුවේ මුදල් අච්චු ගහන තැනිං පිටවුණු ඒවා නෙමෙයි'

ගෝරිල්ලෙකුගේ වැනි විශාල රෝම පිරුණු අත්වලින් කාසි ගත් මැක්ගින්ටි ඒවා හිරු එළියට අල්ලා පරීක්ෂා කොට බැලුවේය.

'දෙවියනේ ! මට නං කිසිම වෙනසක් පේන්නෙ නෑ. සහෝදරයා, උඹව අපට හොඳටොම ප්‍රයෝජනවත් වෙන්න ඉඩ තියෙනවා. අපි අතරේ මිය හරන මිනිස්සු එකෙක් දෙන්නෙක් හිටියට කමක් නෑ.

මැක්මර්ඩෝ මිත්‍රයා, අපට විරුද්ධව එන අයට මොනව හරි නොකෙළොත් අපට ඉන්න සිටින්න බැරි වෙන කාලයක්

ඉස්සරහට එනවා'

'හරි මම ලෑස්තියි. කොල්ලොන් එක්ක එකතු වෙලා මගේ වැඩ කොටස ඉටු කරන්න. මම ලෑස්තියි'

'උඹ මොනොම භය නැති මිනිහෙක් වගෙයි පෙනෙන්නෙ. මං පිස්තෝලෙ අතට ගත්තු වෙලාවෙ උඹ හෙල්ලුණේවත් නෑ?'

'මට කිසි අනතුරක් සිදුවුණේ නෑ'

'එහෙනම් කාටද යකෝ අනතුරක් සිදුවුණේ?'

'අනතුර සිදුවුණේ ඔබතුමාටයි මන්ත්‍රීතුමා' මැක්ගිවර් ඔහුගේ කමිසයේ පැති සාක්කුවෙන් ඕනෑම මොහොතක වෙඩි තැබීමට සූදානමින් තිබූ පිස්තෝලය එළියට ගත්තේය.

'මේකෙ කට මං ඔබතුමාගේ පැත්තට හරවගෙනයි තිබ්බේ. ඔබ වෙඩිතිබ්බ නං මාත් තියනවා'

'දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ !' කෝපයෙන් රතුවූ මැක්ගිවර්ගේ කටින් පිටවිය. ඊළඟට ඔහු මහහඬින් සිනාසීමට පටන් ගත්තේය.

'මේ වගේ යක්ෂයෙක් පැහෙන කාලෙකින් අපේ කණ්ඩායමට එකතුවුණේ නෑ. අපේ සාමාජිකයෝ උඹ ගැන මොනොම ආඩම්බර වෙයි.....'

......මොනවද මිනිහෝ උඹට ඕන කරන්නෙ? මට මේ මහත්තයෙක් එක්ක මිනිත්තු පහක් කතාකරන්න ඉඩ දෙන්නෙ නැද්ද? මොකවද මිනිහෝ උඹ ඔළුව දාන්නෙ?'

කාමරයේ දොර මදක් විවෘත කොට, එහි ඇතුළුවීමට තැත් කළ සේවකයා වෙත මැක්ගිවර් කඩා පැන්නේය. සේවකයා පිළිතුරු දුන්නේ වෙව්ලමිනි.

'ස.......ස.......සමාවෙන්න මන්ත්‍රී තුමා. ටෙඩි බෝල්ඩ්වින් ඇවිත්. එයාට ඔබතුමාව හම්බ වෙන්න ඕනලු වහාම'

පණිවුඩ කරුවාගේ උරහිසට ඉහළින් වෙඩි බෝල්ඩ්වින් ගේ සුපිරි මුහුණ දක්නට ලැබිණි. සේවකයා එළියට තල්ලු කළ බෝල්ඩ්වින් දොර වසා දැම්මේය.

'උඹ ආවද මෙහෙට මට ඉස්සෙල්ල ? මේ මිනිහා ගැන ඔබතුමාට කිවයුතු කාරණාවක් තියෙනවා මන්ත්‍රීතුමා' බෝල්ඩ්වින් පැවසුවේ මැක්මයිර් දෙස කෝපාවිෂ්ඨ බැල්මක් හෙළමිනි.

'ඉතින්, කියාපන් ඒක මගේ මුණටම'

මැක්මයිර් කෑගැසීය.

'මං ඒක කියන්නේ මට ඕන වෙලාවට, මං කැමති විදියට'

'මන්නා ! මන්නා !!' මැක්ගිනට් කෑගැසුවේ පිස්සයෙන් මේසට ගසමිනි.

'මය වැඩේ හරියන්නෙ නෑ. අපේ සාමාජට බැඳෙන්න අලුත් සහෝදරයෙක් ඇවිත් ඉන්නවා බෝල්ඩ්වින්. ඒ මනුස්සයට ඔහොම පිළිගන්න එක හරි නෑ? අතට අත දීල යාළු වෙයල්ල'

'කිසි දවසක නෑ, උගේ එක්ක යාළුවෙන්නෙ'

බෝල්ඩ්වින් කෝපයෙන් ගිගුරුවේය.

'මං එයාට වැරැද්දක් කරලා තියෙනවා නම් පටන් කරලා තීරණයකට එන්න මම ලෑස්තියි.'

මැක්මයිර් කීය.

'බොක්සිං ඕන නම් බොක්සිං. ඒකට එයා කැමති නැත්නම් ඔහු කැමති ඕනෑම විදියකට මම සූදානම්. මන්ත්‍රීතුමා, කාණ්ඩායමේ නායකතුමා හැටියට මේ ගැන තීරණයක් ගන්න එක ඔබතුමාට භාරයි.'

'මේ මොකක් ගැනද?'

'තරුණ ගෑනු ළමයෙක් ගැන. ඇයට ඕන කරන පෙම්වතා තෝරාගන්න ඇයට අයිතියක් තියෙනවා'

'හැබෑට ?' බෝල්ඩ්වින් කීවේ කෝපයෙනි.

මේ ප්‍රශ්නය ඇතිවෙලා තිබෙන්නේ සංගමයේ සහෝදරයන් දෙදෙනෙක් අතර නිසා, 'කැමති පුද්ගලයා තෝරා ගැනීමේ අයිතිය ඇයට දෙමු' මැක්ගිනිට් ප්‍රකාශ කළේ තීරණාත්මක අයුරෙනි.

'ඔබේ තීරණයත් එහෙද එහෙනම්?' බෝල්ඩ්වින් ඇසුවේ කෝපයෙනි.

'ඔව් වෙබ් බෝල්ඩ්වින්. ඒක තමයි මගේ අවසන් තීරණය. ඇයි උඹට ඒක පිළිගන්න බැරිද?' පවසමින් මැක්ගිනිට් කොටියෙකු මෙන් ඔහු වෙතට කඩා පැන්නේ, කෝපයෙන් ගොරවමිනි. බෝල්ඩ්වින්ගේ බෙල්ලෙන් අල්ලාගත් ඔහු, බෝල්ඩ්වින්ව ඇදගෙන ගොස් බිත්තියක හැප්පුවේය. මැක්මිලන් මැදිහත් නොවූවා නම් කෝපයෙන් පිපිරෙමින් සිටි මැක්ගිනිට් අතින් බෝල්ඩ්වින්ගේ ජීවිතය කෙළවර වන්නට ඉඩ තිබිණි.

'ඉවසන්න මන්ත්‍රීතුමනි, දෙවියන්ගේ නාමයෙන් ඉවසන්න' මැක්මිලන්, ලොක්කාව ඉවතට ඇදගත්තේය.

මැක්ගිනිට් තම ග්‍රහණය ලිහිල් කළ පසු, වෙව්ලමින් සිටි බෝල්ඩ්වින් බිම ඉඳුලට එසෙව්වේය. මරණයේ දොරකඩට පැමිණි අයෙකු මෙන් ඉතා අමාරුවෙන් හුස්ම ගනිමින් සිටි ඔහුගේ දෑත් දෙපා සියල්ල වෙව්ලන්නට පටන්ගෙන තිබිණි. ඔහු ඉතා අපහසුවෙන් ආසනයක් මත හිඳගත්තේය.

'දැන් හුඟක් කාලෙක ඉඳල උඹ මගෙන් මොනවත් ඉල්ල ඉල්ලයි හිටියේ බෝල්ඩ්වින්. දැන් උඹට හම්බවුණා නේ.' මැක්ගිනිට් කීවේ හති දමමිනි.

'උඹේ හිතේ ඇති කොණ්ඩායමේ නායක කමට එන්න, මාව ඡන්දෙකින් පරද්දලා. ඒක තීරණය කරන්නේ සංගමයේ සාමාජිකයෝ, මං මෙතන නායකයා හැටියට ඉන්න තුරු, මට ඉහළින් කව

කොල්ලන්ට මං එයාලාවුවන්ට ඉඩ තියන්නෙ නෑ."

"මං ඔබතුමාට විරුද්ධව මොකුත් කියන්න හිතේ නෑ" බෝල්ඩ්විත් කෙඳිරි නැගුවිය.

"එහෙම නං අපි මිත්‍රයො දැන් හොඳ යාළුවෝ!"

මැක්ගිනට් පැටලුණු තොරතුරු කීපයක් ඔවුන් පෙන්වමින්,

"ඒ සිද්ධිය එකෙණින්ම ඉවර කරමු"

විදුරු කුඩාහේ තක් මැක්ගිනට් ඒවා බින්නැතින් පිරෙව්වේය.

"ඒව පමණයාම අවුලන් කරලා, සංගම් කාමරවල ජය පතලා, අපි සමිඳිය පුරමු. ඊට පස්සෙ අපි අනාර් මේසය කියන්න බෑ"

"ඔන්න මගේ දුම් අත මගේ උගුර මත තැබුවා. ඔබ බෝල්ඩ්විත් මං අනතුරට ලක්කෙළා"

"මගේ ඔයා මොකක්ද කියන්නේ?"

"අනය කර විදුලිපුහුලක් බැරයෙලා"

බෝල්ඩ්විත් පිළිතුරු දෙන්නේය.

"එව අතෙකට සාවෙලා සිහින් ඉර කපාවි"

"ඒ ගැන මට සන්තෝෂයි"

ඔවුහු මිත්‍රත්ව විදුරුව බැගින් පානය කොට වාසිනය අවසන් කළහ. ඉන්පසු බෝල්ඩ්විත් හා මැක්ගිනට් අතරද එම වාසිනය ඉඩු අතාවිණි.

"මිත්‍රයාම කරන මරන එකනිං ඉවරයි." මැක්ගිනට් ලොක්කා සතුටෙන් කෑ ගැසීය.

"එහෙම නැතුව ඒව දැරීම ගෙනිච්චොත් සංගමේ ජීවිත අනුව ලංකාවට දඩුවම් කරන්න සිද්ධ වෙයි. ඒ ගැන බෝල්ඩ්විත්

සහෝදරය දන්නවා. ඔහෙවින් ඉක්මනට දැනගන්න ලැබේවි, මැක්මයෝ'

'මට ඉක්මනට කේන්ති ගිහිං ඉක්මනට සන්සුන් කරගන්නවා. ඒ වගේම ඉක්මනට සමාව දීල ඔක්කොම අමතක කරනවා. අයිරිෂ් ජාතිකයෙක් හැටියට ඒක මගේ ලේ වල තියෙන දෙයක් වෙන්න ඇති කියලයි අනිත් උන් කියන්නෙ. මන්න මං ඔක්කොම අමතක කළා. කිසි කරදරයක් නෑ' කිව් මැක්මයෝ තම දකුණු අත බෝල්ඩ්වින් දෙසට දිගු කළේය.

මැක්ගිනට් බලාගෙන සිටි නිසා බෝල්ඩ්වින් අත දිගු කළත්, තම සිතේ ඇතිවූ හැඟීම කිසිසේත් වෙනස් නොකළ බව මුහුණෙන් පිළිබිඹු විය.

මැක්ගිනට් ඔවුන් දෙදෙනාගේම උරහිස් වලට තට්ටු කළේය.

'කොල්ලෝ ! කොල්ලෝ !! එකම කෙල්ලෙක් නිසා මගේ කොල්ලො දෙන්නෙක් සණ්ඩුවෙනව කියල හිතන කොට පිස්සු හැදෙනවා නේද?

මේ ගෑනු ප්‍රශ්න ඇද නොගන්නවාට අපට මීට වැඩි ප්‍රශ්න තියෙනවා විසඳාගන්න, මැක්මයෝ සහෝදරයා, මගේ අංක 341 නාවිකාවට බඳවා ගන්න තියෙනවා. ඒවට අපේ ක්‍රම සහ විධි තියෙනවා. අපේ ක්‍රම විනාශයන්ට ඒවට වඩා වෙනස්. අපේ රැස්වීම සෙනසුරාදා යි. ඔයාට එන්න පුළුවන්නම් ඊට පස්සෙ අපට පුළුවන් ඔයාට වර්ණීසා නිමිත්තයක් නිදහස ලබාදෙන්න.'

# 3

## 341 වන ශාඛාව, වර්මිසාව

එම සිද්ධිය වූ දිනට පසුදින මැක්මඩෝර්, ෂාෆ්ටර්ගේ නේවාසිකාගාරයෙන් ඉවත්ව ගියේය. නගරයේ ඈත කෙළවරේ පිහිටි මැක්නමාරා මහත්මිය නම් වැන්දඹු කාන්තාවකගේ නිවසේ ඔහුට නවාතැන් ගැනීමට හැකිවිය. මේ අතර මයික් ස්කැන්ලන් ද නගරයට සංක්‍රමණය වීමට අවස්ථාව සැලසී තිබිණ. ඔහු ද මැක්මඩෝර් සමඟ හවුලේ නවාතැන් ගැනීමට තීරණය කළේය. එම නිවසේ නේවාසිකයන් වූයේ මේ දෙදෙනා පමණකි. මැක්නමාරා මහත්මිය අයිරිෂ් සම්භවය සහිත මහලු කාන්තාවකි. ඇය ප්‍රශ්නවලින් සිත අවුල් කර නොගන්නා, සියල්ල සැහැල්ලුවෙන් භාර ගැනීමට පුරුදුව සිටි තැනැත්තියකි. මැක්මඩෝර්ට හා ස්කැන්ලන්ට තම කටයුතු පිළිවෙළ කරගැනීමට ඇය ඉඩහැරියාය. එය ඔවුනට විශාල පහසුවක් විය.

කෑම ලබාගැනීමට අවශ්‍ය වූ විටෙක, ෂාෆ්ටර් නේවාසිකාගාරය වෙත යාමට මැක්මඩෝර්ට, මහලු ෂාෆ්ටර්ගේ අවසර ලැබිණ. එහෙයින් එට්ටි සමඟ ඔහු පැවැත්වූ ආශ්‍රයටද බාධාවක් නොවීය.

තමාගේ හොර ඩොලර් කාසි සැදීමේ අච්චු හා ඒ සම්බන්ධ උපකරණ එළියට ගැනීමට අලුත් නවාතැනේ නිදන කාමරය තුළ ආරක්ෂාව ප්‍රමාණවත් යයි මැක්මඩෝර් තීරණය කළේය. සංගමයේ සහෝදරවරු කිහිප දෙනෙක්ම රහසේ, මැක්මඩෝර්ගේ උපකරණ නැරඹීමට පැමිණියහ. ඒ සෑම දෙනෙකුටම මැක්මඩෝර්ගේ හොර ඩොලර් කාසි තෑගි වශයෙන් ලැබිණි. ඒවා කොපමණ සූක්ෂ්ම ලෙස නිමකර තිබුණේද යත්, සත්‍ය කාසි අයුරින්ම ගනුදෙනු වලට යොදා ගැනීමට අපහසු නොවීය. මේ තරම් දක්ෂ ලෙස රන්කාසි අච්චු ගැසීමට හැකියාව තිබියදී මැක්මඩෝර් රැකියාවක යෙදීම මිතුරන්ට තේරුම් ගැනීමට අපහසු ගැටළුවක් විය. එහෙත් රැකියාවක් නොකොට ඔහු ජීවත්වනු දුටුවහොත් පොලිසිය ඔහු ගැන සොයා බැලීමට ඉඩ ඇති බැව් ඔහු පෙන්වා දුන්නේය.

ශාඛා සාමාජිකයෝ සෑම සැන්දෑවකම පාහේ මැක්ගිනිට්ගේ අවන්හලේ රැස්වූහ. මෙම සමාගමයට මැක්මර්ඩෝ සහාය වූයේ නම් ඒ ඉතා කලාතුරකිනි. ඔහුගේ නිර්දය කාඨ විලාපය හා හැසිරීම නිසා කෙටි කාලයකින් ඔහු ශාඛාවේ සාමාජිකයන් අතර ඉහළ ජනප්‍රියත්වයට පත්විය. ටෙඩ් බෝල්ඩ්වින් සමග ඇතිවූ ප්‍රශ්නය මැක්ගිනිට් ඉදිරිපිට විසඳාගත් ආකාරය ගැන, ඔහු මිතුරන් අතර ගෞරවයට පාත්‍රවිය. මැක්මර්ඩෝගේ වර්ණාකම් තවත් ඉහළ ගිය මේ සිද්ධිය ඇති වූයේ ඉන්පසුවයි.

අවන්හල ජනයාගෙන් පිරී ඇතිකී එක් රාත්‍රියක, නිල් පැහැති නිල ඇඳුමකින් හා නිල් තොප්පියකින් සැරසුණු එක් පුද්ගලයෙක් අවන්හලට ඇතුළු විය. ඒ පතල් පොලිස් කඳවුරේ නිලධාරියෙකු බව නිල ඇඳුමෙන්ම හඳුනාගත හැකි විය. සාමාන්‍ය සිවිල් පොලිසියට පාලනය කළ නොහැකි තරම් අපරාධ මෙම ප්‍රදේශයේ පැතිර යමින් තිබිණ. සංවිධානාත්මකව කළ මංකොල්ලකෑම්, මිනීමැරුම් හා ත්‍රස්තවාදය ඉදිරියේ සාමාන්‍ය පොලිස් නිලධාරීයෝ අසරණ වූහ. ශක්තිමත් පහරක් ලබාදීමට දුම්රිය ධාවන සමාගම්, පතල් හා කර්මාන්ත ශාලා හිමිකරුවන් එක්ව පතල් පොලිස් කඳවුර පිහිටුවන ලදී.

නිලධාරියා අවන්හල දොරින් ඇතුළුවෙද්දී එහි එක්වරම නිහඬතාවයක් පැතිර ගියේය. සමහරු ඔහු දෙස බැලුවේ මහත් කුතුහලයෙනි. එක්සත් ජනපදයේ සමහර ප්‍රදේශවල පොලිස් නිලධාරීන් හා අපරාධකරුවන් අතර විශේෂ ආකාරවල සබඳතා තිබිණ. එහෙයින් නිලධාරියා පැමිණ තම අනුග්‍රාහකයන් අතර අලුත් ගනිද්දී මැක්ගිනිට් පුදුමයට පත්නොවිය.

'අද තරම් සීතල දවසක් දෙන්න මට විස්කි එකක්' පොලිස් නිලධාරියා ඉල්ලා සිටියේය.

'අපි මීට පෙර මුණ ගැසිල නෑ නේද මහත්තයෝ?'

'ඔව් මෙතන අලුත් පොලිස් කඳවුරේ අලුත් කපිතාන්?'

මැක්ගිනිට් ඇසීය.

'ඔබ හරි මන්ත්‍රීතුමා. මේ නගරයේ නීතිය ආරක්ෂා කරලා, සාමකාමී ජීවත් කිරීමට අපි මහත්තුමා ඇතුළු අනෙක් වැදගත් මහත්වරුන්ගේ උදව් බලාපොරොත්තු වෙනවා. මගේ නම හරිසන් මාටින්'

'මන්ත්‍රී මහින් නැති වුණාට අපට අපේ නගරයේ සාමය ආරක්ෂා කරගන්න පුළුවන් හරිසන් මාටින්' මැක්ගිල් පැවසුවේ කිසිදු ගරු සරුවක් නැතිවය.

'මේ නගරයේ තියෙනව අපේම පොලිසියක්. ඉතින් මොකටද පිටකින් ඒව ගෙන්වන්නේ? මන්ත්‍රී කාටද කියල අපි දන්නේ නෑ කියලද හිතන්නේ? තමුසෙලා තමයි ධනපතීන්ගේ ආයුධ. අහිංසක ගම්වාසීන්ට, දුප්පත් කම්කරුවන්ට බැටන් පොලු පාර දෙන්න, වෙඩි තියල මරාදන්න ධනපතීන් යොදවපු ආයුධ'

'හොඳයි, හොඳයි, ඔය ගැන තර්ක විතර්ක කරන්න මං කැමති නෑ. අපි කට්ටිය අපේ යුතුකම් හොඳට ඉටුකරන්න ඕන. ඒවුණත් තමුන්නේ යුතුකම් මොනවද කියන එක තැනකටවත් එක විගේ පෙනෙන්නේ නෑ.'

ඩික්සි ටීලුරුව මේ හමාර කළ නිලධාරියා පිටව යන්නට සූදානම් විය. ඔහු තුළුවින් ටාසිවී ඔහු දෙස රවා බලමින් සිටි ජැක් මැක්ගිවෙර්ගේ මුහුණ පොලිස් නිලධාරියා දුටුවේ එවිටය.

'හලෝ ! හලෝ !! පොලිස් නිලධාරියා පැවසුවේ මැක්ගිවෙර් දෙස පරීක්ෂාවෙන් බලමිනි.

'මෙන්න ඉන්නවා ඉස්සර අඳුනන කෙනෙක්'

'මං කවදාවත් තමුසෙව එක් දෙවනි පොලිස් කාර්යාලයක එක් යාලුවෙක් වෙලා හිටියෙ නෑ නෑ'

පැවසූ මැක්ගිවෙර් කෝපයෙන් ඉවත බලා ගත්තේය.

'අඳුනන කෙනෙක් කියන්නෙ හැම තිස්සෙම යාලුවෙකුට නොවෙයි. තමුසෙ විකාරයෙක්ව ජැක් මැක්ගිවෙර් නේද?'

'මං මොකටද නෑ කියන්නෙ, තමුසෙ හිතන්නෙ මගේ නම කියන්න මට ලැජ්ජයි කියලද?'

'එහෙම වෙන්න කාරණාවක් නෑ කියනවා'

'මොකක්ද ඒ කතාවෙ තේරුම ?' මැක්මහෝන් කෝපයෙන් කෑගැහුවේ අත් මිට මොලවමිනි.

'ඔය පුරාජේරු කතාවලින් වැඩක් නෑ ජැක් මාත් එක්ක. මේ ගල් අඟුරු බංකරේට එන්න කලින් මාත් කාලයක් චිකාගෝ පොලිසියෙ වැඩ කළා. චිකාගෝවල තක්කඩියෙක් දැක්ක ගමන් මට අඳුනගන්න පුළුවන්'

මැක්මහෝන්ගේ මුහුණ අඳුරු විය.

'ඔහේ චිකාගෝ පොලිසියෙ හිටියද?'

'අන්න හරි. ඒ වෙඩි තැබීම්ම තමා, මම චෙනුවෙන් සේවයට කැපවෙලා. එත් අර ජොනාස් පින්ටෝට වෙඩි තියපු සිද්ධිය අපට අමතක නෑ'

'මං උගෙ වෙඩි තිබ්බෙ නෑ'

'වෙඩි තිබ්බෙ ඔහේ නෙමෙයි? ආ ඒක බොහොම අපක්ෂපාතී සාක්ෂියක්. එහෙම නේද? ඒත් ඒ මිනිහගේ මරණයෙන් තමුසෙට හරි වාසියක් උණා. තමුසෙගේ හොර සල්ලි අච්චු ගහන ව්‍යාපාරයෙන් තමුසෙ සම්පූර්ණයෙන්ම බේරුණා.

හොඳයි. ඒක ගියාවෙ. තමුසෙට මං රහසක් කියන්නම්. මේව කියන එකත් මගේ රාජකාරි වලට පටහැනියි. තමුසෙට විරුද්ධව නඩුවක් දාන්න තරං සාක්ෂි තිබුණේ නෑ. ඒ නිසාද ඕන නං හෙට උණත් තමුසෙට ආපහු චිකාගෝවට යන්න පුළුවන්.'

'අපොයි ඕන නෑ. මට මෙහේ කිසි කරදයක් නෑ'

'තමුසෙට බොහොම වැදගත් ආරංචියක් මං කිව්වෙ. ඒකට මට ස්තූති කරන්නෙ නැද්ද?'

'හරි හරි. බොහොම ස්තූතියි'

'තමුසෙ නීති ගරුකව ඉන්න තුරු මගෙන් මොකුත් ප්‍රශ්නයක් නෑ. ඒ වුනත් නීතියෙන් පිටපැන්නොත් ? දෙයියම්පා එහෙම උනොත් මගෙන් නම් කිසිම සමාවක් නෑ. ශුභ රාත්‍රියක් මිතුයා. ශුභ රාත්‍රියක් මන්ත්‍රීතුමා'

ඔහු අවන්හලෙන් පිටව ගියේ ජැක් මැක්මයෝර් වීරයෙකු බවට පත්කරමිනි. විකාගෝවේ ඔහුගේ කපන්කම් පිළිබඳ යොමයෙකුත් කටකතා පැතිර තිබිණ. මිතුරන් ඒ පිළිබඳ විමසීම් කරද්දී ඔහු ඒවා සිනහමුසු මුහුණින් ප්‍රතික්ෂේප කළේය. එසේ කරන්නට ඇත්තේ වීරත්වයක් තමා වෙත ගොඩනගා ගැනීම වැරදි යයි සිතූ පුද්ගලයකු විලසිනි. එහෙත් දැන් සියල්ල නිල වශයෙන් අනුමත වී ඇත. අවන්හලේ රැස්ව සිටි සියල්ලෝම ඔහු වටා එක්වී ශුභ පැතුම් පිරිනැමූහ. බොහෝ මත්පැන් පානය කළත් මැක්මයෝර් පහසුවෙන් වෙරිවන පුද්ගලයකු නොවේ. එහෙත් එදා නම් ජැකලින් නොසිටින්නට ඔහුට ආපසු නවාතැනට යාම අපහසු වනු නොඅනුමානය.

වර්මිසා ශාඛාවට මැක්මයෝර් බඳවා ගැනීමේ උත්සවය සෙනසුරාදා දිනයක රාත්‍රියට යෙදී තිබිණ. ඔහු විකාගෝවේදී මෙම සංගමයේ සාමාජිකත්වය ලබා සිටි නිසා, උත්සවයකින් තොරව ශාඛාවට එකතුවීමට මැක්මයෝර් බලාපොරොත්තු විය. එහෙත් වර්මිසා ශාඛාවටම විශේෂ වූ, එහි සාමාජිකයන් වෙනුවෙන් ආඩම්බර වූ චාරිත්‍ර තිබිණ. සියලුම ඉල්ලුම් කරුවන් විසින් ඒවා පිළිපැදිය යුතු විය.

මෙවැනි කටයුතු සිදුකිරීම සඳහා වෙන්වූ විශේෂ ශාලාවක් සංගම් කාර්යාලයට අයත් ගොඩනැගිල්ලේ කොටසක තිබිණි. වර්මිසා නගරයට අනුයුක්ත සාමාජිකයෝ හැට දෙනෙක් එද මෙහි රැස්වූහ. එහෙත් මේ, සංවිධානය සතු පූර්ණ සාමාජික සංඛ්‍යාව නොවේ. වර්මිසා නිම්නය පුරා ශාඛා කිහිපයක්ම තිබිණ. අපරාධයක් කිරීම සඳහා නාඳුනන පුද්ගලයින් යොදා ගැනීමට අවශ්‍ය වූ විට ඈත පිහිටි ශාඛාවක සහෝදරයින් කැඳවා ගැනීම

සිරිතක් විය. ගල් අඟුරු ආකර පිහිටි ප්‍රදේශය පුරා පමණක් ශාඛා පන්සියයකට අධික සංඛ්‍යාවක් විය.

ශාලාවේ ප්‍රධාන මේසය දෙපස සාමාජිකයෝ අසුන්ගෙන සිටියහ. පැත්තක තිබූ තවත් මේසයක් මත ගත්පුන් බෝතල් හා වීදුරු ගොඩගසා තිබිණ. රැස්වීම ආරම්භයට පෙර සිටම සමහරු බිම මේසය දෙස හොර කරකවමින් බැලීමට පටන් ගත්හ.

මේසයේ ප්‍රධාන කෙළවරේ මැක්ගින්ටි අසුන් ගත්තේය. අවුල් වූ කෙස් කලාපය වැසෙන සේ කළු පැහැති වෙල්වුද් හිස්වැස්මක් ද, කර වටා දම් පැහැති දිගු ලුවල් පටියක්ද ඔහු පැළැඳ සිටියේය. යම්කිසි දරුණු දෙව් ප්‍රජාවකට පූජනීය වන යාතුලුවරයකුගේ පෙනුමකි ඔහුගෙන් දිස්වූයේ. මැක්ගින්ටිගේ වම් හා දකුණු පසින් වර්මිසා තොඩ ඉහළ නිලතල දැරුවෝ අසුන් ගත්හ. ටෙඩ් බෝල්ඩ්වින්ගේ කුරිරු මුහුණද ඒ අතර දැකිය හැකිවිය. මෙම නායකයිනට අමතරව සාමාජිකයෝ තම්ගේ තනතුර හැඟවෙන පදක්කමක් හෝ කරලේන්සුවක් පැළඳ සිටියහ.

මෙම තනතුරු දැරුවේ තලතුනා වයසේ අයයි. සෙසු සාමාජිකයෝ බොහෝ සෙයින් තරුණ අය වූහ. වැඩිහිටියන්ගේ නියෝග අනුව ඕනෑම මෙහෙයක ක්‍රියාත්මක වීමට සූදානමින් සිටි සමහරු, අවුරුදු දහයකින් හිට විසිපහ වයසේ ලාබාලයෝ වූහ. වයසින් වැඩි කිහිප දෙනා අතර සමහරුන්ට තිබුණේ, සැබෑ නීතියට එරෙහි, වසලයින් මෙන් දරුණු මිනීමරු පෙනුමකි. එහෙත් මෙම ලාබාල තරුණයින් මිනීමරු කල්ලියකට සම්බන්ධ වීමට තරම් මානසික විකෘතියකට පත්වූයේ ඇයිද යන්න සිතාගැනීමට පවා අපහසුය.

තමන්ට කිසිදිනක වරදක් නොකළ හෝ කිසි දිනෙක දැක නොතිබූ මිනිසෙකු මෙලෙසින් කුරන් කිරීම මවුන්ගේ විකෘති මනසට වීර ක්‍රියාවක් විය. අපරාධය අවසානයේ එය සිදුවූයේ කාගේ පිහි අවියෙන් තියුණු වූ උණ්ඩයෙන්ද යන්න නිරණය කර ගැනීමට මවුනු බහින්බස් වූහ. මරණයට පත් තැනැත්තා කළ විලාපය යළි සිහිකරමින් ආශ්වාදයක් ලැබූහ.

මුලදී මෙම කටයුතු සියල්ල ඔවුන් ගෙන ගියේ රහසිගතවයි. එහෙත් මේ කථාවෙන් කියවෙන කාලයේ මේ අපරාධ එළිපිටම සිදුකිරීමට තරම් ඔවුහු නිර්භය වූහ. ඊට හේතු වූයේ නීතිය හරි හැටි ක්‍රියාත්මක කිරීමේදී රජය දැක්වූ අසාර්ථක භාවයයි. එක් අතකින් ඔවුනට විරුද්ධව සාක්ෂි දීමට කිසිවෙකු ඉදිරිපත් වූයේ නැත. අනෙක් අතට, අපරාධය සිදුවන වෙලාවේ විත්තිකරුවා එහි නොසිටි බවට, උසාවියේ දිවුරා සාක්ෂි දීමට සූදානම් සාක්ෂි කරුවෝ, ඕනෑම ප්‍රමාණයක් ඉදිරිපත් කිරීමට සංගමයට හැකියාව තිබිණ. නඩු වලදී ඔවුන් වියදම් කළ ධනස්කන්ධයට ලෝකයෙන් ප්‍රශස්තයේ දූෂිත නීතිඥයෝ, අපරාධකරුවන්, අහිංසකයන් කොට නීතියේ රැහැණින් මුදාගත්හ. අවුරුදු දහයක් වැනි දීර්ඝ කාලයක් මුළුල්ලේ සිටිම අපරාධකරුවකුට හිසි දඬුවම් දීමට නීතිය සමත් නොවීය. අපරාධකරුවන්ට එල්ල වූ එකම තර්ජනය වූයේ ඔවුනගේ ප්‍රහාරයට ලක්වන තැනැත්තා, අපරාධ කරුවා මෙන, [illegible] රහිත ලෙස එල්ල කළ ප්‍රතිප්‍රහාරයයි. එයද සිදුවූයේ ඉතාමත් කලාතුරකිනි.

යම්කිසි මරපහර ආකාරයක දිවුරුම් දීමකට මුහුණ දීමට සිදුවෙතැයි මැක්මර්ඩෝට සගයන්ගෙන් ආරංචි වී තිබිණ. එහෙත් එය කුමන කාලේ එකක් දැයි පැහැදිලි කිරීමට කිසිවෙකු ඉදිරිපත් නොවීය. සාමාජික සොයුරන් දෙදෙනකු විසින් මැක්මර්ඩෝව පිටත කාමරයකට කැඳවාගෙන යන ලදී. සභා ගර්භය තුළ කෙරෙන කතාබහේ ශබ්දය ඔහුට අසන්නට ලැබුණත්, එය නොපැහැදිලි විය. වරක්, දෙවරක් තමාගේ නම කියවෙනු ඔහුට පැහැදිලිව ඇසිණි. තමාට සාමාජිකත්වය ලබාදීම ගැන සාකච්ඡා කෙරෙන බව ඔහුට සිතාගත හැකිවිය. මීළඟට ඔහු සිටි කාමරයට ඇතුළුවූයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සාමාජිකයෙකි. ඔහු ශරීරය හරහා කොළ හා රතුවන් පැහැය මිශ්‍ර පටියක් පැළඳ සිටියේය.

'නායකතුමා කියනවා ඔහුව බැඳල, ඇස් දෙකත් බැඳල ඇතුළට ගේන්න කියල'

ඔවුහු මැක්මර්ඩෝගේ කබාය ඉවත් කළහ. දකුණු අතේ කමිස අත උඩටම අකුලන ලදී. ශරීරය වටා යැවූ කඹය,

වැලමිටට මදක් ඉහළින් සිටින සේ නමා කොණ්ඩුව සද කරන ලදී. ඊළඟට කළු පැහැති ඝන රෙද්දෙන් මැසූ තොප්පියක් වැනි ආවරණයක් හිසට දමන ලදී. ඇස්දෙක ද ඇතුළුව මුහුණේ උඩ කොටස සම්පූර්ණයෙන්ම එයින් වැසී ගියේය. ඒ නිසා මැක්මයෝර්ට සියල්ල බලාගැනීමට තිබූ අවස්ථාව අහිමිවිය. ඉන්පසු ඔහු රැස්වීම් ශාලාව වෙත කැඳවාගෙන යන ලදී.

සාමාජිකයෝ ශාලාව තුළ කසුකුසු ගාමින් සිටියහ. මැක්ගින්ටි ලොක්කා ප්‍රශ්න කිරීම් ඇරඹීය.

'ජෝන් මැක්මයෝර්. පුරාණයේ සිට පැවත එන නිදහස් විත්තන සංගමයේ ඔබ දැනටමත් සාමාජිකයෙක්ද?'

'ඔව්'

'ඔබේ පාලන ශාඛාව අංක 29 චිකාගෝවද?'

'ඔව්'

'අඳුරු රාත්‍රීන් අප්‍රසන්නයි'

'ඔව්. අමුත්තන්ට ගමන් කිරීම සඳහා'

'වලාකුළු බරවෙලා'

'ඔව්. කුණාටුවක් ළඟ එනවා'

'සහෝදරවරුනි, ඔබ සෑහීමට පත්වුණාද?'

නායකතුමා ඇසීය. එයට එකඟත්වය ප්‍රකාශ විණි.

'සහෝදරයා අපට ඔබේ සංඥා සහ පිළිතුරු සංඥා මගින් ඔබ අපේම කෙනෙක් බව විශ්වාසයි'

මැක්ගින්ටි කීය.

'ඒ වුණත් මේ ප්‍රදේශයේදී අප විසින් චාරිත්‍රානුකූලව පවත්වාගෙන යන යම් චාරිත්‍ර ධර්ම තියෙනවා. ඔබ කැමතිද ඔබව පරීක්ෂාවට ලක් කරනවට ?'

'මම නැගිටියි'

'ඔබේ හදවත නිර්ජීව ද?'

'ඔව්'

'එය ඔප්පු කිරීම සඳහා එක අඩියක් ඉදිරියට තබන්න'

මැක්මහෝන් එක අඩියක් ඉදිරියට තැබීමට උත්සාහ කළේය. දැස් ඉදිරිපසින් උල් කටු දෙකක් වැනි යමක් ඇති බව ඔහුට දැනිණ, දැස් තුවාල කර නොගෙන ඉදිරියට යා නොහැකි බවත් ඔහුට හැඟිණ. එහෙත් මැක්මහෝන් ඉදිරියට ගමන් කළේය. උල් දෙක ක්ෂණිකවම එතැනින් ඉවත් විය.

'ඔහුගේ හදවත නිර්භීතයි. ඔබට වේදනාව උහුලන්න පුළුවන්ද?'

'අනෙක් ඕනෑම කෙනෙකුට වගේ......'

මැක්මහෝන් පිළිතුරු දුන්නේය.

'ඔහුව පරීක්ෂා කරන්න'

එසැණෙහිම අතිශයින් දරුණු, තදබල වේදනාවක් ඔහුගේ අතේ බාහුව පෙදෙසින් දැනිණ. කටින් පිටවීමට ගිය විලාප හඬ, ඔහු මහත් අපහසුවෙන් තදකර ගත්තේය. ඉවසිය නොහැකි වේදනාව නිසා ඔහු ක්ලාන්ත වීමට ආසන්න විය. අත් මිට මොලවාගෙන, තොල් සපාගෙන ඔහු වේදනාව ඉවසා ගත්තේය.

'ඔයාට වඩා වේදනාවක් වුණත් මට උහුලන්න පිළිවන්' මැක්මහෝන් කීය.

සභා ගැබෙන් මහ හඬින් අත් පොළසන් නාදයක් නිකුත් විය. බඳවා ගැනීමේ චාරිත්‍ර වලදී මේ තරම් නිර්භීත ලෙස, වේදනා සහගත පරීක්ෂණයට කිසිදු සාමාජිකයෙකු මුහුණ දී නැත.

මැක්මඩෝගේ හිස් ආවරණය ඉවත් කරන ලදී. සහෝදරයන්ගේ ගුහා තැනුම් මධ්‍යයේ මැක්මඩෝ සිටියේ සිනාමුසු මුහුණෙනි.

'තවත් එක වචනයක් තියෙනවා මැක්මඩෝ සහෝදරයා' මැක්ගින්ටි කීය.

'රහස භාවය රැකීමට හා විශ්වාසය කඩ නොකිරීමට ඔබ දැන් දිවුරුම් දුන්නා. ඔබ දන්නවා ඇති ඒවා කඩකළොත් දඬුවම ක්ෂණික මරණය. එයෙන් ඔබට ගැලවීමක් නෑ.'

'මම දන්නවා.'

'සියලුම අවස්ථාවන්හිදී කණ්ඩායමේ නායක තුමාගේ ආඥා පිළිපැදීමට ඔබ එකඟවෙනවාද?'

'එහෙමයි.'

'එසේ නම් පාලන ශාඛා අංක 341 වර්මිස්සාවට අප ඔබව සාදරයෙන් පිළිගන්නවා. ස්කැන්ලන් සහෝදරයා මින්පැන් මේසයට ගන්න. අපේ වටිනා සහෝදරයා වෙනුවෙන් සවිළිය පුරමු.'

'මැක්මඩෝගේ කබාය ඔහු වෙත ගෙන එන ලදී. එය හැඳගැනීමට පෙර, තවමත් තදින් වේදනා ගෙන දුන් බාහුව ඔහු පරීක්ෂා කර බැලුවේය.

කණ ගැසීමට භාවිත කළ, ගිනියම් කළ යකඩයෙන් තැබූ පලකුණ, කවයක් මැද පිහිටි ත්‍රිකෝණයකි. එය සම පමණක් නොව, මස ඇතුළටම පිළිස්සී ගොස් තද රතු පැහැයෙන් දිස්විය. අසල සිටි මිනිස දෙදෙනෙක් කමිස අත් හකුළා, ඔවුන්ගේ අත්වල පිහිටි ලාංඡන ප්‍රදර්ශනය කළහ.

'අපි ඔක්කොටම ඔය දේ කළා. ඒත් ඒකට ඔබ තරම් නිර්භීතව අපි කවුරුවත් මුහුණ දුන්නෙ නෑ.'

'අයියෝ, මේක සුළු දෙයක්' යයි මැක්මයෝ පැවසුවත් පිළිස්සුම් තුවාලයෙන් මතුව දැඩි වේදනාවක් දැනිණි.

මත්පැන් සංග්‍රහය අවසන් වූ පසු සභාවේ වැඩකටයුතු යළිත් ආරම්භ විය. විසාගෝස්වේ රැස්වීම් වල වැඩ කටයුතු පමණක් දැනසිටි මැක්මයෝ මහත් ඕනෑ කමින් ඊට සවන් දුන්නේය.

'නායක සහෝදර හැටියට අපට කිරීමට තිබෙන මුල්ම කටයුත්ත මේ ලිපිය කියවීමයි.

එය අපට ලැබී තිබෙන්නේ ශාඛා අංක 249 මර්ටන් හි ප්‍රාදේශීය නායක වින්ඩිල් ගෙන්' මැක්ගින්ටි ලිපිය කියවීමට පටන් ගත්තේය.

ප්‍රිය මහත්මයාණනි,

වේ හා ස්වර්මැන් ගල් අඟුරු සමාගමේ හිමිකරුවකු වන ඇන්ඩ්‍රෑ රේ සඳහා කටයුතු සිද්ධ කිරීමට අවශ්‍ය වී ඇත. පසුගිය වසර අවසානයේදී ඔබ ප්‍රදේශයේ පොලිස් නිලධාරියෙකුට වැඩකට යුතු සිද්ධ කිරීම සඳහා අපේ ශාඛාවෙන් සොහොයුරන් දෙදෙනෙකු ලබා දුන් බව ඔබට මතක ඇතැයි සිතමි. දක්ෂ පුද්ගලයින් දෙදෙනෙකු අපවෙත එවන්න. භාණ්ඩාගාරික හිගින්ස් විසින් ඔවුන් භාරගනු ඇත. ඔහුගේ ලිපිනය ඔබ දනියි. ක්‍රියාකළ යුත්තේ කවදාද, කොහිදීද යන්න ඔහු විසින් පෙන්වා දෙනු ඇත.

නිදහස වෙනුවෙන්<br>
ජේ. ඩබ්. වින්ඩිල්<br>
ප්‍රාදේශීය නායක,<br>
නි. වි. සං.

'අපේ වැඩකටයුතු වලට මිනිහෙක් දෙන්නෙක් ඕන වුණාම වින්ඩිල් කවදාවත් බෑ කිව්වේ නෑ. ඒ නිසා අපට කොහොමවත් ප්‍රතික්ෂේප කරන්න බෑ. කවුද මේ වැඩේට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙන්නේ?'

තරුණයෝ කිහිපදෙනෙක්ම තම අත් එසවූහ. නායකතුමා ඔවුන් දෙස බැලුවේ සතුටෙනි.

'හොඳයි තෝමස්. ඔය සැරේ ඔබට භාරදීපු වැඩේ හොඳට කළා. එහෙම කළොත් මේ සැරෙත් වරදින්නෙ නෑ.' අනික් එක්කෙනා විල්සන්

'මං ළඟ පිස්තෝලයක් නෑ.' ඔහු විසිවන වියටවත් පා නොතැබූ ගැටවරයෙකි.

'ඔහේගෙ පළවෙනි එක නේද? පළමුවෙනි එක හොඳයි වෙලාවෙ හරි කරන්න ඕන නේ. සඳුදාට ආවම ආයුධ සූදානමින් තියේවි. වැඩේ හරියට කරලා ආපහු ආවම අපි ඔබව සාදරයෙන් පිළිගන්නවා.'

'මේ සැරේ නැද්ද තෑග්ගක් ?'

කළු පැහැ ගැන්වුණු රළුරළු මුහුණක් හා හැඩිදැඩි සිරුරක් ඇති තෝමස් ඇසීය. දරුණු ස්වභාවය නිසාම ඔහුට තොටියා යයි නමක්ද පටබැඳී තිබිණි.

'තෑගි ගැන හිතන්න එපා. ඒ වචනෙට ගරු කරන්න. වැඩේ ඉවර කළාට පස්සෙ කීයක් හරි ලැබෙන්න ඉඩ තියෙනවා.'

'ඒ මිනිහා මොකක්ද කරල තියෙන වැරැද්ද?'

ඒ ඇසුවේ තරුණ විල්සන්ය.

'උඹට වැඩක් කරන්න කිව්වම ඒ මිනිහ කරල තියෙන වැරැද්ද මොකක්ද කියල අහන්න එපා. ඒ ශාඛාවේ සහෝදරයො තීරණයක් අරගෙනයි කියන්නෙ. ඒ මිනිහා වැරැද්දක් කළාද නැද්ද කියල අහයන එක අපේ රාජකාරියක් නොවෙයි.

ඒ ගැන කියනකොට මතක් වුණේ. මීටන් ශාඛාවේ සහෝදරයෝ දෙන්නෙක් ලබන සතියේ මෙහේ එනවා. වැඩ කටයුතු කරන්න'

'කවුද ඒ මිනිස්සු?' සිසිලෙන් ඇසීය.

'මගේ වචනෙ විශ්වාසෙට ගන්න. මිනිස්සු කවුද කියලා ඔහේල නොදන්න තරමට හොඳයි. එතකොට කටින් මොනවත් පිටවෙන්නෙත් නැ. ඒ ගැන කරදර වෙන්න විදියකුත් නැ. මිනිස්සු කවුරු වුණත් වැඩේ පිරිසිදුවට කරාවි, කොහේ අඩුවක් නොකර'

'ඒ වගේම තවත් සම්පූර්ණ කළ යුතු වැඩ තියෙනවා' ටෙඩි බෝල්ඩ්වින් කීය.

'දැන් මේ පළාත්වල මිනිස්සු ගණනට වැඩිවෙගන එනවා. කර්මාන්ත ශාලාවේ ෆෝමන්, විලෝකර් අපේ මිනිසුන් තුන්දෙනෙකුම ගිය සතියේ රැකියාවෙන් එළවා දැම්මා. දැන් ඉතාක් කල් තිස්සෙ අපේ තියනවා එයාට ගෙවන්න ණයක්. මිනිහට ඒක සම්පූර්ණයෙන්ම ලැබෙයි'

'මොනවද එයාට දෙන්නෙ?' මැක්මඩෝ ඇසීය.

'රන් ලුණිස්සම් සහිත පසුරෝමක වැඩ රාජකාරී තියන පැක්කෙත් සංග්‍රහයක්. ඇයි සහෝදරයා, ඔහේ හිතුවේ මොනවා කියලද?'

මැක්මඩෝගේ අපරාධකාරී ස්වභාවය, ඔහුගේ සංගමයෙන් ලැබෙන ධෛර්යයෙන් දියුණු, තියුණු වී ඇති ආකාරයක් පෙනිණ.

'මං ඒකට නම් කැමතියි. අන්න එහෙම තමා කරන්න ඕන' ඔහු කීය.

'අපේ නායක තුමනි. මං කැමතියි දැනුම් දෙන්න. ශාඛාවේ යම් වැඩක් සඳහා කොතෙක් උවමනා නම්, මං ඕනෙම වෙලාවක ලැස්තියි එහෙම වැඩකට සහභාගී වෙන්න. ඒක මට ගෞරවයක්'

මෙම ප්‍රකාශයට සභාවෙන් අත්පොළසන් නාදයක් ඇසිණ. ඔවුන්ගේ ලෝකය කව තවත් ආලෝකමත් කිරීම සඳහා, අලුත් ඉරක් පායාගෙන එන්නාක් මෙන් සාමාජිකයනට හැඟිණ. එහෙත් සමහර වැඩිහිටි සාමාජිකයෝ මැක්මඩෝගේ ඉදිරි ගමන වේගවත් වැඩි යයි සිතූහ.

ඔහු ලිපිකරුවෙකුගේ මුහුණත් සහ අළුපාට රැවුලක් තිබූ පුද්ගලයෙකු හැටි සිටියේය. මැක්ගින්ටි අසලින්ම අසුන්ගෙන සිටි ඔහු සංගමයේ ලේකම් හැරවේ ය.

'මං යෝජනා කරන්න කැමතියි, සභාවේ සහෝදරයන්ගේ කැමැත්තෙන්ම ඔහුව තෝරාගන්නා තුරු, මැක්මර්ඩෝ සහෝදරයා ඉවසා සිටිය යුතුයි කියල'

'මං අදහස් කළෙත් එයමයි. ඔබේ තීරණයට මං එකඟයි'

'ඔබේ වෙලාව එයි සහෝදරයා,' මැක්ගින්ටි කීය. 'ඔබ කැමැත්තෙන්ම ඉදිරිපත් වෙන කෙනෙක් හැටියට අපි සටහන් කරගන්නා. මේ පළාතේ හොඳ වැඩකටයුතු රාශියක්ම ඔබට කරන්නට ලැබෙන බව අපට විශ්වාසයි. ඊට කලින් අද රෑට කළ යුතු පොඩි වැඩක් තියෙනවා. ඔබ කැමති නම් එයට සහභාගී වෙන්න පුළුවන්'

'මොනව හරි ලොකු වැඩක් ලැබෙනතුරු මං ඉන්නම්?'

'ඕනා නම් ඔබට අද රෑටත් එන්න පුළුවනි. එතකොට ඔබට අපේ සංගමයේ යහපත සඳහා අපි එකමුතුව වැඩකරන හැටි. මං ඒ ගැන විස්තර පස්සෙ කියන්නම්.

නායය පතුගේ හැටියට ඔබට දැනුම් දීමට තවත් කාරණා එකක් දෙකක් තියෙනවා. පළමුවෙන්ම මං කැමතියි භාණ්ඩාගාරික තුමාගෙන් අපේ බැංකු ගිණුමේ තත්ත්වය කොහොමද කියල දැන ගන්න.

ජිම් කාර්නවේ සහෝදරයාගේ බිරිඳට අපි වැන්දඹු විශ්‍රාම වැටුපක් ගෙවිය යුතුයි. ඒක අපේ යුතුකමක්. ඔහු මියගියේ රාජකාරියේ යෙදී සිටිද්දී වැදුණු වෙඩි පහරකින්. ඒ නිසා ඔහුගේ බිරිඳ අනාථ වෙන්න නොදී රැකබලා ගත යුතුයි.'

'මාලින්ක්ස් වල චෙස්ටර් විල්කොක්ස්ව මරන්න උත්සාහ කරද්දී ජිම්ට වෙඩි වැදුණා.'

ළඟ සිටි තැනැත්තෙක් මැක්මහොට කරුණු පැහැදිලි කළේය.

'අපේ අරමුදල දැනට නම් ඉතාම හොඳ තත්ත්වයක පවතිනවා.' මැංගු ගිණුම් සටහන් පොත් තබා ඉදිරියේ තබාගෙන, භාණ්ඩාගාරික තුමා කථාව ඇරඹීය.

පසුගිය කාලේ සමාගම හැම එකක්ම වාගේ ලෝක තැඹුව අප නියමිකල ගෙවීම් කළා. මැක්ෂ් ලින්ඩර් සහ සමාගම ඩොලර් පන්සියයක් ගෙව්වා. ඒ පේ එයාලට කරදරයක් නොකර පාලුවේ ඉන්න අපිත සෙන්ට්‍රොන්ට්‍ර පිට. ඩෙරිකර් සහ සමාගමෙන් ඩොලර් සියයක් එවල තිබුණා. මං ඒක ආපහු යැව්වා, එවනව නං පන්සියයක් එවන්න කියලා. බඳු වෙනකොට සමුද්‍රයක පිළිතුරක් නොලැබුණොත් ඒ ගොල්ලන්ගේ යන්ත්‍ර පුනුවල දැනිමරිඳ තැපෙන්න ඉඩ තියෙනවා. ගිය අවුරුද්දේ ඔවුන් අපේ ඉල්ලීම්වලට එකඟ වුණේ දේපළ කොටසක් ගිනි තියලා විනාශ කළාට පස්සෙයි. විලතට බන්නානිර සළාන් ගල් අඟුරු සමාගම ඔවුන්ගේ වාර්ෂික ගෙවීම් එවල තියනවා. වැඩ කටයුතු රාශියක් වුණත් කරන්න තරම් සෑහෙන විශාල අරමුදලක් අපට තියෙනවා.'

'ආවි ජෙන්කින්ට මොකද වුණේ?'

කිසිවෙක් ඇසුවේය.

'මිනිහා මහත්තොම දේපොළ විකුණලා, මෙහෙන් යන්න ගියා. ඇයි ඒ තාකි යන්නයා ලියුමක් එව්ව නේ යනකොට. මිනිහ කියල තිබුණා හොර තක්කඩින්ට සල්ලම් ගෙවන ගල් අඟුරු ආකර හිමියෙක් වෙනවට වඩා එයා කැමතියි කියල, නිදහස් මිනිහෙක් හැටියට ජීවියෙන් නගරයේ පාර අතුගාන්න. දෙයියම්පා උගේ හොඳ වෙලාවට අපට ලියුම ලැබෙන්න කලින් ඌ පිටරටවල ගියේ. ආයි නම් මේ පැත්තට හොයන්න දන එපාත් නෑ.'

කාරුණිකාවර ඉහුණත් කිසි වියත්ගත සාමාජිකයෙක් නැති සිටියේය.

'ගරු භාණ්ඩාගාරික තුමනි. අපි මෙහෙන් වලවලා දෙන ආව් ස්විත්ඩන්ගේ දේපොල මිලයට ගන්නේ කවුද?'

'ඔව් මොරිස් සහෝදරයා. ඒවා මිලට ගන්නේ මර්ටන්හි ජනපද උම්බිය සමාගම'

'විලහට ගිය අවුරුද්දේ රොබින්ස් හා ලී සමාගම විකිණුවෙද්දී ඒක මිලට ගත්තේ කවුද?'

'ඒත් අර උම්බිය සමාගම තමයි'

'හොඳයි. පසුගිය කාලෙ විකුණූ යකඩ කර්මාන්තශාලා - මැන්සන් සහ පුත්‍රන්, වැන්ඩෙර්ර් ඇට්වුඩ්, මේ සමාගම් මිලට ගත්තේ කවුද ?'

'ඒව ගත්තෙත් වෙස්ට් මිල්මවුන් පසල හැණිම් සමාගම'

'මොරිස් සහෝදරයා' මැක්ගිනර් කථාව ඇරඹීය.

'ඒව කවුරු කවුරු මිලට ගත්තත් අපට මොකෝ? අපට ඒකෙන් පාඩුවක් වෙච් නියල මට නං හිතෙන්නෙ නෑ. මොකද කර්මාන්ත ශාලා ඒ ගොල්ල ඔසොනේ උස්සගෙන යන්නද?'

'නායකතුමනි, මේ ටික කියන්න මටතුමා අවසර දෙන්න. පසුගිය අවුරුදු දහය තිස්සෙම මේ දේ සිද්ධ වුණා. පුර හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන් අපි කුම කුමයෙන් මේ පලාතෙන් වලවලා දැම්ම. මොකක්ද ප්‍රතිඵලය? අර පොඩි ආයතන ඔක්කොම මිලට ගත්තේ විශාල සමාගම් මගින්. මේ ලොකු සමාගම් වල අධ්‍යක්ෂකවරු පදිංචි පිලඩෙල්ෆියාවෙ, නැත්නම් නිව්යෝක් වල. ඔවුන් අපේ තර්ජන ගර්ජන ගණං ගන්නෙ නෑ. ඔවුන් මෙහෙට පත්කරල එවන කළමනාකාර වරුන්ට අපට පුළුවනි දඬුවම් කරන්න. තමුන් වැඩක් නෑ. ඊට පස්සෙ ඒ තැන් වලට තවත් අය එවී. මෙහෙන් වෙන්නෙ අපේ සාමාජික තවත් අනතුරුදායක වෙන එක පමණයි.

පොඩි මිනිස්සුන්ට පුළුවන් කමක් නෑ අපට කරදර

කරන්න. ඒ ගොල්ලන්ට ඒකට බලයවත් මුදල්වත් නෑ. ඔවුන්ව සම්පූර්ණයෙන්ම මිරිකා නොදමනතුරු අපට ප්‍රශ්නයක් වෙන්නෙ නෑ. ඔවුන් අපට යටත් වෙලා ඉදීවි. ඒ වුණත් මේ මහා පරිමාණ සමාගම් එක්ක ඒව හරියන්නෙ නෑ. උන්ගෙ ලාභයෙන් කොටසක් අපි පැහැරගන්නවා කියල තේරුණොත් උන් නිකම් ඉන්න එකක් නෑ. අපේ පස්සෙන් එලවලා, අපව අල්ලාගෙන, නීතිය ඉදිරියට ගෙනෙන එක, කියක් වියදම් උණත් කරාවි.'

මුළු ශාලාව පුරාම පැතිර ගියේ දැඩි නිහඬතාවයකි. කාගේත් මුහුණු අඳුරුවිය. මෙතරම් කලක් කිසි දිනෙක ඔවුනට අභියෝගයක් එල්ලවී තිබුණේ නැත. එහෙත් දැන් එවැන්නක ඡායාවක් ඇත. එම හැඟීම පවා දරුණු සිත් ඇති සහෝදරයන්ගේ සිත් තුළ මහත් චකිතයක් ඇති කිරීමට සමත් විය.

'මං යෝජනා කරන්නේ පොඩි මිනිහාට වැඩිපුර හිරිහැර කරන්නේ නැතුව ඉඳිමු කියලයි. යම් දවසක උන් මක්කොම මේ පළාත අත්හැරදාල ගියොත්, අපේ සංගමයට යන එක මං කැමතිවෙනවා' මොරිස් වැඩිදුරටත් කීය.

සභාව කලබල වූ විට එයට ජනප්‍රියත්වයක් නොලැබෙයි. කථිකයාට තම අප්‍රසාදය පළකරමින් මොහොතේ දෙතා කෑගැහුණ මැක්ගිනිට් ලොක්කා සභාව ඇමතුමට කාලය යළි කරගෙනයි.

'මොරිස් සහෝදරයා. ඔයා හැමදාමත් මොහොතම අශුභවාදීව කල්පනා කරන කෙනෙක්. මේ සංගමයේ සාමාජිකයන් එක්ක වගේ සමගියෙන් ඉන්න තාක් කල් මුළු ඇමරිකා එක්සත් ජනපදයේම කිසිම බලයකට අපට අත තියන්න බෑ. හොඳයි මොකද අපිව උසාවියට කැඳවලා නැද්ද? මං දන්නවා අපිත් එක්ක සටන් කරනවාට වඩා, අපේ කප්පම් ගෙවන්න ලොකු සමාගම් කැමති වේවි.

ඉතින් සහෝදර වරුනි. අද දවසට නියමිත වැඩ කටයුතු අවසානයි, එකක් හැර. අපි වෙන්ව යන වෙලාවට මං ඒ ගැන මතක් කරන්නම්, දැන් ඉතින් ආහාර පාන සංග්‍රහය සඳහා වෙලාවයි'

මිනිස් සිතේ ස්වභාවය පුදුමාකාරය. මෙතැන රැස්වී සිටින්නෝ මිනීමැරීම එදිනෙද ජීවිතයේ සාමාන්‍ය දෙයක් බවට පත්කරගත් පිරිසකි. තමන්ට කිසිදිනෙක වරදක් නොකළ පවුලක, ප්‍රධානියා මවුන් මරා දමන්නේ ඔහුගේ බිරිඳ සහ දරුවන් ගැන අංශු මාත්‍රයක අනුකම්පාවක් නොමැතිවයි. එහෙත් ශෝකය දනවන සංගීතයෙන් සිත කම්පාවට පත්කර ගන්නා මවුන්, ඊට සවන් දෙද්දී කඳුළු සැලූහ. මැක්මනෝට මධුර කටහඬක් තිබිණ. සංගමයේ සහෝදරයන් අතර ජනප්‍රියවීමට මෙතරම් වෙලා ඔහුට දුවක් නොලැබෙන්නට ඇත. එහෙත් ඔහුගේ ගී ගායනයට සවන් දීමෙන් පසු ඒ ජනප්‍රියත්වයක් ඔහුට හිමිවූ බව පැහැදිලිව පෙනිණ. 'ඇලන් තදී ගං ඉවුරේ අඳ සක්මන් කාලේ එද' ආදී ගීත ගයමින් ඔහු මුළු සභාවම කුල්මත් කළේය.

මෙම ව්‍යාපාරයේ ඉහළම නිතිපෙන්නට හැකීමට සුදුසුකා ඇත්තෙකු බව මැක්මනෝ පළමු රාත්‍රියේම පෙන්නුම් කළේය. පසුයේ වෙතත් සංගමයේ කැපී පෙනෙන සාමාජිකයෙකු වීමට පුරුදු පුහුණු කල යුතු තවත් අවශ්‍යතා තිබිණ. එදිනට නියමිත ව්‍යාපාරවලට නිමකිරීමට පෙර ඒවා නැරඹීමට ද මැක්මනෝට අවස්ථාවක් සලසා දෙන ලදී. මත්පැන් බෝතල් කිහිප විටක්ම අතින් අත ගියේය. සාමාජික පිරිස විස්කි වලින් හොඳ හැටි පදම් වී, මද තෙද වැඩිවූ පසු, නායකතුමා යළිත් සභාව ඇමතුවේය.

'මිත්‍රවරුනි, මේ නගරයේ එකම එක පුද්ගලයෙක් ඉන්නවා. ඊටත් ගණනට වැඩියි. ඒ වැඩි හරිය ගණනට කල්පනා කරලා, සකස් කරල ගැනීම ඔබට භාර කටයුත්තක්. මං මේ කථා කළේ කවුරු ගැනද කියන්න ඔබ දැනටමත් දන්නවා ඇති. ඒ තමයි 'හෙරල්ඩ්' පුවත්පතේ කර්තෘ ජේම්ස් ස්ටැන්ගර්. ඔබ දැක තියෙනව නේද ඔහු නැවත වරක් අපිට විරුද්ධව කෑගහන්න පටන් අරගෙන තියෙන හැටි?'

මැක්ගින්ටි සාමා සාක්කුවට අත දමා පුවත් පතකින් කපාගත් කොටසක් එළියට ගත්තේය. 'මෙන්න අහගන්න'

# නීතිය හා සාමය

## ගල් අඟුරු හා යකඩ නිෂ්පාදන පළාත්වල භීෂණය හා ත්‍රස්තවාදය රජකරයි.

අප අතරේම දරුණු අපරාධකරුවන් කල්ලියක් ඇති බව සනාථ කෙරෙන මුල්ම ඝාතනය සිදුවී අදට වසර දොළහකි. එදා සිට අද දක්වාත් මේ ඝාතන හා අපරාධවල අඩුවීමක් ස්වල්ප වශයෙන්වත් සිදුනොවිය. දැන් එය කොපමණ උග්‍ර තත්ත්වයට පත්වී ඇතිද යත්, අපි ශිෂ්ට ජන සමාජයේ බලවත් නින්දාවට පත්වී ඇත්තෙමු.

යුරෝපයේ රාජ්‍යයන්හි දුෂ්ඨ පාලනයන් ගෙන් මිදී අප රටට පලා එන විදේශිකයන්, සරණාගතයන් ලෙසින් අපි භාරගත්තෙමු. අපේ ශ්‍රෙෂ්ඨ දේශය විසින් ඔවුන් සාදරයෙන් පිළිගෙන ළමැදට තුරුළු කර ගත්තේ මෙවැනි භයානක ප්‍රතිඵල උදාකර ගැනීමේ අදහසින්ද? ඔවුනට සෙවණදී, ආරක්ෂා කළ, ඇති දැඩි කළ සත්පුරුෂයනට විරුද්ධවම, දැන් දුෂ්ඨ ත්‍රස්තවාදී ක්‍රියා කලාපයක් ගෙනයාම මොන තරම් නින්ද සහගත ක්‍රියාවක්ද?

නිදහස් භාවයේ සංකේතය ලෙස සැලකෙන ඇමරිකානු ධජය සෙවණේම ත්‍රස්තවාදය හා භීෂණය මුල්බැස ගැනීමට පටන්ගෙන ඇත. පුද්ගලයින් කවුරුදැයි අපි දන්නෙමු. සංවිධානය කුමක්ද, එය කොතරම් ප්‍රබල එකක්ද යන්න ප්‍රසිද්ධ කරුණකි. මේ තත්ත්වය තව කොපමණ කාලයක් ඉවසා දරා සිටීමට අපට සිදුවේද? මුළු ජීවිත කාලයක්ම..........'

'......ඒ ප්‍රරාව මං කියෙව් ප්‍රමාණේ ඇතිනේ?' පැවසූ මැක්ගින්ටි එය ඉවතට දැමීය.

'ඔහු අප ගැන කියන්නෙන සිත්න සිහොවයි. මං මගෙන් අහන්නෙ, මොකක්ද අපි එයාට දෙන්න තිත උත්තරේ?'

'මරණ දඬුවම' දහදොළොස් දෙනෙකු එක හඬින් කියා සිටියහ.

'මං ඒකට විරුද්ධයි' ඒ කලින් වාරයක් සභාව ඇමතූ මොරිස් සහෝදරයාය.

'මං කියන්න කැමතියි සහෝදර වරුනි, මේ නිම්නය තුළ අපි ක්‍රියාකරන ආකාරය බොහොම ප්‍රචණ්ඩ වැඩියි. එහෙම කළොත් මේ මිනිස්සු තමන්ගේ ආත්මාරක්ෂාව ගැන හිතල එකට එකතු වෙයි. එහෙම එකතුවෙලා අපව විනාශ කරන දවසක් එයි. ජේම්ස් ස්ටැන්ෆර්ඩ් වයසක මිනිහෙක්. ඔහු මේ නගරයේ පමණක් නොවෙයි මුළු පළාතෙම ගෞරවයට පාත්‍ර වූ කෙනෙක්. මේ නිම්නයේ, මේ පළාතේ තියෙන අයුතුකම් අසාධාරණකම් පෙන්වා දෙන්නේ ඔහුගේ පුවත්පත. ඒ මිනිහා විනාශ කළොත් මේ ප්‍රාන්තය පුරා මහා කලබලයක් ඇතිවෙයි. අන්තිමට ඒකෙන් වෙන්නේ අපවත් විනාශ වෙන එකයි'

'එයාල කොහොමද අපව විනාශ කරන්නේ වයසක මහත්තයා? පොලීසියේ උදව්වෙන්ද? පොලීසියෙන් භාගයක් අපෙන් අල්ලස් ගන්න උදවිය. ඉතුරු භාගය අපිට බයයි. එහෙම නැත්නම් අපව උසාවි ගෙනියයිද? ඇයි අපි මීට ඉස්සර උසාවි ගිහින් නැත්ද?'

'මිනිස්සු එකට එකතුවෙලා, රැලි ගැහිලා අපව එල්ලලා මරන්න ඉඩ තියෙනවා. මීට ඉස්සර අපරාධකාරයින් එහෙම දේට මුහුණ දීල තියෙනවා'.

මේ ප්‍රකාශයට අප්‍රසාදය පළකරමින් සභාවේ සහෝදරවරු කෝපයෙන් කෑගසන්නට පටන්ගත්හ.

'මට කියන්නෙත් ඇඟිල්ල ඔසවන එක විතරයි'

මැක්ගින්ඩි කීවේ කෝපයෙනි.

'මට පුළුවන් මිනිස්සු දෙසීයක් දාන්න. ඕන නම් නගරයේ එක් කෙළවරක ඉඳන් අනික් කෙළවරටම සුද්ධ කරන්න අපට පුළුවන්.

මේ බලනවා මොරිස් සහෝදරයා මං දැන් සැහෙන කාලෙක ඉඳල තමුසෙ ගැන හෝදිසියෙන් හිටියෙ. තමුසෙ හදන්නෙ අපිත් මිනිස්සුගේ හිත්වල තියන ධෛර්යයත් නැතිකරල දාන්නයි. තමුසෙගේ නමින් අපේ නායක පත්‍රයට වැටෙන දවසක් එවි. එදා තමුසෙට ඉතා දවසක් වෙන්නෙ නැ. මට හිතෙනවා තමුසෙගෙ නම දැන් දාන්න වෙලා තියෙන්නෙ ඒතැනටයි'

මොරිස් මළමිනියක් මෙන් සුදුමැලි විය. දණිස් පණ නැති වූවාක් මෙන් ඔහු පුටුව මතට ඇද වැටිණ. වීදුරුවේ ඉතිරිව තිබූ මත්පැන් ස්වල්පය කටේ හලාගත් මොරිස් ඉතා අපහසුවෙන් කථා කරන්නට පටන් ගත්තේය.

'මං සමාව ඉල්ලනවා නායකතුමනි. පමණට වැඩියෙ දෙයක් මගෙන් කියැවුණා නම් ඒ ගැන මං ඔබෙන් සහ ශාඛාවේ සියලුම සහෝදරයන් ගෙන් සමාව ඉල්ලා සිටිනවා. ඔබ සියලු දෙනාම දන්නවා, මම අපේ සංගමයට පක්ෂපාත සාමාජිකයෙක් බව. මං ඒ වගේ දේවල් කිව්වේ අපේ සංගමය විනාශ වේවිය කියන බයටයි. නමුත් අපේ නායකතුමාට, මට වඩා මේ දේවල් ගැන විනිශ්චය කරන්න පුළුවන් බව විශ්වාසයි. ඒ නිසා මං ඔබෙන් සමාව ඉල්ලනවා. මෙවැනි හිත් රිදවන දේවල් ආයෙමත් නොකියන බවටත් පොරොන්දු වෙනවා'

මැක්ගින්ටිගේ කෝපය පහව ගිය බවක් දිස්විය.

'බොහොම හොඳයි මොරිස් සහෝදරයා. ඔබට පාඩමක් උගන්වන්න සිද්ධ වුණා නං මටත් කණගාටුයි. මං මේ තනතුරේ ඉන්නා තුරු අපේ සහෝදරයන් වචනයෙන් වගේම ක්‍රියාවෙනුත් එකමුතුයි.

ඉතින් සහෝදරවරුනි. මේ ස්ටැන්ගර් පරලොකෙටම යැව්වොත් අපිට හුඟක් කරදර හිටිනවා. මේ පත්තර කර්තෘලා ඔක්කොම එක කල්ලියෙ අය. අපිව අල්ලන්න කියලා පොලීසියටයි, හමුදාවටයි ඉල්ලුම් කරමින් හැම පත්තරයක්, සඟරාවක්ම කෑගහන්න පටන් ගනීවි. මට හිතෙනවා ස්ටැන්ගර්ට හොඳ

අනතුරු ඇඟවීමක් උන්නොත් ඇති කියලා. ඔබට පුළුවන්ද බෝල්ඩ්වින් සහෝදරයා ඒක සංවිධානය කරන්න?"

"ඇත්තෙන්ම ඔව්"

"ඔබට කී දෙනෙක් උවමනාද?"

"දුසිම් භාගයක් දෙන්න. දොර ළඟ මුරට ඉන්න තව දෙන්නෙක් ඕන. ගට්ර් ළඟ වගේ. මැන්සල්, ජැකල්ලන්, විලාම් උඹලත් එවල්ල"

"මං පොපරන්ද වුණා අලුත් සහෝදරයෙක් මෙතට එවන්න" මැක්ගිනට් කීය.

ටෙඩ් බෝල්ඩ්වින් මැක්මහෝන් දෙස බැලීය. කිසිම දෙයක් අමතක වී නැති බවත්, අමතක කිරීමට හැකි සූදානම් නැති බවත් බෝල්ඩ්වින්ගේ දෑසේ ලියැවී තිබිණ.

"එයාට ඕනෑ තැං ආයුධයක්. වැඩේ ඉක්මනට පටන් ගන්න කරමට හොඳයි" බෝල්ඩ්වින් කීය.

සභාහොලෙන් සතුටින් විසිර ගියාය. සහෝදරවරු කිහිප දෙනෙක් අනෙක් සෙනග සමග අවන්හලේම රැඳුණාහ. වැදගත් කටයුත්ත සඳහා තෝරාගත් අය, කාගේත් අවධානයට යොමු නොවන සේ එකා දෙන්නා බැගින් විදියට අවතීර්ණ වී, ඉදිරියට ගියහ. එය ඉතා සීතල රාත්‍රියක් විය. අඩ සඳ අහසේ බැබලෙමින් තිබිණ. ඉදිරියට ගිය සෙනග උස් ගොඩනැගිල්ලක් ඉදිරිපිට මිදුලේ රැස්වූහ.

"වර්මිසා හෙරල්ඩ්"

යතුරුවෙන් රත්වන් පැහැති විශාල අකුරු ගොඩනැගිල්ලේ බිත්තියේ ඉහළින් සඳහන්ව තිබිණි. එයින් නිකුත් වුණේ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකාරී වන හඬයි.

"තම්බන ඉන්නවා පහළ දොරගාව. අපට ඉක්මනින් පැනල යන්න පුළුවන් වෙන විදියට පාර අවහිර නොකර තියාගන්නවා.

ආකාර විලසින් මෙයාන් එක්ක ඉන්නෙ. අනිත් අය මාත් එක්ක වරෙල්ලා. කොල්ලනේ, භය වෙන්න එපා. මේ වෙලාවේ සංගම් කවුන්තලේ අප සිටිය බවට දිවුරන්න, පාක්ෂික කාරයින් උසිම් ගණනක් ඉඳීවි'

වෙලාව මධ්‍යම රාත්‍රියට ආසන්නය. ඉඳහිට වැහි වැහී ඇවිද සිය මෙමිද්දකු හැරෙන්නට වීථිය සම්පූර්ණයෙන්ම පාළුය. දොර විවෘත කරගෙන පුවත්පත් කාර්යාලයට ඇතුළු වූ මැරවරයෝ තරප්පු පෙළේ ඉහළට ගමන් ගත්හ. මැක්මයිඩ් සහ සගයා පහළ දොරටුව අසල රැඳී සිටියෝය.

උඩ තට්ටුවෙන් විලාප ශබ්දයක් ඇසිණ. ඒ සමගම කිසිවකු උදව් ඉල්ලා කෑගසන හඬක්, ඉටු පෙරළන ශබ්දයක් ඇසෙන්නට ලැබිණ. හිස කෙස් සුදුවූ වයස්ගත මිනිහෙක්, තරප්පු පෙළේ පහළට උඩ ආවේය.

වැඩිදුර යාමට පෙර කිසිවෙක් ඔහු අල්ලා ගත්තේය. ඔහුගේ උපැස් යුවළ ගිලිහී ගොස් මැක්මයිඩ්ගේ පාමුල වැටිණ. කාගෙන් දෝ එල්ල වුණු පහරක් සමගම වයස්ගත තැනැත්තා ගිලිහී ගොස් මුහුණ අතට හිම ඇද වැටිණ. පස් හය දෙනෙකුගේ පොලු පහරවල් ඔහුගේ ශරීරය පුරා එල්ල විය. ඔහු විලාප නගමින් වේදනාවෙන් ඇඹරෙන්නට පටන් ගත්තේය. මද වෙලාවකින් පසුව පත් අනෙක් අය පහරදීම නැවැත්වූවත් බෝල්ඩ්වින් නොවේ එය නැවැත්වූවේ. වයස්ගත පුද්ගලයා දෑතින්ම තම හිස ආරක්ෂා කරගැනීමට උත්සාහ කළේය. එහෙත් මිනීමරු සිනාවකින් මුව සරසාගත් බෝල්ඩ්වින් දිගින් දිගටම අසරණයාගේ හිසට පොලු පහරවල් එල්ල කළේය. ඔහුගේ සුදු හිසකෙස්, ගලාගිය ලෙයින් තැවැරී රත් පැහැයට හැරී තිබිණි. මැරවරයා තව දුරටත් එම කාර්යයේ නිරතවෙනු දුටු මැක්මයිඩ් තරප්පු පෙළ ඉහළට දිවගොස්, බෝල්ඩ්වින් පැත්තකට ඇද දැමුවේය.

'උඹ මේ මිනිහ මරන්නද හදන්නේ? නවත්තපං !'

බෝල්ඩ්වින් ඔහු දෙස බැලුවේ පුදුමයෙනි.

'හෙණමෙ ගහපං! මු සංගමයට අලුත් එකෙක්. උඹ කවුද මිනිහෝ? මගේ වැඩ නවත්වන්න හදන්නේ? පැත්තකට වෙයං' බෝල්ඩ්වින් පොල්ල එසෙව්වේ මැක්මඩෝ දෙසටයි.

එහෙත් මැක්මඩෝ එක් ක්ෂණයකින් තම පිස්තෝලය ඉවතට ගෙන එය බෝල්ඩ්වින් දෙසට එල්ල කළේය.

'ඉක්සර වෙලා උඹ පැත්තකට වෙයන්. මගේ ඇඟට අත තිබ්බොත් උඹේ ඔලුව කෑලි කෑලි යන්න වෙඩි තියනවා. මේ මිනිහා මරන්න එපා කියල නායක තුමා කිව්වා උඹට ඇහෙන නැද්ද? උඹ මොනවද මේ කරන්න හදන්නෙ, ඒ මිනිහව මරණවා මිසක?'

'එයාගෙ කතාව ඇත්ත'' සෙස්සෝ එකග වුන.

'දෙයියන්ගේ නාමෙන් ඉක්මනට වරෙල්ලා'

සකල කට්ටුවේ දොරටුව අසල හුන් තැනැත්තා කෑගැසුවේය.

'ගෙවල්වල මිනිස්සුන්ට ඇහැරිලා, පහන් දල්වනවා. මිනිස්සු පහක් යන්න කලින් මුළු නගරයේම මිනිස්සු මෙතනට එයි'

අනතුරු ඇඟවීමේ හඬ වීදිය දෙසින් ඇසෙන්නට පටන්ගෙන තිබිණි. පුවත්පත් කාර්යාලයේ සේවක පිරිස ඔවුනට හැකි පමණින් ඒ සඳහා ක්‍රියාකාරී වී සිටියේ ය.

පුවත්පත් කතුවරයාගේ නිසල දේහය එලෙස තිබියදීම මැරවරයෝ වීථියට පැන ගත්හ. සංගම් කාර්යාලයේ සෙනගට එකතුවූ ඔවුහු තම හපන්කම් ගැන නායකතුමාට දැනුම් දුන්හ. මැක්මඩෝ ඇතුළු කිහිප දෙනෙක් අතුරු මාර්ගවලින් නිවෙස් බලා පිටත්ව ගියහ.

# 4

# බිහිසුණු නිමිතය

පසුවද උදෑසනින්ම මැක්ස්වෙර් අවදිවිය. බඳවා ගැනීමේ උත්සවය කරුණු කිහිපයක් නිසාම ඔහුගේ සිහියට නැගිණ. පානය කිරීමට සිදුවූ අධික මත්පැන් ප්‍රමාණය නිසා ඔහුගේ හිස තදින් කකියන්නට පටන්ගෙන තිබිණි. හණ ගැසීමට ලක්වූ ඔහුගේ අත තදින්ම පුපුරු ගසමින් ඇත.

ඔහුටම විශේෂ වූ ආදායම් මාර්ගයක් තිබුණු නිසා මැක්ස්වෙර් රැකියාවට යාම පිළිවෙළකට නොකළේය. එද උදේ වරුව ගෙදර නැවතීමට තීරණය කළ ඔහු, උදේ තැම් කා අවසන් වන විට දවල් වී තිබිණ. මිතුරෙකුට ලිපියක් ලිවීමට ඔහුට සැහෙන වේලාවක් ගතවිය. ඉන්පසු ඔහු 'ඩේලි හෙරල්ඩ්' පුවත්පත අතට ගත්තේය.

අන්තිම මොහොතේ පුවත්පතට ලැබුණු පුවෘත්තියක සිරස්තලය වෙත ඔහුගේ අවධානය යොමුවිය.

**පුවත්පත් කාර්යාලයේ අමානුෂික මැර ප්‍රහාරයක් !**

ප්‍රධාන කර්තෘට බරපතල තුවාල

එහි සවිස්තරව තිබුණේ කලින්දා රාත්‍රියේ සිද්ධියයි. එම විස්තරය අවසානයේ මෙසේද සඳහන්ව තිබිණි.

"දැන් පොලීසියට ඉතිරිව ඇත්තේ නීතිය ක්‍රියාත්මක කිරීමයි. එහෙත් පසුගිය කාලයේ සිදුවූ මෙවැනි සිද්ධීන් අනුව බලන කල පොලීසියෙන් එය කිසි පරිද්දී ඉටුවේද යන්න සැක සහිතය. මැරවරයින් කිහිප දෙනෙකුම හඳුනා ගැනීමට හැකිව ඇත. ඒ මගින් ඔවුනට දැඩි දඬුවම් පැමිණවීමට හැකිවනු නොඅනුමානය.

මෙම අමානුෂික ප්‍රහාරය එල්ල කරන ලද්දේ මේ පළාතට අරක්ගෙන සිටින මැර කල්ලිය විසින් බව නොරහසකි. සමාජයේ අහිංසක පුරවැසියන් ප්‍රාණ ඇපකරුවන් බවට පත්කරගෙන සිටින මෙම කල්ලියට එරෙහිව හඬක් නැගීමට 'හෙරල්ඩ්' පුවත්පත සැමදාම පෙරමුණ ගත්තේය. කතුවරයාට ප්‍රහාරයක් එල්ල කිරීමට හේතුවූයේ එයයි. අනුකම්පා විරහිත ලෙස කළ දරුණු පහරදීමෙන් පසු ස්ටැන්ගර් මහතා බරපතල තුවාල ලබා සිටියි. එහෙත් මෙම තුවාල වලින්

**ඔහුගේ ජීවිතයට තර්ජනයක් නොමැති බව ඇසීම ස්වැන්ගර් මහතාගේ සිතුවට මහත් සැනසීමක් වනු ඇත".**

පුවත්පත් කාර්යාලයේ ආරක්ෂාව සඳහා වින්චෙස්ටර් රයිපල් වලින් සන්නද්ධ වූ පොලිස් භට පිරිසක් ලබාදෙන මෙන් ඉල්ලීමක් කර ඇති බවද පුවත්පතේ සඳහන් විය.

පුවත්පත ඉවත දමා පයිප්පය දල්වා ගත් මැක්මඩෝට දොරට තට්ටු කරන හඬක් ඇසිණ.

'දැන් ටිකකට ඉස්සර වෙලා පොඩි කොලුවෙක් මේක ගෙනැත් දුන්නා, මැක්මඩෝ 'මහත්තයට දෙන්න කියල' පෙනිමී සාත්තාව ලියුම් කැබැල්ලක් ඔහු වෙත ගෙන ආවාය.

**"මට ඕනෑ ඔබට කතා කරන්න. ඒ වුනත් ඔය ගෙදරදී ඒක කරන්න බෑ. මිලර් කන්දේ පොඩි ගල ළඟ මං ඉන්නවා. වහාම එතැනට ඇවිත් හමු වෙන්න. ඔබට කීමට වැදගත් දෙයක් තියෙනවා. ඒක දැන ගැනීම ඔබට වැදගත්".**

ලියුම එව්වේ කවුද යන්න හඳුනා ගැනීමට එහි අත්සනක් නොතිබිණ. එය කියවූ මැක්මඩෝ මහත් පුදුමයට පත්විය. එය හිඳුපත් සාත්තාවිකාගේ අත් අකුරෙන් නම් එවූ කැනැත්තිය ඔහුට සිතාගත හැක. එහෙත් මේ පෙනෙන තරම් උගත් පිරිමියෙකුගේ අත් අකුරුයි.

යම්දෝ නොයම්දෝ යයි දෙගිඩියාවෙන් කල්පනා කරමින් සිටි මැක්මඩෝ අවසානයේ මිලර් කඳු මුදුනට යාමට තීරණය කළේය.

මිලර් කන්ද යනු, නගර මධ්‍යයේම පිහිටි තරමක් උස් කඳු ගැටයකි. මහජන උද්‍යානයක් ව පැවැති මෙය, නිසි පරිදි නඩත්තු නොකිරීම නිසා වල්බිහි වී තිබිණ. එසේ වුව ද එළිමහනේ දවස ගතකිරීම සඳහා ගිම්හාන සෘතුවේදී බොහෝ දෙනා මෙම ස්ථානය තෝරා ගත්හ. එහෙත් ශීත සෘතුවේදී මෙය පාළු තැනක් විය. මිලර් කඳු මුදුනට නැගගත් විට, මුළු ප්‍රදේශයම පැහැදිලිව නැරඹීමට හැකිවිය. පහළින් පිහිටි දූවිල්ලෙන් පිරුණු අපිරිසිදු නගරයත්, ඊටත් ඇතින් වර්මිස්සා නිම්නය, එහි විසිරී සිඳුණු ගල්

අගුරු ආකර හා කළු දුම් පිටකරන කර්මාන්ත ශාලා කඳු මුදුනට දිස්විය. ඈතින් පිහිටා තිබුණේ නිල්වන් වනාන්තර වලින් වැසීගිය කඳුවැටි හා සුදු පැහැති හිමෙන් වැසුණු ගිරි ශිඛරයි.

මිලර් කඳු මුදුනට ළඟාවිය හැකි මාර්ගය, මහා වෘක්ෂ මෙන් ම කුඩා ගස් හා පඳුරු වලින් සෙවණ වූ වංගු සහිත එකකි. මැක්මිඩෝ මේ මාවත දිගේ හෙමින් හෙමින් පා නැගීය. හිම්නාන සෘතුවේදී උත්සව කාලයට කලබලකාරී තැනක් වූ කුඩා අවන්හල, පාළුවට ගොස් තිබිණ. කොඩියක් නොමැති කොඩි ගහ තිබුණේ ඒ අසලයි. කමිසයේ කොලරය ඉහළටම ඔසවාගෙන, තොප්පියකින් හිස හා මුහුණ සම්පූර්ණයෙන්ම වසාගත් කිසිවකු එතැන හිඳගෙන සිටියේය. මැක්මිඩෝගේ අඩි ශබ්දය ඇසී ඔහු හිස හරවා බැලීය. ඒ, කලින්ද රාත්‍රියේ මැක්ගිනට් ලොක්කාගේ කෝපය ඇවිස්සූ මොරිස් සහෝදරයාය. දුටු වහාම ඔවුහු රහස් ආකාරයට සංඥා හුවමාරු කරගත්හ.

'මට ඔබත් එක්ක කරගන්න කතාවකුත් තියෙනවා මැක්මිඩෝ මහත්තයා. ඔබ මෙහි ආ එක ඉතාම කරුණාවන්ත ක්‍රියාවක්' මොරිස් පැවසුවේ මදක් ඇසිලමිනි.

'ඔයාගෙ නම ලියුමේ ලියලා එව්වේ නැත්තෙ ඇයි?'

'අපි හැමෝම බොහොම පරෙස්සම් වෙන්න ඕන. මේ වගේ කාල වල ඕනම දෙයක් කැරකිලා තමන්ගේ හිස උඩට වැටෙන්න පුළුවනි. කවුරු විශ්වාස කරන්නද, කවුරු විශ්වාස නොකරන්නද කියලා කාටවත් හිතාගන්න බෑ'

'අපේ සංගමයේ සහෝදරයන්ට විශ්වාස කරන්න කාටත් භයවෙන්න දෙයක් නෑ?'

'නෑ නෑ, හැම සිද්ධියම එහෙම විශ්වාසෙ තියන්න බෑ. අපි කතා කරන හැම දෙයක්ම, සමහර වෙලාවට හිතන දේවල් පවා ගිහිං හාවිකින්නෙ මැක්ගිනට් ලොක්ක ළඟ'

'මේ බලන්න මොරිස් සහෝදරයා' මැක්මිඩෝ කීවේ තරමක් උස් හඬිනි.

'අපේ සංගමයට, එච්මීසා හොඳාවට පක්ෂපාතිත්වය, රහස හාඩිය රකින එක ගැන , මං දිවුරලා පොරොන්දු වුණේ ඊයේ රාත්‍රියෙ. ඔබ ඒක හොඳට දන්නවා. ඔහේ කියන්නෙ මට ඒක කඩන්න කියලද?'

'ඔහේ කල්පනා කරන්නෙ ඒ විධියට නං, මං ඔහේට මෙහේ එන්න කිව්වෙ නිකං අපරාදෙ'

මොරිස් පැවසුවේ සංශයාවුවෙනි.

'කාටවත් යටත් නැති රටක, නිදහස් රටවැසියො දෙන්නෙකුට තමන්ගෙ අදහස් නිදහසේ සාකච්ඡා කරන්න බැරි කාලයක්ද දැං ඇවිත් තියෙන්නෙ?'

මැක්මඩෝ මඳ වේලාවක් මොරිස් දෙස, ඉතා සූක්ෂ්මාකාරව බලා සිටියේය. ඉන්පසු ඔහුගේ ස්වරය මඳක් ලිහිල් විය.

'මං ඔහේට කිව්වෙ මං ඉන්න තත්වෙ ගැනයි. මං මෙතනට අළුත් කොහොමත්. මේ හැම දෙයක්ම මට හරි අලුත්‍යි. ඒ නිසා මං මොනවත් කටින් පිටකරන එක හරි නෑ. ඒ වුණත් මොරිස් සහෝදරය ළඟ තියෙනවා නම් මොනවා හරි මට කියන්න, මං ඒක අහගෙන ඉන්නම්'

'මට පක්ෂව ආපහු ගිහිං ඒක මැක්ගිනට්ගේ කනේ කියන්නද?' මොරිස් ඇසුවේ කෝපයෙනි.

'එන්න ඉතිං ඔබ බොහොම අසාධාරණ විදියට කතා කරනවා. මං සංගමයට පක්ෂපාතියි. ඒ බව මං ඔබට කෙලින්ම කියනවා. ඒ වුණත් කෙනෙක් මට රහසේ දැනුම් දෙන පෞද්ගලික කාරණයක්, ගිහිං වෙන කෙනෙකුට කියනවා නම් මං මහ ජරා මිනිහෙක්. ඔබ කියන දේ මගෙන් පිටට යන්නෙ නෑ. ඒ වගේම මං කල් ඇතුව කියන්නම් ඔබට මගෙන් උදව්වක් හෝ අනුකම්පාවක් ලැබෙන එකකුත් නෑ.'

මැක්මඩෝ පිළිතුරු දුන්නේය.

'ඒ දෙක බලාපොරොත්තු වෙන එක නං මම සිතෙන් අත් ඇරලයි ඉන්නෙ. මං මේ කියන දේ නිසා මගේ මුළු ජීවිතයම රැඳී තියෙන්නෙ ඔබේ අතේ. ඔබ නරක මිනිහෙක් වෙන්න පුළුවන්. මට ඊයේ රෑ පෙනුණා ඔබ නරකම මිනිස්සු එක්ක එකතුවෙලා, ඒ මග යන්න පුරුදු වෙන හැටි. ඒ වුණත් ඔබ අලුත් කෙනෙක්. ඔබේ හද සාක්ෂිය තවමත් ඒ හැටි දරදඬු වෙලා නැතුව ඇති. අන්න ඒ නිසයි මං ඔබට කතා කරන්න හිතුවෙ'

'හොඳයි. මොනවාද ඔබට දැන් කියන්න තියෙන්නෙ?'

'ඔබ මාව පාවා දුන්නොත්, ඔබට මං ශාප කරනවා'

'මං එහෙම කරන්නෙ නෑ කියලා පොරොන්දු වුණා නේ මොරිස් සහෝදරයා'

'හොඳයි , එහෙනම් මට ඉක්මන් වෙලාම කියන්න. ඔබ විසාගෝවේ නිදහස් චින්තන සංගමයට බැඳෙන්න දිවුරන කොට, අපරාධයන්ට පිහිට වෙන්න දිවුරන කොට, තවදවත් එහෙත් අපරාධ කාරයින්ගෙ ලෝකයට පා තබන්න වෙච්ච කියල ඔබ බලාපොරොත්තු වුණාද?'

'මේව අපරාධ කියල ඔබ හඳුන්වනව නම්......'

'මේව අපරාධ කියල ?' මොරිස් ඇසුවේ කෝපයෙන් වෙවුලමිනි.

'ඔබ දැක්කෙ බොහොම ටිකයි. ඒ වුණත් මගේ තාත්තා වගේ වයසක මිනිස්සයෙකුට වට වෙලා පොලු වලින් පහර දෙන එක: මිනිසා ඔලුව පැලිලා ලේ වැගිරෙන තුරු පහර දෙන එක අපරාධයක් නොවෙයිද? එහෙනම් මොනවද ඒවා?'

'සමහරුන්ට හඳුන්වන්න පුළුවන් ඒව සටන් වැදීමේ ක්‍රම හැටියට. දෙවිධියක සටන්...........'

'ඔබ විසාගෝවේදී සංගමයට බැඳෙද්දී මොනාව දේවලට සහයෝගය දෙන්න පොරොන්දු වුණාද?'

'නෑ, මං පිළිගන්නවා. එහෙම දේවලට කැමැත්තක් දුන්නෙ නෑ.'

'මං පිලඩෙල්ෆියාවෙදී බැඳෙන කොටත් එහෙම දෙයක් පොරොන්දු වුණේ නෑ. අපි මේක දැනගෙන හිටියේ එකිනෙකාට උපකාර කර ගැනීමට, එකිනෙකා හමුවෙන්න පුළුවන් මිත්‍ර සංගමයක් හැටියටයි. ඊට පස්සෙ මට අහන්න ලැබුණා වර්මිසාව ගැන. ඒ නම මගේ කනට වැටිච්ච වෙලාවට සාප වෙන්න ඕන. මං මෙහාට ආවෙ දියුණු වෙන්න. දෙයියනේ ! මගේ දරුවො කුස්සදනයි, ගෑනියි අරගෙන මං මෙහාට ආවෙ දියුණු වෙන්න.

මං ඇවිත් වෙළඳපොළ චතුරශ්‍රයේ සිල්ලර වෙළඳාමක් පටන් ගත්තා. මට හොඳ ආදායමක් ලැබුණා. මං නිදහස් චින්තක සංගමයේ සාමාජිකයෙක් බවට කොහොම හරි ආරංචිය ගියා. මෙහේ පාලන ශාඛාවෙන් එයාට බැඳෙන්න කියල මට බල කළා. ඊට පස්සෙ, ඊයෙ රෑ ඔබව බඳවාගත් හැටියට මාවත් බඳවා ගත්තා. මගේ අතේ ලැජ්ජාවේ සංකේතය තණ ගැහැව්වා. මගේ හදවතේ තණ ගැහිල තියෙන එක ඊට වඩා බරපතලයි.

මං දරුණු අපරාධකාරයින් කල්ලියකට කොටු වෙලා, උන්ගෙ දැලේ පැටලිලා බව මට තේරුම් ගියා. ඒත් මං මොනවා කරන්නද? මේ සංගමය යහපත් පැත්තට හරවගන්න මං කිව් හැම දෙයක්ම උන් භාරගත්තෙ සංගමයට එරෙහිව කරන කතා හැටියට. ඊයේ රෑ ඔබ දැක්ක නේද? මට දැන් මේකෙන් බේරිල යන්න විදියක් නෑ. මං හම්බකරපු හැම දෙයක්ම මගේ වෙළඳාමට යට කරල ඉවරයි. සංගමයෙන් අස්වුණොත් ඒකෙන් මට මරණ දඬුවම ලැබෙනවා, සහතිකයි. එතකොට මගේ ගෑනිටයි දරුවන්ටයි මොනවා වෙයිද කියල දෙයියො තමා දන්නෙ. ඉතිං දෙවියනේ මං මොකද කරන්නේ ?'

දෑසින් මුහුණ වසාගත් මොරිස් ඉකිගසමින් හඬන්නට පටන්ගත්තේය.

'ඔබ බොහොම මෘදු හිතක් තියෙන පුද්ගලයෙක්. ඔබ මේ වගේ වැඩවලට සුදුසු නෑ.'

මැක්මහෝන් පිළිතුරු දුන්නේය.

'මගේ සිවුණා හැද සාක්ෂිය කියල දෙයක්. මං කත්තිමන්ට ආගම ඇදහූ කෙනෙක්. ඒ වුණාට උං මාව අපරාධකාරයෙක් කළා. එතන වැඩට මාව තෝරා ගත්තා. ඒව ඉටු නොකර පස්ස ගැහුවොත් මට ලැබෙන දුරණම මං දැන හිටියා. කිසිට හිතේවි මං බියගුල්ලෙක් කියලා. මගේ අහිංසක ගැනියි දරුවොයි ගැන හිතන නිසා වෙන්න ඇති, ඒ වගේ හැඟීම් මගේ මලුවට එන්නෙ. මොනවා කරන්නද? උන් නියම කළ වැඩේට මං ගියා.

මගේ ජීවිත කාලය පුරාල්ලේම ඒ පාපය මගේ පිටිපස්සෙන් ඒවි: අවතාරයක් වගේ හොල්මන් කරාවි. මෙහේ ඉඳන් හැතැම්ම විස්සක් විතර ඈත අත්ත අර පැත්තේ: ඒක මහ පාර හැතාප පිහිටි ගෙයක්. මාව එළියෙ තියලා උන් ගේ ඇතුළට ගියා. උං එළියට එද්දි උන්ගෙ දැත් මැණික් කටු ළඟට යනතං රතු පාටයි. අපි ආපහු හැරෙද්දි පොඩි දරුවෙක් විලාප කියල කෑගහමින් අපේ පස්සෙන් ආවා. කම්හ්ගේ තාත්තා ඉල්ලලා ඒ අවුරුදු පහක දරුවෙක් අපේ පස්සෙන් ආවේ. අනේ දෙවියනේ ඒ දර්ශනයෙන් මං සල්ලාන්ත වෙන්න ගියා, ඒ වුණත් අනික් උන් ඉස්සරහ මට පෙන්වන්න වුණේ සිනා මුහුණක්. ඒ මොකද, මං දැනගත්තා එහෙම නොකළා නම් මීළඟට දැත් රතු කරගෙන එළියට එන්නෙ මගේ ගෙදරින්: තාත්ත ඉල්ලලා විලාප ගහල අඩන්නෙ මගේ පුංචි පෙට්.

මේ අපරාධයට සම්බන්ධ වුණු නිසා මාත් අපරාධකාරයෙක් වුණා. මිනීමැරුමක හවුල් කාරයෙක් වුණා. මේ ආත්මයේ විතරක් නෙමෙයි, ඊළඟ ආත්මයෙත් මට ශිෂ්ට ලෝකය අහිමිවෙලා අතරමං වුණා. මං හොඳ කතෝලික බැතිමතෙක්ව හිටියා. මං ප්‍රකාර සංගමයේ කෙනෙක් කියල දැනගත්තාම, පල්ලියේ පියතුමා මාත් එක්ක කථා නොකර ඇරියා. දැන් මගේ ආගමේනුත් මාව කොන් කරලයි තියෙන්නෙ. මින්න මට වුණු දේ. මට සමාවෙනවා, මහ යන්නෙත් මං කිය පාරේමයි. මං මහෙන් අහන්නෙ මොන එකකටද මහ මේ දේවල් කරන්නෙ? අහිංසකම් දරුණු මිනීමරුවෙක් වෙන්න මහ සූදානම්ද? එහෙම නැත්නං මේක

නවත්වන්න ක්‍රමයක් අපට නැද්ද?'

'ඔබ මොනවද කරන්න බලාපොරොත්තු වෙන්නෙ? ඔබ ගිහිං ඔවුනට කියන්න යන්නෙ නැ?'

'දෙවි පිහිටයි ! මගේ හිතේ එහෙම අදහස් මාත්‍රයක් තියෙන බව දැනගත්තොත් මං ඉවරයි'

'හොයියන එක හොඳයි. මට හිතෙනවා ඔබ හිතෙන් බොහොම දුර්වල කෙනෙක්. පොඩි දෙයක් වුණත් ඕනවට වැඩිය හිතට ගන්නවා'

'ඕනවට වැඩිය? තව ටිකක් කල් මෙහේ ජීවත්වෙලා බලන්න. අර නිම්න භූමිය දිහා බලන්න. අර කර්මාන්ත ශාලා සිය ගණනක දුම්බට වලින් අහසට ගිය, කරපාට දුමෙන් හැදුණු අඳුරු වලාකුල පේනවා නේද? මරණය පිළිබඳ, භීෂණය පිළිබඳ, සිතුවිලි මෙහේ මිනිස්සුන්ගේ තියෙන්නෙ ඔය වලාකුළු තරම් ඉහළ අහසේ නෙමෙයි. එක තියෙන්නේ මිනිස්සුන්ගේ හිස් වලට ළඟින්, බොහොම ඝනකමට. මේක තමයි සිසිලුණු නිම්නය. මරණයේ නිම්න භූමිය. ලදේ සාන්දර ඉඳන් ඒ වෙනකං මිනිස්සු ජීවත් වෙන්නෙ භයෙන් ත්‍රස්ත වෙලා. භීතිය කියන එක මිනිස්සුන්ගෙ හදවත් වලට ඇතුළුවෙලා. ටිකක් කල් මෙහේ ඉඳල බලන්න ඉලන්දරියා, ඇත්ත තත්ත්වය මොකක්ද කියලා ඔබටම තේරුම් ගන්න පුළුවන්'

'හොඳයි සහෝදරයා, මං මේක සිද්ධ වෙන දේවල් තව ටිකක් දැක්කට පස්සේ, මගේ අදහස ඔබට කියන්නම්' මැක්මිලර් පිළිතුරු දුන්නේය.

'මොරිස් සහෝදරයා, මට දැනටමත් පැහැදිලිව පෙනෙන එක දෙයක් තියෙනවා. ඒ තමයි ඔයගේ මේ සංගමයට නොගැලපෙන බව. ඔයාට කරන්න තියෙන හොඳම වැඩේ, කාටවත් කියන්නැතුව විසුණිලා දල මෙහෙන් යන්නයි. මට කියාපු දේවල් මගෙන් එහාට තවත් කෙනෙකුට නම් යන්නෙ නෑ. ඒත් මගේ මිත්‍ර කාරයෙක් නම්........දෙවියනේ......මං උඹට'

'නෑ නෑ නෑ' මොරිස් බැගෑපත් විය.

'හොඳයි අපි ඒ කතාව මෙතනින් නවත්වමු. ඔහේ කිව්ව දේවල් මං හිතේ තියාගන්නම්. ඒව කියන්න ඇත්තෙ මං ගැන අනුකම්පාවෙන් බව මට තේරෙනවා. මට ගෙදර යන්න වෙලාව හරි'

'ඔබ යන්න කලින් තව එක වචනයක්. අප දෙන්නා එකට ඉන්නවා කවුරු හරි දැකලා පැමිණිලි කරාවි. අප මොනවද කථා කළේ කියල දැනගන්න ඔවුන්ට ඕනෑ වේවි.'

'ආ...... ඒක මතක් කරපු එක හොඳයි'

'මං මගේ සාප්පුවට ලියන්නෙක් හැටියට රස්සාවක් දෙන්න ඔබට කථා කළා'

'ඔව්. මං ඒකට කැමති වුණේ නෑ...... ඒකයි අපේ සාකච්ඡාව. එහෙනම් මම යන්නම් මොරිස් සහෝදරයා. මං හිතන්නේ ඉදිරි අනාගතයේදී ඔබට සෑහීමකට පත්වෙන්න පුළුවන් විදියකට වැඩ කටයුතු සිද්ධවේවි'

* * *

එදා සවස මැක්මර්ඩෝ තම කාමරයට වී දුම්වැටියක් දල්වාගෙන කල්පනාවක වෙලී හුන්නේය. එක්වරම දොර විවෘත විය. එහි ඇතුළු වූයේ මැක්ගින්ටි ලොක්කායි. රහස් සංඥා හුවමාරු කරගත් පසු මැක්මර්ඩෝ ඉදිරිපිටින්ම ලොක්කා අසුන් ගත්තේය. ඔහු මඳ වේලාවක් ඇසිපිය නොහෙළා තරුණයා දෙස බලා සිටියේය.

'මැක්මර්ඩෝ සහෝදරයා, මම නිතර මිනිස්සු හම්බවෙලා, සතුටු සාමීචි දන්න එක කෙනෙක් නෙමෙයි. මාව හම්බ වෙන්න එන මිනිස්සු නිසා මට ඒ වැඩ වලට විවේකයක් නෑ. ඒ වුණත් වැදගත් කාරණයක් තේරුම් බේරුම් කරගන්නයි ඔබේගෙ ගෙදරටම ආවේ'

"ඔබතුමාගෙ පැමිණීම මට ගෞරවයක් මන්ත්‍රීතුමා" මැක්මිලන් පැවසුවේ විස්කි බෝතලය අල්මාරිය තුළින් එළියට ගනිමිනි. "මං බලාපොරොත්තු නොවූ ගෞරවයක්"

"දැං කොහොමද අත?"

"ඒකෙ වේදනාව නම් අමතක කරන්න බෑ. ඒ වුණත් වැඩේ බොහොම වටිනවා"

"ඔව් වැඩේ වටිනවා, සංගමයට පක්ෂපාත, ගොවිපොළ වෙනුවෙන් කැපවී වැඩ කරන අයට. අද උදේ මිලර් කන්ද මුදුනේ ඔයගේ මොකක්ද මොරිස් සහෝදරයත් එක්ක කරපු කතාව?"

ප්‍රශ්නය තුවක්කුවේ කටින් වෙඩි එන්නාක් මෙන් එක් ක්ෂණයකිනි. ඊට පිළිතුරු සුදානම් කිරීම කොපමණ වාසනාවක්ද යන්න මැක්මිලන්ට එකෙණෙහිම අවබෝධ විය. ඔහු මහ හඬින් සිනාසෙන්නට පටන්ගත්තේය.

"මොරිස් දන්නෙ නෑ මට ගෙදර ඉඳගෙන හොඳ හැටි සල්ලි හොයන්න පුළුවන් බව. එයාට දැනගන්න අවශ්‍යත් හොඳ නෑ. මිනිහගෙ හෘද සාක්ෂිය බොහොම සංවේදියි. ඒ වුණාට මිනිහා හොඳ හිතක් තියෙන වයසක මනුස්සයා නේ. මිනිහා මට රස්සාවක් දෙන්න ආවා. එයාගෙ කඩේ ලිපිකරුවෙක් හැටියට එන්නලු"

"ආ......ඒකද?"

"ඔව්"

"ඉතින් ඔබ බෑ කිව්වා?"

"නැත්තං ? දවසකට පැය හතරක් විතරක් මේ කාමරේ ඇතුළට වෙලා වැඩකරලා මට ඒ වගේ දහගුණයක් හොයන්න පුළුවන්"

"ඒක හරි. ඒ වුණත් මොරිස් වගේ මිනිහෙක් එක්ක වැඩි ආශ්‍රයක් තියාගන්න හොඳ නෑ.

'ඇයි ඒ ?'

'හොඳ නෑ කියල මං කිව්වා. මගේ වචනෙ ඒ විදිහට බාර ගන්න එක බොහොම දෙනෙකුට සැහෙනවා'

'බොහොම දෙනෙකුට සැහෙන්න පුළුවන් මන්ත්‍රීතුමා. ඒත් මට නං මදි. ඔබට මිනිසුන්ව හඳුනාගන්න පුළුවන් නම් ඔයි කාරණාව දන්නවා ඇති.'

මැක්ගිනටිගේ විස්කි වීදුරුව වටා සිඹු ඇඟිලි තලියන්නට පටන් ගත්තේය. තව මොහොතකින් එය මැක්මහෝන් වෙත දමා ගැසීමට ඉඩ තිබිණ. එහෙත් ඊළඟ මොහොතේ මැක්ගිනටි හඬනගා සිනාසුණේය.

'තමුසෙ මහ අමුතුම මිනිහෙක්. හොඳයි. කාරණය මොකක්ද කියල මං කියන්නම්. මොරිස් අපේ සංගමයට විරුද්ධව මොකුත් කිව්වද?'

'නෑ?'

'මට විරුද්ධව මොකුත් කිව්වද?'

'ඒත් නෑ.'

'මට ඒ මොකද ඔහු ඔබව විශ්වාස නොකරන නිසා. මිනිහා අපේ සංගමයට පක්ෂපාත සාමාජිකයෙක් නෙමෙයි. අපි ඒක හොඳට දන්නවා. ඒ නිසා අප ඔහු ගැන බොහොම සෝදිසියෙන් ඉන්නෙ. වෙලාව ආවම එයාට අවසන් දැනුම්දීම කරන්න වෙනවා. මට හිතෙන හැටියට දැං ඒකට කාලය බොහොම ළං වෙලා. කොන්ද පණ නැති ඇයින්ට අපේ කල්ලියේ ඉඩක් නෑ. අපට පක්ෂපාත නැති මිනිසුන් ආශ්‍රය කළොත්, ඔබේ ගැනත් අපට හිතන්න වෙන්නෙ එහෙමයි මැක්මහෝන් සහෝදරයා'

'මට එයාත් එක්ක ආශ්‍රයක් පවත්වන්න උවමනාවක් නෑ. ඒ මොකද මට ඒ යකාව අල්ලන්නෙ නෑ. එච්චරයි. ඒ පක්ෂපාත නෑ' කියන වචනේ ඔබතුමා කිව්ව මිසක්: වෙන කොහොත් මට

එහෙම කිව්ව නං ඒ වචනෙ දෙපාරක් කියන්න මං උඹව ඉතුරු කරන්නෙ නැ'

'හා......ඇති, ඇති' මැක්ගිනට් පැවසුවේ වීදුරුවේ අඩියේ සිටි විස්කි ටික ගිල දමමිනි. 'මං ආයෙ තමුසෙට කල් වෙලා ඇතුව ඒ ගැන දැනුම් දෙන්න. දැං ඒක හරි'

'මං කැමතියි දැනගන්න, ඔබතුමාට කොහොමද ආරංචි වුණේ මං මොරිස් සහෝදරයා එක්ක කතාබහ කරපු බව?'

'මේ නගරයේ සිද්ධවෙන දේවල් ගැන දැනගැනීම මගේ වැඩක් මෙහේ කෙරෙන කතාබහ ඉක්මනට මට වාර්තා වෙනවා. ඕන්....වෙලා ගියා. මට කියන්න තියෙන්නේ.........'

මැක්ගිනට් සමුගැනීමට සූදානම් වුවත් බලාපොරොත්තු නොවූ ආකාරයට එය එක්වරම අත්හිටුවීමට සිදුවිය. කිසිවෙකුගේ පා පහරින් දොර එක්වරම විවෘත විය. පොලිස් නිලධාරීහු කිහිපදෙනෙක් කාමරයට කඩා වැදුණහ. ක්ෂණයකින් නැගී සිටි මැක්මහෝන් රිවෝල්වරය අතට ගැනීමට සූදානම් වුවා පමණි. ඔහුගේ හිස දෙසට වින්චෙස්ටර් රයිෆල් දෙකක් එල්ල වී ඇති බව දුටු මැක්මහෝන් උත්සාහය අත් හැරියේය. සම්පූර්ණ නිල ඇඳුමෙන් සැරසී සිටි තවත් පොලිස් නිලධාරියෙක් ඉදිරියට ආවේ සාණු තයේ රිවෝල්වරයක්ද අතැතිවයි. ඒ, කලින් චිකාගෝ පොලිසියේ සේවය කළ, දැන් පතල් පොලිස් හමුදාවේ කපිතාන් මාවින්ය.

'චිකාගෝවේ තක්කඩි මැක්මහෝන් මහත්තයා. මං දැනගන්නා මෙහෙදිත් උඹ වැරදිවලට පටලැවෙන බව. උඹට බෑ නේද ටිකක් ඔය වැඩ වලින් ඈත්වෙලා ඉන්න. ගනිං උඹේ තොප්පිය. වරෙං අපිත් එක්ක යන්න'

කපිතාන් මාවින් මැක්ගිනට් කැගැසුවේය.

'තමුසෙට මේවට වන්දි ගෙවන්න වෙයි. මේ විදියට ගෙවල් වලට කඩා වැදිලා, නීතිගරුක, අහිංසක පුරවැසියන්ට හිරිහැර කරන්නෙ, තමුසෙගෙ හිතේ තමුසෙ කවුරු කියලද?'

'මන්ත්‍රීතුමා පැත්තකට වෙන්න. අපි ආවෙ ඔබතුමාට කරදර කරන්න නෙමෙයි: මෙන්න මේ මැක්මඩෝ කියන තක්කඩියව අල්ල ගන්න. ඒකට උදව් වෙන එක ඔබතුමාගෙ යුතුකමක්. අපේ රාජකාරියට අවහිර කරන්න එපා.'

'මෙයා මගේ යාළුවෙක්. එයාගෙ ක්‍රියා කලාපය ගැන මට වග කියන්න පුළුවන්'

මැක්ගින්ටි කීය.

අපට අහන්න ලැබෙන දේවල්වල හැටියට, වැඩිකල් යන්න කලින් ඔබතුමාගේ ක්‍රියා කලාපය ගැනම ඔබතුමාට වගකියන්න සිද්ධ වේවි. මේ මිනිහා මෙහේ එන්න කලින් ඉඳලම හොර තක්කඩියෙක්. තවමත් එහෙමයි. මං එයාගෙ ආයුධ ගත්තාම අල්ලගන්නවා මිනිහව'

මාවින් අනෙක් පොලිස් භටයන්ට නියම කළේය.

'මෙන්න මගේ පිස්තෝලෙ. කපිතාන් මාවින් මෙතැන හිටියේ අපි දෙන්න විතරක් නම්, ඒකත් මූණට මූණ නං, ඔහේට මගේ පිස්තෝලෙ ගන්න එක ඒ තරං ලේසි වෙන්නෙ නෑ'

මැක්මඩෝ කීය.

'කෝ ඔහේගෙ වරෙන්තුව? පොලිසියෙ ඉන්නෙ ඔහේල වගේ මිනිස්සු නම් වර්මිසාවෙ ඉන්නවාට වඩා හොඳයි රුසියාවෙ ඉන්න එක. මේක මහ අසාධාරණ විදියට මානුෂික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් නේ. මං මේක මෙතනිං ඉවර කරන්නෙ නෑ' මැක්ගින්ටි ගිගුරුවේය.

'මන්ත්‍රීතුමා, ඔබට සුදුසුයි කියල හිතෙන විදියකට රාජකාරි කරන්න. මං රාජකාරි කරන්නෙ පොලිසියට නියම විදියට'

'මොකක්ද මට විරුද්ධව තියෙන චෝදනාව?'

මැක්මඩෝ ඇසීය.

'හෙරල්ඩ් පුවත් පතේ කර්තෘ ස්ට්‍රෑන්ගර්ට පහරදීම. මේක මිනීමැරීමේ චෝදනාවක් තුනෙ මගේන ධාසනාවකට'

'එසේද මේ මිනිහට විරුද්ධව තියෙන චෝදනාව?' මැක්ගින්ටි ඇසුවේ මහ හඬින් සිනාසෙමිනි.

'සපිතාන් මාවින්. ප්‍රශ්න ඇතිකරගන්නෙ නැතුව මේ ඉලන්දරියාව දැම්ම නිදහස් කරල දානවා. ඊයේ රෑ දෙගොඩ හරි ජාමේ වෙනකං මේ මිනිහා මාත් එක්ක සයිදයි සෙල්ලං කරා, අපේ අවන්හලේ. ඒක ඔප්පු කරන්න මට සාක්ෂි කාරයො දුසිම් ගණනක් ඉදිරිපත් කරන්න පුළුවන්'.

'ඒක ඔයාම රාජකාරියක් මන්ත්‍රීතුමා. මං මොහුව හෙට උසාවියට ඉදිරිපත් කරනවා. ඔයේ කතාව උසාවියට කියල එහෙදි මෙයාව බේරගන්න.

මැක්මඩෝ, කලබල කරන්නෙ නැතුව එනවා. ඒව කොහොලොක් තමුසෙගෙ මලුවට තුවක්කු මිටෙන් පාරක් වැදෙන්න ඉඩ තියෙනවා, මැක්ගින්ටි මහත්මයා ටිකක් එහාට වෙන්න. රාජකාරි කරන වෙලාවට කාගෙවත් බාධාකිරීම් වලට මං කැමති නෑ. ඒ ටික මං ඔබට කියන්න ඕනෙ'

පොලිස් නිලධරයාගේ දැඩි ස්වභාවය දුටු මැක්මඩෝ මෙන් ම ලොක්කාද සසුනා සිටියහ. මැක්මඩෝ පොලීසියට රැගෙන යාමට පෙර, හොර රහසේ වචන කීපයක් හුවමාරු කරගැනීමට ලොක්කා සමත් විය.

'අරක කොහොමද......?' උඩ තට්ටුවේ සඟවා තිබූ හොර සල්ලි අච්චු ගැසීමේ යන්ත්‍රය ගැන ඔහු විමසුවේ කෙඳිරිලි හඬෙනි.

'ප්‍රශ්නයක් නෑ.' මැක්මඩෝ පිළිතුරු දුන්නේ ඔහු යන්ත්‍රය සඟවා තැබුවේ පොළොව යට තුටියක බැවිනි.

'මං දැන් යනවා රයිලි නීතිඥයා හම්බ වෙන්න, තමුසෙව නිදහස් කරගන්න. තමුසෙව අත්අඩංගුවේ තියාගන්න මෙයාලට ඉඩ ලැබෙන්නෙ නෑ' මැක්ගින්ටි ලොක්කා කීවේ පොලිස් නිලධරයාන්ට ඇසෙන අයුරෙනි.

'ඒක නං හරියයි කියල මං හිතන්නෙ නෑ. කවුරුහරි දෙන්න සිරකාරයාට බලාගන්නවා. මිනිහ පොල්ලං දෙන්න හැදුවොත් වෙඩි තියනවා. පිටවෙලා යන්න කලින් මම මේ ගේ පරීක්ෂා කරල බලන්න ඕන'

ඔහු ගේ පරීක්ෂා කළ නමුත් සැඟවී යමක් සොයාගත් බව අසන්නට නොලැබිණ. ඉන්පසු ඔවුනු, මැක්මහොන් පොලිස් ස්ථානය වෙත කැඳවාගෙන ගියහ.

ඇඳිරි වැටීමට පටන්ගෙන තිබිණ. ඉරිද හැන්දෑවේ වීථිවල දක්නට ලැබුණේ රස්තියාදුකාරයින් කිහිප දෙනෙකු පමණි. පොලිස් නිලධාරීයන් මැක්මහොන් කැඳවාගෙන යනු දුටු ඔවුනු පෙරහැරක් මෙන් ඒ පිටිපස ගමන් ගත්හ. අඳුරෙන් ලැබුණු පිළිසරණ නිසා නිර්භයව කෑගැසීම් කිරීමට ඔවුනු ඉදිරිපත් වූහ.

'නූස්ත කල්ලියේ වණ්ඩියාව එල්ලා මරාපියව්'

ඔවුනු කරහයට පමණ කෑගැසූහ.

'එල්ලාපියව් ඕකව එල්ලාපියව්'

අන්තිමේදී මැක්මහොන් පොලිස් ස්ථානය තුළට කල්ලු කරනු දුටු විට, ඔවුනු මැක්මහොන්ට නූ කියමින් උසුළු විසුළු කිරීමට පටන් ගත්හ.

කරුණු විමසීම ඉක්මනින් අවසන් කොට මැක්මහොන්ව රක්ෂිත බන්ධනාගාරයට දමන ලදී. කලින්ද රාත්‍රියේ ප්‍රහාරයට සහභාගී වූ බෝල්ඩ්වින් හා තවත් තිදෙනෙක් ඒ කුටිය තුළදී මැක්මහොන්ට හමුවිය.

ජීවිතයේ ආරක්ෂාව පවතින් ඇති මෙම බලකොටුව තුළටත්, තම අදිසි හස්තය දිගු කිරීමට නූස්තවාදී කල්ලියට හැකියාවක් තිබිණ. බන්ධනාගාර නිලධාරියෙක් මත ඒ එහි පැමිණියේ, සිරකරුවනට නිදි ගැනීම පිණිස පිදුරු යොදා සැදූ මෙට්ට කිහිපයක් රැගෙනයි. එම මෙට්ටයක් කපා විවෘත කළ නිලධාරියා,

ඒ තුළින් විස්කි බෝතල් දෙකක්, වීදුරු කිහිපයක් හා තට්ටු කුට්ටමක් එළියට ගත්තේය. විපිසේ මත්පැන් බොමින්, දුපොලියෙහි නිරතවූ සිරකරුවනට පසුදු උදයේ මුහුණ දීමට ඇති නඩුවක් පිළිබඳව සිහිවූයේවත් නැත.

පසුවද උදයේ නඩුව විභාගයට ගැනිණි. විත්තිකරුවනට විරුද්ධව තිබූ සාක්ෂි සතුටුදායක නොවූ නිසා, නඩුව ඉහළ උසාවියට ඉදිරිපත් කිරීමටවත් මහේස්ත්‍රාත්වරයාට හැකියාවක් නොතිබිණි. ස්ටැන්ගර් මහතාට පහරදීමට පැමිණි අය අතර මේ විත්තිකරුවන් සිටි බව පැමිණිලි පක්ෂය ප්‍රකාශ කළේය. එහෙත් ඔවුන් පැහැදිලි ලෙසම හඳුනාගත් බව තහවුරු කිරීමට සාක්ෂිකරුවෝ අසමත් වූහ. කාර්යාලය තුළ තිබූ ආලෝකය එතරම් සතුටුදායක නොවූ බවත්, තමන් බොහෝ කලබලයට පත්ව සිටි බවත් සාක්ෂිකරුවනට පිළිගැනීමට සිදුවිණි. මැක්ගින්ටිගේ නීතිඥයා ඇසූ හරස් ප්‍රශ්න ඉදිරියේ ඔවුන්ගේ සාක්ෂි තවත් අවුල් සහගත විය.

පහරදීමට ලක්වූ ස්ටැන්ගර් මහතා පැවසුවේ, මැරයන් එක්වරම කඩා වැදුණු නිසා තමාට ඔවුන් හඳුනා ගැනීමට අපහසුවූ බවයි. තමාට පළමුවෙන්ම පහරදුන් තැනැත්තා උඩුරැවුලක් තිබූ අයෙකු යන්න හැරෙන්නට, ඔහුට වෙන කිසිවක් මතක තිබුණේ නැත. මොවුන් නිසැකයෙන්ම ස්කෝරර් සංගමයේ අය බව ස්ටැන්ගර් මහතා තවදුරටත් කීය. මෙම මැර කල්ලියේ භීෂණ ක්‍රියා තමා දිගින් දිගටම පුවත්පතේ, කතුවැකිය මගින් පෙන්වා දුන් නිසා, ඔවුන් තමා සමග අමනාප බවත්, ඒ හැර වෙනත් කිසිදු සතුරකු තමන්ට නොමැති බවත් කර්තෘ වරයා පැවසීය.

අනෙක් අතට නාගරික මන්ත්‍රී මැක්ගින්ටි මහතා ඇතුළු සාක්ෂි කරුවන් හය දෙනෙකු දිවුරා කියා සිටියේ, මේ විත්ති කරුවන් සියලු දෙනාම , තමන් සමග එදා සවස කාඩ්පත් ක්‍රීඩා තරඟයකට සහභාගී වූ බවයි. සිද්ධිය වූවායයි කියන වේලාව පසුවී පැය ගණනාවක් ගතවන තුරුත් ඔවුන් සංගම් ශාලාව තුළ සිටි බව පැහැදිලි ලෙසම සාක්ෂි වලින් තහවුරු විය.

විනිසුරුවන් නිදහස් කරන ලදී. ඔවුනට මුහුණ පෑමට සිදුවූ අපහසුව ගැන සමාව අයැදිමිනට සිටියු ප්‍රකාශයක් විනිසුරු වරයින් නිකුත් විය. වැදගත් පුරවැසියන් මෙවැනි චෝදනා යටතේ සිරභාරයට ගැනීමට පෙර, මීට වඩා සැලකිලිමත් විය යුතු බවට පොලීසියට හා සහිතයන් මාධ්‍යට දෝෂාරෝපණයක්ද කෙරිණි.

තාවු නින්දුව ප්‍රකාශයට පත්වූත් මල්වරයන් හැඟිණ. සෙනග අතර හුරුහුරුය මිහුණු කිහිපයක්ම ඇති බව මැක්ඩොවේ දුටුවේය. සංගමයේ සහෝදරයෝ සිනාසෙමින්, අතට පලකරමින් විනිසුරුවරයාට ගුණ පැතූ අතර, එහි රැස්ව සිටි කවත් සමහරු සාර කියාගත හැකි කිසිවක් නොමැතිව බලාසිටියහ. ඒ අතර සිටි මුහුණ සාර රැවුලකින් වැසුණු එක් කුඩා මිනිසෙකි.

'සන්තකයි මිනිසුරුවෙනි. අප ළඟදීම අල්ල ගන්නම් දවසක' මිනු සිහින් හඬින් සම හැඟීම් වචනවලට නැගුවේය.

# 5

## අඳුරුම පැය

ජැක් මැක්මර්ඩෝට තම සගයන් අතර අතිශය ජනප්‍රියත්වයක් ලැබී තිබුණු බව කලින් සඳහන් කරන ලදී. එහෙත් මෙසේ සිරභාරයට පත්වීම හා එයින් නිදහස් වීම නිසා ඒ ජනප්‍රියත්වය දෙගුණ තෙගුණ විය. සංගමයට බැඳුණු මුල්ම දවසේ අපරාධයකට හවුල්වී, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියට යැමට මීට පෙර කිසිම සාමාජිකයෙකුට සිදුවී නැත. එය සංගමේ ඉතිහාසයේ නව වාර්තාවකි.

මැක්ගින්ටි ලොක්කාගෙන් එල්ලවන බැණුම්වලට, ඉවසාගෙන නොසිට එකට එක කියන තදබල කේන්තිකාරයෙකු ලෙසද ඔහු ප්‍රකට විය. මෙපමණක් නොව ලේ පිපාසිතයන්ගේ සිහිවුණු අපරාධ සැලැසුම් කිරීමට තරම් බුද්ධිමත් බවක් ද, ඒවා ක්‍රියාවට නැංවීමට තරම් කාර්යක්ෂම බවක්ද සතු එකම පුද්ගලයා මැක්මර්ඩෝ බවට, සගයන් අතර පිළිගැනීමක් ඇතිවිය. 'වැඩේ නොම්මර එකට දෙන්න පුළුවන් කොල්ලෙක්' ඒ, සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් මැක්මර්ඩෝ ගැන දැරූ මතයයි. ඔහුට භාරදීමට සුදුසු කාර්යයක් ලැබෙන තුරු ඔවුහු බලා සිටියහ.

මැක්ගින්ටි සතු දරුණු ආයුධ රාශියක් විය. එයින් දරුණුතම පුද්ගලයා මැක්මර්ඩෝ බව ලොක්කාට අවබෝධ වෙමින් තිබිණ. මැක්ගින්ටිට දැනුණේ දම්වැලකින් ගැටගසා තත් මිනීකාකා බල්ලෙක් තමා සතුව ඇති බවයි. ගොදුරත් වෙත පැනීමට නොඉවසිල්ලෙන් සිටි මේ බල්ලා සුදුසු වෙලාව පැමිණි කල මුදා හැරීමට ලොක්කා සූදානමින් සිටියේය. අලුතෙන් පැමිණි සැහැන්නාට ඉතා ඉක්මනින් ලැබුණු මේ පිළිගැනීම ගැන ටෙඩ් බෝල්ඩ්වින් ඇතුළු සාමාජිකයෝ කිහිප දෙනෙක්ම මැක්මර්ඩෝට ඊර්ෂ්‍යා කළහ. එහෙත් සිනාසීමටත් සටනටත් එක සේ සූදානම් ඔහු සමග, ප්‍රශ්න ඇතිකර නොගෙන ඈත්ව සිටීමට ඔවුහු ප්‍රවේශම් වූහ.

එලෙස එක් පැත්තකින් ඔහුට ජනප්‍රියත්වය හිමිවෙද්දී තවත් අත්‍යවශ්‍ය අංශයකින් මැක්මර්ඩෝට එය අහිමිවිය. එටී ශාෆ්ටර්ගේ පියා මැක්මර්ඩෝ සමග සියලු සම්බන්ධකම් අත්හැර දැම්මේය. ඔහුට තම නිවසට ඇතුළුවීම පවා මහලු ශාෆ්ටර් තහනම් කළේය. එහෙත් මැක්මර්ඩෝ සමග ප්‍රේමයෙන් වෙළී සිටි එටීට නම් ඔහු අමතක කිරීමට හැකිවූයේ නැත. දරුණු අපරාධකරුවකු ලෙස ප්‍රසිද්ධියට පත්වී ඇති මේ මිනිහා සමග විවාහය කුමන ආකාරයක එකක් වේද? ඇය සිටියේ දැඩි අවිනිශ්චිත සිතකිනි.

එක් රාත්‍රියක්ම නිදි නොලබා එටී මේ ප්‍රශ්නය ගැන කල්පනා කළාය. පසුවදා උදේ ඇය තීරණයක් ගත්තාය. ඔහුව ගිලගනිමින් සිටින මේ අපරාධ මඩ ගොහොරුවෙන් තම පෙම්වතා ගළවා ගැනීමට අවසන් උත්සාහයද දැරීමට ඇය සිතාගත්තාය. ඔහු හමුවීමට පැමිණෙන මෙන් මැක්මර්ඩෝ කිහිප වරක්ම එටීට ආයාචනය කොට තිබිණ. ඔහු ලැගුම් ගත් නිවස සොයා එටී පිටත්ව ගියාය.

නිවස සොයා ගත් ඇය, නිශ්ශබ්දවම එයට ඇතුළු වූවාය. ඔහු විසිත්ත කාමරය ලෙස භාවිත කළ කාමරය දෙසට ඈ පා තැබුවාය. දොර දෙසට පිටුපා, ඔහු මේසය අසල වාඩිවී ලිපියක් කියවමින් සිටියේය. තවමත් දහනව හැවිරිදි වියේ සිටි එටීට දඟකාර කමක් කිරීමට සිතිණි. අඩි ශබ්ද නොනැගෙන සේ පා ඇඟිලිවලින් අඩි තැබූ ඇය, ඔහු සිටි තැනට ගොස් ඔහුගේ උරහිසට අත තැබුවාය.

ඇගේ අරමුණ වූයේ ඔහු පුදුමයට පත් කිරීමට නම් ඇගේ ඒ උත්සාහය සෑම අතකින්ම සාර්ථක විය. එපමණක් නොව ඇය පුදුමයටත් අනතුරුව බියටත් පත්වූවාය. හිඳ සිට, කෝපයෙන් අවදි වූ රෞද්‍ර ව්‍යාඝ්‍රයෙකු මෙන් ගොරවමින් පිම්මක් පිනූ ඔහුගේ, දකුණු අත ගියේ ඇගේ උගුරු දණ්ඩ වෙතයි. ඒ වහාම තමා ඉදිරියේ තිබූ ලියවිල්ල ගුලිකළ ඔහු, තමා බියටත් විස්මයටත් පත්කෙළ කවුරුදැයි පරීක්ෂා කළේ ඉන් පසුවයි. මොහොතකින් ඔහුගේ රෞද්‍ර ස්වභාවය ප්‍රීතිප්‍රමෝදයකට හැරිණි.

'මේ ඔයාද එරී.......... ඔයා මාව හොයාගෙන ආවම මං ඔයාගෙ බෙල්ල මිරිකන්න හැදුව කියන එක හිතන කොටත් .......එන්න සොළුරීය'

එහෙත් මැත්මඩෝයේ මුහුණේ ඇය දුටු බීතියෙන් මවිතයට පත් එරී, තවමත් ප්‍රකෘති තත්ත්වයට පත්නොවූවාය. මිනුගේ මුහුණේ පිළිබිඹු වූයේ තමා කළ ද්‍රෝහී ක්‍රියාවක් කිසිවකු දැනගත් විට ඇතිවන බීතිය හා කම්පනයයි.

'ඔයාට මොකද වෙලා තියෙන්නෙ ජැක්?'

ඇය කෑගැසුවාය

'මං දැක්කාම ඔයා මොකද මේ හැටි බය වුණේ? ඔයාගෙ හෘද සාක්ෂිය පිරිසිදු නම් ඔයා මේ විදියට මං දිහා බලන එකක් නෑ?'

'ඇත්ත. මං ලොකු කල්පනාවක වැටිල හිටියෙ. අඩි ගෙබිමේ ඇහෙන්නෙ නැති විදියට ඔයා ප්‍රංචි සුරංගනාවියක් වගේ ඇවිත් මාව ඇල්ලුවාම............'

'නෑ නෑ ජැක්. මෙතන ඊට වඩා ලොකු රහසක් තියෙනවා. ඔයා ලියමින් හිටි ලියුම මට පෙන්වන්න'

'අනේ ඒක නං කරන්න බෑ එරී'

'මං දන්නවා. ඔයා ලියුම ලිව්වෙ වෙනිං ගෑනියෙකුට. ' ඈ හැඬීමට පටන් ගත්තාය

'මං දන්නවා. ඒක නිසානෙ ඔයා මට ඒක හංගන්නෙ ඔයාගෙ බිරිඳටද ඒ ලියුම ලිව්වෙ? මං කොහොමද දන්නෙ? ඔයා සමහර විට බැඳපු මිනිහෙක් වෙන්න ඇති. ඔයා මේ පළාතට කිසි කෙනෙක් හාදුනන අමුත්තෙක්'

මං බැඳපු කෙනෙක් නෙමෙයි එරී. මං දිවුරන්නම්. මේ ලෝකෙ මට ඉන්න එකම ගෑනි ඔයා විතරයි. ජේසු තුමා සහ ඉද්ධ වූ කුරුසියේ නාමයෙන් මං දිවුරන්නම්'

ඔහු අවංකව තම හැඟීම් පැවසූ ආකාරය නිසා මැක්මඩෝ ගේ දෙවල් සත්‍ය බව ඇයට සිතිණ.

'හොඳයි. ඇයි එහෙනම් ඔයා ඒ ලියුම පෙන්වන්නේ නැත්තේ?' ඇය හඬමින්ම විමසුවාය.

'මං ඔයාට කියන්නම් එටී. මං දිවුරලා පොරොන්දු වෙලා ඉන්නේ ඒ ලියවිලි වෙන කාටවත් පෙන්වන්නෙ නෑ කියල. මං ඔයාට වුණු පොරොන්දුව කඩන්නෙ නෑ වගේම, මේ ලියුම් වල රහසිගත භාවය රකින්න වුණු පොරොන්දුවත් කඩන්න බෑ. මේක අපේ සංගමයේ රහස් රාජකාරි වැඩක්. ඒක ඔයාටවත් හෙළි කරන්න මට අයිතියක් නෑ. ඔයා මගේ ඇඟට අත තියපු වෙලාවේ මං හොඳටම බය වෙලා කලබල වුණේ ඇයි කියල ඔයාට දැන් තේරෙනවද? මං හිතුවේ ඒ රහස් පරීක්ෂකයෙක් කියල'

ඔහු පැවසූ දෙය සත්‍යයක් බව ඇය තේරුම් ගත්තාය.

'දැං එටී මෙහෙන් වාඩිවෙන්න. මේක රැජිනකට සුදුසු සිංහාසනයක් නම් නොවෙයි. ඒ වුණත් ඔයාගෙ දුප්පත් පෙම්වතාට, ඔයාට වාඩිවෙන්න දෙන්න තියෙන්නෙ මේ පුටුව විතරයි. බලමු, ඉස්සරහට දවසක අපට කාලෙ හොඳ වෙන්නත් ඉඩ තියෙනවා. දැන් එටී ඔයාගෙ හිතට හරි නේද?'

'හිත හරියන්නෙ කොහොමද ජැක්, ඔයා අපරාධකාරයින් අතරේ දරුණු අපරාධකාරයෙක් බව මං දන්න කොට ? ඔයාට මිනීමැරුමක් නිසා කොයි මොහොතේ එල්ලුම් ගස් යන්න වෙද කියල නොදන්න කොට ?' මිනීමරු කල්ලියේ මැක්මඩෝ - අන්න එහෙමයි අපේ නේවාසිකාගාරයේ නැවතිල ඉන්න මිනිහෙක් ඊයේ ඔයාට ඇඳින්නුවා. ඒක ඇහුණාම මගේ පපුවට ඇණපු පිහිපාරක් වගේ දැනුණා.'

'ඕන කෙනෙක් ඕන එකක් කියපුවාවෙ. මොකෝ අපේ ඇටකටු කැඩෙනවැයි?'

'ඒ වුණාට ඒ කතාව ඇත්ත නේද?'

'මගේ ආදර එවී. මෙතන ඔයා හිතන තරම් තර්ක දෙයක් සිද්ධ වෙලා නෑ. අපි උපන්නේ මිනිස්සු විදිහට. අපි උත්සාහ කරන්නේ අපේ අයිතීන් දිනාගන්න'. එවී ඇගේ පෙම්වතාගේ කරවටා දෑත් යැව්වාය.

'ඕකෙන් අයින්වෙන්න ජැක්. මං වෙනුවෙන් අයින්වෙන්න. දෙයියන්ගෙ නාමෙන් අයින්වෙන්න. මං අද මෙහෙන් ආවෙ ඒ ටික ඔයාගෙන් ඉල්ලා හිටින්නයි. මෙන්න මං ඔයාගෙ කකුල් දෙක ළඟ දණ ගැහුවා. ඔයාගෙ ඉදිරියේ වැඳ වැටිලා මං ආයාචනා කරන්නේ ඔය කල්ලියෙන් ඉවත් වෙන්න කියලයි'

ඔහු , ඇය ඉහළට එසැවූයේය.

'ඔයා එහෙම ඉල්ලා හිටියට, ඒක තියන බරපතල කම ඔයාට තේරෙන්නෙ නෑ එවී. මං කොහොමද මගේ පොරොන්දු කඩකරල මගේ මිත්‍රයින්ව අත් ඇරලා යන්නෙ? මට උවමනා වුණත් මං කොහොමද ඒක කරන්නෙ? ඔයා හිතන්නෙ මේ සංගමයේ රහස් ඔක්කොම දන්න මිනිහෙකුට එයාල අත්ඇරලා යන්න ඉඩ හරීවිද?

'මං ඒ ගැන හිතුව ජැක්. මං ඒ ඔක්කොම සැලසුම් කරලයි ඔයාට හමුවෙන්න ආවෙ. තාත්ත ඉතුරු කරගනිපු මුදල් ටිකක් තියෙනවා. මේ භයානක පළාතෙ ජීවත්වෙලා තාත්තටත් දැං හොඳටම ඇතිවෙලයි ඉන්නෙ. තාත්ත ලෑස්තියි මෙහෙන් යන්න. අප තුන්දෙනාම මෙහෙන් පැනල යමු. අපි යමු පිලඩෙල්ෆියාවට, නැත්නං නිව්යෝක්වලට. එතකොට අපට මුන්ගෙන් බේරෙන්න පුළුවන්'

මැක්මඩෝ සිනාසුණේය.

'සංගමයට රට පුරාම බොහොම සම්බන්ධකම් තියෙනවා. ඔයා හිතන්නෙ ඒ කොල්ලන්ගෙ නියෝජිතයො පිලඩෙල්ෆියාවෙ නැත්නං නිව්යෝක්වල නැහැයි කියලද?'

'එහෙනං අපි යමු බටහිර පැත්තට, නැත්නං එංගලන්තයට,

නැත්නං ජර්මනියට. මේ බිහිසුණු නිම්නයෙන් පිටවෙලා කොහේට හරි යමු'

මැක්ස්වෙල්ට නම් වයස්ගත මිත්‍රයා, මොරිස් සහෝදරයා ගැන සිහිවිය.

'මේ නිම්නය ගැන ඔයානම් කියනවා මං මේ අහපු දෙවැනි වතාව. ඔයාලටත් මේක බිහිසුණු නම් හුඟක්ම දැනෙනවා වගෙයි'

මේ පළාතෙ ඉන්න තුරු අපේ ජීවිතය සම්පූර්ණයෙන්ම අඳුරේ. ඔයා හිතන්නෙ ලෝඩ් බෝල්ඩ්වින් කවදාවත් අපට සමාව දෙයි කියලද? ඔහු ඔහට කවුරුත් හය නිසා මිසක් නැත්නං අපි කොහොම බේරිලා ඉන්නද? ඔහු යකෙක් වගේ මං දිහා බලනකොට ඔහුගෙ ඇස් දෙකේ හැටි ඔයා දැක්කොත් හෙම..........?'

'දෙයියම්පා! එහෙම වෙලාවක ඔහුට මට අහුවුණොත්..........

මේ බලන්න පුංචි කෙල්ලේ. මට නම් මෙහෙන් යන්න බෑ. මං කියන දේ ඔයා තේරුම් ගන්න. මට මෙහෙන් යන්න ක්‍රමයක් නෑ. ඔයා මට ටිකක් ඉඩ දෙන්න. ඔයා ඉඩ දෙනවා නම් මෙහෙන් නිදහස් වෙන්න ක්‍රමයක් මං හොයා ගන්නම්. මගේ ආත්ම ගෞරවය රැකගෙන මෙහෙන් ඉවත්වෙන්න ක්‍රමයක් මං බලන්නම්'

'මොකක්ද ඔයාලගෙ තියෙන ආත්ම ගෞරවය?'

'හරි හරි. ඒ ඔයාට තේරෙන්නෙ නැති. ඔයා මට මාස හයක් දෙන්න. මං ඒක සූදානම් කරගන්නම්. මට අනිත් මිනිස්සුන්ගෙ මුහුණ බලන්න පුළුවන් විදියට, ලැජ්ජා ඇති නොවෙන විදියට මෙහෙන් නිදහස් වෙන ක්‍රමයක් මං සූදානම් කරන්නම්'

තරුණිය සතුටින් සිනාසුණාය.

'මාස හයක්? ඔයා මට පොරොන්දු වෙනවද?'

'සමහර විට මාස හතක් අටක් වෙයි. නමුත් අනුරුද්දක්-

ඇතුළත තොගොම හරි අපි මෙතෙන් පිටවෙලා යමු'

ඇයට ලබාගත හැකිවූ ලොකුම දෙය එයයි. එහෙත් කිසිත් නොමැතිවාට වඩා එය යම්කිසි ආකාරයක සැනසීමකි. එය දැනට තිබෙන ඝනාන්ධකාරය මැදින් ඇසින් දිස්වෙන ආලෝකයකි. ඇය ආපසු ගෙදර ආවේ හිතේ සැහැල්ලුවෙනි. ඇගේ හදවතට මැක්මඩෝ ඇතුළු වූවාට පසු වඩාත්ම සැනසීමක් දැනුණු දිනය අදයි.

සංගමයේ සාමාජිකත්වය ලැබුණු විට සියලු රහස් දැන ගැනීමට හැකිවේතැයි යමෙකුට සිතෙන්නට ඉඩ ඇත. එහෙත් සත්‍යය එය නොවේ. මෙම නිදහස් විත්තන සංගමය යනු එක් ශාඛාවකට වඩා බොහෝ සෙයින් විශාල, සංකීර්ණ පුළුල් විහිදුණු එකක් බව මැක්මඩෝට ඉක්මනින් අවබෝධ විය. මෙහි සිදුවන සමහර දේවල් ගැන, මැක්ගින්ටි ලොක්කා පවා දැනසිටියේ නැත. හොබ්සන් පැච්හි ජීවත්වූ නිලධාරියෙක් විය. ප්‍රාන්ත නියෝජිතයා නමින් හැඳින්වූ ඔහුගේ අධීක්ෂණය යටතේ ශාඛා කිහිපයක්ම පැවැතිණි. ඔහු මැක්මඩෝට දකින්නට ලැබී තිබුණේ එක්වරක් පමණි. කකුලක් කොටවී නිසා එය එක් පැත්තකට ගස්සමින් අඩි තබන, හිසකේ සුදු වූ , මීයෙකුගේ වැනි පෙනුමක් තිබූ ඔහු, එවන්ස් පොට් නම් විය. මැක්ගින්ටි ලොක්කා පවා ඔහු කෙරෙහි දැක්වූයේ භය සම්ප්‍රයුක්ත පිළිකුලකි. ප්‍රංශ විප්ලවය මෙහෙයවූ දැවැන්ත ඩැන්ටන්, කුඩා සිරුරක් තිබූ රොබෙස්පියර්ට දැක්වූ අපරිමිත භයට එය සමාන කළ හැකිය.

මැක්මඩෝ සමග එකට ලැගුම්ගත් ස්කැන්ලන්ට දිනක් මැක්ගින්ටිගෙන් ලිපියක් ලැබිණි. එවන්ස් පොට් විසින් රාජකාරී කටයුත්තක් සඳහා ලෝලර් හා ඇන්ඩ්රූස් නම් දෙදෙනා වර්මිසා පෙදෙසට එවීමට නියමිතව ඇත. වේලාව පැමිණෙන තෙක් ඔවුනට නවාතැන් පහසුකම් සපයන මෙන් එවන්ස් පොට් මැක්ගින්ටිට දැනුම් දී ඇත. අන් අයගේ අවධානයට ලක්නොවී සංගම් කාර්යාලයේ ලැගුම් ගැනීම අපහසුය. එහෙයින් දින කීපයක් මැක්නමාරා මහත්මියගේ නිවසේ නවාතැන් සපයා දෙන මෙන් ලොක්කා අණ කර තිබිණි.

එම පුද්ගලයෝ එද පවසම එහි පැමිණියහ. ව්‍යාපාරික මිනිසෙකු වූ ලෝලර්ට තිබුණේ, තැනින් තැනට ගොස් දේශන පවත්වන පූජකවරයෙකු සතු පෙනුමකි. යන්තමින් ගැටවර විය ඉක්මවූ ඇන්ඩ්‍රෑස්, නිවාඩුවක් ගත කිරීමට ආ සංචාරකයෙකු මෙන් දිස්විය. මත්පැන් බීමෙන් සම්පූර්ණයෙන්ම වැළැකුණු ඔවුහු එක් කරුණකින් හැර අන් සියල්ලකින්ම සමාජයේ ඉතා ආදර්ශමත් පුද්ගලයන් ලෙස හැසිරුණහ. වෙනසක් තිබූ එකම කරුණ වූයේ ඔවුන් සංගමය වෙනුවෙන් ඝාතන ක්‍රියාවලි වල යෙදීමයි. ලෝලර් විසින් එයින් දහහතරක් ද, ඇන්ඩ්‍රෑස් විසින් තුනක් ද සම්පූර්ණ කොට තිබිණ.

පසුගිය කාලයේ ඔවුන් විසින් කරන ලද අපරාධ සම්බන්ධයෙන් ඔවුන් මැක්මඩෝ සමග විස්තර පැවසුවේ ආඩම්බරයෙනි. ආත්මාර්ථය නොතකා, සංගමය වෙනුවෙන් යහපත් සේවයක් ඉටු කිරීම ගැන ඔවුහු එසේ ආඩම්බර වූහ.

'ඔවුන් අපි දෙන්නාව මේකට තෝරා ගත්තෙ, අපි මත්පැන් කටේවත් තියන්නෙ නැති නිසා. අපේ කටින් කිසිදෙයක් පිටවෙන්නෙ නැති බව ඔවුන්ට විශ්වාසයි'.

'අපි ඔක්කොම එක සංගමයක , එකම විදියෙ වැඩ වල යෙදෙන මිනිස්සු නේ.' එසේ කීවේ ස්කැන්ලන්ය.

'ඒක හැබැවයි. වාලි විල්සන් නැත්නං සයිමන් බර්ඩ් ආදීන්ව ගොදුරු කරගත්ත එව, නැත්නං වෙනත් මිනිස්සුන්ට වෙඩි තියපුව ගැන එළිවෙනකං වුණත් විස්තර කියන්නම්. නමුත් මේ වැඩේ ඉවර වෙන කං, මේ ගැන නම් මොකුත් කියන්න බෑ' ලෝලර් කීය

'වරදවා හිතන්න එපා. නමුත් මෙව ප්‍රාන්ත නියෝජිතයගේ අණ. අපි ඒව පිළිපදින්න ඕනනේ' ඇන්ඩ්‍රෑස් එය ස්ථිර කළේය.

'මේ පැත්තේ හය හත් දෙනෙක් ඉන්නවා. ඔවුන් ගැන විස්තර වචනයක් දෙකක් මටත් කියන්න පුළුවනි. ඔහේල ඇවිත් ඉන්නේ යකඩ කාන්දේ ජැක් නොක්ස්ට වෙඩි තියන්නද දන්නෙ

නෑ. එයාට සංගුණ ලැබෙන හැටි බලන්න මං ඕනම දුරක් යන්න ලැස්තියි" මැක්ස්වෙල් කීය.

"නෑ, එයා නෙමෙයි"

"එහෙනං හර්මන් ස්ට්‍රෝස්ද?"

නෑ එයත් නෙමෙයි"

"ඔබ කියන්නේ නැත්නම්, කියන්න කියල අපට බලකරන්න බෑ, ඒ වුණාට අපි ආසයි දැනගන්න"

ලෝලර් සිනාසී හිස සැලුවේය. රහස ඔහුගෙන් හෙළිකර ගැනීමට නොහැකි විය.

"අමුත්තන්ගේ රහස්‍ය ස්වභාවය නිසාම සාකච්ඡාව සිදුවන අවස්ථාවේ එය නැරඹීමට යාමට ස්කැන්ලන් හා මැක්ස්වෙල් තීරණය කළහ. රාත්‍රිය ගෙවී ගොස් පාන්දර යාමය උදාවෙද්දී, කිසිවකු පහල තට්ටුවට බැස නිවසින් පිටව යනු මැක්ස්වෙල්ට අසන්නට ලැබිණ. ස්කැන්ලන් අවදි කරගත් ඔහු ඉක්මනින් සූදානම් විය. එය අවසන් වන විට අමුත්තන් දෙදෙනා නිවසින් පිටවී ගොස් අවසන්ය. නිවසේ දොර විවෘතව තිබිණ. තවමත් එළිය වැටීමට පටන් ගෙන නැත. ඔවුහු වහා පිටත් වූහ.

ලෝලර් හා ඇන්ඩ්‍රූස් විදියේ තරමක් ඈත ගමන් කරන අයුරු පහන් කණු වල එළියෙන් මැක්ස්වෙල් දුටුවේය. ශබ්දයක් නොනගා ඔවුහු ඒ පිටිපසින් ගමන් ගත්හ. මද වේලාවක් ගත වෙද්දී ඔවුහු නගරය මායිමේ පිහිටි මංසන්ධියක් වෙත පැමිණියහ. එහි රැඳී සිටි තිදෙනෙක් කලින් දෙදෙනා සමඟ එකතු වූහ. මොහොතක් සාකච්ඡා කොට ඔවුහු යළිත් පිටත්වූහ. මෙය සාහසිකයන් විශාල සංඛ්‍යාවක් අවශ්‍ය වෙන තරම් විශාල කටයුත්තක් විය. යුතුය. දැන් ඔවුන් පැමිණ ඇත්තේ පතල් කිහිපයකටම යා හැකි මංසන්ධියකටයි. මෙහිදී ඔවුන් තෝරා ගත්තේ ක්‍රොස්හිල් පතල දෙසට යන මාර්ගයයි. දීර්ඝ කාලයක් තිස්සේ පැවැති අවිචාර සමයේදී පතලේ කම්කරුවන් අතර විනය,

සතුටුදායක තත්ත්වයෙන් පවත්වාගෙන යාමට ජෙරෙමිල් පතලේ කළමනාකාර වරයා සමත් විය. ඔහු ජෝසයියා. එච්. වින්. නම් නිර්භීත, කාර්ය ශූර පාලකයෙකි.

අරුණාලෝකය වැටෙන්නට පටන්ගෙන ඇත. සේවකයෝ එකා දෙන්නා සහ කාණ්ඩ වශයෙන් පතල් බිම දෙසට ඇදෙන්නට පටන්ගෙන තිබිණි. දැන් ඝන මීදුමක් පැතිරයාමට පටන්ගෙන ඇත. මීදුම මැදින් වාෂ්ප හලාවක හඬ නිකුත් විය. ඒ, දවසේ වැඩ ඇරඹීමට තව ඇත්තේ මිනිත්තු දහයක් බව හඟවන සංඥාවයි. ගල් අඟුරු ආකාරය තුළට දඹරය මගින් ලෝහ මැදිරි පහත් කිරීම අරඹන්නේ එවිටයි.

කම්කරුවෝ සියගණනක් සීතල ඉවසිය නොහැකිව, අත් වලට පිඹිමින්, පතල් කට අසල බලාසිටියහ. ආගන්තුකයෝ පස්දෙනා යන්ත්‍රාගාරයේ සෙවණට වී රැඳී සිටියහ. මැක්මිලෝ හා ස්කැන්ලන් දෙදෙනා අසල ගොඩගසා තිබූ ගල් අඟුරු ගොඩක් පිටුපස සැඟවී ගත්හ.

ලොකු රැවුලකින් මුහුණ වැසුණු මෙන්සිස් නම් පතල් ඉංජිනේරුවා යන්ත්‍රාගාරයෙන් එළියට ආවේය. කළමනාකාර ජෝසයියා වින්ද එහි පැමිණියේය. දඹරය ක්‍රියා කරවීම සඳහා නලා සංඥාවක් නිකුත් විය.

තොප්පි හා කම්බිලි කොලරවලින් මුහුණු වසාගත් පිරිසක් සුළු ක්ෂණයකින් කළමනාකරුට තමාට එල්ල විය හැකි ප්‍රහාරයක් ගැන ඉවෙන් මෙන් වැටහුණා විය යුතුය.

'එයි තමුසෙල කවුද? මිනහ මොකද කරන්නේ ?'

එට පිළිතුරක් නොලැබිණ. අපරාධකරුවන්ගේ ගිනි අවි, කළමනාකරු හා ඉංජිනේරු වරයා දෙසට ක්‍රියාත්මක වෙද්දී ඔවුහු කපා හෙළූ ගස් ලෙස බිම ඇද වැටුණහ. සිය ගණනක් වූ කම්කරුවෝ කර කියා ගත දෙයක් නොමැතිව භයින් ත්‍රස්තව ගල්ගැසුණාක් මෙන් බලා සිටියහ. අනතුරුව ඔවුහු එම දර්ශනයෙන් වියරු වී කෑගැසීමට පටන් ගත්හ. සාහසිකයන්

අනතුරට වෙඩි තැබීමට පටන්ගත් විට කම්කරුවෝ හිස් ලූ ලූ අත පළා ගියහ.

නිර්භය සිහිය දෙනොකු හද වේලාවකින් පහල වෙත පැමිණියත් ඒ වන විට හාදුනන ආරක්ෂකයෝ උද්දතව මිදුලේ සැඟවී පලාගොස් සිටියහ. සිය ගණනක් දෙනාගේ ඇස් ඉදිරිපිට මේ දරුණු මිනීමැරුම සිදු කලත්, අපරාධ කරුවන්ගේ හැඩරුව ගැන හරි හැටි විස්තර කළ හැකි කිසිවෙක් නොවිය.

මැක්මඩෝ හා ස්කැන්ලන් ආපසු නිවස බලා පිටත් වූහ. ස්කැන්ලන් මෙවැනි මිනීමැරුමක් තම දෑසින්ම දුටු පළමු අවස්ථාව මෙයයි. එය සගයන් විස්තර කරන කාලේ විනෝද ජනක දෙයක් නොවූ බව ඔහුට වැටහිණ. මියගිය මෙන්සිස් මහතාගේ බිරිඳ හැඬූ විලාප හඬ ආපසු එද්දී ඔවුනට ඇසෙන්නට ලැබිණ. කල්පනාවේ වෙලී සිටි මැක්මඩෝ නිහඬ විය. එහෙත් තම සහයාගේ බියසුළු ස්වභාවය ගැන ඔහු අනුකම්පාවක් නොදැක්විය.

'මේක තමා යුද්ධයක් වගෙයි. එයාලයි අපියි අතරේ යුද්ධයක්. අපට පුළුවන් වෙලාවට අපි වෙඩි තියනවා.'

එදා රාත්‍රී සංගම් ශාලාවේ කොලාහලයක් මහ ප්‍රකාශ විය. ක්‍රොෆිල් පතලේ කළමනාකරු හා ඉංජිනේරුවාගේ මරණ ගැනත් සමාගම් වලටත් යස පාඩමක් බව සමහරු පැවසූහ. මෙය වර්මිසා නිම්නයේ ජයග්‍රහණයක් බව තවත් සමහරු කියා සිටියහ.

ප්‍රාන්ත නියෝජිත පොට්, කුලයේ හොඳම මිනිසුන් පස්දෙනෙකු වර්මිසාවට එවීමේ නිකම් නොවේ. වෙනත් ප්‍රදේශයක ගල් අඟුරු පතල් හිමියකු මරා දැමීමට ඔහුට වර්මිසාවෙන් ඝාතකයන් තිදෙනෙකු අවශ්‍ය විය. ඒ අවාසනාවන්ත පතල් හිමිකරුවා ගිල්මර්ටන් ප්‍රදේශයේ ස්ටේක් රෝයල් පතල හිමි විලියම් හේල්ස්ය.

ඉතා ජනප්‍රිය පුද්ගලයකු වූ හේල්ස් ට කිසිම සතුරකු ඇතැයි යන්න විශ්වාස කිරීමට පවා අපහසුය. ඔහු ආදර්ශවත් හාම්පුතෙකි. කෙසේ වෙතත් වැඩ කටයුතු කාර්යක්ෂම ලෙස

සේවකයන් විසින් ඉටුකරනු ඇතැයි ඔහු බලාපොරොත්තු විය. සාහසිකයන්ගේ සංගමයේ සහෝදරවරු කිහිප දෙනෙක් මෙම පතලේ සේවය කළහ. ඔවුන්ගෙන් සමහරු මත්පැන් පානයට ගිජු වී සේවයට නොපැමිණි වෙබද්දන් කිහිප දෙනෙකි. තවත් සමහරු නිතිපතා තම වැඩ පැහැර හැරියහ. හේල්ස් මොවුන් සේවයෙන් අස්කර දැමීය. විලියම් හේල්ස්ගේ නිවසේ දොරේ ඔහු වෙත මරණීය තර්ජන ඇලවා තිබිණි. එහෙත් මේ කිසිවකින් ඔහු කලබලයට පත්වූයේ නැත. නිදහස් ශිෂ්ට සම්පන්න රටක ජීවත්වන නිර්දෝෂී පුරවැසියකුට මරණීය දණ්ඩනය නියම වී තිබිණ.

විලියම් හේල්ස් සැන්දෑ කාලයේ තම නිවස වෙත අළුම්වින් යන මාර්ගයේ රැක සිටි අපරාධකාරයෝ ඔහු මරා දැමූහ. මෙය සිදුකරන ලද්දේ වෙඩ් මොල්ම්විත් කුලිය කණ්ඩායමක් විසිනි. මෙසේ ඝාතනයට ලක්වූයේ වර්ෂිසාවේ කිසිවෙකු දැන හැඳින සිටි පුද්ගලයකු නොවේ. එහෙත් වර්ෂිසාවේ වැඩකාරයන් කොපමණ දක්ෂ පුද්ගලයන්ද යන්න, ගිල්මර්ටන්හි සහෝදරයන් වෙත පැහැදිලිවම පෙන්වන ලදී.

එද ජෝසාරයන්ට ජයග්‍රාහී දවසක් විය. නිම්නය පුරා සෑම හදවතකම පැතිර ගියේ භීතියයි. අති දක්ෂ යුද්ධ සේනාධිපතියා තම ඉදිරි ගමන දෙගුණ කර ගැනීම සඳහා කෝර්ගාන්ගේ ජයග්‍රහණය ලැබූ මොහොතයි. එක් පරාජයක් ලැබූ සතුරාට, තම අඩුපාඩු තම සහායකයෙකු නිස එසවීමට එවිට ඉඩක් නොලැබේ. මේ අයුරෙන්, මැක්ගිනිට් ලොක්කාද තම සතුරන්ට ප්‍රහාරයක් එල්ල කිරීමට මේ ජයග්‍රාහී අවස්ථාව තෝරා ගත්තේය. මැක්මියර්ගේ එක් අතකින් අල්ලාගත් මැක්ගිනිට්, ඔහු ඇතුළත කාමරයට කැඳවාගෙන ගියේය.

-"මේ බලපං කොල්ලෝ. උඹටම ගැළපෙන කාලේ රාජකාරියක් මන්න දැන් ලැබිල තියෙනවා. ඒක හරියට කිරීම උඹට භාරයි"

'හොන්තාන් සන්තෝසයි'

'උඹට මං මිනිස්සු දෙන්නෙක් දෙන්නම්, මැක්මර්ඩුයි,

රයිලියි. ඒ දෙන්නටත් වැඩකට සූදානම් වෙන්න කියල දැනුම් දීලයි තියෙන්නේ. චෙස්ටර් විල්කොක්ස්ටත් හොඳ පාඩමක් උගන්වනතෙක් අපේ වැඩකටයුතු සම්පූර්ණ වෙන්නේ නෑ. ඒ වැඩේ හරියට කළොත් මේ ගල් අඟුරු පළාතේ තියන හැම ගොවිතැනම් සහෝදරයෝ උඹට ස්තූතිවන්ත වෙයි.

"මට පුළුවන් තරම් හොඳින් වැඩේ කරන්නම් සවුද් බිය මිනිහා? කොහේදිද මට උඹේ හම්බවෙන්න පුළුවන්?"

මැක්ගින්ටිගේ කටේ නිතරම දකින්නට ලැබෙන මායෙට ඉරූ, මායෙට හපගැසු සුරුට්ටුව ඔහු ඉවතට ගත්තේය. ඉන්පසු ඔහු කොළ කැබැල්ලක සටහනක් අඳින්නට පටන් ගත්තේය.

"චෙස්ටර් යකඩ නිෂ්පාදන සමාගමේ ප්‍රධාන ෆෝමන් තමා විල්කොක්ස්. යුද්ධ හමුදාවේ ඉඳපු ජ්‍යෙෂ්ඨ සාජන්ට් වරයෙක් හැම දේකටම මුහුණ දීල හොඳ හැටි හෙම්බත්වුණු වෙච්ච එකෙක්. මිනිහව මරන්න අපි දෙපාරක් උත්සාහ කළා. එක සැරයක් උණේ වෙඩි පාරෙන් අපේ ජිමි කානවේ මැරුම් කෑවා. අනික් පාරත් වැඩේ වැරදුණා. දවල් වෙලාවේ මොකුත්ම කරන්න බෑ. මිනිහ ළඟ ආයුධ තියෙනවා. ඌ ප්‍රශ්න අහන්නෙ නෑ. කෙළින්ම වෙඩි තියනවා. ඉලක්කය අහුවටම හරි. නමුත් රෑට කන්තෝරුව ටිකක් වෙනස්. ගෙදර ඉන්නෙ මිනිහයි, ගෑනියි, ළමයි තුන් දෙනෙකුයි, වැඩට ඉන්න ගෑනියෙකුයි විතරයි. අපට එක එකා තෝරලා බේරලා ගන්න විධියක් නෑ. කිසිකෙනෙකුට ඒක එක පැත්තේ යවන්නයි වෙන්නෙ. වෙඩි බෙහෙත් කෑලියක් ඉස්සරහ දොරට ගේන්න කරලා, හෙමින් පත්තු වෙලා යන තිරි දැල්ලක් ඌ කළොත්......"

"මිනිහ මොකක්ද කරල තියෙන වැරැද්ද?"

"ඇයි මං උඹට කිව්වෙ, ඌ අපේ ජිමි කානවේ මැරුව කියල?"

"ඒ මොකද ජිමිට වෙඩි තිබ්බේ?"

"උඹට ඒකෙං ඇති වැඩක් නෑ මිනිහෝ. විල්කොක්ස් මරණ

අදහසින් උගේ ගේ ගාව පීම් හැංගිලා හිටියා. විල්කොක්ස් පිහිට වෙයි කියලා. ඒ ඕක ඇදෑ? උඹ මේ වැඩේ හරියටම කරන්න ඕන'

'මේ ගෑනු දෙන්නෙකුයි ළමයින් ඉන්නව නේ. ඒ කොල්ලත් එන්නමද?'

'නිස්සොම තමා. නැතුව කොහොමද මිනිහ විසරක් අල්ල ගන්නේ?'

'ඕක මහ අපරාධයක් නෙ. එවුන් මොකුත් වැරැද්දක් කරල නැහැනේ'

'උඹ කියන්නෙ මහ මෝඩ කතාවක්. මින්න උඹ පස්ස ගහන්නයි හදන්නෙ?'

'කලබල වෙන්න එපා මන්ත්‍රීතුමා, කලබල වෙන්න එපා. නායකතුමාගෙන් එක අණක් කොයි වෙලාවකවත් නොකර ඇරල, මං පස්ස ගහලා තියෙනවාද? හරිද වැරදිද කියන එක තීරණය කරන්න ඕන ඔබතුමා'

'එහෙනං උඹ වැඩේ කරනවා?'

'ඔව් මං කරනවා'

'කවදද?'

'මට දවසක් දෙකක් දෙන්න. ඒ වෙච්ච වෙලාවක ගිහින්, ගේ තියන තැන බලාගෙන මං සැලැස්මක් හදන්නම්. ඊට පස්සෙ.......'

'බොහොම හොඳයි. එහෙනං ඕක ඉවර කරන එක උඹට බාරයි. විල්කොක්ස්ලව ඉවර කරපු ආරංචිය අරගෙන උඹ එන දවස බොහොම ප්‍රීතිමත් දවසක් වේවි. පතල්, කර්මාන්ත ශාලා අයිතිකාරයෝ කිස්සොම දණගස්සවන්න අපට කරන්න ඉතුරු වෙලා තියෙන්නේ මෙච්චරයි.'

මේ හදිසියේ මිනුව නාරදන් රාජකාරිය ගැන මැණිකෙට

බොහෝ වේලාවක් කල්පනා කළේය. වෙස්ටර් විල්කොක්ස් ජීවත් වූ හුදකලා නිවස පිහිටා තිබුණේ වර්මිසාවට යාබද නිම්නයේයි. කටයුතු සැලැසුම් කිරීමට පෙර සියල්ල දැක බලා ගැනීමේ අදහසින් ඔහු එද රාත්‍රියේම තනියම පිටත්ව ගියේය.

ඔහු ආපසු පැමිණියේ පසුවද දහවල්ය. ඊළඟ දිනයේ තම සහකරුවන් දෙදෙනා වූ මැන්ඩර්ස් හා රයිලි සමග ඔහු සාකච්ඡාවක් පැවැත්වීය. මුව දඩයමක් සඳහා යන ගමනකට සැලැසුම් කරන්නාක් මෙන් තරුණ උදව්කරුවෝ ඉමහත් උද්‍යෝගයෙන් පසුවූහ.

රාත්‍රී දෙකට පසු ඔවුහු නගරයෙන් පිටත ස්ථානයකදී යළි හමුවූහ. තිදෙනාම ආයුධ සන්නද්ධව සිටියහ. ඊට අමතරව ගල්පර්වත පිපිරවීමට යොදා ගන්නා වෙඩි බෙහෙත් පිරවූ ගෝනියක් එකෙක් කර තබා ගත්තේය.

විශාල වතුයායක් මැද හුදකලාවම පිහිටි නිවස වෙතට ඔවුන් ළං වන විට පාන්දර දෙක පමණ වී තිබිණ. එය හඳ පුළුං සහ තාරකා හඳ එළියක් තිබූ රාත්‍රියක් විය. මුර බල්ලන්ගෙන් ප්‍රවේශම් විය යුතු බවට ඔවුනට අනතුරු අඟවා තිබිණි.

පිස්තෝල සූදානම් කරගෙන ඔවුහු ඉදිරියට ගමන් ගත්හ. සුළඟත් සමග සෙලවෙන ගස් කොළං වලින් නැඟුණු හඬ හැරෙන්නට සියල්ල නිශ්චලය.

නිවසේ දොරට කන තබා මැක්මහෝන් මද වේලාවක් සවන් දීගෙන සිටියේය. කිසිදු ශබ්දයක් නොමැත. වෙඩි බෙහෙත් ගෝනිය දොරට හේත්තු කළ ඔහු, පිහියෙන් එය සිදුරු කළේය. ෆියුස් නූල දිගහැර, ඊට සම්බන්ධ කොට; එහි කෙළවරට ගිනි දල්වා ඔවුහු පැනදිවූහ. සාහසිකයන් නිවසෙන් සෑහෙන තරම් දුර දිය කඩිත්තක් අසලට පැමිණි පසු මහ හඬින් පිපිරීමේ ශබ්දයක් ඇසිණි. ඒ සමගම අසන්නට ලැබුණේ නිවසේ බිත්ති සියල්ල කඩා වැටී, එය සුන්බුන් ගොඩක් බවට පත්වන හඬයි. රාජකාරිය සම්පූර්ණ බවට සංඥාවයි ඒ. ජ්‍යකෝර සංගමයේ ලේ තැවරුණු

ඉතිහාසයේ, කවදාවත් මේ තරම් සාර්ථක ලෙස මනුෂ්‍ය ඝාතනයක් සිදුකර නොමැති බැව් අසන්නට ලැබිණි.

එහෙත් මේ තරම් සූක්ෂම ලෙස සැලසුම් කොට කළ කටයුත්ත, සම්පූර්ණයෙන්ම අසාර්ථක විය. තමාට එල්ල වූ මරණීය තර්ජන වලින් තැතිගෙන සිටි චෙස්ටර් විල්කොක්ස්, ඊට කලින් දින සිය පවුල සමග නිවසින් ඉවත්ව ගොස් සිටියේය. දැන් ඔහු පොලිස් ආරක්ෂාව යටතේ නිම්නයේ කොතැනක හෝ අප්‍රසිද්ධියේ ජීවත් වන බව අසන්නට ලැබිණි. පුපුරා හරින ලද්දේ හිස් නිවසකි. මැක්මිලන් සාජන්වරයා දිගටම පහළ සේවකයන් විනයානුකූලව ක්‍රියාවෙහි යොදා ගැනීමේ නිරත විය.

'උන්දැව මට ඉඳුරු කරන්න.' ඒ කීවේ මැක්මිලන්ය.

'එයාගෙ ජීවිතය අයිති මටයි. අවුරුද්දක් බලාගෙන ඉන්න සිද්දුණත් එයාගෙ වැඩේ ඉවර කරල තමයි මං පස්ස බලන්නෙ.'

මෙවර පැවැති සංගමයේ සභා වාරයේදී මැක්මිලන් ඇතුළු තිදෙනාට විශ්වාසය පළකිරීමේ යෝජනාවක්ද, ස්තුති යෝජනාවක්ද ඒකච්ඡන්දයෙන් සම්මත විය. විල්කොක්ස් සම්බන්ධයෙන් මීළඟට ගතයුතු ක්‍රියාමාර්ගය ගැන සාකච්ඡා කිරීම පසුවට කල්තබන ලදී. කෙසේ වෙතත්, විල්කොක්ස් ගමන් ගන්නා මාර්ගය අවට සැඟවී සිටි කිසිවෙකු, ඔහුට වෙඩි පහර කිපයක් එල්ල කර ඇති බවට තොරතුරු පුවත්පත්වල පළ විය. තමා පටන්ගත් රාජකාරිය අවසන් කිරීම සඳහා මැක්මිලන් තවමත් උත්සාහ ගනිමින් සිටින බව විවෘත රහසක් විය.

ස්කෝවර් සංගමය ඔවුනගේ අණසක පැතිරවූයේ මෙවැනි ක්‍රම සහ විධිවලිනි. ත්‍රස්තවාදය රජකරවමින්, ඔවුන් විසින් දිගින් දිගටම කරන ලද, දරුණු අපරාධවල පැල්ලම් වලින් මේ පොතේ පිටු තව තවත් අපිරිසිදු කරන්නේ කුමකටද? මේ පාපිෂ්ඨ අධම පුද්ගලයින්ගේ ක්‍රියා කලාපය පැහැදිලි කිරීමට මවිසින් ඉදිරිපත් කර ඇති කරුණු ප්‍රමාණවත් නොවන්නේද?

මේ සියලුම අපරාධ පිළිබඳව පොලිස් වාර්තාවල සඳහන්ව

ඇත. ජ්නොර් සංගමයේ සාමාජිකයන් දෙදෙනෙකු අත් අඩංගුවට ගැනීම නිසා ඝාතනය කරනු ලැබූ හෙට්ටි හා එඩ්වින් නම් පොලිස් නිලධාරීයන් දෙදෙනා පිළිබඳ සිද්ධිය එවැන්නකි. මොවුන් දෙදෙනා ආයුධ නොමැතිව සිටි වේලාවක කඩා පැන, අඩු අඩුවේම කරන ලද ඝාතනය සැලැසුම් කරන ලද්දේ වර්මිසා ගාමාවේදිය. මැස්කිනිට් ලොජ්ජාගේ අණ පරිදි ලාර්ම් නම් මහත්මයෙකු අමානුෂික ප්‍රහාරයකට ලක්විය. ඔහු මරණීය තුවාල ලබා ඇදේ වැතිර සිටියදී ඔහුට ශාන්තු පප්පායම් කළ ලාර්ම් මහත්මිය වෙඩි තබා ඝාතනය කිරීමට තරම් සංගම් සාමාජිකයෝ පැකැටි වූහ. ඊට පසුව සිදුවූ තවත් එක් සිද්ධියක් නම් වයෝවෘද්ධ ජෝන්කින්ස් මහතා මරා දැමීමයි. කිසිඳ දිනකට පසු ඔහුගේ සොහොයුරාටද එම ඉරණමම අත්විය. එම සිත පසුවේදීම කළ තවත් අපරාධ රාශියකි. ජේම්ස් මර්ඩොක් කපා, කොටා තවත් දරුණු තුවාල සිදුකිරීම, ජ්වැත්හවුස් පවුල පීඩිත්වූ නිවස පිටින්ම පුපුරවා හැරීම, හා ජ්‍යාට්ත්වාල් පවුලම ඝාතනය ඉන් සමහරකි.

මහා බෙදුම්කාර අඳුරු වලාවකින් මිනිසුණු නිම්නය වැසී තිබිණි. භේමන්ත සෘතුව උදාවෙද්දී ගස් වැල්, පිපුණු මලින් බරවිය. කුරුළු ගී නාදය දසදිගින් ඇසෙන්නට පටන් ගත්තේය. කලා බස්නා ඇල දොළෙන් නැගුණේ කොටකේ හඬකි. පුපුරුදු සිරිමයන් පරිසරය අලංකාර කිරීමට සොබා දහමට නුඹ ලැබිණ. එහෙත් මේ නිම්න සිරිය දිව හොඩු මිනිසුන්ට කොහිද සතුටක් ? භීෂණයෙන් කෙම්පිනවූ ඔවුනට කොහිද සැනසුමක් ? 1875 වසරේ වසන්ත සෘතුව උදාවෙද්දී නිම්න තිම් වසාගෙන පැතිරගියේ කිසිදක නොවූ විරූ භීෂණ වලාවකි.

## 6

## අනතුරුදායකයි !

ඒ ත්‍රස්තවාදය ඉහළම හිනිපෙත්තට නැගී තිබූ සමයයි. මේ වන විට සංගමයේ සභාධිකාරී මණ්ඩලයේ ඉහළම තනතුරක් සඳහා මැක්මහෝන් තෝරාගෙන තිබිණ. නුදුරු අනාගතයේදී මැක්ගින්ටි ලොක්කා තනතුරෙන් ඉවත්වූ පසු, එම තනතුර හිමිවන්නේ මැක්මහෝට බව රහසක් නොවීය. සියලුම වැඩ කටයුතු සඳහා ඔහුගේ අවවාද උපදෙස් ලබාගැනීමට සහෝදර සාමාජිකයෝ අමතක නොකළහ. සංගමයේ ඔහු වඩවඩාත් ජනප්‍රිය වෙද්දී වර්මිස්සාවේ ජනතාව ඔහුට වඩ වඩාත් ශාප කළහ.

ඔවුනට විරුද්ධව ත්‍රස්තවාදයේ අසීමිත රැල්ල වෙද්දී ඊට විරුද්ධව එක්සත් වීමට නගර වැසියෝ තීරණය කළහ. 'වර්මිස්සා හෙරල්ඩ්' පුවත්පත් කාර්යාලයේ රහසේ රැස්වීම් පවත්වා, නීතිගරුක ගම්වැසියන් අතරේ ගිනි අවි බෙදා හැරීමට පියවර ගන්නා ලදී. මේ බව ප්‍රකාර සංගමයට ආරංචි විය. එහෙත් මැක්ගින්ටි ලොක්කාවත් ඔහුගේ සගයින්වත් මේ ආරංචි වලින් කලබලයට පත්වූයේ නැත. ඔවුන් හොඳින් ආයුධ සන්නද්ධව සිටි අතර සංගමය සතුව සිටි සාමාජිකයන්, ගණනින්ද බොහෝ වැඩිවිය. අල්ප වූ විරුද්ධ වාදීන් තැන් තැන් වලට විසිරී සිටි නිසා බලයෙන් අඩුවිය.

'කලින් වාර වල වගේ තමයි. අපි කීප දෙනෙකුව අත්අඩංගුවට ගනීවි. ඊළඟට සාක්ෂි නැති නිසා නිදහස් කරන්න සිදුවේවි. එතකොට ඔය කයිවාරු නිකම්ම නවතීනාවා'

මැක්ගින්ටි පැවසූ විට සෙස්සෝ එය අනුමත කළහ.

මැයි මාසයේ එක් සෙනසුරාද දිනයක සැන්දෑවකි. සෙනසුරාද රාත්‍රිය සෑම විටකම සංගමයේ රැස්වීමක් සහිතව සම්භාෂණයක් පැවැත්වෙන රාත්‍රියයි. එයට සහභාගී වීම සඳහා මැක්මහෝන් නිවසින් පිටත්විය. ඔහුට ඉදිරියට හමුවූයේ සංගමයේ

වියපත්ම සාමාජිකයා ලෙස හැඳින්වුණු මොරිස් සහෝදරයායි. ඔහුගේ නළල රැලි වැටී තිබිණ. මුහුණෙන් දිස්වූයේ බරපතල කරදරයක සලකුණුයි.

'මැක්මයෝර් මහත්මයා. මට ඔබත් එක්ක රහසක් කථාකරන්න පුළුවන්ද?'

'සත්‍යයෙන්ම ඔව්'

'මගේ හදවතෙන් මතුවෙන අවංක හැඟීම් සැරයක් මං ඔබට කිව්වා. ඔබ ඒක රහසක් ලෙස තියාගත්තා. ලොක්කා ගෙදරටම ඇවිත් අහලත් ඒ ගැන කිසිම දෙයක් ඔබ ඔහුට හෙළි කළේ නෑ. ඒව මට අමතක නෑ'

'සහෝදරයා ඔබේ මං ගැන විශ්වාසය තියල රහසක් කිව්වාම, මම ඒක කඩකරන්නෙ කොහොමද?'

'මං ඒක හොඳට දන්නවා. ඔබට කිව යුතු රහසක් මං ළඟ තියෙනවා' මොරිස් තම පසුවට අත තැබුවේය.

'මං දැන් ඉන්නෙ පසුවේ තීන්දුවෙන්. මේක ඔබේව ඇර වෙන කාට කිව්වත් මට මැරුම් කන්න සිද්ධ වෙනවා. විලසට මං මේක නොකියා හිටියොත් අපේ ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම ඉවර වේවි. දෙයියනේ මං මොකද මේකට කරන්නෙ? මට දැන් පිස්සු හැදී ගෙනයි එන්නෙ'

මැක්මයෝර්, මොරිස් දෙස පරීක්ෂාවෙන් බැලීය. මොරිස්ගේ මුළු සිරුරම වෙව්ලයි. වීදුරුවකට විස්කි ස්වල්පයක් වත්කළ මැක්මයෝර් එය මොරිස් අතට දුන්නේය.

'තමුසෙ ඔබේ සිහිස්ථානට මේක ගුණ වෙනවා. දැංවත් කියමුකො කියන්න අර රහස'

මොරිස් විස්කි වීදුරුව එක හුස්මට හිස් දැම්මේය. සුදුමැලිව තිබූ ඔහුගේ මුහුණ මඳ වශයෙන් රෝස පැහැයට හැරිණ.

'මට පුළුවන් ඒ රහස ඔබේට එක වාක්‍යයකින් කියන්න,

අපේ පිටිපස්සෙන් එනවා රහස් පරීක්ෂකයෙක් !

මැක්මයෝ ඔහු දෙස බලාසිටියේ පුදුමයෙනි.

'ඇයි මනුස්සයෝ ඔහේට පිස්සුද? මෙහේ කොයිතරං පොලිස්කාරයො, රහස් පරීක්ෂකයො ඉන්නවද? අපට උන්ගෙන් කිසි කරදරයක් නෑ?'

'නෑ නෑ. ඒ යකා මේ පළාතෙ මිනිහෙක් නෙමෙයි. මෙහේ ඉන්න රහස් පරීක්ෂකයො ඔක්කොම අපි අඳුනනවා. උං ගෙන් කරදරයක් නෑ තමයි. නමුත් ඔහේ අහල තියෙනවද සිංහටන් ගැන?'

'ඔය නම නම් පත්තර වල කියවල තියෙනවා'

'එහෙනං අහගන්නවා මගෙන්. සිංහටන් මිනිහෙක් පස්සෙන් වැටුණොත් ඔක්කොම ඉවරයි. ඒ ගොල්ලගෙ වැඩ ඔය ආණ්ඩුවේ වැඩ වගේ නෙමෙයි. ප්‍රතිඵලයක් ලැබෙන කල්ම පස්සෙන් එළවනවා. හොඳින් නැත්නම් නරකින් උන් කොහොම හරි මාරගන්න වැඩේ කරනවා, කරනවාමයි. අපේ ව්‍යාපාරය පස්සෙ සිංහටන් මිනිහෙක් එනවා නම් අපි විනාසයි.

'අපි කොහොම හරි උංව මරමු'

තමුසෙගෙ මොළේට ඉස්සර වෙලාම කල්පනා වුණේ ඒකද? එහෙනං නාවාලුවේ තීරණයක් ඒකම වේවි. දෙවියනේ එහෙනම් මිනීමැරුමක්'

'ඔව් මිනීමැරුමක් තමයි. ඒ වුණත් ඒක ඉතිං මේ පළාතේ සාමාන්‍ය දෙයක් නේ'

'ඒක හැබෑව්. නමුත් යම් මිනිහෙක්ව මරාදමන්න හදනවානම්, ඔහු අනිත් අයට පෙන්වලා දෙන මිනිහ වෙන්න මං කැමති නෑ. ඒ මොකද ඊට පස්සෙ කවදාවත් මගේ හෘද සාක්ෂියෙන් මට නිදහසක් නෑ. ඒ වුණත් මේ මිනිහා අපි ඔක්කොගෙම බෙල්ලෙන්ම අල්ල ගනීවි. දෙවියන්ගෙ නාමෙන් කියන්න මං මොකද්ද කළ

ලුන්නේ කියල?"

ඔහුගේ වදන් වලින් මැක්මර්ඩෝ ද මහත් සේ කැළැඹීමට පත්ව ඇති බව පෙනිණ. ඔහු මොරිස්ගේ උරහිසෙන් අල්ලා සොලවිය.

"මනුස්සයො, මේ බලනවා. මිනියක් වළදන්න හදනකොට විලාප ගහන නාකි අම්මණ්ඩි කෙනෙක් වගේ නිකං කෑගහල වැඩක් නෑ. විස්තර ටික හරියට කියනවා. කවුද ඒ මිනිහා? කොහේද ඌ ඉන්නෙ? තමුසෙ කොහොමද එහෙම කෙනෙක් ඉන්න බව දැනගත්තෙ? මොකද ඉතින් මේක මටම ඇවිත් කිව්වෙ?"

"මැක්මර්ඩෝ මං ඔයා ළඟට ආවෙ, මේකට දැනමුතුකමින් ගන්න පුළුවන් එකම මිනිහා ඔයා නිසා. මං කිව්ව නේද මෙහේ එන්න ඉස්සර වෙලා මං නැගෙනහිර පළාතේ කඩයක් දාගෙන හිටිය කියල. එහේ මගේ හිතවත් යාළුවො කීප දෙනෙක්ම ඉන්නවා. එයින් එක්කෙනෙක් රස්සාව කරන්නෙ විදුලි පණිවුඩ කන්තෝරුවේ. මෙන්න එයාගෙන් ඊයේ මට ලැබිච්ච ලියුම. මෙන්න මේ කොටස තමයි වැදගත්. ඔයාම කියවල බලන්න"

**"ඔබේ පළාතේ ස්කෝවර් සංගමයේ වැඩ කටයුතු කොහොමද? පුවත්පත් වල නම් ඔවුන් ගැන නිතරම කියවන්න ලැබෙනවා. ඉක්මනින්ම ඔබේ තොරතුරු මට දන්වා එවන්න. ඔබට රහසක් කියන්නම්. මේක කාටවත් හෙළිකරන්න එපා. විශාල නිෂ්පාදන සමාගම් පහක් සහ දුම්රිය ධාවන සමාගම් දෙකක් එකතුව ලොකු වැඩක් කරන්නයි සූදානම. වැඩේ ඉවරයක් වන තුරු ඔවුන් ඒක අත්හැර දන්නෙ නැති බව මට නම් හොඳටම විශ්වාසයි. ඔවුන් වැඩේ පිංකටන් ආයතනයට භාරදීලා. පිංකටන් එකේ දක්ෂම මිනිහා බර්ඩි එඩ්වඩ්ස් තමයි වැඩේට බැඳලා තියෙන්නේ. පුළුවන් ඉක්මනින් එය නවත්වන්න වෙවි."**

"දැන් මේ යටින් කියන ටිකත් කියවන්න"

**"මං මේ ඔබට දැනුම් දෙන්නේ රාජකාරි කරද්දී මට දැනගන්න ලැබුණු තොරතුරු. වර්මිසාවෙන් මහා දිග පණිවුඩ එනවා දිනපතාම වගේ. ඒත් ඒ එකක්වත් තේරුම් ගන්න බැහැ. රහස් භාෂා ක්‍රමයකට ඒවා ලියල තියෙන්නේ. ඒ භාෂාවත් දිනපතාම වාගේ වෙනස් කරනවා. ඉතින් පණිවුඩ වල අඩංගු මොනවාද කියා කිසිදෙයක් තේරුම් ගන්න බැහැ."**

ලිපිය දෙස ඇසිපිය නොහෙළා බලාගෙන මැක්මිලන් තරමක් වෙලා නිහඬව සිටියේය. මෙතෙක් සියල්ල වසා තිබූ මීදුම පහව ගිය ආකාරයකි. ඔහු ඉදිරියට ඇත්තේ භයානක ප්‍රපාතයකි.

'කවුරුවත් මේ ගැන දන්නවාද?'

'මං කාටවත් කිව්වෙ නෑ'

'ඒ වුණත් මගේ මේ මිත්‍රයා- එයා වෙන කාටවත් දන්වල යැව්වද දන්නෙ නෑ?'

'ඔහු අඳුනන කවුරුත් එක්කෙනෙක් දෙන්නෙක් ඉන්නවා'

'අපේ ගාඩ්ලාගෙන් ඉන්නවද?'

'සමහරවිට මෙහෙත් ඉන්න ඉඩ තියෙනවා'

'මං ඒ කාරණය අනුව මේ නියයි. මේ ඩර්ඩි එඩ්වඩ්ස්ගේ හැඩිහුරුකම් කොහොමද, අඳුන ගන්න පුළුවන් ලකුණු මොනවාද, කියල කාට හරි දන්වල තිබුණොත් අපට ඒ විස්තර ප්‍රයෝජනවත් වෙන නිසා'

'ඒ වුණාට මං හිතන්නෙ නෑ මගේ මිත්‍රයා ඩර්ඩි එඩ්වඩ්ස්ගේ හැඩරුව දන්නවා ඇති කියල. විදුලි පණිවුඩ යවද්දි ඔහුව දැනගන්න ලැබුණු තොරතුරු තමයි මේ දන්නල එවල තියෙන්නෙ. සිංකුටත් මිනිහව කොහොම අඳුනන්නද?'

මැක්මිලන් එකවරම තිගැස්සී කෑගැසුවේය.

'දෙවියනේ සාක්කි ! මං දන්නවා උං කවුද කියලා. මෙච්චර වෙලා ඒක මට කල්පනා නොවුණු හැටි. කොහොම වුණත් මේක අපේ වාසනාව. අපට මොනව හරි කරදරයක් කරන්න ඉස්සර වෙලා එයාව ඉවර කරමු. මේ බලන්න මොරිස්. මේ වැඩේ සම්පූර්ණයෙන්ම මට භාරදීල ඔබ මේකෙන් අයින් වෙන්න කැමතිද?'

'සන්තෝසයෙන්ම ඔව්. ඒ බර ඔබේ කරපිටට ගන්නව නම්'

'හරි. මං ඒ විදියට කරන්නම්. ඔයා සම්පූර්ණයෙන්ම පිටිපස්සට වෙලා ඉඳගෙන මට මේක කරන්න ඉඩ හරින්න. ඔයාගෙ නමවත් මේකට ගැවෙන්න අරින්න ඕන නෑ. හරියට ලියුම් ආවේ මගේ නමට වගේ සම්පූර්ණ වගකීම මං භාරගන්නම්. ඒකෙන් ඔයාට හැඟීමකට පත්වෙන්න පුළුවන්ද?'

'ඇත්තෙන්ම ඔව්. මටත් ඕන එච්චරයි.'

'එහෙනං මින් ඉදිරියට ඔය ගැන කට නොලවන්න එපා. මං දැන් සංගම් කාර්යාලයට යනවා. වැඩි දවසක් යන්න කලින් මේකට ඔලුව දාපු එක ගැන පිංකටන් කාර්යාට කණගාටු වෙන්න සිදුවෙයි.'

'ඔහේ මේ මිනිහට මරන්නෙ නැහැ නේද?'

'මොරිස් යාළුවා, ඒව ගැන විස්තර ඔහේ නොදන්න තරමට හොඳයි. එතකොට ඔහේගෙ හිතත් සැහැල්ලුයි. හොඳට නින්දත් යාවි. ප්‍රශ්න අහන්න එපා. සුදුසු විදියට කාරණා සිද්ධ වේවි.'

'මට හිතෙනවා ඒ මිනිහගේ ලේ මගේ අත් වලත් තැවරුණා කියල.' මොරිස් පහත් හඬින් කීවේ පිටවී යාමට සූදානම් වෙමිනි.

'ආත්මාරක්ෂාව සලසා ගැනීමට මිනීමැරුමක් කියන්නෙ නෑ මනුස්සයෝ.' මැක්මඩෝ පැවසුවේ සිනාමුසු මුහුණෙනි.

'එක්කො උං. නැත්නං අපි. ඔය මිනිහා මේ පළාතෙ වැඩි දවසක් හිටියොත් අපි ඔක්කොම විනාසයි. මොරිස් සහෝදරයා, ඔහේ මැක්ගින්ටිගෙන් පස්සෙ නායකතුමා හැටියට තෝරගන්න වටින කෙනෙක්. අපේ මුළු සංගමයම බේරගත්තෙ ඔහේ'

මැක්මඩෝ මෙලෙස සැහැල්ලුවට කථා කළත්, අලුත් ආරංචිය නිසා ඔහු මහත්සේ කැලඹීමට පත්ව ඇති බව පෙනිණ. එක්කෝ නමා අපරාධ වලට සම්බන්ධ නිසා හෘද සාක්ෂියෙන් පෑගෙන හැඟීම නිසා විය යුතුය. එසේත් නැත්නම් ඉතා සාර්ථක ලෙස අපරාධකාරයින් අල්ලා ගැනීම ගැන පිංකටන් සංවිධානය ලබා ඇති ප්‍රසිද්ධිය නිසා විය යුතුය. එසේත්

හැකිනම් ප්‍රහාරයන් විනාශ කරදැමීමට සමාගම් හා කර්මාන්තශාලා හිමියන් එකතු වී යුද්ධ ප්‍රකාශ කිරීම නිසා විය හැකිය. කාරණාව කුමක් වුවත් මැක්මහෝන් ක්‍රියා කළේ අන්තිම සටනට සූදානම් වන අයකු ලෙසයි. කිසියම් අවස්ථාවක ඔහුට විරුද්ධව ප්‍රයෝජනයට ගත හැකි යයි සිතූ, ඔහු සතු ලිපිලේඛන සියල්ල පුළුස්සා දමා විනාශ කළේය. ඔහු සැනසුම් සුසුමක් හෙළුවේ ඉන්පසුවයි. දැන් ඉතින් තමා ආරක්ෂිත බව ඔහුට සහතිකය.

ඉදිරියේ ඇති අනතුර ගැන ඔහුගේ හිතට කලින් කා වැදී තිබුණු නිසාදෝ, හැංගී කාර්යාලයට යන අතර මගදී කාන්ටර් නිවසටද මැක්මහෝන් ගොඩ වැදුණේය. මේ නිවස ඔහුට සනසුම් ස්ථානයකි. එහෙත් එන්නලයට මද වෙලාවක් කට්ටු කරද්දී එවි එලියට ආවාය. යකාටවත් භය නැති පෙනුම, ඇගේ කෙම්ටසාගේ මුහුණෙන් ඉවත්ව ගොස් ඇති බව, එවිට එක්වරම දකින්නට ලැබිණ. ඔහුගේ මුහුණේ පිළිබිඹු වූයේ භීතියයි.

'මොකක්වත් කරදරයක් සිද්ධ වුණාද ජැක් ? ඔයාගෙ මුහුණෙන් පෙනෙන්නේ මොකක් හරි අන්තරාවක්'

'ඒක ඇත්ත එවී. ඒ වුණත් තත්ත්වය ඒ තරමටම භයානක නැ. කොහොම වුණත් වැඩේ දරුණු වෙන්න ඉස්සර අපි පැනගන්නොත් හොඳයි'

'පැනගන්නොත් ?'

'ඔ. ඔයාට පොරොන්දු වුණා නේද මියන් එක්ක දවසක මේ පළාතෙන් පිටවෙලා ඈත පළාතකට යන්න එනවා කියලා? ඔන්න දැන් ඒකට වෙලාව ඇවිත්. මට දැන් තරක ආරංචියක් ලැබුණා. ලොකූම අපට ලොකු ලොකු කරදරවලට මුහුණපාන්න සිදුවෙයි.'

'පොලීසියෙන්ද?'

'නැ. පිංකටන් කාරයින්ගෙන්. මෙව ගැන විස්තර කරල

කිව්වට ඔයාට තේරෙන්නෙ නෑ. එච් මං මේකෙ පතුලටම බැහැලා වැඩ කරන කෙනෙක්. මෙහෙන් පුළුවන් ඉක්මනින් යන්නයි දැන් මම උත්සාහ ගන්නෙ. ඔයා කිව්ව නේද මං මෙතනං හිටියොත් ඔයත් එනවා කියල මාත් එක්ක?'

'දැන් ඔයාව බේරගන්න තියන එකම ක්‍රමයත් ඒකයි.'

'එච්චර දේවල් සම්බන්ධවෙලා මං කොහොම අවංක කෙනෙක්. මුළු ලෝකෙම මං ළඟින් හොඳට සිටියත් එපි, මං ඔයාගෙ සෝස් ගහකට හානියක් කරන්නෙ නෑ. වලාකුළු අතරේ පාවෙන සිංහාසනයක රජිනක් වගේ ඉන්න ඔයාව, එයින් එක අඟලක් පහළට ඇද දමන්නෙ නෑ. ඔයා මාව විශ්වාස කරනවද?'

මනුගෙ දෑත් මත, ඇය තම දෑස තැබුවාය.

'හොඳයි එහෙනං මේ මං කියන දේ අහන්න. ඊට පස්සෙ මං දෙන උපදෙස් වල හැටියට සූදානම් වෙන්න. අපට බේරෙන්න තියෙන එකම ක්‍රමය ඒකයි.

මේ ඒරමිතා නිම්නයේ ඔහා කලබල ගොඩක් ඇතිවෙන්නයි යන්නෙ. ඒක මට දැනෙන් වගේ තේරෙනවා. අපි පැණිකා ගණිකාවට නමකමින්ගේ ආරක්ෂාව සලස්වා ගන්න ඕනෙවා. මාත් එයින් එක්කෙනෙක්. ඔහ යි සෝ මහ දවාලේ මට මෙහෙන් පැනල යන්න වෙනවා. එහෙම යන කොයි වෙලාවේ හරි ඔයත් මා එක්ක ආ යුතුමයි.'

'ඔයා ගියාට පස්සෙ මං එන්නම් දැන්'

'නෑ නෑ. ඔයා මාත් එක්කම ආ යුතුයි. මේ පළාත මට තහනම් අඩවියක් වුණාට පස්සෙ මට කවදාවත් මෙහේ එන්න බෑ. මං කොහොමද ඔයාව දාල යන්නේ? පොලිසියෙන් හැංගිලයි මට ඉන්න වෙන්නෙ. පණිවුඩයකවත් මට එවන්න ලැබෙන එකක් නෑ. මගේ ගමේ හොඳ වැදගත් තෝතා කෙනෙක් ගැන මං දන්නවා. අපි විවාහ වෙනකං මං ඔයාව නවත්වන්නෙ ඒ තෝතා ළඟ. එතකොට ඔයා එනවද?'

'බව් ජැක්, මං එන්නම්'

'ඔයේ වචනේ විශ්වාස කළාට ඔයාට දෙවියන්ගේ ආශිර්වාද ලැබේවි. මං ඔයාට දීපු වචනය කඩකළොත් මගේ ඔලුවට හොඳ ගහවී. දැන් අහගන්න එපා. අපි පිටත්වෙමු කියලා මං ඔයාට පණිවුඩයක් එවනවා. ඒ වචනේ අහන්න ලැබුණු ගමන් ඔක්කොම දේවල් අත්හැරදලා ඔයා එන්න ඕනෙ. ඔයා දන්නවා නේ හැනා? එතැනට ඇවිත් මා එනතුරු ඉන්න'

'රෑ හරි දවල් හරි ඔයාගෙන් පණිවුඩය ලැබුණු ගමන් මං එනවා ජැක්'

නිම්නයෙන් පැන යාමේ සැලසුම සම්පූර්ණ කළ පසු මැක්මහෝන් ගේ සිතට දැනුණේ මද අස්වැසිල්ලකි. ඉන්පසු ඔහු පිටත්ව ගියේ සංගම් කාර්යාලය වෙතයි.

ඔහු එහි යන විට සභාවේ වැඩකටයුතු ආරම්භ වී තිබිණ. දැඩි මුරකාවල් යටතේ පැවැත්වුණු මේ රැස්වීමට ඇතුළු විය හැකිවූයේ සංඥා, ප්‍රතිසංඥා රාශියක් හුවමාරු කරගත් පසුවයි. මැක්මහෝන් ඇතුළුවෙද්දී සතුට හා ආශිර්වාද ඔහු වෙත පළකෙරෙන ශබ්ද සභා ශාලාවෙන් නිකුත් විය. රැස්වීම් ශාලාව සම්පූර්ණයෙන්ම සාමාජිකයන්ගෙන් පිරී පැවතිණ. දුම්කොළින් පිරුණු දුම් වරාටු අතරින්, මැක්ගින්ටි ලොක්කාගේ කළු පැහැති, ගැට සැදුණු රැවුල දැකගත හැකි විය. බෝල්ඩ්වින්ගේ කෲර මුහුණ, ලේකම් හැරවේගේ ගිජුලිහිණියෙකුගේ වැනි මුහුණ ද ඔහුට දිස්විය. තමා ගෙන එන අලුත් ආරංචිය සභාවට දැනුම් දෙන වේලාවේ මේ සියලු දෙනා එහි සිටීම ගැන ඔහුගේ සිතේ ඇතිවූයේ හිම් නිම් නැති සතුටකි.

'මේ වෙලාවේ ඔබ දකින්න ලැබීම ලොකු සතුටක් මැක්මහෝන් සහෝදරයා' සභාපතිතුමා පැවසීය. 'අපට ප්‍රශ්නයක් මතුවෙලා තියෙනවා. ඒක විසඳගන්න ඔබ මොළකාරයෙක් ඕනවෙලා තියෙන වෙලාව.'

ස්ටයිල්ස් නගරයේ නාකි ස්ටිබ් කියන මිනිහව මරන්න

ඊයේ ලැන්ඩර් සහ ඊගන් දෙන්නාව යැව්වා. දෙන්නාම පිස්තෝල දෙකකින් වෙඩි තියල තියෙන්නෙ එකම වෙලාවේ. කාගෙ වෙඩිල්ලෙන්ද මිනිහා මැරුණෙ කියන්න කවුරුත් දන්නෙ නෑ. මේ මිනීමැරීමට හිමිවෙන තෑගි මුදල හිමි වෙන්නෙ කාටද කියන එක ගැනයි ප්‍රශ්නය මතුවෙලා තියෙන්නෙ. ලැන්ඩර් කියනවා ඒක අයිති එයාටලු. ඊගන් කියනවා තමන්ටලු"

මැක්මයෝර් නම් අසුනෙන් නැගිට අත ඉහළට එසෙව්වේය. ඔහුගේ මුහුණේ දක්නට තිබූ කැළඹිලි ස්වභාවයෙන් සෙස්සෝ කලබලයට පත්වූහ.

"නායකතුමනි ! මට අවස්ථාව ලබාදෙන්න. ඉතාම වැදගත් හදිසි කාරණයක් !"

"මැක්මයෝර් සහෝදරයාට හදිසි කාරණයක් දැනුම් දීමට ඇති බව කියනවා. අපේ ව්‍යවස්ථාව අනුව ඒකට ප්‍රමුඛත්වය දිය හැකියි. හොඳයි සහෝදරයා, අපි සූදානම්. දැන් ඔබට අවස්ථාව"

මැක්මයෝර් නැගිට සාක්කුවෙන් ලියමන එළියට ගත්තේය.

"ගරු නායකතුමනි. සහෝදරවරුනි.

මේ අශුභ ආරංචිය අද දවසේ මෙහි ගෙන ඒමට සිදුවී ඇත්තේ මටයි. එහෙත් ඒක කාටත් දැනුම්දීල, ඒක අපි සාකච්ඡා කරල, කල යුතු දෙය වහාම තීරණය කිරීම අනිවාර්‍ය දෙයක්. එහෙම නැතුව ඒ ගැන නිහඬව සිටියොත් අපි සියලු දෙනාටම විනාශය සිකුරුයි. මුළු ඇමරිකා එක්සත් ජනපදයේම සිටින ධනවත්, බලවත් සමාගම් රාශියක් එකතුවී, අප විනාශ කිරීමට ලොකු සැලැස්මක් ඇතිව වැඩකරන බව මට විශ්වාස කටයුතු මාර්ගයකින් දැනගන්න ලැබුණා. පිංකටන් අපරාධ පරීක්ෂණ සංවිධානයට අයත් බර්ඩි එඩ්වර්ඩ්ස් නම් රහස් පරීක්ෂකයා, මේ මොහොතේ අපේ ගම් පළාතේ සැරිසරමින්, අපට විරුද්ධව සාක්ෂි එකතුකරමින් සිටින බව ආරංචියි. එය සාර්ථක වුණොත් අපි සැහෙන ගණනක් දෙනාගේ බෙල්ලට තොණ්ඩුව වැටෙන බවට

සිසිම සැකයක් නෑ. මේ ශාලාව තුළ ඉන්න ඉතුරු සියලුම දෙනාට, ජීවිතාන්තය තෙක් හිරගෙදර ලගින්න වෙන බවටත් සැක නෑ. අන්න ඒකයි මට ඉදිරිපත් කිරීමට ඇති කාරණාව'

ශාලාව පුරා පැතිර ගියේ දැඩි නිශ්ශබ්දතාවයකි. මඳ වේලාවකට පසු මැක්ගිනට් ලොක්කා සභාව ඇමතීය.

'මැක්මඩෝර් සහෝදරයා. මේ කාරණාව ගැන ඔබට තියෙන සාක්ෂි මොනවාද?'

'මා අතට පත්වී ඇති මේ ලියුමයි ඊට සාක්ෂිය'

ඔහු ලියුමේ අදාල කොටස ශබ්ද නගා කියවීය.

'මට එය ලැබුණේ ඉතාම විශ්වාස කටයුතු මාර්ගයකින්. ඔහුනට මං පොරොන්දු වී ඇති නිසා, එය ලැබුණේ කොහෙන්ද යන්න හෙළිකිරීමට හෝ එය ඔබ අතට පත් කිරීමට නොහැකියි. මට දැනගන්න ලැබුණු කරුණු සියල්ලයි මං ඉදිරිපත් කළේ'

'සභාවෙන් අවසරයි' ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙක් නැගී සිටියේය.

'මං මේ බර්ඩි එඩ්වඩ්ස් ගැන අහල තියෙනවා. පිංකටන් සංවිධානයේ ඉන්න දක්ෂම පුද්ගලයා ඔහු බවයි මට දැනගන්න ලැබුණේ'

'ඔහුව දැක්කොත් අඳුනගන්න පුළුවන් කවුරුවත් ඉන්නවද මෙතන?' මැක්ගිනට් ඇසීය

'ඔව්, මට පුළුවන් අඳුනගන්න' ඒ පිළිතුර මැක්මඩෝර් ගෙන්ය. විස්මයට පත් අය නැගූ හඬින් මුළු ශාලාවම පිරී ගියේය.

'මට විශ්වාසයි අපිට ඔහු අතටම අල්ලා ගන්න පුළුවන්. අපි ඉක්මනටම ඒ වගේම බුද්ධිමත්ව ක්‍රියාකාරී වුණොත් මේක බොහොම පහසුවෙන් ඉවරයක් කරන්න පුළුවන්. ඔබ සියලු දෙනාගේම විශ්වාසයත් සහයෝගයත් මට ලැබෙනවා නම්, අපට බයවෙන්න දෙයක් නෑ'

'අපි මොනවටද බය වෙන්නෙ? අපේ වැඩකටයුතු ගැන එයා මොනව දැනගන්නද?'

'මන්ත්‍රීතුමා, සහෝදරයෝ හැමෝම ඔබතුමා වගේ ව්‍යාපාරයට ඇප කැප වෙච්ච, අවංක, විශ්වාසවන්ත අය නම් අපට භය වෙන්න දෙයක් නෑ තමයි. නමුත් මේ බර්ඩි එඩ්වර්ඩ්ස් කියන මිනිහා ගමගේ ඒවල තියෙන්නේ කෝටිපති ව්‍යාපාරිකයෝ. උන් ලැස්තියි අපව විනාශ කිරීමට ඕනම ගණනක් වියදම් කරන්න. ඔබ හිතන්නෙ අප අතරේ නැද්ද හිත බොහොම දුර්වල සාමාජිකයෝ? සල්ලි කීයක් හරි දීල ඔවුන්ගෙන් අපේ රහස් මිලකට ගනීවි. සමහර විට දැනටමත් රහස් අරගෙන ඉවර ඇති. අපි දන්නෙ නෑ ඒක කොහොමද කියන්න. මේකට තියෙන්නෙ එකම පිළියමයි'

'බර්ඩි එඩ්වර්ඩ්ස්ට කවදාවත් වර්මිසා නිම්නයෙන් පිටවෙලා යන්න දෙන්න හොඳ නෑ' ඒ කීවේ බෝල්ඩ්වින්ය.

මැක්මර්ඩෝ හිස සලා එය අනුමත කළේය.

'අන්න හරි බෝල්ඩ්වින් සහෝදරයා. අපි දෙන්න අතර වෙන වෙන පුද්ගලික ප්‍රශ්න තියෙන්න පුළුවන්. නමුත් මෙහිදී ඔබ කිව්වදේට මං එකඟ වෙනවා, ඔබ කිව්ව දේ තමයි එකම පිළියම'

'නමුත් කොහේද මිනිහා ඉන්නෙ? අප කොහොමද මිනිහව හොයාගන්නෙ.'

'ගරු නායකතුමනි,' මැක්මර්ඩෝ යළි කථා කළේය. 'මෙන්න මේ කාරණාව සභාවෙ ඉන්න හැමෝම ඉස්සරහ කථා කරන්න සුදුසු එකක් නොවෙයි නේද? මේ සභාවේ ඉන්න මොනම සහෝදරයෙක් ගැන හරි සැක ඉපදවීම ගැන දෙයියෝ මට සමාකරන්න ඕන. ඒ වුණත් මේ මිනිහ පස්සේ අපි එළවන බව ඔහුගෙ කනට වැටුණොත් ඔහු අල්ලා ගන්න වැඩේ එතනින් අවසන් වේවි. මං සභාවෙන් ඉල්ලා සිටිනවා මේ කාරිය සඳහා විශ්වාසදායක කමිටුවක් පත්කර ගන්න කියලා.

මං යෝජනා කරන්න කැමතියි, අපේ ගරු සභාපති තුමාගේ සහ බෝල්ඩ්වින් සහෝදරයගේ නම්. ඊළඟට තවත් පස් දෙනෙකු

පත්කර ගනිමු. එතකොට මට පුළුවනි මං දන්න සියලුම දේ ඔය හැටුව දැනුම් දෙන්න. ඒ වගේම අපි කළ යුත්තේ කුමක්ද කියන එකත් පැහැදිලි කරන්න.'

එම යෝජනාව ඒකච්ඡන්දයෙන්ම සම්මත විය. කමිටුවක්ද පත්කරගන්නා ලදී. මැක්ගිනටි ලොක්කා, බෝල්ඩ්වින් සහෝදරයා, ලේකම් හැරවේ, කොටි කෝමැක්, තරුණ සානක කාටර්, භාණ්ඩාගාරිකයා සහ විලබි සොහොයුරන් දෙදෙනා එට ඇතුළත් විය.

රැස්වීමෙන් පසු පැවැත්වෙන සාදය, එද ඉතා හොඳ එකක් විය. එහි ප්‍රීතිමත් ස්වභාවයද සම්පූර්ණයෙන්ම අතුරුදහන්ව ගොස් තිබිණි. සැමගේ හිස් වලට ඉහළින් අඳුරු වලාකුළු පාවීමට පටන් ගෙන ඇති අයුරක් දිස්විය. අන් අයගේ ජීවිත වලට හිංසනය ගෙන එමින් සහෝදරවරු නිදහසේ ජීවත්වූහ. හිංසනය දැන් ඔවුන්ගේ මුහුණු වලටද එබී බැලීමට පටන්ගෙන ඇත. සාදය ඉක්මනින් අවසන් කළ සහෝදරවරු, කමිටු රැස්වීමට ඉඩ සලසා ඉක්මනින් ඉවත්ව ගියහ.

'හොඳයි මැක්මඩෝ, දැන් ඔබේ වාරය' මැක්ගිනටි පවසද්දී අනෙක් සාමාජිකයෝ අසුන්වලට වී ගල් ගැසුණාක් මෙන් බලා සිටියහ.

'මං ඔබට මොහොතකට පෙර කිව්වා, බර්ඩි එඩ්වඩ්ස් ගැන මං දන්නා බව. ඔහු මේ පළාතේ රැඳී ඉන්නේ නියම නාමෙන් නොමෙයි, බොරු නමකින් බව ඔබට අමුතුවෙන් කියන්න තරං දෙයක් නොවෙයි. ඔහු බොහොම නිර්භීත කෙනෙක්. ඒ වගේම මෝඩයෙක් නොවෙයි. ඔහු ඉන්නේ හොබ්සන්ස් පැච් එකේ. එහෙදි ඔහුගේ නම ස්ටීව් විල්සන්'

'මට ඔහු සමග කථාකරන්න අවස්ථාවක් ලැබුණා. ඒ වෙලාවෙ මෙවැනි සැකයක් මගේ ඔළුවට ආවෙ නැ. මෙහෙම ලියුමක් මට ලැබුණෙ නැත්තං නිකම්වත් සැක හිතන්නෙ නැ. මට හොඳටම විශ්වාසයි ඔහු තමා මිනිහා.

ගිය මැදද මං කෝච්චියෙන් ගමන් කළා. මං ගිය කෝච්චි පෙට්ටියෙ ඉඳපු මිනු මා එක්ක කථාවට වැටුණා. මිනිහ කිව්වෙ එයා පත්තර කාරයෙක් කියල. ඒ වෙලාවෙ මං ඒක විශ්වාස කළා. මේ මිනිහා මාත් එක්ක කිව්වා, එයාට ජ්‍යොතිර් සංගමය ගැනත් ඔවුන් කරන දරුණු අපරාධ ගැනත් විස්තර දැනගන්න ඕනෙ කියල. මිනිහා දිගින් දිගටම මගෙන් ප්‍රශ්න කළා. එයා බලාපොරොත්තු වුණේ මොනව හරි මගේ කටින් අල්ලගන්න. කිව්වොත් වල එයාගෙ පත්තරේ කර්තෘ සතුටු කරන්න පුළුවන් විදිය විස්තර කිව්වොත් මිනු හොඳට මුදල් ගෙවනවා කිව්වා. මං කියපු විස්තර වලට මිනු ඩොලර් විස්සක නෝට්ටුවක් මගේ අතේ තියල කියනවා:

'මට ඕන කරන තොරතුරු ටික හොයල දුන්නොත් ඔය වගේ දහගුණයක් සල්ලි දෙන්න පුළුවන්'

'ඉතින් මැක්මෙඩ් සහෝදරය මොනවද ඔහුට හෙළිකළේ?' මැක්ගිනට් ඇසීය.

'ඒ වෙලාවට මගේ කටට ආපු පට්ටපල් බොරු ගොඩක් මං මිනුට කිව්වා.'

'ඒ මිනිහා පත්තර වාර්තාකාරයෙක් නොවෙයි කියල තමුසෙ කොහොමද දැනගත්තෙ?'

'මහොම ඉන්න, මං කියන්නම්. මිනිහ කොච්චරත් හැටි දුම්රිය පොළෙන් බැස්සා. මාත් එතනිං බැස්සා. ටික වෙලාවකට පස්සේ මම නිකමට විදුලි පණිවුඩ කාර්යාලය දිහාවට ගියා. එතකොට මෙන්න අර මිනිහ ඒක ඇතුලේ ඉඳල එළියට එනවා. මිනිහ ගියාට පස්සෙ මං කාර්යාලය ඇතුළට ගියා. එතන වැඩ කරන මනුස්සය මා එක්ක කථාව පටන් ගත්තා.

'මහත්තයො, දැන් අර ගියා නේද මිනිහෙක්? එයා යවන විදුලි පණිවුඩ වලට හරි තං අපි සාමාන්‍ය ගණන වගේ දෙගුණයක් ගාස්තු අයකරන්න ඕන. ඒ මොකද මිනිහ ලියන්නෙ පුදුම භාෂාවකින්. ඒක චීන භාෂාවද මොන යකාගේ භාෂාවක්ද

මං දන්නෙ නෑ. හැමදාම කොළයක් පිරෙන්න, කාටවත් නොතේරෙන විදියට පණිවුඩ යවනවා. ඒ එයාගෙ පත්තරේට විශේෂ වාර්තාලු. එයාට බයලු වෙනත් පත්තරේක වාර්තාකාරයෙක් එයාගෙ ආරංචි ටික හොරෙන් ගනීවි කියලා.'

විදුලි පණිවුඩ යවන මිනිහා හිතාගෙන හිටියෙ එහෙමයි. ඒ වෙලාවෙ මටත් හිතුණේ එහෙම තමයි. නමුත් දැන් නම් මගේ අදහස වෙනස්'

'දෙයියනේ ! මං හිතන්නේ නමුසෙ හරි. ඉතින් දැන් මොකක්ද අපි මේකට කරන්නේ?'

'කරන්න තියෙන්නෙ මේ දැන් එතැනට ගිහිං වැඩේ ඉවරයක් කරන එක' එකෙක් යෝජනා කළේය.

'මේ මොහොතෙම ඒ විදියට වැඩේ කෙළවරක් කරන්න මං කැමතියි, ඒ යකා ඉන්න තැන දන්නවා නම්' මැක්මහෝන් කීය.

'මිනිහ හොබ්සන්ස් පැව් වල ඉන්න බව ඇත්ත. ඒත් මොන ගෙදර ඉන්නවද අපි දන්නෙ නෑ. ඔහේල මේකට කැමති නං මගේ පොඩි සැලැස්මක් තියෙනවා'

'ඒ මොකක්ද?'

'මං හෙට උදේ හොබ්සන්ස් පැව් වලට යනවා. විදුලි පණිවුඩ කන්තෝරුවෙන් මිනිහගේ ලිපිනය හොයාගන්න පුළුවන් වේවි. ඊට පස්සෙ මං මිනිහට කියනවා මමත් ස්කෝරර් සංගමේ සාමාජිකයෙක් බව.

මං එයාට කියනවා අපේ සංගමේ රහස් ඔක්කොම මං නමුසෙට කියන්නම්; හැබැයි සැහෙන මුදලකට. මම ඔට්ටුවක් මිනිහා ඒ ඇම ගිලිනවා. මං මිනිහට කියනවා ඔක්කොම කඩදාසි තියෙන්නෙ මං ඉන්න ගෙදරයි. මිනිස්සු එහෙ මෙහෙ ගැවසෙන වෙලාවෙ නමුසෙ එහේ ආවොත් මගේ ජීවිතෙත් විශ්වාස නෑ. ඒ නිසා රෑ දහයට අපේ ගෙදරට එන්න. රහස් අඩංගු ලියකියවිලි ඔක්කොම මම පෙන්වන්නම්. කිසිම සැකයක් නෑ මිනිහ ඒවි'

"ඊට පස්සේ ?"

"ඊට පස්සේ කරන්න ඕන දේ මගේලට කැමති ආකාරයකට සූදානම් කරගන්න. අපි ඉන්න ගේ තියෙන්නෙ හරිම පාළු තැනක. මැක්නමාරා හොන්න හොඳ විශ්වාසවන්තයි. ඒ වගේම ගලක් වගේ නිවියි. ගෙදර ඉන්නෙ ස්කැන්ලනුයි මායි. විසර ගේ. මගේලට තියෙන්නෙ රෑ නවය වෙද්දි එහේට එන එකයි. අපි හරිවි එච්චචිස්ට ගේ ඇතුලට එන්න අවිනූ. මිනිහට පණ පිටින් ආපසු යන්න ලැබුණොත්... එයාට ජීවිත කාලෙටම අනිත් අය එක්ක කතා කරන්න දේවල් තියේවි, එයාගෙ වාසනාව ගැන"

"ම්. හිතන්නෙ සිංහටින් සංවිධානයේ ඇමැරිකුවක් ඇතිවේවි. අපි වැඩ ටික ඒ විදියට කරමු මැක්මෙර්. එහෙනං හෙට රෑ නවයට අපි එනවා මගේගේ ගෙදරට. මිනිහ ගෙට ඇතුළු වුණාට පස්සෙ දොර වහනවා. ඉතුරු ටික අපි බලා ගන්නම්"

## 7

## බර්ඩි එඩ්වඩ්ස් උගුලක

ඔහු ජීවත්වූ නිවස, මැක්මර්ඩෝ සඳහන් කළ පරිදිම තාර් බිම්හා හුදකලාව පිහිටි නිවසක් විය. එහෙයින් ඔවුන් සැලසුම් කළ ආකාරයේ අපරාධයකට එය ඉතා සුදුසු තැනකි. මෙයට කලින් අපරාධකරුවන්ගේ සිරිත වී තිබුණේ ඔවුනට අවශ්‍ය පුද්ගලයා නිවසෙන් එළියට කැඳවා ගිනි අවිය ක්‍රියාත්මක කිරීමයි. නමුත් මෙය, ඊට වඩා වෙනස් විදියේ ගනුදෙනුවකි. ඔහු දන්නේ මොනවාද, ඒ තොරතුරු ලබාගත්තේ කෙසේද, සංවිධානයට කොපමණ රහස් පසයා ඇතිද යන්න සැකහැර දැන ගැනීම ඉතාම වැදගත්ය.

'සමහර වෙලාවට අපි දැනටමත් ප්‍රමාද වැඩිද දන්නේ නෑ?' එදා මැක්මර්ඩෝගෙන් සමුගෙන නිවසින් පිටත්ව යාමට පෙර කාටර් ඇසීය.

'එහෙම නම් අපට කරන්න ඉතුරු වෙන්නේ තොරතුරු ලබා දීපු එකාගෙන් පළිගන්න එක විතරයි'

බෝල්ඩ්වින් කීය.

'මං හිතන්නෙ නෑ බර්ඩි එඩ්වඩ්ස්ට, ඒ හැටි වැදගත් තොරතුරු මොනවත් දැනගන්න ලැබිල ඇති කියල. ඒ මොකද මං ඒ වෙලාවෙ ගොතල කියාපු සුළු සුළු බොරු පවා මිනිහ සටහන් කරගත්තේ හරිම උනන්දුවෙන්'

මැක්මර්ඩෝ පිළිතුරු දුන්නේය.

'අපි එයාගෙන්ම අහගමු මොනවද එයා දන්නෙ, මොනවද නොදන්නෙ කියල' මැක්ගින්ටි පැවසීය.

සැලසුම් කරගත් පරිදි මැක්මර්ඩෝ හොබ්සන්ස් පැච් වෙත පිටත්ව ගියේය. එදා උදෑසන පොලිසියේ විශේෂ අවධානයද ඔහු වෙත යොමු විය. ඔහු දුම්රිය පොළේ සිටිනු දුටු කපිතාන් මාර්වින්

මැක්මයෝර් ගෙන් කිසිවක් විමසීය. මාටින් සමග කථා කිරීම පවා පිළිකුල් කළ මැක්මයෝර් අහක බලා ගත්තේය. සිය රාජකාරිය නිමවා ආපසු ආ මැක්මයෝට සංගම් කාර්යාලයේදී මැක්ගින්ටි හමුවිය.

'මිනිහ එනවා'

'බොහොම හොඳයි' මැක්ගින්ටි ලොක්කා සතුට පළකළේය. ඒ වෙලාවේ කබාය ඉවත් කොට සිටි ඔහු හැඳ සිටියේ සැහැල්ලු කමිසයකි. ඔහුගේ කරවටා තිබූ ගනකම් රන්මාලද, එක් මාලයක එල්ලා තිබූ විශාල දියමන්තිය ද බැබලෙමින් තිබිණි. මත්පැන් විකිණීම හා දේශපාලනය නිසා මැක්ගින්ටි ලොක්කා විශාල ධනවතෙක් මෙන් ම බලවතෙක් බවට පත්ව ඇත. කලින්ද රාත්‍රියේ ලැබුණු ආරංචියෙන් ඔහුට එක්වරම සිහිවුණේ සිරගෙදර සහ එල්ලුම් ගසයි. එහෙයින් ඔහු මහත් සේ කැළඹීමට පත්ව සිටියේය.

'ඔහේට හිතෙන්නෙ මිනිහ ගැන කාරණා දැනගෙන කියලද?'

'මිනිහ මෙහේට ඇවිත් සෑහෙන කාලයක්-අඩුම ගණනෙ මාස එකහමාරක් විතර ගතවෙලා බවයි පෙනෙන්නෙ. දුම්රිය සමාගම් වලින් හොඳට මුදල් ලැබෙන්න ඇති. එහෙම ලැබුණා නම් ඒ සල්ලි වලින් අපේ විස්තර සෑහෙන දුරට හොයාගන්න ඇති. ඒව යවලත් ඇති.'

'අපේ සංගමේ කොන්ද පණ නැති අයෙක් නැ. ඔක්කොම, වානේ වගේ ශක්තිමත් පිටකොන්දක් තියෙන, විශ්වාස කටයුතු අය. නැමැයි එකෙක් ඇර. දෙයියම්පා ! අර මොරිස් කියන කාලකණ්ණියා තමයි අපට ඉන්න එකම එක නැදයා. අපි ගැන මිත්තු දුන්න නං ඌ ඇරෙන්න වෙන කවුද? මට හිතෙනවා අද රෑට කොල්ලො විතක් යවන්න. හිකි, මොරිස්ට දෙකක් ඇනලා අහල බලන්න මේ මිනිහා ගැන මොනවද ඌ දන්නේ කියල'

'මට, ඒකෙ වැරැද්දක් නෑ.' මැක්මයෝර් පිළිතුරු දුන්නේය.

'ඇත්තම කියනවා නම් මන්ත්‍රීතුමා, මොරිස් ගැන මගේ හිතේ පොඩි පැහැදීමක් ඇතිවුණා. මිනිහට හිරිහැරයක් වෙන එක දකින්නත් මට කණගාටුයි, අපේ පංගමේ කාරණා ගැන පැරයක් දෙකක් මාත් එක්ක මිනිහ කථා කළා. එයා මේ දේවල් දකින්නෙ අපි දකින ආකාරයට නෙමෙයි. කොහොම වුණත් ඔබතුමා මොරිස්ට විරුද්ධව මොනවා හරි කරන්න හදනවා නම් මං ඒකට බාධා කරන්නෙ නෑ.'

'ඔය නාකි යක්ෂයට මං හොඳ වැඩක් දෙනවා. පහුගිය අවුරුද්දෙම මං ඕක ගැන කෝඩිසියෙන් හිටියේ.'

'ඔව්, ඔව්. කරන්න ඕන හොඳම දේ මොකක්ද කියල ඔබතුමා දන්නවා නේ. හැබැයි මොනවා කරන්නත් මේ පිංකටත් වැඩේ ඉවරයක් වෙනකම් ඉන්න. මේ වෙලාවෙ පොලීසිය කලබල කරගන්න නරකයි. විශේෂයෙන්ම අද.'

'තමුසෙගේ කතාව සම්පූර්ණ ඇත්ත. මැක්මයර්. අපි බර්ඩි එඩ්වඩ්ස් නෙත්ම අහු ආරංචි කොයනද්ද හොයාගන්නෙ කියල. උගේ හෘදය වස්තුව සාපල ඒලියට ගන්න වුණත් ඒක අහගෙන හිටිමු ඉස්සර වෙලා. උගුලක් ගැන මිනිහට සැකයක් නෙම හිතුණද දන්නෙ නෑ.'

මැක්මයර් සිනාසුණේය.

මිනිහගේ උදව්වල සහයෙන් මං ප්‍රයෝජන ගන්නා. ප්‍රකෝරයන් ගැන හොඳ හොඳ විස්තර කියනවා නම් මිනිහ අපායට වුණත් යන්න සූදානම්. මේ බලන්න.'

මැක්මයර් ඩොලර් නෝට්ටු මිටියක් පෙන්වූයේ සිනාසෙමිනි.

'මං මිනිහගෙන් ඉස්සර වෙලා සල්ලි ගත්තා. මගේ කැඩදයි විත පෙන්නුවාම තව සල්ලි ගොඩක් ලැබෙනවා.'

'මොන කැඩදයිද?'

'මොන කැඩදයියක්වත් නෑ. ඒ වුණාට මං උගේ මලුවට

දැම්මා අමූලික බොරු ගොඩක්. මං කිව්වා අපේ තියෙනවා ව්‍යවස්ථාවක්, පරිපාලන රෙගුලාසි පොතක්, සාමාජිකත්වය ලබාගත හැකි ආකාරය, ඊකට අයදුම් පත්. මිනිහ බලාපොරොත්තු වෙන්නෙ ගෙයින් පිටවෙන්න කලින් ඒ ඔක්කොම විස්තර ලබාගන්න'

'සැකයක් නෑ මිනිහ ඒවි. ඇහුවෙ නැද්ද තමුසේ කඩදසි අරගෙන ආවෙ නැත්තෙ ඇයි කියලා'

'මං කිව්වා කඩදසි අරගෙන සොහොමවත් එහෙ මෙහෙ යන්න බෑ කියල. දැනටමත් පොලිසියෙන් මා ගැන සැක කරනව. අදත් දුම්රිය පොළේදී කාකිකන් ඇවිත් මාත් එක්ක කතාවක් දාන්න ලැස්ති වුණා.' මැක්මිලර් කීය.

'ආ.......... මට ඕක ආරංචියි. අපේ වැඩවල මරපතලම කොටස පැවරිලා තියෙන්නෙ තමුසෙට නේද? මේ වැඩේ ඉවර කළාට පස්සේ අපි මාධිත්ටවත් මොකාව හරි කරන්න ඕන. මිනිහව පරණ ගල් අඟුරු පතලක, දෝනාවක් දිගේ වත් යවන්න බලමු. තමුසෙ අද හොඹියන්ස් පැවි එකට ගිය එකත් ප්‍රශ්නයක් වේවි'

'අපි වැඩේ හරියට කළොත්, පොලිසියට මොකුත්ම ඔප්පු කරගන්න ලැබෙන්නෙ නෑ. ඇඳිරි වැටුණට පස්සේ මිනිහ මගේ ගෙදරට එන එක කාටවත් දකින්න ලැබෙන්නෙ නෑ. ඕන සිට්ටුවක්. මිනිහ ආපහු යන එක දකින්න ලැබෙන්නෙත් නෑ.

මන්ත්‍රීතුමා, මං ඔබතුමාට කියන්නම් මගේ සැලැස්ම. අනිත් අය ඒකට ගැළපෙන විදියට සූදානම් කර ගැනීම ඔබතුමාට භාරයි. ඔබ සියලු දෙනාම හොඳට කල්වේලා ඇතුව අපේ ගෙදරට ඇවිත් ඉන්න ඕන. ඒක හරි නේ. මිනිහ එන්නේ හරියට රෑ දහයට. ඇවිල්ලා තුන් පාරක් දොරට තට්ටු කරනවා. එතකොට මං ගිහින් දොර අරිනවා. මිනිහා ඇතුළුවුණු ඉක්මනින්ම දොර වහනවා. ඔන්න එතකොට මිනිහ අපි ළඟ'

'ඒ විදිය හොඳයි, පහසුයි'

"ඔව්. නමුත් ඊළඟට ගන්න ඕන පියවර ගැන අපි ප්‍රවේසම් වෙන්න ඕන. ඒ යකා ඔන අමාරුකාරයෙක්. කොයි වෙලෙත් ආයුධ ළඟ තියාගෙන ඉන්නේ. මං මිනිහට කිව්ව මෙහේ එනකොට පොඩ්ඩක්වත් සැක වෙන්න එපා, ආයුධ ඕන නැහැ කියලා. නමුත් එයා වැඩි ප්‍රවේසමට ආයුධ ගේන්නත් ඉඩ තියෙනවා. මං එයාට කිව්වෙ මං දන්නා කනියම කියල නේ. ඉතිං එයා ඇතුළට ගන්න ගමන් ගේ ඇතුලේ තව මිනිස්සු හත්දෙනෙක් ඉන්නව දැක්කම වෙඩි කීපයක් හුවමාරු වෙනවා සිකුරුයි. කාට හරි තුවාල වෙන්නත් පුළුවනි"

"ඒකත් හරි තමා"

"ඊළඟට ඒ සද්දෙට ටවුමේ ඉන්න පොලිස් කාරයෝ එකෙක් නෑර මේ පැත්තට දුවගෙන එයි"

"කසුපෙසයේ කතාව හරි"

"මං වැඩේ කරන්න බලාපොරොත්තු වෙන්නෙ, මෙන්න මේ විදියට. ඔබතුමාට මතක නේද එදා අපි දෙන්න කතා කර කර ඉඳපු ලොකු කාමරය? මය කාණ්ඩේ ඔක්කොම ඒ කාමරේට වෙලා හැංගිලා ඉන්නවා. මිනිහා ගෙදර දොරට තට්ටු කළාම, මං දොර ඇරලා , මිනිහ ගේ ඇතුළට අරගෙන, සාලෙන් වාඩි කරවා ගන්නවා. මිනිහට කියනවා කඩදසි ටික අරගෙන එනකං සාලෙන් ඉන්න කියලා. එනකොට මට ඉඩක් ලැබෙනවා, වැඩේ කෙරෙන හැටි ගැන ඇවිත් ඔබට දැනුම් දෙන්න.

ඊළඟට මම බොරු කඩදසි ටිකක් අරගෙන ආපහු ගිහිං, ඒක මිනිහට කියවන්න දෙනවා. මිනිහ ඒක කියවන අතරේ මං කඩා පැනලා, අත්වලින් හිර කරලා අල්ල ගන්නවා, ආයුධ පාවිච්චි කරන්න බැරි විදියට. මං අල්ලගත්ත කොට හැමෝම ඉක්මනට දුවගෙන එන්න ඕන. මිනිහ මං වගේ සවි ශක්තිය තියෙන කෙනෙක්. වැඩි වෙලා මර්දනය කරල තියාගන්න මට අමාරු වෙයි. ඒ නිසා ඉක්මනට ආපු තරමට හොඳයි. ඊස් ඔබතුමායි සහෝදරයා ටිකයි එනතුරු තියාගන්න මට බැරි වෙන්නෙ නෑ"

"මේක බොහොම හොඳ සැලැස්මක්. අපේ මුළු සංගමයම ඔහෙට ණයගැතියි මැක්මර්ඩෝ. මං නායක තනතුරෙන් අයින් වෙද්දී, මට පස්සෙ තනතුර භාරගන්න පුද්ගලයෙක් ගැන මට නම් යෝජනා කරන්න පුළුවන් බව විශ්වාසයි"

"මං තවම අලුත් කෙනෙක් නේ මන්ත්‍රීතුමා" යයි පැවසුවත් නායකතුමාගේ පැසසුම ගැන මැක්මර්ඩෝ මහත් සතුටට පත්ව සිටියේය.

ආපසු ගෙදර පැමිණි ඔහු, ඉදිරියේ ඇති බැරෑරුම් කාර්ය සඳහා සූදානම් විය. පළමුව ඔහුගේ "ස්මිත් සහ වෙසන්" වර්ගයේ රිවෝල්වරය පිරිසිදු කොට, තෙල් දමා, උණ්ඩ පිරෙව්වේය. මීළඟට රහස් පරීක්ෂකයා උගුලට හසුකර ගැනීම සඳහා යොදා ගන්නා නම් නිවස පරීක්ෂා කර බැලුවේය. සහෝදරවරුන්ට සැඟවී සිටීමට ඇති සාමර්ථ්‍යය සෑහෙන තරම් විශාල එකකි. මැද දිගු මේසයක්ද, එක් කෙළවරක උදුනක්ද පිහිටි එහි ජනේල නොතිබිණි. ආලෝකය හා වාතාශ්‍රය ලැබීම සඳහා වටේටම පිහිටි කුඩා කවුළු රාශියකි. ඒවා ද බිත්තියට සැදවුනා සේ සවිකළ තිර රෙදි වලින් ආවරණය වී තිබිණ.

අනතුරුව ඔහු තමා සමග එකට ලැගුම් ගත් මයිස් ස්කැන්ලන් සමග සාකච්ඡා කළේය. ස්කෝරර් සංගමයේ සහෝදරයකු වුවත් ස්කැන්ලන් අසරණකුට හිරිහැරයක් නොකොට ජීවත් වූ පුද්ගලයෙක් විය. සහෝදර සාමාජිකයන් සමග සහභාගිවීමට සිදුවූ භයානක ලේ වැගිරීම් වලින් අපමණ බියකට පත්වුවත් එය රහසක් ලෙස තබා ගත්තේය.

"ස්කැන්ලන් සහෝදරයා අද රෑට මෙතෙන් මඟ-ඇරල, කොහේට හරි වෙලා ඉන්න තියෙනවා නම් ඔහෙට ඇඟට ගුණයි. හෙට පාන්දර වෙන්න කලින් මෙතන මහා ලේ වැගිරීමක් තියේවි"

"ඇත්තම කියනවා නං මැක් මට වෙලා තියෙන්නේ මේ වැඩ බලාගෙන ඉන්න බැරිකමයි. එද අර කර්මාන්ත ශාලාවේ කළමනාකාරයා, ඩන් මරාදෙන හැටි මට බලාගෙන ඉන්න සිද්දවුණා. තමුසෙලාට බෝල්ඩ්වින්ලට වගේ මිනී බලාගෙන ඉන්න

මගේ හිතේ හයියක් නෑ. සංගමයේ සහෝදරයො වැරදි විදියට හිතාවිද? එහෙම නැත්නං මගේලාට කැමති විදියට ඕන එකක් කරගන්න. ඇරල ටිකක් මග ඇරල ඉන්න මාත් කැමතියි."

"තමුසෙට හොඳ වැඩේ ඒකයි"

නියම කරගත් පරිදි කමිටුවේ පිරිස නියමිත වේලාවට කලින් පැමිණියේය. හොඳින් හැඳ පැළඳ ගෙන සිටි ඔවුන් දිස්වූයේ වැදගත් පුහු පිරිසක් ලෙසයි. එහෙත් යමෙකු ඔවුන්ගේ මුහුණු දෙස විමසිලිමත්ව පරීක්ෂා කොට බැලුවේ නම් ඔවුන්ගේ නියම ස්වභාවය පැහැදිලි වනු නියතය. එතැන සිටි සෑම පුද්ගලයෙකුම දහදොළොස් [illegible]යක් වත් මිනීමැරුම් වලට සහභාගී වී දෑත්වල ලේ තවරාගත් අයයි. ඔවුනට මිනීමැරීම, මස් කඩකාරයෙකුට බැටළුවකු මැරීම තරම් පහසු කාර්යයක් විය. හර්ඩි එව්වනිස්ට කුමන ගැලවීමක්ද?

කළ අපරාධ සංඛ්‍යාවෙනුත්, දරුණු පෙනුමෙනුත් ඉදිරියෙන්ම සිටියේ මැක්ගින්ටි ලොක්කාය. ඊළඟට ටෙඩ් බෝල්ඩ්වින්ය. ඊට පසු ලේකම්වරයා වූ හැරවේය. භාණ්ඩාගාරික කාටර් මැදිවියේ පුද්ගලයෙකි. සියලුම අපරාධ සැලැසුම් කෙරුණේ ඔහුගේ මොළයෙනි. විලබි සොහොයුරෝ අනුකම්පා විරහිත මිනීමරුවෝ වූහ. කොටි කෝමැක් කොයි තරම් දරුණු පුද්ගලයෙකු වී ද යත් ඔහුට සංගමයේ සාමාජිකයෝ පවා බියවූහ. පිංකටන් රහස් පරීක්ෂකයා ඝාතනය කිරීමේ අරමුණෙන් මැක්මඩෝගේ නවාතැනේ එක් රැස්වූයේ මේ පිරිසයි.

මැක්මඩෝ ආගන්තුක සත්කාර අමතක නොකෙළේය. ඔවුනට වෙන්වූ කාමරයේ මේසය මත, විස්කි බෝතල් ගණනාවක් තබා තිබිණ. ඉදිරියේ ඇති රාජකාරී සාර්ථකව ඉටුකිරීමේ අරමුණෙන් ඔවුහු වහ වහා මත්පැනින් සප්පායම් වූහ. වැඩිවේලා යාමට පෙර ටෙඩ් බෝල්ඩ්වින් හා කොටි කෝමැක් දෙදෙනා සෑහෙන තරම් වෙරිවූහ. ඔවුනගේ කෲර අමානුෂික ස්වභාවය වඩාත් ඉස්මතු වූයේ වෙරිවූ පසුයි.

රාත්‍රිය ශීතල වූ බැවින් ගිනි උදුන දල්වා තිබිණි. එක්

මොහොතකට එහි අත තබා, කෝමස් උදුනේ උණුසුම පරීක්ෂාකොට බැලුවේය.

'හොඳට රත්වෙයි'

'ඔව්. බර්ට් එඩ්වඩ්ස් ඕක ගැටගැහුව නං මත්තෙකම ඕක අහගන්න පුළුවන්'

ඒ කීවේ බෝල්ඩ්වින්ය.

'බයවෙන්න එපා. අපි කොහොම හරි මිනිහගෙන් ඇත්ත දැනගන්නවා' මැක්මහෝන් පැවසීය. මෙම පැහැරුම් රාජකාරියේ බර සම්පූර්ණයෙන්ම පැටවී තිබුණේ ඔහුගෙ කරපිට වුවත් ඔහු සිටියේ සන්සුන් විලාසයෙනි. කිසිවකින් නොසැලෙන මැක්මහෝන්ගේ මෙම ස්වභාවය දුටු මිතුරෝ ඔහු ගැන පැහැදුණහ.

'මේ යකාව අල්ලගන්න සුදුසුම මිනිහ කමිසෙ තමයි. කමිසෙ උගේ බෙල්ලෙං තිරකරලා අල්ල ගන්න තුරු, උඩට යන්තමින්වත් සැකයක් තියෙනා එකක් නෑ' මැක්ගින්ටි ලොක්කා කීය.

'කමිසෙගේ ගෙදර තුළං කවුළු වලට ජනෙල් පියන් නැති එක ලොකු පාඩුවක්'

මැක්මහෝන් වහා ගොස් කවුළු හොඳින් ආවරණය වන සේ තිර රෙදි සැකසුවේය.

'දැන් අපේ හොර අල්ලන්න කාටවත් බෑ. ඔන්න දැන් වෙලාවත් හරියාගෙනයි එන්නෙ'

'මිනිහ නැවත් ඉඳීවිද දන්නෙ නෑ. අනතුරක් ඉව වැටුණාවත්ද?' හැරවේ ඇසීය.

'බයවෙන්න එපා. මිනිහා එනවා. ඔහේල මිනිහ එනකං බලා ඉන්නෙ මොහොතයි නොඉවසිල්ලෙන්. ඒ වගේම මිනිහත් මෙතෙන් එන්න බලාගෙන ඉන්නෙ හරි නොඉවසිල්ලෙන්. මිත මචවුවක්'

සියලු දෙනාම කාමරයේ නියමිත තැන්වල අසුන්ගෙන සිටියේ මැටියෙන් ඇඹූ ප්‍රතිමා විලසිනි. තුන් වරක් දොරට තට්ටු කරන හඬක් ඇසිණි. බාගෙට හිස් වූ විස්කි වීදුරු, කටට යන අතර මග නැවතිණි.

'ඒ' මැක්මිලන් අත මසවා නිශ්ශබ්ද වන ලෙස සංඥා කළේය.

සහෝදරයින් තවුරුන් ඊකිහෙතාගේ මුහුණු බැලූ අතර කාගෙත් අත් යොමු වූයේ සඟවා තබාගත් ආයුධ වෙතයි.

'කිසිම ශබ්දයක් දාන්න එපා' කෙඳුරූ මැක්මිලන් දොර හොඳින් වසා කාමරයෙන් එළියට ගියේය.

හොඳින් සවන් යොමා ගත් මිනිමරුවෝ දැන් සූදානම්ය. ඔවුන්ගේ සතයා පැසේජය දිගේ ඇවිද යන හඬ ඔවුනට පැහැදිලිව ඇසිණ. ඔහු ඉදිරිපස දොර විවෘත කරන හඬත්, ආචාර කරන හඬත් ඔවුහු අසා සිටියහ. මීළඟට ඇසුණේ නිවසට ඇතුළු වූ කොනෙකුගේ අඩි ශබ්දයයි. ඔහුගේ නුහුරු කටහඬ හා දොර වසා යතුරු දැමූ ශබ්දය අනතුරුව ඇසෙන්නට ලැබිණ.

'හරි. අපේ උගුල, ගොදුර කොටු වුණා' කොට් කෝමැක් කීවේ සිනාවක් සමගය. ලොක්කා කෝපයෙන් ඔහුගේ කට මිරිකුවේය.

'සද්ද කරන්න එපා බූරුවෝ. උඹ වැඩේ ඔක්කොම විනාශ කරන්නයි හදන්නේ' ඔහු කෙඳුරුවේය.

සාකච්ඡාවක් පැවැත්වෙන හඬක් සාලය දෙසින් ඇසිණ. කතාවේ ඉවරයක් නැත. යළි ඇසුණේ අඩි ශබ්දයකි. දොර විවෘත විය. ශබ්ද නොනගන මෙන් තොල් හරහට දබරගිල්ල තබා සංඥාවක් කරමින් මැක්මිලන් කාමරයට ඇතුළුවිය.

මේසය කෙළවරට පැමිණි මැක්මිලන්, සහෝදරවරුන් දෙස නිසුණු බැල්මක් හෙළුවේය. ඔහුගේ මුහුණ ජ්වලිත වශයෙන් වෙනස් වී තිබිණි. මහා බැරෑරුම් රාජකාරියක් කිරීමට ඇති

අයියකුගේ මෙන් අමුතු පෙනුමක් ඔහුගේ මුහුණට ආරූඪ වී තිබිණි. ඔහු නායකත්වයට සුදුස්සකු බව පැහැදිලිය. මවුනු නොඉවසිල්ලෙන් මැක්මයෝ දෙස බලා සිටියහ. කටින් වචනයක් වත් පිට නොකළ මැක්මයෝ, වර්නාට එකා මැයින් තම පසෙක් දෙස ඉතා පරික්ෂාවෙන් බැලීය.

'කෝ ?' නිහඬතාවය ඉවසිය නොහැකි තැන ලොක්කා ඇසීය.

'කෝ තර්ඩ් එච්චචිස් ආවද?'

'ඔව්' මැක්මයෝ පිළිතුරු දුන්නේ ඉතා සෙමින්ය.

'තර්ඩ් එච්චචිස් ආවා. මං තමයි තර්ඩ් එච්චචිස් !'

කාමරය පුරා පැතිර ගියේ දැඩි නිශ්ශබ්දතාවයකි. තත්පර දහයක කාලයක් පැවැතියේ හිස් කාමරයක පවතින නිහඬතාවයකි. කේතලයක වතුර උතුරාගෙන එන හඬ උදුන දෙසින් ඇසිණි. භයෙන් තුන්කාවී ගිය සුදුමැලි වූ මුහුණු හතක් මැක්මයෝ දෙසට යොමු වී තිබිණි. එක් ක්ෂණයකින් කවුළු සියල්ල ආවරණය කර තිබූ තිර රෙදි ඉවත් ඉරී ගියේය. රයිෆල් තුවක්කු රාශියක කට්ටල් කාමරය තුළට ඇතුළු විය.

එය දුටු විගස, මැක්ගින්ටි ලොක්කා වෙඩි වැදුණු වලසකු මෙන් කෑ ගසාගෙන, අඩක් විවෘතව තිබූ දොර දෙසට පැන්නේය. පකල් පොලිසියේ කපිතාන් මාවින්ගේ රිවෝල්වරය ලොක්කාගේ හිස දෙසට එල්ල විය. මැක්ගින්ටි ආපසු තම අසුනටම ඇද වැටුණේය.

'මන්ත්‍රීතුමා, ඔබතුමාගෙ ආසනේටම වෙලා ඉන්න එක වැඩිය පරෙස්සම්.' එසේ කීවේ මවුන් මෙතෙක් මැක්මයෝ නමින් හඳුනාගෙන සිටි තැනැත්තාය.

'බෝල්ඩ්වින්, ඔය පිස්තෝලෙන් උඹේ අත පැත්තකට ගත්තේ නැත්නං , අලුගෝසුවට උඹ වෙනුවෙන් කරන්න දෙයක් ඉතුරු වෙන්නේ නෑ.'

ඔහු හිඳුරුවේය.

"අන්න හරි. මේ ගේ වටේට ආයුධ සන්නද්ධ පොලිස් භටයන් හතළිස් දෙනෙක් ඉන්නවා. ඒ නිසා කල්පනා කරල බලනවා, එක එක විජ්ජා කරල කළුපොලාට පැනල යන්න පුළුවන් වේවිද කියලා. තාවින්* ගන්නවා මේ මිනිස්සුන්ගේ ආයුධ ඔක්කොම."

ඔහු අණ දුන්නේය.

කතර වටෙන්ම වැල්ල වී තිබුණු රයිෆල් ආවක්ෂ මධ්‍යයේ අපරාධකරුවන් සතු ආයුධ ඉවත්කර ගැනීම අපහසු නොවීය. ඔවුහු තවමත් පුදුමයෙන් මෙන් බලා සිටියහ. එහෙත් මුහුණු සියල්ල විරූප වී ඇත.

"අපි වෙන්වෙලා යන්න කලින් ඔබේලාට වචනයක් දෙකක් කියන්න මං කැමතියි. සමහර විට අපි නැවතත් හමුවෙන්නේ උසාවියේදී වෙන්න පුළුවනි.

සිංහරාජ් ආයතනයේ හර්බි එඩ්වඩ්ස් මමයි. ඔබේලාගේ මිනීමරු සංවිධානය විනාශ කරන්න තෝරාගත්තු ලැබුවේ මටයි. මට කරන්න තිබුණේ බොහොම භයානක, ඒ වගේම දුෂ්කර රාජකාරියක්. කපිතාන් මාටින් සහ මාගේ ආයතනයේ අය ඇරෙන්න වෙන කිසිම කෙනෙක් මේ රහස දැන හිටියේ නෑ. මා ළඟින් ආශ්‍රය කළ අය නියා මගේ ආදරණීය එව් වත් මේ රහස දැන හිටියේ නෑ. දැන් ඉතින් ඒ ඔක්කොම ඉවරයි. දෙවියන්ට ස්තුති වේවා! මගේ සටන මං ජයගත්තා"

කෝපයෙන් විරූපී වුණු, කැකෑරෙන වෛරය පිළිබිඹු වූ මුහුණු හතක් ඔහු දෙසට යොමුවී ඇති තැටි හර්බි එඩ්වඩ්ස් දුටුවේය.

"සෙල්ලම කවම ඉවර උණේ නැහැ කියල කළුපොලා හිතනවා ඇති. මං ඒවටත් ලෑස්තියි. කළුපොලා ඇරුණම අද රෑම හිරගෙදර තවාතැන් ලැබෙන කවුන් හැට දෙනෙක් ඉන්නවා. මං

එකක් කියන්නම්. මේ වැඩේ මට භාර දුන්නම මං හිතුවෙ නෑ මේක මේ තරම්ට සංවිධානය වූ එකක් කියල. මං හිතුවේ මේ ඔක්කොම පත්තර වාර්තාකාරයො ගොතපු, කර්තෘවරු මවා පාන දෙයක් කියල. මට හිතෙන වුණේ ඔවුන් බොරු කියනවා කියල ඔප්පු කරන්නයි. ඔවුන් මට කිව්වා තමුසෙලා නිදහස් චින්තන සංගමයට සම්බන්ධයි කියලා. ඒ නිසා මං චිකාගෝවට ගිහින් ඒකෙ සාමාජිකත්වය ලබාගත්තා. සංගමයේ නම් කිසි වැරැද්දක් මට පෙනුණෙ නෑ. ඔවුන් සමාජයට කළේ යහපත් සේවයක් පමණයි.

භාර ගත්ත රාජකාරිය ඉටු කරන්න මට නියම වී තිබුණා. ඉතින් මං ආවා ගල් අඟුරු හා යකඩ කර්මාන්ත කරන නිම්න භූමියට. මං හිතාගෙන හිටිය දෙය වැරදි බවත්, මේක පත්තර කාරයින්ගේ ප්‍රබන්ධයක් නොවෙන බවත් එතකොටයි මට තේරුණේ. මං එව නිරීක්ෂණය කරමින් ඉවසීමෙන් බලා හිටියා. මම චිකාගෝවේදී මිනිහෙක් මරලත් නෑ. ජීවිතේටම හොර ඩොලර් කාසි අච්චු ගැහුවෙත් නෑ. ඔබලාට දීපු රන්කාසි ඔක්කොම ආණ්ඩුවෙන් අච්චු ගහපු ඇත්ත ඩොලර් කාසි. ඒ කිසිවක් අපතේ ගියේ නෑ. මේ තරම් ප්‍රයෝජනයක් ලැබෙන විදියට මං කවදාවත් සල්ලි වියදම් කරල නෑ. නීතිය මා පස්සෙන් එළවන බව මං ඔබට කිව්වා. ඔබ ඒක හොඳට විශ්වාස කළා.

එද මගෙල අර පුවත්පත් කාර්යාලයේ වයසක මිනිස්සයා ස්ටැන්ගර්ට පහර දීපු වෙලාවෙ මට තවුල් වෙන්න සිද්ධවුණා. ඔහුට අනතුරු අඟවන්න මට වෙලාවක් තිබුණෙ නෑ. කොහොම වුණත් බෝල්ඩ්වින් ඔහුව මරන්න හදද්දී ඒ මිනිස්සයව මරණයෙන් බේරගන්න මට හැකිවුණා. ඔබ අතරේ විශ්වාසය තහවුරු කරගන්න මං මොනවා හරි යෝජනා කළා නම්, ඒ මට වළක්වා ගන්න පුළුවන් ඒවා. මෙන්සීස් හා ඩන් දෙදෙනාගේ ජීවිත බේරා ගන්න මට හැකියාවක් තිබුණේ නෑ. ඒ මොකද ඔවුන් ගැන දැනෙන තරම් තොරතුරු කල්තබා දැනගන්න බැරිවුණු නිසා. ඒ වුණත් ඒ මිනීමරුවන් එල්ලුම් ගස් යවන එක නං නොවරදවාම කරනවා. චෙස්ටර් විල්කොක්ස්ගේ ගේ පුපුරවා හරින්න කලින්

මිනුට දක්වලා, පවුල පිටින්ම ඉවත් කරන්න මට හැකිවුණා. මට වළක්වන්න බැරිවුණු මිනීමැරුම් තිබුණා. ඒත් මම කල්පනා කරල බැලුවොත් මතක් වේවි. ඔහෙලට සම්භරුතාව මරාදමන්න මිතාවෙලා කාරක් අයිනේ ඒකාල ඉඳිද්දි, ඔවුන් වෙනත් කාරකින් කරදරයක් නැතුව ගෙදර ගිය හැටි; කොහොතුට වෙව් කියන්න මිනු ගෙයින් එළියට එතකුරු බලා ඉඳිද්දි ඒ මිනිහා හාගරයේ කවතක් කොහෙත් හරි රැඳී හිටි හැටි; ඒ ගැන හිතුවොත් මාත් මොනවා හරි කරලා තියෙනවා කියල තේරේවි.'

'සාලකාණ්ඩ වංචාකාරයා' මැක්ගින්ටි කෝපයෙන් ගිගුරුවේය.

'මගේශක ශෝත්‍රිය විනාශ අඩු කරගන්න පුළුවන් නම් ඒගොම කිරීමට වරදක් නෑ ජෝන් මැක් ගින්ටි. තමුසෙයි තමුසෙගේ කල්ලියයි ක්‍රියා කළේ, මේ පළාතේ, මනුෂ්‍යයින්ගේත් දෙවියන්ගේත් හතුරො හැටියටයි. තමුසෙලාගෙ යකඩ අඬුවට හිරවෙලා හිටි අහිංසක මිනිස්සු, ගැහැනු, ළමයි සමීරා ගන්න මිනිහෙක් අවශ්‍ය වෙලා තිබුණා. ඒ දේ ඉටු කරන්න තිබුණේ එකම විදියයි. මං ඒ විදියට කළා. මගේ කියන්නෙ මං වංචාකාරයෙක් කියල. තමුන් මං ඔවුන්ගේ ගැළවුම්කාරයා කියන්න ලක්ෂ ගණනක් ඉඳීවි. ඒක ඉටු කරන්න තමුසෙලාගේ අපායේ මට තුන් මාසයක් දුක් විඳින්න සිද්ධ වුණා. ඇමරිකාවෙ රාජ්‍ය භාණ්ඩාගාරයෙන් මට ඇති තරං රන්කාසි හොරගන්න තිබුණත්, ආයෙත් නම් මම ඒ වගේ තුන්මාසයක් දුක් විඳින්න ලෑස්ති නෑ. මට මෙච්චර කල් වුණත් රැඳී ඉන්න වුණේ තමුසෙල ගේ ව්‍යාපාරයට සම්බන්ධ හැම මිනිහෙක්ම, හැම රහසක්ම දැනගන්න ඕන වුණු නිසා. තවත් ටික කලක් මං ඒ විදියටම ඉන්න ඉඩ තිබුණා. ඒත් මගේ රහස හෙළිවෙන විදියේ ලියුමක් වර්මිසාවට ආවා. ඒ නිසා මගේ වැඩේ බොහොම ඉක්මන් කරන්න මට සිද්ධවුණා. මැරෙන්න වෙලාව ආවම, මම මෙහේ කළ සේවය ගැන මතක් කරලා මට හිතේ සැනැල්ලුවෙන් මැරෙන්න පුළුවන්. එච්චරයි. ඉතින් මාවින් ඉතිරි වැඩ කොටස ඔබට භාරයි.'

තව කීමට ඇත්තේ ඉතා ස්වල්පයකි. මුද්‍රා තැබූ ලියුමක් එවි

ෂාල්ට්ර්ට ගෙන ගොස් දීමට ජිකැල්ලන්ට භාරවිය. ඔහු එය සතුටින් ඉටු කළේය. දුම්රිය ධාවන සමාගම් වලින් එවුණු විශේෂ දුම්රියකින් එවී ෂාල්ට්ර් සහ තවත් පුද්ගලයෙක් බිහිසුණු නිම්නයෙන් පිටවී ගියහ. දින දහයකට පසු ඔවුහු විසාගෝවේදී අභිනන ගත්හ. සාක්ෂියට අත්සන් කළේ වයස්ගත ජේකබ් ෂාල්ට්ර් මහතාය.

වර්මියාවට බොහෝ ඈත ජනපදයකදී ප්‍රකෝරයන්ට විරුද්ධව නඩුව විභාගයට ගැනිණ. නිම්නයේ කප්පම් වලින් හා මිනීමැරීමෙන් එකතු කරගත් ධන සම්භාරය ගංගාවක් මෙන් ගලා ගියේය. ව්‍යාපාරය කැඩී බිඳී විසිරී ගියේය. ඔවුන්ගේ අයෝබිය ග්‍රහණයෙන් නිම්න භූමියම නිදහස් වෙද්දී, එහි අහිංසක වැසියෝ සැනසුම් සුසුම් හෙළූහ.

ජෝන් මැක්ගින්ට් එල්ලුම් ගසට නියම විය. එයට වෙලාව පැමිණි කළ ඔහු පෝරකයට යමින් කළේ අඳෝනා නගමින් හා හඬමිනි. ඔහුගේ සමීප සගයන් අට දෙනෙකුටද මැක්ගින්ට්ට නියම වූ දඬුවම ම ලැබිණි. පනහකට නොඅඩු ගණනක් ද දීර්ඝ සිර දඬුවම් සඳහා බන්ධනාගාරයට නියම විය. බ්රඩ් එඩ්වඩ්ස්ගේ රාජකාරිය එයෙකින් සම්පූර්ණ විය.

එහෙත් ඔහු සිතූ ආකාරයට කතාව එතැනින් අවසන් වූයේ නැත. බෙට් බෝල්ඩ්වින් හා විලම් පොනොපුරන් එල්ලුම් ගසෙන් බේරී සිරගෙට නියම විය. අවුරුදු දහයක් සිරගෙදර ගතකොට එයින් නිදහස් වූ පසු, තමාගේ නිදහස අවසන් වන තුරු බ්රඩ් එඩ්වඩ්ස් දැන සිටියේය. එල්ලුම් ගසෙන් බේරී සිටි සියල්ලෝම කෙසේ හෝ බ්රඩ් එඩ්වඩ්ස් මරා දැමීමට දිවුරා පොරොන්දු වී සිටියහ.

ඔහු ඝාතනය කිරීමට විසාගෝවේදී දෙවරක්ම උත්සාහ දරන ලදී. ඒ උත්සාහයන් දෙකම අසාර්ථක විය. බ්රඩ් විසාගෝවෙන් කැලිෆෝනියාවට පැන ගියේ නම නමද වෙනස් කරගනිමිනි. ඔහුගේ මුළු ජීවිතයම අඳුරට හෙළමින් එවී කැලිෆෝනියාවේදී උණ සන්නිපාතය වැළඳී මියගියාය.

කැලිෆෝනියාවේදී ද ඔර්බි එඩ්වඩ්ස් මරා දැමීමට යළිත් වරක් උත්සාහ කරන ලදී. එයද වැරදී ගියේය. එවකට ඩග්ලස් යන නාමින් පෙනී සිටි ඔහු, ගාසර් නම් ඉංග්‍රීසි ජාතිකයෙකු සමග රත්රන් පතලක සේවය කළේය. විශාල වශයෙන් ධනය උපයා ගනිමින් සිටියදී මිනීමරු දඩබල්ලන් යළිත් ඔහු පසුපස හඹා එන බවට ලකුණු පහළ විය. සතුරන්ට අසුවීමට මත්තෙන් මෙන්න කියා සිටියදී ඔවුනගෙන් ගැලවී එංගලන්තයට පැන ගැනීමට එඩ්වඩ්ස් සමත් විය. යළිත් විවාහවී ජෝන් ඩග්ලස් නම් වැදගත් මහත්මයෙකු ලෙස එංගලන්තයේ වාසය කළේ ඉන් පසුවයි.



........අර තරුණියක් හිස දෑත්වලට තුළු කරගෙන ගඟ දිහා බලාගෙන ඉන්න සිතුවම නේද?

ඔව්. ඒක ජෝන් බැප්ටිස් ග්‍රූස්ගෙ හෙල් පායිම් සිතුවමක්. 1865 චිත්‍ර ප්‍රදර්ශනයේදී රන්පදක්කම් ලැබුණු සිතුවමක් වුණා. මහාචාර්ය සැමෙත් මොරියාටිට ලැබෙන්නේ අනුරුවක්. පළමු නාමයයි. ග්‍රූස්ගෙ සිතුවමක් වගේ අපිට !

කොහෙන්ද කෙනිස් මෙන්ඩෙස මේ පලිහ? ගොර පලිහ නම් මේ කෙරිල් මිලදී?

ඒක තමයි මගේ අහන්නේ. කොහෙන්ද මේ පලිහ !

දෙවියන් සාක්ෂි ! උන්නැහේ අමුතු නම් ගෙයි පුදුමාකාර මිනිහෙක්. මේ පලාතේ කියන්නේ............ ජොනාර් සැමෙනී වැඩ කරපුත මිනිහෙක්

ජොනාර් සැමෙනී ඒ මැජිස්ට්‍රේට්ගේ පාලිවිත් නේද?

නැට ! නැට ! තමුසෙගෙ කට පරෙස්සම් කරගනින්. ඔහේ කොහේදී හරි මිනිහට කතා කරලාත් තමුසෙට වැඩි කල් යන්නේ නැතිව ඉන්න ලැබෙන්නේ නෑ. මෙයට වඩා ලොකු දේවල් වලට මිනිස්සු මැරෙනවා අයිතිකාර කියලා මේ පලාතේ



165/=